ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය

කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය

ණය අංකය. ශ්‍රී (…..)

කැළණිවැලි දුම්රිය මාර්ගය වැඩිදියුණු කිරීමේ වැඩසටහන අදියර – I

(මරදාන - පාදුක්ක)

නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලසුම් කෙටුම්පත - 2 වන කොටස

(ලොකෝ හන්දිය - සීවලී පටුමග)

2020 ජනවාරි

සකස් කළේ:

ව්‍යාපෘති කළමනාකරණ ඒකකය

කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය

කොළඹ - ශ්‍රී ලංකා

පටුන

සංක්ෂිප්ත සහ කෙටි යෙදුම්......6
පාරිභාෂික වචන මාලාව......8
වගු ලැයිස්තුව......12
සටහන් ලැයිස්තුව......14
සාරාංශය......15
ව්‍යාපෘතිය:......15
නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරකම් සැලැස්මෙහි අරමුණු......16
පාර්ශවකරුවන් සමඟ සාකච්ඡා, ඔවුන්ගේ සහභාගීත්වය සහ අනාවරණ......17
නැවත පදිංචි කිරීමේ බලපෑම්......18
ප්‍රතිස්ථානගත කිරීම සහ ජීවනෝපාය ප්‍රතිස්ථාපනය......19
හිමිකම් ගෙවීමේ ක්‍රමවේදය......19
දුක්ගැනවිලි සඳහා සහන සැලසීමේ යාන්ත්‍රණය......20
අයවැය......20
සුපරීක්ෂණය......21
1 වන පරිච්ඡේදය - ව්‍යාපෘති විස්තරය......22
1.1 ව්‍යාපෘතියේ පසුබිම......22
1.2 කැළණිවැලි දුම්රිය මාර්ගය වැඩිදියුණු කිරීමේ වැඩසටහන - අදියර 1 (KV Rail - Phase 1)......23
1.3 කැළණිවැලි දුම්රිය මාර්ගයේ පළමු අදියර හි දෙවන කොටස......26
1.4 නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරකම් සැලැස්මෙහි (RAP) අරමුණු - කැළණිවැලි දුම්රිය මාර්ගයේ පළමු අදියර හි දෙවන කොටස......26
1.5 නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරකම් සැලැස්ම සකස් කිරීම සඳහා අනුගමනය කරනු ලැබූ ක්‍රමෝපාය......27
2 වන පරිච්ඡේදය - ඉඩම් අත්කර ගැනීමේ හා නැවත පදිංචි කිරීමේ විෂය පථය......29
2.1 හැඳින්වීම......29
2.2 ඉඩම් මත ඇති කරන බලපෑම......30
2.2.1. පුද්ගලික ඉඩම් මත ඇති කරන බලපෑම......31
2.3 ඉදිකිරීම් මත ඇති කරන බලපෑම......33
2.3.1 ඉදිකිරීම් සිදු කිරීම සඳහා භාවිතා කරනු ලබන අමුද්‍රව්‍ය......35
2.3.2 එක් එක් අමුද්‍රව්‍ය වර්ගය යොදා ගෙන ඇති ගෙබිම වර්ග ප්‍රමාණය (වර්ග අඩි)......36
2.3.3 මායිම් තාප්ප......36
2.3.4 ඉදිකිරීම්වල බලපෑමට ලක් වූ ගෙබිම වර්ග ප්‍රමාණය......37
2.3.5 බලපෑමට ලක් වූ ඉදිකිරීම් සඳහා පවතින පහසුකම්......37
2.3.6 බෝග සහ ගස් වැල් මත ඇති කරන බලපෑම......38
3 වන පරිච්ඡේදය - සමාජ ආර්ථික පැතිකඩ......39
3.1 හැඳින්වීම......39
3.2 ව්‍යාපෘතියෙන් බලපෑමට ලක් වූ කුටුම්බවල සමාජ ආර්ථික තත්ත්වය......40
3.2.1. කුටුම්බවල විශාලත්වය......40
3.2.2. කුටුම්බවල ආදායම හා වියදම......41
3.3 ව්‍යාපෘතියෙන් බලපෑමට ලක්වන ගෘහ මූලිකයන්ගේ සමාජ ආර්ථික තත්ත්වය......42
3.3.1. ජන වර්ගය......42
3.3.2. වයස සහ ස්ත්‍රී පුරුෂ භාවය......42
3.3.3. විවාහක අවිවාහක භාවය......43
3.3.4. අධ්‍යාපන මට්ටම......43

3.3.5. වෘත්තීය රටාවන් 44
3.4 ව්‍යාපෘතියෙන් බලපෑමට ලක් වූ කුටුම්බවල සාමාජිකයින්ගේ සමාජ ආර්ථික තත්ත්වය 45
3.4.1. වයස සහ ස්ත්‍රී පුරුෂ භාවය 46
3.4.2. විවාහක අවිවාහක භාවය 46
3.4.3. අධ්‍යාපන මට්ටම 47
3.4.4. වෘත්තීය රටාවන් 48
3.5 දිළිඳු සහ අවදානම් මට්ටමේ තත්ත්වයන් 49
4 වන පරිච්ඡේදය - මහජන සාකච්ඡා/ උපදේශන 51
4.1 බලපෑමට ලක් වූ පුද්ගලයන් හා අනෙකුත් පාර්ශවකරුවන් සමඟ සාකච්ඡා /උපදේශන ක්‍රියාවලිය 51
4.2 මහජනායාට අනාවරණය කිරීම හා තොරතුරු බෙදා හැරීම 67
4.3 අඛණ්ඩ උපදේශනය / සාකච්ඡා සහභාගිත්වය 67
5 වන පරිච්ඡේදය - දුක්ගැනවිලි සඳහා සහන සැලසීමේ යාන්ත්‍රණය 69
5.1 හැඳින්වීම 69
5.2 කැළණිවැලි දුම්රිය මාර්ගයේ පළමු අදියර සඳහා වන දුක්ගැනවිලි සඳහා සහන සැලසීමේ යාන්ත්‍රණයෙහි ක්‍රියාකාරී අංශයන් 70
5.3 දුක්ගැනවිලි සඳහා සහන සැලසීමේ යාන්ත්‍රණය සහ දුක් ගැනවිලි සඳහා සහන සැලසීමේ කමිටුව සුපරීක්ෂණය හා ඇගයීම 72
5.4 අතෘප්තියට පත් පාර්ශවයන්ට සිය දුක්ගැනවිලි ඉදිරිපත් කළ හැකි වෙනත් ආයතන 73
6 වන පරිච්ඡේදය - නීතිකාරකය සහ ප්‍රතිපත්ති රාමුව 76
6.1 අදාළ වන නීති 76
6.1.1 *ඉඩම් අත්කර ගැනීමේ පනත* (LAA) 76
6.1.2 *2008 වන්දි ගෙවීමේ ජාතික ප්‍රතිපත්තිය සහ 2008 ඉඩම් අත්කර ගැනීමේ රෙගුලාසි* 77
6.1.3 *ඉඩම් අත්කර ගැනීමේ හා නැවත පදිංචි කිරීමේ කමිටුව (ලාර්ක් හා සුපර් ලාර්ක්) 2013* 78
6.1.4 *1935 ඉඩම් සංවර්ධන ආඥා පනත* - Land Development Ordinance (1935) 78
6.1.5 *1903 අංක 1 දරන දුම්රිය ආඥා පනත (සංශෝධිත)* 78
6.1.6 *1947 අංක 8 දරන රජයේ ඉඩම් ආඥා පනත* 78
6.1.7 *1970 අංක 7 දරන රජයේ ඉඩම් (සන්තකය ආපසු ගැනීමේ) පනත* 79
6.1.8 *1871 අංක 22 දරන කාලාවරෝධී ආඥා පනත* 79
6.1.9 *1931 අංක 19 දරන බෞද්ධ විහාර දේවාලගම් ආඥා පනත* 80
6.1.10 *1980 සහ 1988 දරන ජාතික පාරිසරික පනත* 80
6.1.11 දිළිඳු සහන ආඥා පනත Poor Law Ordinance 80
6.1.12 *කාන්තාවන් සහ ළමුන් ආරක්ෂා කිරීමේ ආඥා පනත* 81
6.1.13 *කම්කරු නීතිය* 81
6.2 ප්‍රතිපත්ති වැඩ රාමුව 81
6.2.1 ස්වකැමැත්තෙන් තොරව අවතැන් වූවන් නැවත පදිංචි කිරීමේ ජාතික ප්‍රතිපත්තිය 87
6.2.2 2009, ආසියානු සංවර්ධන බැංකුවේ සමාජ ආරක්ෂණ ප්‍රතිපත්ති ප්‍රකාශය (SPS) 84
6.3 අහිමි වූ සහ බලපෑමට ලක් වූ දේපළ තක්සේරු කිරීම 89
6.4 සාකච්ඡාකොට එකඟතාවයට පැමිණි ඉඩම් අත්කර ගැනීම් 90
6.5 ප්‍රතිස්ථාපන පිරිවැය තක්සේරු කිරීම 91
6.6 හිමිකම් තක්සේරු කිරීමේ කමිටුව ස්ථාපිත කිරීම 94
6.7 ව්‍යාපෘති මෙහෙයවීමේ ජාතික කමිටුව (NPSC) 95
6.8 ඉඩම් අත්කර ගැනීමේ පනත හා ස්වකැමැත්තෙන් තොරව අවතැන්වූවන් නැවත පදිංචි කිරීමේ ජාතික ප්‍රතිපත්තිය අතරත් ඒ සම්බන්ධයෙන් ආසියානු සංවර්ධන බැංකුවේ 2009 සමාජ ආරක්ෂණ ප්‍රතිපත්ති ප්‍රකාශය අතරත් දැනට පවතින පරතරය 96

7 වන පරිච්ඡේදය - හිමිකම්, සහාය සහ ප්‍රතිලාභ 103
7.1 හැඳින්වීම 103
7.**2** හිමිකම්/ සහාය/ ප්‍රතිලාභ සඳහා සුදුසුකම් ලැබීම 104
7.**3** හිමිකම් ගෙවීමේ ක්‍රමවේදය 104
8 වන පරිච්ඡේදය - නිවාස හා ජනාවාස ප්‍රතිස්ථාපනය කිරීම 124
8.1 පදිංචි ස්ථාන ප්‍රතිස්ථානගත කිරීම 124
8.1.2 *නැවත පදිංචි කිරීම පිළිබඳ බලපෑමට ලක් වූ කුටුම්බ දරණ ආකල්ප* 125
8.2 යෝජිත වන්දි පැකේජය 125
8.3 බලපෑමට ලක් වූ ආගමික සිද්ධස්ථාන ප්‍රතිස්ථානගත කිරීම 127
9 වන පරිච්ඡේදය - ආදායම් ප්‍රතිස්ථාපන වැඩසටහන 128
9.1 හැඳින්වීම 128
9.2 ජීවනෝපාය මත බලපෑම 129
9.3 අවදානම් තත්ත්වයේ පවුල් සහ පුද්ගලයන් සඳහා ස්වකැමැත්තෙන් තොරව නැවත පදිංචි කිරීමේ අවශ්‍යතා 130
9.4 කැළණිවැලි දුම්රිය මාර්ගයේ පළමු අදියරෙහි "**2** වන කොටස" සඳහා ආදායම් ප්‍රතිෂ්ඨාපන වැඩසටහන 131
9.5 ආදායම් ප්‍රතිෂ්ඨාපන වැඩසටහන සඳහා ජීවනෝපාය සංවර්ධන පුහුණු වැඩසටහන්වල අවශ්‍යතාවය 132
9.6 ජීවනෝපාය හා ආදායම් ප්‍රතිෂ්ඨාපන උපාය මාර්ග 132
9.7 ආදායම් ප්‍රතිෂ්ඨාපන වැඩසටහනට සහභාගි වීමට අවස්ථාව ලබන ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක් වූ කුටුම්බ කාණ්ඩ 133
9.8 විභව්‍ය ආදායම් ප්‍රතිෂ්ඨාපන වැඩසටහන 133
9.9 ආදායම් ප්‍රතිෂ්ඨාපන වැඩසටහන ක්‍රියාත්මක කිරීමෙහි ලා සංවිධානවලට සහාය වීම. 135
9.10 ආදායම් ප්‍රතිෂ්ඨාපන වැඩසටහනෙහි ප්‍රගතිය අධීක්ෂණය 136
10 වන පරිච්ඡේදය - නැවත පදිංචි කිරීමේ අයවැය සහ මූල්‍යමය සැලැස්ම 137
10.1 හැඳින්වීම 137
10.2 වන්දි ගෙවීම 138
10.2.1 පුද්ගලික ඉඩම් සඳහා වන්දි 138
10.2.2 පොදු මහජන සම්පත් ඇතුළත්ව ඉදිකිරීම් සඳහා වන්දි ගෙවීම 139
10.3.3 ශාක සහ බෝග සඳහා වන්දි 140
11 වන පරිච්ඡේදය - ක්‍රියාත්මක කිරීමේ උපලේඛනය 145
12 වන පරිච්ඡේදය - ආයතනික කටයුතු 149
12.1 හැඳින්වීම 149
12.2 ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය 149
12.3 පරිසර හා සමාජ ආරක්ෂණ අංශය සහ ඉඩම් අත්කර ගැනීමේ අංශය 150
12.3.1 *පරිසර හා සමාජ ආරක්ෂණ අංශය*: 151
12.3.2 *ඉඩම් අත්කර ගැනීමේ අංශය*: 151
12.4 ප්‍රාදේශීය ලේකම් කාර්යාලය 151
12.5 මිනින්දෝරු දෙපාර්තමේන්තුව 152
12.6 ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය 152
12.7 තක්සේරු දෙපාර්තමේන්තුව 152
12.8 නැවත පදිංචි කිරීමේ වැඩ රාමුව සහ නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම අනුමත කිරීමේ ක්‍රියාවලිය 153
13 වන පරිච්ඡේදය - සුපරීක්ෂණය හා වාර්තා කිරීම 155
13.1 සුපරීක්ෂණයේ ඉලක්ක හා අරමුණු 155

13.2 අභ්‍යන්තර සුපරීක්ෂණය හා ක්‍රමවේදය 155
13.3 සුපරීක්ෂණයේ ප්‍රධාන දර්ශක 155
13.4 වාර්තා කිරීමේ අවශ්‍යතා 156
13.5 බාහිර සුපරීක්ෂණය හා ක්‍රමවේදය 156

සංක්ෂිප්ත සහ කෙටි යෙදුම්

ADB	ආසියානු සංවර්ධන බැංකුව
AHHs	බලපෑමට ලක් වූ ගෘහ මූලිකයන්
CEA	මධ්‍යම පරිසර අධිකාරිය
CMR	කොළඹ අගනගර කලාපය
CSRP	කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය
CV	ප්‍රධාන තක්සේරුකරු
DS	ප්‍රාදේශීය ලේකම්
DGP	රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව
DPD	නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ
DSD	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
EA	ක්‍රියාත්මක කිරීමේ ආයතනය
EM	හිමිකම් ගෙවීමේ ක්‍රමවේදය
EAC	හිමිකම් තක්සේරු කිරීමේ කමිටුව
EIA	පාරිසරික බලපෑම් තක්සේරු කිරීම
FGD	කේන්ද්‍රගත කණ්ඩායම් සඳහා සාකච්ඡා
GN	ග්‍රාම නිලධාරී
GND	ග්‍රාම නිලධාරී කොට්ඨාශය
GOSL	ශ්‍රී ලංකා රජය
GRC	දුක් ගැනවිලි සඳහා සහන සැලසීමේ කමිටුව
GRM	දුක් ගැනවිලි සඳහා සහන සැලසීමේ යාන්ත්‍රණය
HH	ගෘහ මූලිකයා
IR	ස්වේච්ඡාවෙන් නැවත පදිංචි කිරීම
HRC	මානව හිමිකම් කොමිසම
IA	ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන නියෝජිත ආයතනය
IRP	ආදායම් ප්‍රතිසංස්කරණ වැඩසටහන
KV	කැළණි වැලි
KII	ප්‍රධාන තොරතුරු සම්මුඛ සාකච්ඡා
LAA	ඉඩම් අත්කර ගැනීමේ පනත
LAR	ඉඩම් අත්කර ගැනීමේ රෙගුලාසි
LARB	ඉඩම් අත්කර ගැනීමේ වන්දි සමාලෝචන මණ්ඩලය
LARC	ඉඩම් අත්කර ගැනීමේ සහ නැවත පදිංචි කිරීමේ කමිටුව
LARS	ඉඩම් අත්කර ගැනීමේ සහ නැවත පදිංචි කිරීමේ මැනුම

LHS	වම් පැත්ත
MLPR	ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය
M&E	සුපරීක්ෂණය හා තක්සේරු කිරීම
MTCA	ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය
NEA	ජාතික පාරිසරික පනත
NWS&DB	ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය
NPPC	වන්දි ගෙවීමේ ජාතික ප්‍රතිපත්තිය
NGOs	රාජ්‍ය නොවන සංවිධාන
NIRP	ස්වකැමැත්තෙන් තොරව අවතැන්වූවන් නැවත පදිංචි කිරීමේ ජාතික ප්‍රතිපත්තිය
NHDA	ජාතික නිවාස සංවර්ධන අධිකාරිය
NGO	රාජ්‍ය නොවන සංවිධානය
PAP	ව්‍යාපෘතියෙන් බලපෑමට ලක් වූ පුද්ගලයන්
PMU	ව්‍යාපෘති කළමනාකරණ ඒකකය
PAH	ව්‍යාපෘතියෙන් බලපෑමට ලක් වූවන්
PIC	ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ උපදේශක
PPC	පාර්ලිමේන්තු පෙත්සම් කාරක සභාව
RDA	මාර්ග සංවර්ධන අධිකාරිය
RF	නැවත පදිංචි කිරීමේ වැඩරාමුව
RAP	නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරකම් සැලැස්ම
ROW	වෙන්කළ බිම් තීරුව
SPS	ආසියානු සංවර්ධන බැංකුවේ සමාජ ආරක්ෂණ ප්‍රතිපත්ති ප්‍රකාශය
SLR	ශ්‍රී ලංකා දුම්රිය සේවය
SD	මිනින්දෝරු දෙපාර්තමේන්තුව
SLT	ශ්‍රී ලංකා ටෙලිකොම්
SM	සමථ මණ්ඩලය
TA	තාක්ෂණික සහායක
TOR	යොමු කිරීමේ කොන්දේසි
UDA	නාගරික සංවර්ධන අධිකාරිය
UN	එක්සත් ජාතීන්
VD	තක්සේරු දෙපාර්තමේන්තුව

පාරිභාෂික වචන මාලාව

ව්‍යාපාර හිමිකරු (Business Owner): ව්‍යාපෘතිය යටතේ සිදු කරනු ලබන ඉදිකිරීම් කාර්යයන් හේතුවෙන් බාධාවට ලක්වන, ව්‍යාපෘතියෙන් බලපෑමට ලක්වන ප්‍රදේශය තුළ ව්‍යාපාරයක් හිමි හෝ ව්‍යාපාර පවත්වාගෙන යන පුද්ගලයෙකි. ඔහු/ ඇය නෛතික හිමිකරු, ඉදිකිරීමක හිමිකම් නොමැති අයිතිකරු හෝ කුලීකරු විය හැකි අතර හිමිකම් ගෙවීමේ ක්‍රමවේදය ප්‍රකාරව විවිධ වන්දි සහ පුනරුත්ථාපන හා නැවත පදිංචි කිරීමේ (R&R) පැකේජ ලබනු ඇත.

වන්දි (Compensation): බලපෑමට ලක් වූ යම් පුද්ගලයෙකුට හිමිකමක් පවතින කිසියම් වත්කමක්, සම්පතක් හෝ ආදායම් මාර්ගයක් ව්‍යාපෘතිය මගින් අත්කර ගනු ලැබුවේ නම් හෝ බලපෑමට ලක් වී ඇත්නම් ගෙවනු ලබන මුදල හෝ ලබාදෙන යම් ආකාරයක ප්‍රතිස්ථාපනයකි.

අවසන් දිනය (Cut-off date): ඉඩමට හිමිකමක් පවතින පුද්ගලයන් සඳහා අවසන් දිනය ලෙස සලකනු ලබන්නේ ඉඩම් අත්කර ගැනීමේ පනතේ 2 වන වගන්තිය යටතේ නිවේදනය නිකුත් කළ දිනය වන අතර හිමිකමක් නොමැති පුද්ගලයන් සඳහා අවසන් දිනය වන්නේ නැවත පදිංචි කිරීමේ බලපෑම් සමීක්ෂණය සිදුකළ දිනයයි. අවසන් දිනයට පසුව අදාළ ප්‍රදේශයෙ තුළ අනවසරයෙන් පදිංචි වූ පුද්ගලයන් වන්දි සඳහා හෝ වෙනත් කවර හෝ ආකාරයක නැවත පදිංචි කිරීමේ සහාය ලබා ගැනීම සඳහා හිමිකම් නොලබයි. එසේම වත්කම් තොග ලේඛනය සකස් කොට අවසන් කළ දිනට හෝ අන්‍යෝන්‍ය දිනයට පසුව ස්ථාපිත කරන ස්ථාවර දේපළ (ඉදිකිරීම්, බෝග, පළතුරු ගස් සහ දැව කඳන් වැනි) සඳහා වන්දි ගෙවනු නොලැබේ.

අවතැන් වූ පුද්ගලයන් (Displaced persons): ස්වකැමැත්තෙන් තොරව නැවත පදිංචි කිරීම සම්බන්ධයෙන් වන කල්හි අවතැන් වූ පුද්ගලයන් යනු, ස්වකැමැත්තෙන් තොරව ඉඩම් අත්කර ගැනීමේ හෝ ඉඩම් පරිහරණය හෝ ප්‍රවේශය මත ස්වකැමැත්තෙන් තොරව සීමාකිරීම් වල ප්‍රතිඵලයක් වශයෙන් භෞතික අවතැන් වන (ප්‍රතිස්ථානගත කිරීම, නේවාසික ඉඩම් අහිමි වීම හෝ නිවසන අහිමි වීම) සහ/ හෝ ආර්ථික වශයෙන් අවතැන්වන (ඉඩම්, වත්කම්, වත්කම් සඳහා ප්‍රවේශය, ආදායම් මූලාශ්‍ර හෝ ජීවනෝපාය මාර්ග අහිමිවන) පුද්ගලයන් වේ.

හිමිකම් තක්සේරු කිරීමේ කමිටුව (Entitlement Assessment Committee**)**: නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලියේ දී දැනට පවතින නීති හා රෙගුලාසි වලින් ආවරණය නොවන අංග ආවරණය කරමින් එකඟත්වයට පැමිණි විධිවිධාන හරහා, බලපෑමට ලක් වූ පුද්ගලයන් හට ප්‍රමාණවත් පරිදි වන්දි ලබාදීම පිළිබඳ නිශ්චය කිරීම සහ වෙනත් ආශ්‍රිත ක්‍රියාකාරකම් සිදු කිරීම පිණිස අදාළ රාජ්‍ය ආයතනවල නියෝජිතයන්ගේ සහභාගීත්වයෙන් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය යටතේ පත් කරන ලද ව්‍යාපෘති විශේෂ කමිටුවකි. (2013 ඉඩම් අත්කර ගැනීමේ රෙගුලාසි ප්‍රකාර ලාර්ක් කමිටුව වැනි)

ආර්ථික අවතැන්වීම (Economic Displacement): (i) සිය කැමැත්තෙන් තොරව ඉඩම් අත්කර ගැනීම නිසා ඉඩම, වත්කම්, වත්කම් සඳහා ප්‍රවේශය, ආදායම් මූලාශ්‍ර හෝ ජීවනෝපාය මාර්ගයකට පිවිසීමේ අයිතිය අහිමිවීම හෝ සම්පත් කරා ළඟාවීමට ඇති හැකියාවට බාධා ඇතිවීම, (ii) ඉඩම් පරිහරණය මත හෝ නීතියෙන් නම් කරන ලද උද්‍යාන සහ සංරක්ෂිත ප්‍රදේශ වෙත ප්‍රවේශ වීම මත ස්වකැමැත්තෙන් තොරව බාධා ඇතිවීම.

සුදුසුකම් ලැබීම (Eligibility): නැවත පදිංචි කිරීමේ වැඩසටහනක් යටතේ ප්‍රතිලාභ ලැබීමට සුදුසුකම් ලැබීමේ ක්‍රමවේදයයි. බලපෑමට ලක් වූ නේවාසික හෝ ව්‍යාපාර දේපළ හිමිකරුවන්, බදුකරුවන්, ජංගම වෙළඳුන්, අනවසරකරුවන්, බලහත්කාරයෙන් පදිංචිවූවන්, තැන තැන ගොස් වෙළඳාම් කරන්නන් ආදී වූ විවිධ වර්ගවලට අයත් එක් එක් කාණ්ඩය වෙත හිමිවන නැවත පදිංචි කිරීමේ හිමිකම් වශයෙන් මෙම ක්‍රමවේදය ක්‍රියා කරයි.

අනවසරකරු (Encroacher): ඔහුගේ/ ඇයගේ පුද්ගලික භූමියේ බාහිර සීමාව, අනුමත ගොඩනැගිල්ලෙහි සීමාවෙන් කෘෂිකාර්මික ඉඩමෙන් ඔබ්බට අනවසරයෙන් පුළුල් කරගෙන ඇති හෝ වැඩි කරගෙන ඇති සහ/ හෝ ඔහුගේ/ ඇයගේ ඉඩම් කොටස හෝ කෘෂිකාර්මික ඉඩමෙන් ඔබ්බට පොදු ඉඩකඩ අල්ලාගෙන ඇති පුද්ගලයෙකු වේ.

හිමිකම් (Entitlement): සුවිශේෂී සුදුසුකම් ලැබීමේ කාණ්ඩයක් සම්බන්ධයෙන් නැවත පදිංචි කිරීමේ හිමිකම් යනු අදාළ සුදුසුකම් ලැබීමේ කාණ්ඩයේ බලපෑමට ලක්වන පුද්ද්ගලයන් හට ලබාදෙන වන්දිය සහ වෙනත් ආකාරයේ සහාය වේ. එයට බලපෑමට ලක් වූ පුද්ගලයන්ගේ අහිමිවීම්වල ස්වභාවය මත පදනම්ව ඔවුන්ගේ ආර්ථික හා සමාජ පදනම ප්‍රතිස්ථාපනය කිරීම සඳහා ඔවුන් වෙත ලබාදිය යුතු වන්දි ගෙවීම, ආදායම් ප්‍රතිස්ථාපන, පදිංචිය වෙනස් කිරීමේදී අවශ්‍ය සහාය, ආදායම් ආදේශන සහ ප්‍රතිස්ථානගත කිරීම ඇතුළත් පියවර පරාසයක් ඇතුළත් වේ.

සත්කාරක ජනගහනය/ ප්‍රජාව (Host Population/Community): ව්‍යාපෘතිය මගින් භෞතික වශයෙන් අවතැන්වන පුද්ගලයන් නැවත පදිංචි කරනු ලබන ප්‍රදේශය තුළ හා ඒ අවට ජීවත් වන පුද්ගලයන් සත්කාරක ජනගහනය/ ප්‍රජාව වශයෙන් සලකන අතර නැවත පදිංචි කිරීම හේතුවෙන් ඔවුන් ද බලපෑමට ලක්විය හැකිය. නැවත පදිංචි කිරීම් හේතුවෙන් ඇති විය හැකි සමාජීය අවදානම් අවම කිරීම සහ විභව්‍ය සමාජීය ගැටුම් වැළැක්වීම පිණිස සත්කාරක ජනගහනය/ ප්‍රජාව/ පිරිසගේ අවශ්‍යතා/ ඕනෑ එපාකම් සහ අපේක්ෂාවන් පිළිබඳව නැවත පදිංචි කිරීමේ වැඩසටහනකදී විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

ස්වකැමැත්තෙන් තොරව නැවත පදිංචි වීම (Involuntary Resettlement): බලපෑමට ලක් වූ පුද්ගලයන්ගේ කැමැත්තෙන් තොරව එය සිදුවුණි නම් හෝ නැවත පදිංචි කිරීම ප්‍රතික්ෂේප කිරීමට තරම් බලයක් නොමැති හෙයින් ඔවුන් ඒ සඳහා කැමැත්ත දුන්නේ නම්, එවන් අවස්ථාවලදී සිදු වූ නැවත පදිංචි කිරීම බලපෑමට ලක්වූවන්ගේ කැමැත්තෙන් තොරව සිදුවූවා සේ සැලකේ.

ක්‍රියාත්මක කිරීමේ කාර්ය සටහන (Implementation Schedule): ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් ඉටු කිරීම සඳහා නියම කරගෙන ඇති කාල රාමුවයි.

ආදායම් ප්‍රතිස්ථාපනය (Income Restoration): අවතැන් වූ පුද්ගලයන් හට ඔවුන් නැවත පදිංචි කිරීමට ලක්වීමට පෙර උපයාගත් ආදායමට සමාන හෝ, හැකියාවක් පවතී නම් ඊට වඩා වැඩි ආදායමක් ඉපැයීම පිණිස ඵලදායී ජීවනෝපාය නැවත ස්ථාපිත කිරීමයි.

ඉඩම් හිමිකරුවන් (Land Owners): රජයේ ලිඛිත ලේඛනවල වාර්තා ගත වී ඇති නිරවුල් හිමිකමක් සහිත ඉඩමට සම්බන්ධව වෘක්ෂලතා, බෝග හෝ ඉදිකිරීම් සහිත හෝ රහිත ඉඩමක් හිමි තැනැත්තන් ඉඩම් හිමිකරුවන් ලෙස හඳුන්වනු ලැබේ. ඇතැම් විශේෂිත අවස්ථාවල ව්‍යාපෘතියෙන් බලපෑමට ලක් වූ ප්‍රදේශවල ඉඩම් පිහිටියද ඒ සඳහා සනාථ කළ හැකි හිමිකමක් පැවතියද, නොපැවතියද ඔහුගේ/ ඇයගේ හිමිකම අධිකරණයේ පිළිගෙන ඇත්නම්

එවන් පුද්ගලයන්ද මෙම කාණ්ඩයට ඇතුළත් වේ. එවන් අවස්ථාවලදී පළාත් පාලන ආයතනය හා ප්‍රජාව සමඟ සාකච්ඡා කොට ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PMU) විසින් විශේෂ තීරණයක් ගනු ලැබේ.

පදිංචිව නොමැති ඉඩම් හා ඉදිකිරීම් හිමියන් (Non-Resident Land and Structure Owners): සිය ඉඩම සහ ඊට අයත් දේපළ කුලියට හෝ බද්දට ලබාදීම හේතුවෙන් හෝ වෙනයම් පුද්ගලයෙකු එම ඉඩම භුක්ති විදීම හේතුවෙන් එහි භුක්තිය නොලබන අදාළ ඉඩමේ භුක්තිය නොමැති නීත්‍යානුකූල ඉඩම් හිමියන් වේ.

භෞතික අවතැන්වීම (Physical Displacement): ස්වකැමැත්තෙන් තොරව ඉඩම් අත්කර ගැනීම හෝ ඉඩම් පරිහරණය කිරීමෙහි හෝ ඉඩමට ප්‍රවේශ වීම සඳහා ස්වකැමැත්තෙන් තොරව සීමා පැනවීමෙහි ප්‍රතිඵලයක් ලෙස නේවාසික ඉඩම් අහිමි වීම හෝ වාසස්ථාන අහිමි වීම.

භෞතික හා සංස්කෘතික සම්පත් (Physical and Cultural Resources): පුරාවිද්‍යාත්මක, ෆොසිල් විද්‍යාත්මක, ඓතිහාසික, වාස්තු විද්‍යාත්මක, ආගමික, සෞන්දර්යාත්මක හෝ වෙනත් සංස්කෘතිකමය වැදගත්කමක් සහිත නිශ්චල හෝ චංචල වස්තූන්, ස්ථාන, ඉදිකිරීම්, ඉදිකිරීම් සමූහයක් සහ ස්වභාවික features හා භූ නිර්මාණ. ඒවායේ සංස්කෘතිකමය වටිනාකම ප්‍රාදේශීය, පළාත්, ජාතික හෝ ජාත්‍යන්තර මට්ටමේ විය හැකිය. මෙයට සුසාන භූමි, පොදු සනීපාරක්ෂක ස්ථාන, පිට්ටනි ආදිය ඇතුළත් වේ.

ව්‍යාපෘතියෙන් බලපෑමට ලක් වූ පුද්ගලයන් (Project Affected Person): ව්‍යාපෘතියක්, උප ව්‍යාපෘති කටයුතු ආදිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිඵලයක් ලෙස අයිතිව තිබීමට ඇති හිමිකම, එහි ඉදිකිරීම් භාවිතා කිරීමට හෝ වෙනත් ආකාරයේ ප්‍රතිලාභ ලැබීමට, ඉඩම (නේවාසික, කෘෂිකාර්මික, වාණිජ්‍ය), වාර්ෂික හෝ බහු වාර්ෂික බෝග වෘක්ෂලතා හෝ වෙනත් චංචල හෝ නිශ්චල දේපළ පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් තාවකාලිකව හෝ ස්ථිර වශයෙන් අහිමි වීමට ලක් වූ යම් පුද්ගලයෙකු වේ.

ආරක්ෂිත කුලී නිවැසියන් (Protected Tenants): ව්‍යාපාර හෝ නේවාසික නෛතික දේපළක් භුක්ති විදින සහ ඉඩම් හිමියන් විසින් ඔවුන් නෙරපා දැමීමෙන් හෝ ඔවුන්ගේ අභිමතය පරිදි ගෙවල් කුලී වැඩි කිරීමෙන් 1972 දරන ගෙවල් කුලී ආඥා පනත හා ඊට පසුව ඉදිරිපත් වූ සංශෝධනවල විධිවිධාන මගින් ආරක්ෂා කෙරෙන කුලී නිවැසියන් වේ.

ප්‍රතිස්ථානගත කිරීම (Relocation): ස්මාරක, පිළිම, අධ්‍යාපන ආයතන, ක්‍රීඩා පිටි, පුද්ගලික දේපළ පවතින ස්ථානයෙන් ඉවත් කිරීම සහ නිවාස, නිෂ්පාදන ඉඩම් හා පොදු යටිතල පහසුකම් ඇතුළත් වත්කම්, වෙනත් ස්ථානයක නැවත ඉදිකිරීමයි.

පුනරුත්ථාපනය (Rehabilitation): ආදායම්, ජීවනෝපාය, දිවිපැවැත්ම සහ සමාජ ක්‍රමය සමඟ පවතින ඒකාබද්ධතාව නැවත ස්ථාපිත කිරීම.

ප්‍රතිස්ථාපන පිරිවැය (Replacement Cost): අත්කර ගන්නා අවස්ථාවේදී වත්කමක් ප්‍රතිස්ථාපනය කිරීම සඳහා වැයවන වත්මන් වියදම අදහස් වන අතර, ඊට සාධාරණ වෙළඳපල අගය, ගනුදෙනු වියදම්, එකතුවන පොළිය, සංක්‍රාම හා ප්‍රතිස්ථාපන වියදම් සහ වෙනත් අදාළ ගෙවීම් ඇතුළත් වේ. නමුත් වත්කම්වල හා ව්‍යුහයන්ගේ ක්ෂය වීම් පවතී නම් වියදම් ගණනය කිරීමේදී ඒවා අදාළ කර නොගත යුතුය. සක්‍රීය වෙළඳපල තත්ත්වයක් නොමැති

විටක ප්‍රතිස්ථාපන වියදම්වලට සියලුම ගොඩනැගිලි භාරදීමේ වියදම්, ඉදිකිරීම් සඳහා ශ්‍රම වියදම් සහ ගනුදෙනු හෝ ප්‍රතිස්ථාපන පිරිවැයක් වැය වී ඇත්නම් එයද ඇතුළත් වේ.

නැවත පදිංචි කිරීමේ සැලැස්ම (Resettlement Plan): ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම නිසා සිදුවිය හැකි බලපෑම් අවම කිරීම, අහිමි වීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග, අහිමි වීම් සඳහා වන්දි ගෙවීම සහ ආයෝජන ව්‍යාපෘතියක් මගින් බලපෑමට ලක්වන පුද්ගලයන් හට සහ ප්‍රජාවන් හට සංවර්ධන ප්‍රතිලාභ ලබාදීමට ව්‍යාපෘති යෝජක හෝ වෙනත් වගකිව යුතු ආයතන විසින් ගනු ලබන ක්‍රියාකාරකම් ඇතුළත් ලියවිල්ලකි.

නැවත පදිංචි කිරීමේ සහාය (Resettlement Assistance): ව්‍යාපෘතියක් හේතුවෙන් භෞතික වශයෙන් අවතැන් වන පුද්ගලයන් හට ලබාදෙන සහායයි. බලපෑමට පත් වූ පුද්ගලයන් වෙනත් ස්ථානයක පදිංචි කරන අතරතුර ඔවුනට අවශ්‍ය නැවත පදිංචි කිරීමේ සහාය ලබාදීමට, ගමනාගමන පහසුකම්, ආහාර, නිවාස සහ සමාජ සේවා සැපයීම මෙයට ඇතුළත් වේ. නැවත පදිංචි හා බැඳුනු ඔවුන්ගේ අපහසුතාවය සඳහා බලපෑමට ලක් වූ අයට හානි පූර්ණය සිදු කරන අතර නව ස්ථානයට පදිංචිය වෙනස් කිරීමේදී පැන නගින ගමනාගමන වියදම් හා අහිමි වන වැඩ දින වැනි වියදම් ද ආවරණය වන පරිදි ගෙවන මුදල්මය දීමනාවන්ද මෙම සහනයට ඇතුළත් වේ.

පදිංචි ඉඩම් සහ ව්‍යුහ හිමිකරුවන් (Resident Land and Structure Owners): ව්‍යාපෘතියෙන් බලපෑමට ලක්වන අවස්ථාව වන විට පුද්ගලයන් නේවාසික, වාණිජ්‍ය, සංස්කෘතික හෝ ආගමික අරමුණක් වෙනුවෙන් භාවිතා කරමින් සිටි නිරවුල් හිමිකමක් හිමි ඔප්පු සහිත ඉඩම් සහ ඉදිකිරීම්වල හිමිකරුවන් වේ.

සමාජ ආර්ථික සමීක්ෂණය (Socio-economic Survey): ව්‍යාපෘතියෙන් බලපෑමට ලක්වන පුද්ගලයන් හෝ ජනගහනය සඳහා සිදු කරන පරිපූර්ණ සහ නිවැරදි සමීක්ෂණයකි. සමීක්ෂණ වලදී ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් සහ වෙනත් සමාජ ආර්ථික දර්ශක පිළිබඳ සමීක්ෂණයේ දී අවධානය යොමු කෙරේ. සාමාන්‍යයෙන්, සමීක්ෂණය සිදු කරනු ලබන්නේ නැවත පදිංචි කිරීම සැලසුම් කරන ආරම්භක අදියරේදීය.

පාර්ශවකරුවන් (Stakeholders): ව්‍යාපෘතියකට බලපෑම් කිරීමේ හැකියාව පවතින, ව්‍යාපෘතිය සම්බන්ධයෙන් උනන්දුව දක්වන සහ ව්‍යාපෘතියකින් බලපෑමට ලක්වීමේ හෝ ඉන් ප්‍රතිලාභ ලැබීමේ අවකාශය සහිත සහ සියලු පුද්ගලයන්, කණ්ඩායම් සංවිධාන සහ ආයතන වේ.

අනවසර පදිංචිකරුවන් (Squatter): සංවර්ධනය කිරීම සඳහා අවසරය සහ නීති ප්‍රකාරව හිමිකමක් නොමැති රජයේ හෝ පුද්ගලික ඉඩමක පදිංචිව සිටින, එහි ඉදිකිරීම් කර ඇති සහ එවන් ඉඩම් සංවර්ධනය කිරීමේ අවසරය සහ නීති යටතේ විධිමත් හිමිකමක් ලබා නොගෙන එකී ඉඩම නේවාසික, කෘෂිකාර්මික හෝ වාණිජ්‍ය කටයුත්තක් සඳහා යොදා ගන්නා පුද්ගලයෙකි.

කුලී නිවැසියන් සහ බදු ගැනුම්කරු (Tenants and Lessees): නීතිය යටතේ අනුමැතිය ලබා දී ඇති පරිදි නියමයන් සහ කොන්දේසි යටතේ ලිඛිත ලේඛනයකින් ලියාපදිංචි එකඟත්වයට පත් වූ නිශ්චිත කාල සීමාවක් සඳහා කිසියම් ඉඩමක් හෝ දේපළක් හෝ එම ද්විත්වයම කුලියට හෝ බද්දට ලබාගෙන ඇති පදිංචිකරුවන් වේ.

අවදානම් කණ්ඩායම් (Vulnerable Groups): ස්ත්‍රී පුරුෂ සමාජභාවය, ජාතිය, වයස, ශාරීරික හෝ මානසික දුබලතාව, ආර්ථික අවාසිය/ හානිය හෝ සමාජ තත්ත්වය යන ආකාරයන්ගෙන් නැවත පදිංචි කිරීම හේතුවෙන්

වෙනත් අයට වඩා වඩාත් අහිතකර බලපෑම්වලට ලක්වන, නැවත පදිංචි කිරීමේ සහාය සහ ව්‍යාපෘතිය ආශ්‍රයෙන් ලැබෙන සංවර්ධන ප්‍රතිලාභ සඳහා හිමිකම් ඉදිරිපත් කිරීම හෝ ඒවායේ ප්‍රතිලාභ ලැබීමට පවතින හැකියාව සීමිතව පවතින පුද්ගලයන්, මුදල් ඉපැයීමේ හැකියාව පවතින පිරිමි සාමාජිකයන් නොමැති කාන්තාවන් විසින් නඩත්තු කරන පවුල්, ශාරීරිකව හෝ මානසිකව අභියෝගයට ලක් වූ පවුල්, තම පවුල නඩත්තු කිරීම පිණිස මුදල් ඉපැයීමට අසමත් ඉතා මහළු සහ බෙලහීන පුද්ගලයන් සහ දරිද්‍රතා මට්ටමට පහළ මට්ටමේ ජීවිත ගත කරන පුද්ගලයන් වශයෙන් රජය විසින් හඳුනාගෙන ඇති ඉතා දිළිඳු පුද්ගලයන් මෙම කාණ්ඩයට අයත් වේ.

වගු ලැයිස්තුව

වගුව 1.1: කැළණිවැලි දුම්රිය වැඩිදියුණු කිරීමේ වැඩසටහන අදියර – I හි නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීමේ කොටස

වගුව 2.1: ස්වකැමැත්තෙන් තොරව නැවත පදිංචි කිරීමේ බලපෑම් සාරාංශය

වගුව 2.2: ඉඩම් මත ඇති කරන සමස්ථ බලපෑම

වගුව 2.3: බලපෑමට ලක් වූ ඉඩම් ප්‍රමාණය අනුව

වගුව 2.4: බලපෑමට ලක් වූ ඉඩම්, පරිහරණ රටාව අනුව

වගුව 2.5: බලපෑම්වල ප්‍රමාණය (විශාලත්වය)

වගුව 2.6: බලපෑමට ලක් වූ කුටුම්බ හා ව්‍යාපාර ඉදිකිරීම්වල විස්තර

වගුව 2.7: රජයේ හා පොදු සංස්කෘතිකමය වටිනාකමක් සහිත ඉදිකිරීම් මත ඇති කරන බලපෑම

වගුව 2.8: රජයේ සහ පොදු සංස්කෘතික සම්පත්වල ඉදිකිරීම් මත ඇති කරන බලපෑම

වගුව 2.9: ඉදිකිරීම් සිදු කිරීම සඳහා භාවිතා කරනු ලබන අමුද්‍රව්‍ය

වගුව 2.10: එක් එක් අමුද්‍රව්‍ය වර්ගය යොදා ගෙන ඇති ගෙබිම වර්ග ප්‍රමාණය

වගුව 2.11: ඉදිකිරීම් වර්ග හා ගෙබිම වර්ග එල

වගුව 2.12: බලපෑමට ලක් වූ ඉදිකිරීම් සඳහා පවතින පහසුකම්

වගුව 2.13: බලපෑමට ලක් වූ ගස්

වගුව 3.1: ජනගහන ව්‍යාප්තිය - වනාතමුල්ල ග්‍රාම නිලධාරී කොට්ඨාශය

වගුව 3.2: පවුල්වල විශාලත්වයේ ව්‍යාප්තිය

වගුව 3.3: දෙමාපියන් සමඟ වාසය කරන සංකීර්ණ (විස්තෘත) පවුල් ඒකක සංඛ්‍යාව

වගුව 3.4: ව්‍යාපෘතියෙන් බලපෑමට ලක්වන පුද්ගලයන්ගේ සාමාන්‍ය මාසික ආදායමේ ව්‍යාප්තිය

වගුව 3.5: ව්‍යාපෘතියෙන් බලපෑමට ලක්වන ගෘහමූලිකයන්ගේ ජන වර්ගය, ස්ත්‍රී පුරුෂ භාවය අනුව වෙන් වෙන්ව

වගුව 3.6: ව්‍යාපෘතියෙන් බලපෑමට ලක් වූ ගෘහ මූලිකයන්ගේ වයස් කාණ්ඩ, ස්ත්‍රී පුරුෂ භාවය අනුව වෙන් වෙන්ව

වගුව 3.7: ව්‍යාපෘතියෙන් බලපෑමට ලක් වූ පුද්ගලයන්ගේ විවාහක අවිවාහක භාවය, ස්ත්‍රී පුරුෂ භාවය අනුව වෙන් වෙන්ව

වගුව 3.8: ව්‍යාපෘතියෙන් බලපෑමට ලක් වූ ගෘහ මූලිකයන්ගේ අධ්‍යාපන මට්ටම, ස්ත්‍රී පුරුෂ භාවය අනුව වෙන් වෙන්ව

වගුව 3.9: ව්‍යාපෘතියෙන් බලපෑමට ලක් වූ ගෘහ මූලිකයන්ගේ ආදායම් උත්පාදන රටාව

වගුව 3.10: ව්‍යාපෘතියෙන් බලපෑමට ලක් වූ පවුල්වල ගෘහ මූලිකයන් අයත්වන වයස් කාණ්ඩ ස්ත්‍රී පුරුෂ භාවය අනුව

වගුව 3.11: ව්‍යාපෘතියෙන් බලපෑමට ලක් වූ කුටුම්බවල සාමාජිකයන්ගේ විවාහක අවිවාහක භාවය අනුව සිදු කරන විශ්ලේෂණය

වගුව 3.12: ව්‍යාපෘතියෙන් බලපෑමට ලක් වූ කුටුම්බවල සාමාජිකයන්ගේ අධ්‍යාපන පසුබිම, ස්ත්‍රී පුරුෂ භාවය අනුව

වගුව 3.13: ව්‍යාපෘතියෙන් බලපෑමට ලක්වන කුටුම්බ සාමාජිකයන්ගේ වෘත්තීය රටාවන්

වගුව 3.14: ව්‍යාපෘතියෙන් බලපෑමට ලක් වූ කුටුම්බවල අවදානම් සහිත තත්ත්වයන්

වගුව 3.15: ව්‍යාපෘතියෙන් බලපෑමට ලක් වූ කුටුම්බවල අවදානම් සහිත තත්ත්වයන්

වගුව 4.1: ප්‍රශ්න සහ පිළිතුරුවල සාරාංශය

වගුව 4.2: ප්‍රශ්න සහ පිළිතුරුවල සාරාංශය

වගුව 4.3: ප්‍රශ්න සහ පිළිතුරුවල සාරාංශය

වගුව 4.4: ප්‍රශ්න සහ පිළිතුරුවල සාරාංශය

වගුව 4.5: ප්‍රශ්න සහ පිළිතුරුවල සාරාංශය

වගුව 4.6: ප්‍රශ්න සහ පිළිතුරුවල සාරාංශය

වගුව 4.7: සාකච්ඡා කරන ලද ප්‍රශ්න සහ පිළිතුරුවල සාරාංශය

වගුව 4.8: සාකච්ඡා කරන ලද ප්‍රශ්න සහ පිළිතුරුවල සාරාංශය

වගුව 4.9: ප්‍රධාන තොරතුරු සපයන සම්මුඛ සාකච්ඡාවල සාරාංශය

වගුව 4.10: ප්‍රශ්න සහ පිළිතුරුවල සාරාංශ්‍ය

වගුව 6.1: ඉඩම් අත්කර ගැනීමේ පටිපාටිය

වගුව 6.2: ණය ගැනුම්කරුවන් සහ ආසියානු සංවර්ධන බැංකුවේ සමාජ ආරක්ෂණ ප්‍රතිපත්ති ප්‍රකාශය අතර සංසන්දනය

වගුව 7.1: හිමිකම්, සහාය සහ ප්‍රතිලාභ සඳහා සුදුසුකම් ලැබීම

වගුව 7.2: ගෙබිම වර්ග ප්‍රමාණය සහ පවුලේ සාමාජිකයන් සංඛ්‍යාව අනුව ලකුණු ලැබෙන ආකාරය

වගුව 7.3: ගෙබිම වර්ග ප්‍රමාණය/ නිවසේ ප්‍රමාණය නිශ්චය කරන ලකුණු පදනම

වගුව 7.4: හිමිකම් ගෙවීමේ ක්‍රමවේදය

වගුව 8.1: බලපෑමට ලක් වූ කුටුම්බ සහ ව්‍යාපාර ඉදිකිරීම්වල විස්තර

වගුව 8.2: ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක් වූ කුටුම්බවල වන්දි සඳහා වූ මනාපයන් (බහු ප්‍රතිචාර)

වගුව 8.3: නිවාස යෝජනා ක්‍රමවල විස්තර

වගුව 9.1: කැළණිවැලි දුම්රිය මාර්ගයේ පළමු අදියරෙහි 2 වන කොටසෙහි වෙසෙන ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක් වූ කුටුම්බවල පුද්ගලයන්ගේ ආදායම් මාර්ග

වගුව 9.2: බලපෑමට ලක් වූ කුටුම්බ සංඛ්‍යාව සහ එක් එක් ආදායම් ඉපැයීමේ මූලාශ්‍ර අනුව බලපෑමට ලක් වූ ශ්‍රමිකයන්

වගුව 9.3: බලපෑමට ලක් වන කුටුම්බවල ප්‍රධාන ආදායම් මාර්ග
වගුව 9.4: ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක් වූ කුටුම්බවල රැකියා විරහිත සාමාජිකයන්
වගුව 9.5: ව්‍යාපෘතිය ආශ්‍රිත ප්‍රදේශවල වෙසෙන ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක් වූ කුටුම්බවල මාසික ආදායම් මට්ටම්
වගුව 9.6: ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක් වූ කුටුම්බවල අවදානම් තත්ත්වය
වගුව 9.7: ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක්වන පුද්ගලයන්ගේ අවදානම් සහගත තත්ත්වය
වගුව 10.1: කොළඹ මහනගර සහා බල ප්‍රදේශයේ ඉඩම්වල ප්‍රතිස්ථාපන වටිනාකමෙහි තක්සේරු කිරීම සඳහා ඒකක වටිනාකම (පර්චසයකට රුපියල්)
වගුව 10.2: ඉදිකිරීම්වල ප්‍රතිස්ථාපනය පිරිවැය ඇස්තමේන්තුව කිරීමේදී ඒකක ගාස්තු
වගුව 10.3: නැවත පදිංචි කිරීමේ අයවැය
වගුව 11.1: යෝජිත ක්‍රියාත්මක කිරීමේ උපලේඛනය

සටහන් ලැයිස්තුව

සටහන 1: KV Rail Phase – 1 හි නැවත පදිංචි කිරිම සඳහා යෝජිත කොටස් දැක්වෙන සිතියම
සටහන 2: කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය සඳහා යෝජිත දුක්ගැනවිලි සඳහා සහන සැලසීමේ යාන්ත්‍රණය
සටහන 3: වර්තමාන පදිංචි ස්ථානයේ සහ ප්‍රතිස්ථානගත කිරීම සඳහා යෝජිත ප්‍රදේශයේ සාපේක්ෂ පිහිටීම

සාරාංශය

ව්‍යාපෘතිය:

ගමනාගමනය, යම් රටක ජීවනාලිය වශයෙන් අවධාරණය කළ හැකිය. දිනකට 300,000කටත් වැඩි වාහන සංඛ්‍යාවක් කොළඹ නගරයට ඇතුළුවන බැවින් කොළඹ අගනගර කලාපය අධික වාහන තදබදයන්ට ලක්වෙයි. මාර්ග තදබදයට විකල්පයක් වශයෙන් බොහෝ රටවල නාගරික කලාපයන් හි මගී ගමනාගමනය සඳහා දුම්රිය සේවා භාවිතා කරනු ලබන නමුත් දැනට ශ්‍රී ලංකාවේ කොළඹ අගනගර කලාපයේ සමස්ථ මගී ගමනාගමනය සහ භාණ්ඩ ප්‍රවාහනයේදී දුම්රිය සේවයේ භාවිතය 13%කි. එබැවින්, කොළඹ අගනගර කලාපය තුළට වැඩි මගීන් සංඛ්‍යාවක් ප්‍රවාහනය කරන කැළණිවැලි මාර්ගය, ප්‍රධාන මාර්ගය, මුහුදුබඩ මාර්ගය සහ පුත්තලම මාර්ගය යන මාර්ග හතරෙන් සමන්විත දුම්රිය මාර්ග ජාලය සංවර්ධනය කර නවීකරණය කිරීම මගින් සමස්ථ මගී ප්‍රවාහනය සහ භාණ්ඩ ප්‍රවාහනය සඳහා දුම්රිය සේවාවේ දායකත්වය වැඩි කිරීමට ශ්‍රී ලංකා රජය අපේක්ෂා කරයි.

කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය 2016 වසරේ දී ආරම්භ කරන ලදී. මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වනුයේ නවීන තාක්ෂණයට අනුගත යන්ත්‍රෝපකරණ සහිත දුම්රිය යටිතල පද්ධතිය නවීකරණය කිරීමත්, මනා පරිචයන් තුළිනුත් උසස් ගුණාත්මක බවකින් යුතු ප්‍රවාහන සේවා සැපයීමයි. වැඩිදියුණු කරන ලද safety intelligence හා සංඥා පද්ධතිය, ගමන් කාලය අඩුකිරීම, බස් රථ ගමනාගමනයේ සිට දුම්රිය ගමනාගමනය වෙත සහ පුද්ගලික වෑන් රථ/ කාර් සිට දුම්රිය ගමනාගමනය වෙත (modal shift) මාරුවීමෙන් ආදායම වැඩි වීම, ටිකට්පත් ගාස්තුව වැඩිවීම සහ ආදායම් හානිවිම අඩුවීම මඟින් මෙම අරමුණ සාක්ශාත් කර ගැනීමට අපේක්ෂිතය. කොළඹ තදාසන්න ප්‍රදේශයේ දුම්රිය මාර්ග ජාලය, සේවාවන් හා පහසුකම් වැඩිදියුණු කිරීම පිණිස මෙම ව්‍යාපෘතිය සැලසුම්කොට ඇත. ඉදිරි වසර 20ක කාලයක් සඳහා අපේක්ෂිත දුම්රිය සේවාවන් සඳහා පවතින ඉල්ලුම සපුරාලීමට ප්‍රමාණවත් විභවතාවක් ව්‍යාපෘතිය සතු වේ. ජනගහනය මිලියන 5.8ක් (මුළු ජනගහනයෙන් 28%ක්) වාසය කරන කොළඹ අගනගර කලාපයේ දුම්රිය මාර්ග ජාලයේ එක් ප්‍රධාන මාර්ගයක් වන දැනට පවතින මාර්ගය සංවර්ධනය හා නවීකරණය කිරීම කැළණිවැලි දුම්රිය මාර්ග වැඩිදියුණු කිරීමේ වැඩසටහනින් අපේක්ෂා කරයි. මෙය කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය යටතේ ප්‍රමුඛතාගත කළ ව්‍යාපෘතියකි.

ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍යාධාර ලැබීම සඳහා සලකා බලනු පිණිස කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය යටතේ කැළණිවැලි දුම්රිය මාර්ග වැඩිදියුණු කිරීමේ වැඩසටහන සකස් කිරීමේ කාර්ය, ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය (MoTCA) සහ ශ්‍රී ලංකා දුම්රිය සේවය විසින් සිදු කරනු ලබයි.

කැළණිවැලි දුම්රිය මාර්ගය කි.මී. 60ක දිගකින් යුතු තනි ධාවන පථයකින් සමන්විත මාර්ගයක් වන අතර එය මරදාන සිට අවිස්සාවේල්ල දක්වා දිවෙයි. දෛනිකව එම මාර්ගය භාවිතා කරන දුම්රිය මගීන් ගණන 14,600ක් පමණ වේ. එමනිසා දැනට පවතින හා අනාගතයේදී ඇති විය හැකි ඉල්ලුම සපුරාලනු පිණිස, දැනට පවතින දුම්රිය මාර්ගය පාදුක්ක දක්වා විදුලි දුම්රිය ධාවන කිරීමට හැකිවන පරිදි ද්විත්ව දුම්රිය මාර්ගයක් බවට පත් කිරීමටත් අවිස්සාවේල්ල දක්වා දැනට පවතින තනි දුම්රිය මාර්ග කොටස පුනරුත්ථාපනය කිරීමටත් අපේක්ෂිතය. දැනට

පවතින කැළණිවැලි දුම්රිය මාර්ගය, කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය යටතේ කැළණිවැලි දුම්රිය මාර්ග වැඩිදියුණු කිරීමේ වැඩසටහන - අදියර 1 වශයෙන් වැඩිදියුණු කිරීම පිණිස මූල්‍යනය කිරීම සඳහා ප්‍රමුඛතාව දැක්වීමට ශ්‍රී ලංකා රජයත් ආසියානු සංවර්ධන බැංකුවත් තීරණය කොට ඇත. මේ අනුව කැළණිවැලි දුම්රිය මාර්ග වැඩිදියුණු කිරීමේ වැඩසටහන - අදියර 1 දී ලොකෝ හන්දියේ (0+900m) සිට කොට්ටාව දුම්රිය ස්ථානය (0+19,700m) දක්වා කොටස ගුවන්ගත (elevated) ද්විත්ව දුම්රිය මාර්ගයක් වශයෙන් ඉදිකිරීමටත්, කොට්ටාව සිට පාදුක්ක දක්වා වන (at grade) ශ්‍රේඩ් ද්විත්ව මාර්ගය ඇතුළු මරදාන සිට පාදුක්ක දක්වා විදුලි දුම්රිය ක්‍රියාත්මක වන මාර්ගයක් බවට පත් කිරීමටත්, සංඥා සහ විදුලි සංදේශන පද්ධතියක් ස්ථාපනය කිරීමටත්, අතිරේක ගොඩනැගිලි හා පහසුකම් වැඩිදියුණු කිරීමටත්, නවීකරණය කරන ලද දුම්රිය මාර්ග වැනි නව යටිතල පහසුකම් ඇති කිරීමටත් නියමිතය. බහුවිධ මූල්‍යකරණ පහසුකම ක්‍රමානුකූල කරනු පිණිස, කැළණිවැලි දුම්රිය මාර්ග වැඩිදියුණු කිරීමේ වැඩසටහන - අදියර 1 සඳහා නැවත පදිංචි කිරීමේ වැඩරාමුව සකස් කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුවේ තාක්ෂණික සහාය යටතේ උපදේශකවරයෙකු කැඳවා/ පත්කර ඇත. කෙසේවුවද, ආසියානු සංවර්ධන බැංකුව විසින් මූල්‍යනය සිදු කෙරේ නම් ඔවුන් විසින් අපේක්ෂා කරන ප්‍රධාන අවශ්‍යතාවයක් වනුයේ ව්‍යාපෘතියෙන් බලපෑමට ලක්වන ප්‍රදේශයට යටත්වන, දුම්රිය මාර්ගයට අදාළ ඒ දෙපස පිහිටි බිම් තීරයෙන් (ROW) අවම වශයෙන් 50%ක ප්‍රදේශයක ඉඩම්, ඉදිකිරීම් කාර්යය වෙනුවෙන් නිදහස් කරගෙන පැවතිය යුතු බවය. ඒ අනුව, KV Rail - Phase 1 හි විවිධ කොටස් වෙනුවෙන් ආසියානු සංවර්ධන බැංකුවේ තාක්ෂණික සහායක යටතේ සේවයේ යොදවා සිටින උපදේශකයන් විසින් සකස් කරන ලද නැවත පදිංචි කිරීමේ වැඩරාමුව මත පදනම්ව වෙන් වෙන් වශයෙන් නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරකම් සැලැස්ම සකස් කොට ඉහත අවශ්‍යතාවය සපුරාලීමට ව්‍යාපෘති කළමනාකරණ ඒකකය තීරණය කර ඇත. නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරකම් සැලැස්ම ක්‍රියාත්මක කිරීම, ව්‍යාපෘතියෙන් බලපෑමට ලක් වූ පුද්ගලයන් (PAP) ප්‍රතිස්ථානගත කිරීම සඳහා නිවාස ඒකක ලබා ගැනීමට ගතවන කාලය මත පදනම් වනු ඇත. නාගරික සංවර්ධන අධිකාරියට අයත් නිවාස යෝජනා ක්‍රමයකින් 2019 වසරේ මුල් භාගයේ දී ලබාගත් පළමු නිවාස ඒකක 262 ක, දෙවන කොටසේ (ලොකෝ හන්දියේ සිට සීවලී මාවත දක්වා කොටසේ) සිදු කිරීමට නියමිත සංවර්ධන කාර්යයන් හේතුවෙන් බලපෑමට ලක්වන පුද්ගලයන් නැවත පදිංචි කිරීම පිළිබඳව අවධානය යොමුකර මෙම නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරකම් සැලැස්ම සකස්කර ඇත. කැළණිවැලි දුම්රිය මාර්ග වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය 2020 වසරේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කොට ඇත.

නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරකම් සැලැස්මෙහි අරමුණු

නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරකම් සැලැස්ම, KV දුම්රිය මාර්ගයේ, දුම්රිය මාර්ගයට අයත් දෙපස බිම් තීරය (ROW) තුළ මීටර් 12ක් සහ බේස්ලයින් දුම්රිය ස්ථාන භූමිය තුළ ලොකෝ හන්දියේ සිට සීවලී පටුමග (0+900m - 0+2200m) දක්වා කොටසට අදාළ වේ. ඉඩම් අත්කර ගැනීමේ පනත හා එහි සංශෝධන හා ඊට අදාළ රෙගුලාසීන්, සිය කැමැත්තෙන් තොරව අවතැන්වූවන් නැවත පදිංචි කිරීමේ ජාතික ප්‍රතිපත්තිය (NIRP), ජාතික පරිසර පනත (NEA) සහ ආසියානු සංවර්ධන බැංකුවේ ස්වකැමැත්තෙන් තොරව නැවත පදිංචි කිරීම් හා සම්බන්ධ, 2009 සමාජ ආරක්ෂණ ප්‍රතිපත්ති (SPS) වලට අනුකූලව නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරකම් සැලැස්ම හා සමාජ ආරක්ෂණ ලියවිලි සම්පාදනය කොට ඇත. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හේතුවෙන් ඇති විය හැකි අහිතකර බලපෑම් හඳුනා ගැනීම සහ අහිතකර බලපෑම් අවම කිරීම සහ ව්‍යාපෘතියෙන් බලපෑමට ලක් වූ පුද්ගලයන් හට ලබාදෙන වන්දි හා

හිමිකම් ඔවුන්ගේ ජීවන තත්ත්වය මැනවින් පවත්වා ගැනීමට ප්‍රමාණවත් දැයි සහතික කිරීම නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරකම් සැලැස්මක ප්‍රමුඛ අරමුණ වනු ඇත.

නැවත පදිංචි කිරීමේ මූලධර්ම පහත සඳහන් කරුණු මත පදනම් වේ.

- බලපෑමට ලක් වූ සියලුම පුද්ගලයන් හට ගෙවිය යුතු වන්දි මුදල්, වෙනත් ප්‍රතිලාභ සහ දීමනා, ප්‍රතිස්ථානගත කිරීමට පෙරාතුව ගෙවා නිම කළ යුතුය.
- ඉදිකිරීම් කාර්යයන් ආරම්භ කිරීම සහ ඉදිරියට පවත්වාගෙන යාමට බාධා/ අවහිර නොවනු පිණිස කුටුම්බ සහ ව්‍යාපාර ප්‍රතිස්ථානගත කිරීම විධිමත් කාර්ය සටහනකට අනුව සිදුවන පරිදි සම්බන්ධීකරණය කිරීම.

ඉඩම් අත්කර ගැනීම හා සම්බන්ධයෙන් පැන නගින අහිතකර බලපෑම් අවම කිරීම, හානිවීම් සඳහා වන්දි ගෙවීම සහ බලපෑමට ලක් වූ පුද්ගලයන් සහ ප්‍රජාවන් වෙත සංවර්ධනයේ ප්‍රතිලාභ ලබාදීම පිණිස ගත යුතු ක්‍රියාමාර්ග, නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරකම් සැලැස්මෙහි සවිස්තරව සඳහන් කරයි. ඉහත අරමුණ සාක්ෂාත් කරගනු පිණිස එක්සත් ජාතීන්ගේ මානව ජනාවාස වැඩසටහන (UN Habitat) විසින් 2017 මැයි මස 7 වන දින සිට 2017 අගෝස්තු 14 වන දින දක්වා කාලසීමාව තුළ කැළණිවැලි දුම්රිය මාර්ගයේ ලොකෝ හන්දියේ සිට හෝමාගම දක්වා දැනට පවතින දුම්රිය මාර්ගයේ මධ්‍ය ලක්ෂයෙහි සිට දෙපසට මීටර් 10ක බිම් තීරයකට ඇතුළත් වන කලාපය සම්බන්ධයෙන් සමාජ ආර්ථික සමීක්ෂණයක් හා සංගණන සමීක්ෂණයක් සිදු කරන ලදී. තවද, 2018 දෙසැම්බර් 15 දින සිට 2019 ජනවාරි 08 දින දක්වා කාල සීමාව තුළ කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතියේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් සමාලෝචන සමීක්ෂණයක් සිදු කරනු ලැබූ අතර එහිදී, ඉදිකිරීම් සීමාව තුළ සහ KV Rail - Phase 1 හි දෙවන කොටසෙහි යෝජිත බේස්ලයින් දුම්රිය පොළ සඳහා අවශ්‍ය ප්‍රදේශය යටතට ගැනෙන කලාපය පිළිබඳ අවශ්‍ය ගැලපීම් සිදුකොට ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය යැයි අවසන් වශයෙන් නිශ්චය කරන ලද ප්‍රදේශය පිළිබඳව සමාලෝචනය සිදු කරන ලදී. මෙම නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරකම් සැලැස්ම සකස් කිරීම නැවත පදිංචි කිරීමේ වැඩරාමුවට අනුකූලව සිදු කරන ලද අතර එහිදී, සමාජ ආර්ථික සමීක්ෂණයේදී හා සංගණන සමීක්ෂණයේදී ලබාගත් දත්ත, ව්‍යාපෘතියෙන් බලපෑමට ලක් වූ ප්‍රජාවන් සහ වෙනත් අදාළ පාර්ශවකරුවන් සමඟ සිදු කරන ලද සාකච්ඡා/ උපදේශන වලදී ලබාගත් තොරතුරු සහ ඉඩම් මැනුම් සටහන් සහ ඉංජිනේරු සැලසුම් සලකා බලන ලදී.

පාර්ශවකරුවන් සමඟ සාකච්ඡා, ඔවුන්ගේ සහභාගීත්වය සහ අනාවරණ

ව්‍යාපෘතිය හේතුවෙන් වත්කම් වෙත ඇති කරන බලපෑම් අවම කිරීමත්, ඔවුන්ගේ ජීවනෝපායන්ට හා සමාජීය පදනම්වලට ඇති කරන බාධාකාරී ක්‍රියාවන් ඇති වීම වැළැක්වීමත් හැකි උපරිම මට්ටමින් සිදු කිරීමට අවශ්‍ය සියලු පියවර ගනු ලැබිණි. පාර්ශවකරුවන් සමඟ සාකච්ඡා 2017 පූර්ව ශක්‍යතා අදියරේ දී ආරම්භ කරන ලද අතර 2018 වසර පුරාවට ද පවත්වන ලදී. ඊට එක්සත් ජාතීන්ගේ මානව ජනාවාස වැඩසටහන (UN Habitat) සහ ව්‍යාපෘති කළමනාකරණ අංශය යන අංශ දෙකෙහිම දායකත්වය ලැබිණි. ව්‍යාපෘතියෙන් බලපෑමට ලක් වූ පුද්ගලයන් වෙනුවෙන් පවත්වන දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම සහ ව්‍යාපෘතිය මගින් කුටුම්බ මත ඇති කරන බලපෑම් අනාවරණය කිරීම පිණිස ප්‍රදේශය හා ප්‍රාදේශීය මට්ටම් වලින් පැවැත්වෙන විධිමත් හා අවිධිමත් රැස්වීම් හා සාකච්ඡා පැවැත්වීම මගින් බලපෑමට ලක් වූවන්ගේ අදහස් හා යෝජනා ලබා ගනිමින් සවිස්තරාත්මක සැලසුම්

අදියරේදී සහ නැවත පදිංචි කිරීම සැලසුම් කිරීමේ කාලයේදී මෙම ක්‍රියාවලිය වඩාත් වේගවත් කරන ලද අතර ව්‍යාපෘති සැලසුම්, බලපෑම් අවම කිරීමේ ප්‍රතිපත්ති සහ පියවර පිළිබඳ මූලික තොරතුරු මහජනතාව වෙත අනාවරණය කරන ලදී. තොරතුරු බෙදා හැරීමේ මූලික මෙවලම වශයෙන් ව්‍යාපෘති තොරතුරු ඇතුළත් කොට භාෂා ත්‍රිත්වයෙන්ම සකස් කරන ලද කුඩා පත්‍රිකාවක් භාවිතා කරන ලදී. භාෂා ත්‍රිත්වයෙන්ම සකසන ලද නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්මෙහි පිටපත් ව්‍යාපෘතියෙන් බලපෑමට ලක්වූවන් සහ මහජනතාව වෙත ලබා දෙන ලද අතර ඔවුන් වෙත ලැබෙනු ඇති හිමිකම් පිළිබඳ සාරාංශයක් බලපෑමට ලක් වූ එක් එක් පුද්ගලයන් වෙත අනාවරණය කරනු ඇත.

ව්‍යාපෘතිය විසින් සිදු කරන ලද උපදේශන/ සාකච්ඡා වලින් ලත් ප්‍රතිඵලය මගින් ව්‍යාපෘතියෙන් බලපෑමට ලක්වූවන් විසින් යෝජිත ව්‍යාපෘතිය සඳහා වන කැමැත්ත පිළිබඳ සහතිකයක් සහ ඔවුන් පෙර පදිංචිව සිටි නිවාසවලට ආසන්නයෙන් පිහිටි නිවාස යෝජනා ක්‍රමයකින් රජය ලබාදෙන නිවාසයක පදිංචි වීමට දක්වන කැමැත්තක් ප්‍රකාශ වෙයි. ව්‍යාපෘතිය ඔවුන්ගේ ජීවන තත්ත්වය වර්ධනය කර ගැනීම උදෙසා මහඟු අවස්ථාවක් වනු ඇතැයි බොහෝ දෙනෙකු අපේක්ෂා කරයි.

නැවත පදිංචි කිරීමේ බලපෑම්

මෙම කොටසට අයත් වන ශ්‍රී ලංකා දුම්රිය සේවය සතු ඉඩම්වල වාසය කරන පුද්ගලයන්ගෙන් ඉඩම් අත්කර ගැනීම සහ ආපසු ලබා ගැනීම හේතුවෙන් එම පුද්ගලයන් භෞතික හා ආර්ථික අවතැන්වීම සිදුවිය හැකි අතර එහි ප්‍රතිඵල ලෙස ස්වකැමැත්තෙන් තොරව නැවත පදිංචි කිරීම සහ ඉඩම් හිමියන් හා පරිහරණය කරන්නන් මත බලපෑම් ඇතිවීම සිදුවිය හැකිය. කැළණිවැලි දුම්රිය මාර්ගයේ පළමු අදියර හි 2 වන කොටස යටතේ, දුම්රිය මාර්ගය සඳහා අළුතින් වෙන් කරන ලද බිම් තීරය (new ROW) වෙනුවෙන් ලොකෝ හන්දියේ සිට සීවලී පටුමග දක්වා ඇතැම් ස්ථානවල පුද්ගලික ඉඩම් අත්කර ගැනීමට සිදු වේ.

කැළණිවැලි දුම්රිය මාර්ගයේ පළමු අදියර 1 හි 2 වන කොටස සඳහා අවශ්‍ය කෙරෙන මුළු ඉඩම් ප්‍රමාණය පර්චස් 1070ක් වන අතර ඊට දුම්රිය දෙපාර්තමේන්තුව සතු පර්චස් 952ක්, කොළඹ මහනගර සභාව සතු පර්චස් 22ක්, නාගරික සංවර්ධන අධිකාරිය සතු පර්චස් 10ක් සහ පර්චස් 86ක පුද්ගලික ඉඩම් අයත්වන අතර දුම්රිය දෙපාර්තමේන්තුව සතු ඉඩම් බොහොමයක් අනවසරකරුවන් විසින් භුක්ති විඳිනු ලබයි. ඉහත කී පුද්ගලික ඉඩම් අතුරින් පර්චස් 30ක ප්‍රමාණයක් ඉඩමට නෛතික හිමිකමක් සහිත පුද්ගලයන් සතුවන අතර ඉතිරි පර්චස් 56, ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ ඔප්පු ලාභීන් සතු වේ. සමීක්ෂණ හා සංගණන වලට අනුව ඉදිකිරීම් 271ක් බලපෑමට ලක්වන අතර ඉන් 239ක් නිවාස ඒකක වන අතර 15ක් ව්‍යාපාර ඉදිකිරීම් වේ. ව්‍යාපෘති හේතුවෙන් බලපෑමට ලක්ව කඩා දැමීමට සිදුවන ඉදිකිරීම් අතුරින් ඉදිකිරීම් 41ක්, ඉඩමට නෛතික හිමිකමක් සහිත ඉදිකිරීම් වන අතර නෛතික හිමිකමක් නොමැති ඉදිකිරීම් 230ක් බලපෑමට ලක් වේ. ඊට අමතරව, පොදු දේපළ සම්පත් 8ක් බලපෑමට ලක්වන අතර කුටුම්බ 6කට අයත් ඉදිකිරීම් සහ/ හෝ ඉඩම්වල කොටස් අහිමි වෙයි. වැටුප් ලබන රැකියා අහිමිවීමෙන් බලපෑමට ලක්වන පුද්ගලයන් ගණන 37කි. බලපෑමට ලක්වන කුටුම්බ අතරට අවදානම් කාණ්ඩයට අයත් පුද්ගලයන් 39 දෙනෙකු අයත්වන අතර ඉන් 9 දෙනෙකු දරිද්‍රතා මට්ටමට වඩා අඩු ආදායම් ලබන්නන් වේ. දස දෙනෙකු (10) කාන්තා මූලික කුටුම්බ වන අතර දහතුන් දෙනෙකු (13) ආබාධිත පුද්ගලයන් වේ.

ප්‍රතිස්ථානගත කිරීම සහ ජීවනෝපාය ප්‍රතිස්ථාපනය

සංවර්ධන කාර්යයන් සඳහා ඉඩම් අත්කර ගැනීම හා ස්වකැමැත්තෙන් තොරව නැවත පදිංචි කිරීම හේතුවෙන් අවතැන්වන පුද්ගලයන්ගේ ජීවනෝපාය නැවත ස්ථාපිත කිරීම, ඔවුන්ගේ ජීවන තත්ත්වය වර්ධනය කිරීම සහ ඔවුන් පෙර සිටි තත්ත්වයට වඩා වැඩි දරිද්‍රතා මට්ටමකට පත්වීම වැළැක්වීම සඳහා පියවර ගැනීමට අවශ්‍ය විධිවිධාන, ස්වකැමැත්තෙන් තොරව අවතැන්වූවන් නැවත පදිංචි කිරීමේ ජාතික ප්‍රතිපත්තිය හා ආසියානු සංවර්ධන බැංකුවේ 2009 සමාජ ආරක්ෂණ ප්‍රකාශනය මගින් සැපයේ. ව්‍යාපෘතියෙන් බලපෑමට ලක්වූවන් ප්‍රතිස්ථානගත කිරීම/ නැවත පදිංචි කිරීම සඳහා ප්‍රමාණවත් විධිවිධාන නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරකම් සැලැස්ම මගින් ලබා දෙයි. ව්‍යාපෘතියෙන් බලපෑමට ලක්වූවන් ප්‍රතිස්ථානගත කිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ නාගරික පුනර්ජනනී ව්‍යාපෘතිය (URP) යටතේ ඉදිකළ මධ්‍යම ප්‍රමාණයේ මහල් නිවාස යෝජනා ක්‍රමයෙන් උපරිම පහසුකම් වලින් සමන්විත නිවාස මිලදී ගැනීමට ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය (MoTCA) තීරණය කර ඇත. කෙටිකාලීන ක්‍රියාකාරකම් සහ දිගුකාලීන මැදිහත්වීම් වලින් සමන්විත ප්‍රවේශයන් අනුගමනය කිරීම මගින් ඔවුන්ගේ ජීවන තත්ත්වය, ව්‍යාපෘතියෙන් බලපෑමට ලක්වීමට පෙර පැවති තත්ත්වයට පත් කිරීම සඳහා පෙර පැවති රැකියාවෙහි තවදුරටත් නියැලීමටත්, නැතහොත් විකල්ප ජීවනෝපාය ආරම්භ කිරීමටත්, අවශ්‍ය උපාය මාර්ග ගැනීම මගින් ව්‍යාපෘතියෙන් බලපෑමට ලක්වූවන් බලගැන්වීමටත් ව්‍යාපෘතිය කටයුතු කරනු ඇත.

හිමිකම් ගෙවීමේ ක්‍රමවේදය

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හේතුවෙන් ඉඩමට නෛතික හිමිකමක් සහිත පුද්ගලයන්, බදුකරුවන්, කුලී නිවැසියන් මෙන්ම අනවසරකරුවන්, බලහත්කාරයෙන් පදිංචිව සිටින්නන් වැනි නෛතික හිමිකමක් නොමැති පුද්ගලයන්ද, ශ්‍රමිකයන්, දෛනික වැටුප් ලබන්නන් සහ අවදානම් තත්ත්වයේ සිටින පුද්ගලයන් වැනි විවිධ කණ්ඩායම් වලට අයත් පුද්ගලයන් සැලකිය යුතු මට්ටමකට භෞතික හා ආර්ථික අවතැන්වීමකට ලක්විය හැකිය. එසේ බලපෑමට ලක්වන පුද්ගලයන්ට වන හානිය පූර්ණය කිරීම සහ පූර්ව ව්‍යාපෘති අවධියේ දී ඔවුනට පැවති ආර්ථික තත්ත්වයට සමාන හෝ ඊට වැඩි ජීවන තත්ත්වයක් ලබාදීමට කටයුතු කිරීම පිණිස හිමිකම් ගෙවීමේ ක්‍රමවේදය සකස් කර ඇත. KV Rail Phase 01 යටතේ සකස් කරන ලද නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරකම් සැලැස්මට සහ 1950 ඉඩම් අත්කර ගැනීමේ පනත හා 2008 රෙගුලාසි මගින් පෙන්නුම් කෙරෙන ශ්‍රී ලංකාවේ නෛතික හා නියාමන රාමුවෙහි විධිවිධාන වලට අනුකූලව හිමිකම් ගෙවීමේ ක්‍රමවේදය සකස් කර ඇත. හිමිකම් ගෙවීමේ ක්‍රමවේදයෙහි විශේෂයෙන් සඳහන් කොට ඇති අතිරේක දීමනාවන් ගෙවීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය අවශ්‍ය කෙරේ. ප්‍රකාශයට පත් කරනු ලැබූ 'අවසාන දිනයට පසුව' අදාළ ප්‍රදේශයේ අනවසරයෙන් පදිංචි වූ හෝ පදිංචි වූ කවර හෝ පුද්ගලයෙකු වන්දි ලැබීම සඳහා හෝ වෙනත් කවර හෝ නැවත පදිංචි කිරීමේ සහායක් ලබා ගැනීම සඳහා හිමිකම් නොලබයි.

දුක්ගැනවිලි සඳහා සහන සැලසීමේ යාන්ත්‍රණය

ඉඩම් අත්කර ගැනීම හා නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලිය සහ ඉදිකිරීම් අදියරේදී ඇතිවන ගැටළු හේතුවෙන් සමාජීය, ආර්ථික, සංස්කෘතික සහ පාරිසරික ගැටළු ඇතිවිය හැකිය. මෙම සංකීර්ණ ගැටළු, ව්‍යාපෘතියෙන් බලපෑමට ලක් වූ පුද්ගලයන්ගේ ජීවනෝපාය වෙනස් කිරීමට හේතුවිය හැකිය. ව්‍යාපෘතියෙන් බලපෑමට ලක් වූ පුද්ගලයන්ගේ එවන් ගැටළු හා දුෂ්කරතා හඳුනාගෙන ඒවාට පිළියම් යෙදීම පිණිස, විධිමත්ව ස්ථාපිත, නිසි කලට වේලාවට පියවර ගනු ලබන දුක්ගැනවිලි සඳහා සහන සැලසීමේ යාන්ත්‍රණයක් තුළින් ව්‍යාපෘතියෙන් බලපෑමට ලක්වූවන් හට සහන සැලසීම පිණිස කඩිනම් පියවර ගතයුතු වේ. ව්‍යාපෘතියෙන් බලපෑමට ලක් වූවන් හට අවම අපහසුතාවයක්වත් ඇති නොවන පරිදි කටයුතු කිරීම සහතික කරමින් ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක්ව දුක්ගැනවිලි පවතින කවර හෝ පුද්ගලයෙකුට සහන සැලසීම පිණිස ව්‍යාපෘතිය සඳහාම සුවිශේෂී වූ දුක්ගැනවිලි සඳහා සහන සැලසීමේ යාන්ත්‍රණයක් යෝජනා වී ඇත. මෙම යෝජිත යාන්ත්‍රණය, ක්ෂේත්‍ර මට්ටම, ප්‍රාදේශීය මට්ටම හා ජාතික මට්ටම ලෙස ස්ථර තුනකින් යුත් කමිටු වලින් සමන්විත වේ.

අයවැය

කැළණිවැලි දුම්රිය මාර්ගයේ පළමු අදියර හි 2 වන අදියර සඳහා සකස් කළ නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරකම් සැලැස්මෙහි සඳහන් වන හිමිකම් ගෙවීමේ ක්‍රමවේදයෙහි දැක්වෙන පරාමිතීන් මත පදනම්ව නැවත පදිංචි කිරීමේ අයවැය සකස් කොට ඇත. නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරකම් සැලැස්මේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය ශ්‍රී ලංකා රුපියල් 1,942,630,800/=ක් පමණ වන අතර ඒ සඳහා ශ්‍රී ලංකා රජය මුදල් ප්‍රතිපාදන සපයයි. විකල්ප නිවාස (නාගරික සංවර්ධන අධිකාරියෙන් මිලදී ගනු ලැබූ) වෙනුවෙන් වියදම ඇතුළත් නොවන අතර ව්‍යවස්ථාපිත ගෙවීම්, ප්‍රතිස්ථාපන පිරිවැය, ප්‍රජා සංවර්ධන පිරිවැය, ජීවනෝපාය ප්‍රතිස්ථාපනය හා වර්ධනය, පුහුණු කිරීම් සඳහා පිරිවැය, පරිපාලන පිරිවැය සහ හදිසි අවස්ථා සඳහා පිරිවැය ඇතුළත් වේ.

සාමාන්‍යයෙන්, ස්වකීය නිවාසය අහිමිවන කුටුම්බ වෙනුවෙන් හිමිකම් අයිතිවාසිකම් සහිත විකල්ප නවාතැන් හෝ ව්‍යාපෘතියෙන් බලපෑමට ලක්වූවන් හට ප්‍රතිස්ථාපන පිරිවැය මත සෘජුවම වන්දි ගෙවනු ඇත. වන්දි ගෙවීම සඳහා, දේපළවල වටිනාකම තක්සේරු කිරීමේදී තක්සේරු දෙපාර්තමේන්තුවේ දායකත්වය ලබාගනු ඇත. ව්‍යාපෘතියෙන් බලපෑමට ලක්වූවන් සම්බන්ධයෙන් සිදු කරන සමීක්ෂණ හා ඉඩම්වලට පවතින වෙළඳපල පිළිබඳව සිදු කරන සමීක්ෂණ හා ගොඩනැගිලි කුලිය පිළිබඳ සමීක්ෂණ වලින් ලබා ගන්නා දත්ත අයවැය ගණනය කිරීම සඳහා උපකාරී වේ. ඉදිකිරීම් ආරම්භ කිරීමට පෙර ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරකම් අවසන් සැලැස්ම නාගරික සංවර්ධන අධිකාරිය සහ අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ඇත. වන්දි ගෙවීම හා නැවත පදිංචි කිරීමේ සහාය ලබාදීම නිම කරන තෙක් ඉදිකිරීම් ආරම්භ නොකරනු ඇත.

සුපරීක්ෂණය

ස්වකැමැත්තෙන් තොරව නැවත පදිංචි කිරීම සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා සුපරීක්ෂණයෙහි විවිධ සංරචක සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යාංශ සහ ආයතන රාශියක් සම්බන්ධව කටයුතු කරයි. සමස්ථයක් ලෙස නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරකම් සැලැස්ම අනුමත කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ වගකීම ගනු ලබන්නේ ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය (MoTCA) විසින් වන අතර ක්‍රියාත්මක මට්ටමේදී, නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරකම් සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ ආයතනික වගකීම දරනුයේ කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතියෙහි ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසිනි. අභ්‍යන්තර හා බාහිර සපරීක්ෂණ කාර්යය සමස්ථ ව්‍යාපෘති කළමනාකරණ ඒකකයෙහිම අත්‍යවශ්‍යය අංගයකි. ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ නියෝජිතයන්, උපදේශකවරුන් සහ කොන්ත්‍රාත්කරුගෙන් සමන්විත කණ්ඩායමක් විසින් අභ්‍යන්තර සුපරීක්ෂණය සිදු කරනු ඇත. නැවත පදිංචි කිරීමේ වැඩසටහන සුපරීක්ෂණය කරන බාහිර නියෝජිත ආයතනයක් මගින් බාහිර සුපරීක්ෂණය අධීක්ෂණය සහ සුපරීක්ෂණය සිදු කරනු ඇත. මෙම අරමුණ වෙනුවෙන් සුදුසු නියෝජිත ආයතනයක් තෝරා ගැනීම, ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් සිදු කරනු ඇත. නැවත පදිංචි කිරීමේ වැඩසටහන ආරම්භ කළ පසුව බාහිර සුපරීක්ෂණ කාර්යය ආරම්භ වනු ඇත. නැවත පදිංචි කිරීමේ කටයුතු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය, කිසියම් අනුකූලතා ගැටළු පවතී නම් ඒවා සහ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය හා ආසියානු සංවර්ධන බැංකුව සඳහා කිසියම් නිවැරදි කිරීමේ කටයුතු විස්තර කෙරෙන මාසික සුපරීක්ෂණ වාර්තා හා කාර්තුමය වාර්තා සකස් කිරීම හා ඉදිරිපත් කිරීම ඔහු/ ඇය විසින් සිදු කරනු ඇත. නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරකම් සැලැස්ම ක්‍රියාත්මක කිරීමේදී හමුවන අඩුලුහුඩුකම් ද ඔවුන් විසින් හඳුනාගනු ලබනු ඇති අතර එම ගැටළු අඩු කිරීම, වැළැක්වීම හෝ අවම කිරීම පිණිස ව්‍යාපෘතියෙන් බලපෑමට ලක් වූ පුද්ගලයින් සමඟ සාකච්ඡා කොට නිසි විසඳුම් සොයනු ඇති අතර ඒ සඳහා සුදුසු නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග පිළිබඳව ව්‍යාපෘති කළමනාකරණ ඒකකය වෙත නිර්දේශ ඉදිරිපත් කරනු ඇත.

1 වන පරිච්ඡේදය - ව්‍යාපෘති විස්තරය

1.1 ව්‍යාපෘතියේ පසුබිම

ජනගහනය මිලියන 5.8ක් (28%ක්) වාසය කරන බස්නාහිර පළාතේ සහ කොළඹ අගනගර කලාපයේ දුම්රිය මාර්ග පද්ධතිය වැඩිදියුණු කිරීමට ශ්‍රී ලංකා රජය අපේක්ෂා කරයි. කොළඹ අගනගර කලාපයෙහි වාර්ෂික ජනගහන වර්ධන වේගය 1.05% කි. රජයේ කාර්යාල හා ව්‍යාපාර/ ව්‍යාපාර ආයතන බහුතරයක් කොළඹ අගනගර කලාපය තුළ කොළඹ නගරයේ පිහිටා ඇත. දෛනිකව කොළඹ නගරයට පිවිසෙන වාහන සංඛ්‍යාව 300,000 ඉක්මවයි. ඒ අනුව කොළඹ අගනගර කලාපයට දැරිය නොහැකි තරම් වූ රථ වාහන තදබදයකට මුහුණ පෑමට සිදුවෙයි. දැනට කොළඹ අගනගර කලාපය තුළ මගී ප්‍රවාහනයෙන් දුම්රිය මාර්ග පද්ධතිය මගින් ආවරණය කරනුයේ 13%ක් පමණ වන අතර ඒ දුර ගමන් දුම්රිය සහ රථවාහන තදබදය අඩු කිරීම පිණිස ධාවනය වන මගී දුම්රිය මගිනි. රජයේ අරමුණු කරනුයේ කොළඹ අගනගර කලාපය තුළ අධික මගී ඝණත්වයක් පවතින දුම්රිය මාර්ග හතරක් එනම්; කැළණි වැලි මාර්ගය, ප්‍රධාන මාර්ගය, මුහුදුබඩ මාර්ගය සහ පුත්තලම මාර්ගය, සංවර්ධනය කිරීම හා නවීකරණය කිරීම මගින් සමස්ථ මගී ප්‍රවාහනයේදී දුම්රිය සේවාව ලබා ගැනීමත්, එමගින් සැලකිය යුතු මට්ටමකින් රථ වාහන තදබදය අඩු කිරීමත් වේ.

කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය යටතේ ඉහත සඳහන් දුම්රිය මාර්ග හතර සංවර්ධනය කිරීමේ කාර්යය සඳහා ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍යාධාර ලබා ගැනීම සලකා බලනු පිණිස ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය (MoTCA) හා ශ්‍රී ලංකා දුම්රිය සේවය (SLR) අවශ්‍ය ව්‍යාපෘති සකස් කරයි. දුම්රිය සේවාව සඳහා පවතින ඉල්ලුම සපුරාලීම සඳහා වන ධාරිතාව මෙම ව්‍යාපෘතිය සතුව පවතින අතර ඉදිරි විසි වසරක (20) කාලය පුරාවට සේවා සැපයීමට ද හැකිවනු ඇත.

මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වනුයේ නවීන තාක්ෂණයට අනුගත යන්ත්‍රෝපකරණ සහිත දුම්රිය යටිතල පද්ධතිය නවීකරණය කිරීමත්, මනා පරිචයන් තුළිනුත් උසස් ගුණාත්මක බවකින් යුතු ප්‍රවාහන සේවා සැපයීමයි. වැඩිදියුණු කරන ලද සංඥා පද්ධතිය, ගමන් කාලය අඩුකිරීම, බස් රථ ගමනාගමනයේ සිට දුම්රිය ගමනාගමනය වෙත සහ පුද්ගලික වෑන් රථ/ කාර් සිට දුම්රිය ගමනාගමනය වෙත (modal shift) මාරුවීමෙන් ආදායම වැඩි වීම, ටිකට්පත් ගාස්තුව වැඩිවීම සහ ආදායම් හානිවීම අඩුවීම මඟින් මෙම අරමුණ සාක්ශාත් කර ගැනීමට අපේක්ෂිතය. ව්‍යාපෘතිය මගින් සමාන්තර දුම්රිය මාර්ග අළුතින් ඉදිකරන අතර දුම්රිය මාර්ග විද්‍යුත් දුම්රිය බවට පත්කිරීම පිළිබඳව අවධානය යොමු කරමින්, දැනට පවතින මාර්ගය පුනරුත්තාපනය කිරීමද සිදු කරනු ඇත. වායු දූෂණය හා ශබ්ද දූෂණය අවම වීමෙන් වාතයේ ගුණාත්මකභාවය වඩාත් හොඳ තත්ත්වයට පත්වීම වැනි පාරිසරික ප්‍රතිලාභ වර්ධනය කිරීමටද මෙය ඉවහල් වනු ඇත.

කැළණිවැලි දුම්රිය මාර්ගය දිගින් කි.මී. 60ක් වන තනි දුම්රිය මාර්ගයක් වන අතර එය මරදාන සිට අවිස්සාවේල්ල තෙක් දිවෙයි. දෛනිකව මෙම මාර්ගයේ ගමන් ගන්නා දුම්රිය මගීන් ගණන14,600ක් පමණ වේ. සාමාන්‍යයෙන් පටු gauge ලෙස පැවති මෙම මාර්ගය, එම පැවති මාර්ගය ඔස්සේම පුළුල් gauge බවට 1992 වසරේදී පත් කරන ලදී. හොරණ දෙස සිට පැමිණෙන වැඩි මගීන් පිරිසක් එක්වන පාදුක්ක (මරදාන සිට කි.මී. 35ක දුරින් පිහිටි), කැළණිවැලි මාර්ගයේ පිහිටා ඇත. එබැවින්, වර්තමාන හා අනාගතයේ ඇති විය හැකි ඉල්ලුම සලකා බලමින් දැනට පවතින තනි දුම්රිය පහසුකම් වැඩි කරමින් ද්විත්ව දුම්රිය මාර්ගයක් බවට පත් කිරීමටත්, පාදුක්ක සිට අවිස්සාවේල්ල දක්වා දැනට පවතින මාර්ගය පුනරුත්ථාපනය කිරීමටත් අපේක්ෂිතය. 2020 වසරේදී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කොට ඇති කැළණිවැලි දුම්රිය වැඩිදියුණු කිරීමේ වැඩසටහනට මූල්‍යයනය කිරීමට ආසියානු සංවර්ධන බැංකුව මූලික වශයෙන් කැමැත්ත පළකොට ඇත.

කෙසේවුවද, ඉදිකිරීම් සඳහා මූල්‍යයනය කිරීමේදී ආසියානු සංවර්ධන බැංකුවේ ප්‍රධාන අවශ්‍යතාවයක් වනුයේ සමස්ථ දුම්රිය මාර්ගය පුරාම ව්‍යාපෘතියෙන් බලපෑමට ලක්වන ඉඩම්වලින් අවම වශයෙන් 50% වත් ඉඩම් අත්කර ගෙන නිදහස් කිරීම සහ ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය (MoTCA) හා ශ්‍රී ලංකා දුම්රිය සේවය (SLR) වෙත භුක්තිය භාර ගැනීමයි. එබැවින්, ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍යයනය කිරීමේ ඉහත සඳහන් කරන ලද අවශ්‍යතාවය සපුරාලනු වස්, එක්සත් ජාතීන්ගේ මානව ජනාවාස වැඩසටහන සම්බන්ධ කොට ගෙන ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය (MoTCA) හා ශ්‍රී ලංකා දුම්රිය සේවය (SLR) සමාජ ආර්ථික හා සංගණන සමීක්ෂණයන් සිදු කරන ලද අතර මාර්ගයේ මධ්‍ය රේඛාවේ සිට දෙපසට මීටර් 10 බැගින් වන බිම් තීරයක් බෙදා වෙන් කරමින් දුම්රිය මාර්ගය දෙපස ඊට අයත් දැනට පවතින භූමි ප්‍රදේශය සඳහා නැවත පදිංචි කිරීමේ සැලැස්මක් (RP) සකස් කරන ලදී. මේ අතර ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක් වූ, තිඹිරිගස්යාය හා කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවලට අයත් පුද්ගලයන් නැවත පදිංචි කිරීම සඳහා ඒ අවට ප්‍රදේශයෙන් නිවාස ඒකක 1244ක් මිලදී ගැනීමට ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය (MoTCA) හා ශ්‍රී ලංකා දුම්රිය සේවය (SLR) අවශ්‍ය කටයුතු සිදුකර ඇත.

1.2 කැළණිවැලි දුම්රිය මාර්ගය වැඩිදියුණු කිරීමේ වැඩසටහන - අදියර 1 (KV Rail - Phase 1)

දැනට පවතින කැළණිවැලි දුම්රිය මාර්ගය, කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය යටතේ කැළණිවැලි දුම්රිය මාර්ග වැඩිදියුණු කිරීමේ වැඩසටහන - අදියර 1 (KV Rail - Phase 1) වශයෙන් වැඩිදියුණු කිරීම පිණිස මූල්‍යනය කිරීම සඳහා ප්‍රමුඛතාව දැක්වීමට ශ්‍රී ලංකා රජයත් ආසියානු සංවර්ධන බැංකුවත් තීරණය කොට ඇත. මේ අනුව කැළණිවැලි දුම්රිය මාර්ග වැඩිදියුණු කිරීමේ වැඩසටහන - අදියර 1 (KV Rail - Phase 1) දී ලොකෝ හන්දියේ (0+900m) සිට කොට්ටාව දුම්රිය ස්ථානය (0+19,700m) දක්වා කොටස ගුවන්ගත (elevated) ද්විත්ව දුම්රිය මාර්ගයක් වශයෙන් ඉදිකිරීමටත්, කොට්ටාව සිට පාදුක්ක දක්වා වන (at grade) ග්‍රේඩ් ද්විත්ව මාර්ග කොටස ඇතුළු මරදාන සිට පාදුක්ක දක්වා විදුලි දුම්රිය ක්‍රියාත්මක වන මාර්ගයක් බවට පත් කිරීමටත්, සංඥා සහ විදුලි සංදේශන පද්ධතියක් ස්ථාපනය කිරීමටත්, අතිරේක ගොඩනැගිලි හා පහසුකම් වැඩිදියුණු කිරීමටත්, නවීකරණය කරන ලද දුම්රිය මාර්ග වැනි නව යටිතල පහසුකම් ඇති කිරීමටත් නියමිතය. බහුවිධ මූල්‍යකරණ පහසුකම ක්‍රමානුකූල කරනු

පිණිස, කැළණිවැලි දුම්රිය මාර්ග වැඩිදියුණු කිරීමේ වැඩසටහන - අදියර 1 සඳහා නැවත පදිංචි කිරීමේ වැඩරාමුව සකස් කිරිම සඳහා ආසියානු සංවර්ධන බැංකුවේ තාක්ෂණික සහාය යටතේ උපදේශකවරයෙකු කැඳවා ඇත. නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැසුම් කිහිපයක් සකස් කිරීම තුළින් නැවත පදිංචි කිරීමේ වැඩසටහන පහසුවෙන් ක්‍රියාත්මක කිරීමට මෙය හේතු වී ඇත. එබැවින්, සිතියමේ (චිත්‍රය 1) දැක්වෙන අංශයන්/ කොටස් සඳහා වෙන් වෙන් වශයෙන් නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම පහක් (05) සකස් කිරීමට ව්‍යාපෘති කළමනාකරණ ඒකකය තීරණය කරන ලදී. නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරකම් සැලැස්ම ක්‍රියාත්මක කිරීමට ගතවන කාලය නිවාස යෝජනා ක්‍රමයෙන් නිවාස ඒකක ලබා ගැනීමට ගතවන කාලය මත රඳා පවතී. මේ අනුව පළමු අදියර යටතේ නාගරික සංවර්ධන අධිකාරියේ නිවාස 262ක් 2019 මුල් භාගයේදී නැවත පදිංචි කිරීම් වෙනුවෙන් නිදහස් කෙරේ.

වගුව 1.1 **කැළණිවැලි දුම්රිය මාර්ගය වැඩිදියුණු කිරීමේ වැඩසටහන - අදියර 1** හි එක් එක් කොටස් වෙනුවෙන් නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරකම් සැලැස්ම පිළියෙල කිරීම

ඉදිකිරීම් පැකේජය	**නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරකම් සැලැස්මෙහි කොටස**	**දිග**	**ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය**	**බලපෑමට ලක් වූ ග්‍රාම නිලධාරී කොට්ඨාශය**
පැකේජය 1	i වන කොටස: මරදාන සිට ලොකෝ හන්දිය දක්වා	0+900m	කොළඹ	මාළිගාකන්ද, මාළිගාවත්ත බටහිර
	ii වන කොටස: ලොකෝ හන්දිය සිට සීවලීපුර පාර දක්වා	0+900m – 0+2200m	තිඹිරිගස්යාය	වනාතමුල්ල
	iii වන කොටස: සීවලීපුර පාර සිට නුගේගොඩ දුම්රිය ස්ථානය දක්වා (කට්ටිය හන්දිය)	0+2200m – 0+10,000m	තිඹිරිගස්යාය කෝට්ටේ	බොරැල්ල උතුර බොරැල්ල දකුණ නාරාහේන්පිට කිරුල කිරුලපන ගෝතමීපුර නුගේගොඩ නුගේගොඩ බටහිර පාගොඩ නැගෙනහිර
	iv වන කොටස: නුගේගොඩ දුම්රිය ස්ථානයේ (කට්ටිය හන්දිය) සිට ගලවිලවත්ත උතුර දක්වා	0+10,000m – 0+23,000m	කෝට්ටේ මහරගම	ගංගොඩවිල දකුණ ගංගොඩවිල නැගෙනහිර ගංගොඩවිල බටහිර නාවින්න පන්නිපිටිය උතුර

පැකේජය 2				කොට්ටාව නගරය මාලපල්ල නැගෙනහිර මාලපල්ල බටහිර මාකුඹුර උතුර මහරගම නගරය පතිරගොඩ දඹහේන කොට්ටාව දකුණ කොට්ටාව උතුර කොට්ටාව බටහිර
පැකේජය 3	v වන කොටස: ගලවිලවත්ත උතුර සිට පාදුක්ක දක්වා	0+23,000m - 0+34,980m	හෝමාගම පාදුක්ක	ගලවිල උතුර හෝමාගම දකුණ හෝමාගම බටහිර හෝමාගම නැගෙනහිර හෝමාගම නගරය පිටිපන නගරය ගොඩගම දකුණ කුරුළුවත්ත ගැහැණුවල වටරැක දකුණ ඕවිටිගම පනාගොඩ නැගෙනහිර පාදුක්ක



සටහන 1: KV Rail Phase – 1 හි නැවත පදිංචි කිරිම සඳහා යෝජිත කොටස් දැක්වෙන සිතියම

1.3 කැළණිවැලි දුම්රිය මාර්ගයේ පළමු අදියර හි දෙවන කොටස

කැළණිවැලි දුම්රිය මාර්ගයේ පළමු අදියර හි **දෙවන** කොටස වශයෙන් ලොකෝ හන්දියේ සිට සීවලී පටුමග (0+900m – 0+2200m) දක්වා කොටස තෝරාගෙන ඇත. එහිදී බලපෑමට ලක්වන කුටුම්බ 260කට ආසන්න සංඛ්‍යාවක් නාගරික සංවර්ධන අධිකාරියේ නිවාස යෝජනා ක්‍රම වෙත යාමට කැමැත්ත පළකර ඇත. නාගරික සංවර්ධන අධිකාරියේ නිවාස යෝජනා ක්‍රමයේ සිට එහි ප්‍රතිස්ථාපනගත වීමට කැමැත්ත දැක්වූ එක් එක් කුටුම්බ දැනට පදිංචිව සිටින ස්ථානයට පවතින දුර සලකා බලා II වන කොටසේ මායිම් නිශ්චය කරනු ඇත.

1.4 නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරකම් සැලැස්මෙහි (RAP) අරමුණු - කැළණිවැලි දුම්රිය මාර්ගයේ පළමු අදියර හි දෙවන කොටස

නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරකම් සැලැස්මෙහි අරමුණු වනුයේ ව්‍යාපෘතියේ දී අනුගමනය කරන ක්‍රියාමාර්ග නිශ්චිත වශයෙන් සඳහන් කිරීම සහ ඉඩම් අත්කර ගැනීම හා සම්බන්ධ අහිතකර බලපෑම අඩු කිරීම, අහිමි වීම් සඳහා වන්දි ගෙවීම සහ බලපෑමට ලක් වූ පුද්ගලයන් හා ප්‍රජාවන් වෙත සංවර්ධන ප්‍රතිලාභ ලබාදීමයි. නැවත පදිංචි කිරීම සංවර්ධන කාර්යයන් ලෙස සලකා සැලසුම් සකස් කිරීමට සහ බලපෑමට ලක් වූ පුද්ගලයන්ගේ ජීවන තත්ත්වය නැවත ගොඩනංවා ගැනීමටත් වර්ධනය කර ගැනීමටත් ඔවුන් ගන්නා උත්සාහයේදී ඔවුනට සහාය දීමත් අරමුණු කොට ඇත. බලපෑමට ලක්වූවන් වෙත ලබාදිය යුතු හිමිකම් කඩිනමින් හා සාධාරණ ලෙස ගෙවීම සහ

ඔවුන්ගේ ජීවනෝපාය වර්ධනය කිරීම සඳහා විකල්ප හා අවස්ථා සොයා ගැනීම සඳහා ඔවුනට සහාය දීම සම්බන්ධයෙන් වන රජයේ කැපවීම මෙමගින් පිළිබිඹු කෙරේ. ඉහත කී ක්‍රියාමාර්ග ගනු ලබන්නේ, ශ්‍රී ලංකා රජයේ නීති, රෙගුලාසි සහ ප්‍රතිපත්ති වලට හා ආසියානු සංවර්ධන බැංකුවේ 2009 සමාජ ආරක්ෂණ ප්‍රතිපත්ති ප්‍රකාශයේ නිර්ණායක වලට අනුව සකස් කරන ලද නැවත පදිංචි කිරීමේ වැඩරාමුව ප්‍රකාරව වේ.

1.5 නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරකම් සැලැස්ම සකස් කිරීම සඳහා අනුගමනය කරනු ලැබූ ක්‍රමෝපාය

ව්‍යාපෘතියෙන් බලපෑමට ලක්වන කුටුම්බ සහ දේපළ හඳුනා ගැනීම සහ බලපෑමට ලක් වූ කුටුම්බ හා දේපළ වල පිහිටීම සහ තත්ත්වය කුමක්ද යන බව සහතික කර ගැනීම පිණිස ලොකෝ හන්දියේ සිට හෝමාගම දක්වා දැනට පවතින දුම්රිය මාර්ගයේ මධ්‍ය රේඛාවේ සිට දෙපසට මීටර් 10ක බිම් තීරයට අයත් කොටස සඳහා 2017 මැයි මස 7 වන දින සිට 2017 අගෝස්තු මස 14 දින දක්වා එක්සත් ජාතීන්ගේ මානව ජනාවාස වැඩසටහන විසින් සමාජ ආර්ථික සමීක්ෂණයක් සහ සංගණන සමික්ෂණයක් සිදු කරන ලද අතර එහිදී දුම්රිය නැවතුම්පළ පිහිටා ඇති ප්‍රදේශවල, දත්ත රැස් කිරීම සිදු කරන ලද්දේ දුම්රිය දෙපාර්තමේන්තුව සතු ඉඩම්වල මායිම දක්වා පමණි. දත්ත රැස් කිරීමේදී ප්‍රමාණාත්මක හා ගුණාත්මක යන ක්‍රම දෙකම යොදා ගන්නා ලදී. මේ අනුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල පවතින ආකෘති (පැතිකඩ) සහ රජයේ සංගණන වාර්තා වලින් ද්විතියික දත්ත රැස් කරන ලදී.

ප්‍රමාණාත්මක දත්ත රැස් කිරීමේදී බලපෑමට ලක් වූ සියලුම පුද්ගලයන්ගේ තොරතුරු රැස්කිරීම සඳහා විශේෂයෙන් සකස් කරන ලද ප්‍රශ්නාවලියක් යොදා ගන්නා ලදී. එම ප්‍රශ්නාවලියේදී; බලපෑමට ලක් වූ කුටුම්බවල තොරතුරු, ව්‍යාපාර හා ජීවනෝපාය ක්‍රියාකාරකම්, බලපෑමට ලක් වූ ඉඩම් හා බෝග, ඉඩමට දේපළවල සහ ගොඩනැගිලිවලට පවතින අයිතිවාසිකමේ ස්වභාවය සහ ව්‍යාපෘතියෙන් බලපෑමට ලක් වූ පුද්ගලයන්ගේ සමාජ ආර්ථික පැතිකඩ පිළිබඳ අවධානය යොමු කරන ලදී. ගුණාත්මක දත්ත රැස් කිරීම; ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡා (FGDs), ප්‍රධාන තොරතුරු ලබා දෙන්නන් සමඟ පවත්වන සම්මුඛ සාකච්ඡා (KII), පාර්ශවකරුවන් සමඟ සිදු කරන සාකච්ඡා රැස්වීම් සහ ක්ෂේත්‍ර නිරීක්ෂණ තුළින් සිදු කරන ලදී.

ඉඩම් හා දේපළ වලට ඇතිවන බලපෑම් තහවුරු කිරීම, GIS දත්ත පද්ධති සකස් කිරීම සහ සිතියම් සකස් කිරීම සඳහා භූ විද්‍යාත්මක තොරතුරු පද්ධති තාක්ෂණය (Geological Information System) යොදා ගන්නා ලදී.

දත්ත රැස් කිරීම සඳහා උපාධිධාරීන් යොදවන ලදී. මේ සඳහා ප්‍රශ්නාවලීන් යොදා ගන්නා ආකාරය, ප්‍රශ්නාවලි ලබාදීම සඳහා පුද්ගලයන් තෝරා ගැනීම සහ අවශ්‍ය තොරතුරු රැස්කර ගැනීම පිළිබඳව ධනාත්මක හා ඵලදායී අත්දැකීමක් ලබාදෙනු පිණිස ආධුනිකයන් හට පුහුණු වැඩමුළුවක් පවත්වන ලද අතර එහිදී අවශ්‍ය තොරතුරු ලබාදෙන ලදී.

කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතියෙහි ව්‍යාපෘති කළමනාකරණ ඒකකය මගින් 2018 දෙසැම්බර් මස 15 වන දින සිට 2019 ජනවාරි මස 3 වන දින දක්වා කාලසීමාවේදී සමාලෝචන සමීක්ෂණයක් සිදු කරන ලදී. ඒ අනුව, අවශ්‍ය

වෙනස්කම් සිදුකොට අවසන් වශයෙන් තීරණය කළ ප්‍රදේශය තුළ ඉදිකිරීම් සීමාව සහ යෝජිත කැළණිවැලි දුම්රිය මාර්ගයේ පළමු අදියර හි, දෙවන කොටසෙහි බේස්ලයින් (Baseline) දුම්රිය ස්ථාන පිළිබඳ සමාලෝචනය කරන ලද අතර ඒ අනුව එක්සත් ජාතීන්ගේ මානව ජනාවාස වැඩසටහන විසින් සකස් කරන ලද දත්ත සමුදාය යාවත්කාලින කරන ලදී. ආදායම් ප්‍රතිස්ථාපනය පිළිබඳ තොරතුරු රැස්කර ගැනීම සඳහා වෙනමම අධ්‍යයනයක් ප්‍රශ්නාවලි හරහා සිදු කරන ලදී. දත්ත ඇතුළත් කිරීම සහ දත්ත සැකසීම සඳහා MS Access හා MSQL යන මෘදුකාංග භාවිතා කරන ලදී.

2 වන පරිච්ඡේදය - ඉඩම් අත්කර ගැනීමේ හා නැවත පදිංචි කිරීමේ විෂය පථය

2.1 හැඳින්වීම

කැළණිවැලි දුම්රිය මාර්ගයේ පළමු අදියර හි ව්‍යාපෘතියේ සංවර්ධන කාර්යයන් යටතට ගැනෙන ඉඩම් බොහොමයක් ශ්‍රී ලංකා දුම්රිය සේවය සතුවන බැවින් ඒ වෙනුවෙන් සිදුකළ යුතු ඉඩම් අත්කර ගැනීම් බෙහෙවින්ම සීමිත වනු ඇත. කෙසේවුවද, වර්තමානයේ දුම්රිය මාර්ගය අසල පදිංචිව සිටින ජනතාව බොහෝ පෙදෙස්වල දුම්රිය මාර්ගය සඳහා මීටර් 6ක් පළල බිම් තීරයක් පමණක් ඉතිරිකර පදිංචිව සිටින බැවින් එම ඉතිරි බිම් තීරය යෝජිත සංවර්ධන කාර්යය සඳහා කිසිසේත් ප්‍රමාණවත් නොවේ. එබැවින් දුම්රිය මාර්ගය දෙපස ඊට අයත් බිම් තීරය (ROW) මෙම සංවර්ධන කාර්යය සඳහා අවම වශයෙන් මීටර් 12ක් දක්වා වත් පුළුල් කළ යුතු අතර එවිට එම කොටසට පුද්ගලික ඉඩම්ද අයත් වේ. මීට අමතරව, මෙම සංවර්ධන කාර්යයේ දී දුම්රිය පොළ සංවර්ධනය කිරීම සිදු කරන බැවින් දැනට පවතින දුම්රිය ස්ථානවලට යාබද ඉඩම් අත්කර ගැනීමට සිදුවනු ඇත. ඉහත සඳහන් කළ ඉඩම්වලට අමතරව දුම්රිය මාර්ගය වෙනුවට අළුතින් වෙන් කරන ඉඩම් තීරයෙහි සිට මීටර් 4 ක පළලින් යුතු නව බිම් තීරයක්, කොන්ත්‍රාත් කාලසීමාවේදී තාවකාලික ප්‍රවේශ මාර්ග ලෙස භාවිතා කිරීම සඳහා අවශ්‍ය වේ.

කැළණිවැලි දුම්රිය මාර්ගයේ පළමු අදියර හි දෙවන කොටස යටතේ ලොකෝ හන්දියේ සිට සීවලී පටුමග දක්වා, දුම්රිය මාර්ගයට වෙන් කළ බිම් තීරයෙහි (ROW) ඇතැම් ස්ථානවල පුද්ගලික ඉඩම් කිහිපයක් අත්කර ගැනීමට අවශ්‍ය වනු ඇති අතර ඊට දුම්රිය මාර්ගය දෙපසින්ම පිහිටි නේවාසික ස්ථාන, ව්‍යාපාර ආයතන, වෙනත් ආයතන සහ පොදු දේපළ ද, අයත් වනු ඇත. මෙම කොටසේ සිදුවන ඉඩම් අත්කර ගැනීම හා භුක්තිය භාර ගැනීම හේතුවෙන් ඒවායේ හිමිකරුවන් හා පරිහරණකරුවන් භෞතික හා ආර්ථික අවතැන්වීමට සිදුවනු ඇති අතර එහි ප්‍රතිඵලයක් ලෙස සිදුවන ස්වකැමැත්තෙන් තොරව නැවත පදිංචි කිරිම ඉඩම් හිමිකරුවන් සහ පරිහරණකරුවන් මත බලපෑම් ඇති කරනු ඇත.

කැළණිවැලි දුම්රිය මාර්ගයේ පළමු අදියර හි දෙවන කොටස මගින් ඇති කරන ස්වකැමැත්තෙන් තොරව නැවත පදිංචි කිරීමේ බලපෑම්වල සාරාංශය වගුව 2.1 හි දක්වා ඇත. ඉඩම් අත්කර ගැනීම, නැවත පදිංචි කිරීම සහ වෙනත් බලපෑම් වලට ලක් වූ කාණ්ඩ, හිමිකම් ගෙවීමේ ක්‍රමවේදය යටතේ හඳුනාගෙන ඇති අතර වන්දි ගෙවීම සඳහා අවශ්‍ය වන වටිනාකම් තක්සේරු කොට ඇත. එයට අනුව කුටුම්බ 271ක් සැලකිය යුතු මට්ටමක බලපෑමට ලක් වේ. ඒ අනුව; ඉඩමට නෛතික හිමිකම සහිත කුටුම්බ 40ක් කඩහිමියන් 15ක් සහ නිවස හා ව්‍යාපාර ස්ථානය යන දෙකම බලපෑමට ලක්වන පුද්ගලයන් 15ක් බලපෑමට ලක්වනු ඇත. ඉඩමට නෛතික හිමිකම සහිත කුමුටුඹ 06ක නිවාසවල කොටස් බලපෑමට ලක්වන අතර ඔවුනට, බලපෑමට ලක්වන ඉඩම හා ඉදිකිරීම යන දෙකටම වන්දි හිමි වේ. බලපෑමට ලක් වූ පුද්ගලයන් විසින් රෝපණය කොට භුක්ති විඳින ශාක සඳහා හිමිකම් ගෙවීමේ ක්‍රමවේදයේ සඳහන් කොට ඇති මිල ගණන් අනුව වන්දි හිමි වේ. බලපෑමට ලක්වන නිවාසවල වාසය කරන කුලී නිවැසියන් 06 දෙනෙකු, විකල්ප නිවාස සොයා ගැනීම සඳහා වන්දි ලබනු ඇත.

වගුව 2.1 - ස්වකැමැත්තෙන් තොරව නැවත පදිංචි කිරීමේ බලපෑම් සාරාංශය

බලපෑම	ප්‍රමාණය/ ගණන 2 කොටස - ලොකෝ හන්දිය සිට සීවලී පටුමග දක්වා
පුද්ගලික ඉඩම් අත්කර ගැනීම (පර්චස්)	107
අවශ්‍ය රජයේ ඉඩම් (පර්චස්)	952
තාවකාලික ඉඩම් අත්කර ගැනීම (පර්චස්)	0
බලපෑමට ලක් වූ නෛතික හිමිකම් ඇති/ සහතිකලාභී	40
භෞතික අවතැන් වූ කුටුම්බ (වාසස්ථාන අහිමි වීම)	239
ආර්ථික වශයෙන් අවතැන් වූ කුටුම්බ (වෙළඳසැල අහිමි වීම)	15
ඉඩම් අහිමිවන, ආර්ථික වශයෙන් අවතැන් වන ඉඩමට හිමිකමක් සහිත පුද්ගලයන්[1]	01
භෞතික හා ආර්ථික වශයෙන් අවතැන් වන කුටුම්බ (වාසස්ථාන හා වෙළඳසැල අහිමි වීම)	15
සැලකිය යුතු තරම් නොවන බලපෑම්[2]	0
ඉඩම් තීරයක් අහිමිවන ඉඩමට හිමිකම ඇති පුද්ගලයන්	06
කුලී නිවැසියන්	06
බලපෑමට ලක් වූ මුළු පුද්ගලයන් සංඛ්‍යාව	271
ඉඩමට හිමිකමක් සහිත බලපෑමට ලක් වූ පුද්ගලයන් සංඛ්‍යාව	40
ඉඩමට හිමිකමක් රහිත බලපෑමට ලක් වූ පුද්ගලයන් සංඛ්‍යාව[3]	230
බලපෑමට ලක් වූ සේවා නියුක්තිකයන් සංඛ්‍යාව	37
බලපෑමට ලක් වූ ඉදිකිරීම් සංඛ්‍යාව	271
බලපෑමට ලක් වූ පුද්ගලික ශාක සංඛ්‍යාව	107
බලපෑමට ලක් වූ පොදු දේපළ සම්පත් සංඛ්‍යාව	08

2.2 ඉඩම් මත ඇති කරන බලපෑම

කැළණිවැලි දුම්රිය මාර්ගයේ පළමු අදියර හි දෙවන කොටස සඳහා අවශ්‍ය වන මුළු ඉඩම් ප්‍රමාණය ආසන්න වශයෙන් පර්චස් 1091 ක් පමණ වේ. එසේ අවශ්‍ය ඉඩම් වලින් පර්චස් 952කට ආසන්න සංඛ්‍යාවක් ශ්‍රී ලංකා දුම්රිය සේවය සතුවන අතර පර්චස් 10කට ආසන්න ගණනක් නාගරික සංවර්ධන අධිකාරිය සතු වේ. පර්චස් 107ක් පමණ පුද්ගලික ඉඩම් වේ. පුද්ගලික ඉඩම්වලින් පර්චස් 50ක් ඉඩමට නෛතික හිමිකමක් සහිත පුද්ගලයන් සතුවන අතර

[1] ඉඩම් හිමියන්ට ඔවුන්ගේ ඉඩම්වලින් 10% හෝ ඊට වඩා අහිමි වීම.

[2] ඉදිකිරීමකට ඇති කළ බලපෑම එහි මුළු වර්ග ප්‍රමාණයෙන් 10%කට වඩා අඩු නම් හෝ එහි මායිම් තාප්පයට පමණක් බලපෑමක් ඇති වුණි නම්, එවන් බලපෑමක් සැලකිය යුතු මට්ටමේ නොවන බලපෑමක් ලෙස වර්ග කරයි. ඒවායේ බලපෑමට ලක්වූවන්, භෞතික හෝ ආර්ථික වශයෙන් බලපෑමට ලක් නොවන බැවිනි.

[3] දුම්රිය මාර්ගයට වෙන්කළ බිම් තීරය (ROW) තුළ ඉදිකිරීම් පවතින කුටුම්භ

පර්චස් 57ක් ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සහතික පත්‍රලාභීන්ට අයත් වේ. කෙසේවුවද, රජය සතුව පවතින්නේ යැයි ඉහතින් සඳහන් කළ සංඛ්‍යාවලින් විශාල ප්‍රමාණයක් අනවසරයෙන් හා බලහත්කාරයෙන් භුක්ති විඳියි. ඒ අනුව දුම්රිය දෙපාර්තමේන්තුව සතු පර්චස් 340ක දුම්රිය මාර්ගය දෙපස පිහිටි දුම්රිය මාර්ග රක්ෂිතය එසේ භුක්ති විඳිනු ලබයි. මීට අමතරව, මෙම ඉඩමෙහි කොටසක ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් නිවාස යෝජනා ක්‍රමයක් ඉදිකොට ඇත. මේ අනුව, මෙම යෝජිත ව්‍යාපෘතිය මගින්, ඉඩම්වල භුක්තිය නැවත රජය වෙත ලබා ගැනීමත්, නාගරික සංවර්ධන අධිකාරියේ සහ ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ ඉඩම් අවසතු කිරීමත් මෙන්ම පුද්ගලික ඉඩම් අත්කර ගැනීමත් සිදුකළ යුතු වේ.

වගුව 2.2: ඉඩම් මත ඇති කරන සමස්ථ බලපෑම

යෝජිත දුම්රිය මාර්ගය සඳහා වෙන්කළ බිම් තීරය (ROW) සඳහා අවශ්‍ය භූමි ප්‍රමාණය (පර්චස්)	රජයේ ඉඩම්			පුද්ගලික ඉඩම්			
	යෝජිත දුම්රිය මාර්ගය සඳහා වෙන්කළ බිම් තීරය (ROW) තුළ පිහිටි, දුම්රිය දෙපාර්තමේන්තුව සතු ඉඩම් ප්‍රමාණය (පර්චස්)	යෝජිත දුම්රිය මාර්ගය සඳහා වෙන්කළ බිම් තීරය (ROW) තුළ පිහිටි, කොළඹ මහනගර සභාව සතු ඉඩම් ප්‍රමාණය (පර්චස්)	යෝජිත දුම්රිය මාර්ගය සඳහා වෙන්කළ බිම් තීරය (ROW) තුළ පිහිටි, නාගරික සංවර්ධන අධිකාරිය සතු ඉඩම් ප්‍රමාණය (පර්චස්)	යෝජිත දුම්රිය මාර්ගය සඳහා වෙන්කළ බිම් තීරය (ROW) තුළ පිහිටි, ඉඩමට හිමිකමක් සහිත පුද්ගලයන් සතු ඉඩම් ප්‍රමාණය (පර්චස්)	යෝජිත දුම්රිය මාර්ගය සඳහා වෙන්කළ බිම් තීරය (ROW) තුළ පිහිටි ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ කුටුම්බ කාඩ්පත් හිමියන් භුක්ති විඳින ඉඩම් ප්‍රමාණය (පර්චස්)	ඉඩමට හිමිකම සහිත පුද්ගලයන් සතුවන ඉඩම් කැබලි ගණන	ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සහතිකපත් ලාභීන් සතුවන ඉඩම් කැබලි ගණන
1091	952	22	10	50	57	12	28

සමීක්ෂණයට අනුව, ඉහත 2.2 වගුවෙන් පෙන්නුම් කරන ආකාරයට, අත්කර ගැනීමට යෝජිත මුළු ඉඩම් ප්‍රමාණය පර්චස් 107කි. පුද්ගලික ඉඩම් හිමියන් ලෙස සැලකෙන ඉඩම් හිමියන් 40 දෙනෙකුගේ ඉඩම් කැබලි 40ක් අත්කර ගැනීමට යෝජිතය.

2.2.1. පුද්ගලික ඉඩම් මත ඇති කරන බලපෑම

ඉඩමකට හිමිකමක් පැවතීම ශ්‍රී ලංකාව තුළ ගෞරවාන්විත තත්ත්වයක් වන අතර එමගින් අදාළ පුද්ගලයාට සමාජයේ පවතින සමාජ තත්ත්වය පිළිබිඹු කරයි. ඉඩම් අත්කර ගැනීම නිසා බලපෑමට ලක්වන පුද්ගලික ඉඩම් මත ඇති කරන අහිතකර බලපෑම් අවම කිරීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගැනීම පිළිබඳ දැඩි අවධානයක් නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරකම් සැලැස්ම මගින් අවධාරණය කරයි. මෙහිදී ස්වකීය ඉඩමෙන් කොටසක් පමණක් බලපෑමට ලක්වන කුටුම්බ 6ක් ඇත.

2012 වසරේදී ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් පවරනු ලැබූ දුම්රිය ඉඩම් නියමානුකූල කරන ලද අතර අඩු ආදායම් සහිත කාණ්ඩයට ගැනෙන පුද්ගලයන් හට එක් අයෙකුට පර්චස් 02 බැගින් වෙන් කරමින් කුටුම්බ හැඳුනුම්පත් නිකුත් කරන ලදී. පසුව මෙම කුටුම්බලාභීන්ගෙන් ඇතැමෙක් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙත අවම ගෙවීම සිදුකර ඔප්පු ලබාගත් අතර ඒ අනුව ඔවුනට අදාළ ඉඩම සඳහා නෛතික හිමිකමක් පවතී. නමුත් ඔවුන් අතුරින් බොහෝ දෙනෙක් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙතින් ඔප්පු ලබාගෙන නොමැත. නමුත් ඔවුන් නිවාස ඉදිකිරීම සඳහා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය හරහා රජයේ ණය ලබා ගැනීමට හිමිකම් ලබන බැවින් සහතිකපත්ලාභීන් වශයෙන් සැලකිය හැකි වේ. (හිමිකම් සහිත පුද්ගලයන් සහ කුටුම්බපත් හිමියන් දැක්වෙන ඇමුණුම 01 හා 02 බලන්න) මෙම නිවාසවල පදිංචි ජනතාව නැවත පදිංචි කිරීම පිණිස ඔවුන්ගේ භුක්තිය, ඔප්පු හිමියෙකු/ සහතිකපත් හිමියෙකු යන තත්ත්වයේ නෛතික වලංගුභාවයක් ලබාදීම සඳහා අවශ්‍ය කටයුතු ව්‍යාපෘතිය මගින් සිදු කරනු ඇත. එමගින්, ඔප්පු ලබා නොගත් නිවැසියන්ද, සහතිකපත්ලාභීන් වශයෙන් මෙම නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරකම් සැලැස්මෙහි සලකා ඇත.

බලපෑමට ලක් වූ ඉඩම්, ඒවායේ ප්‍රමාණය අනුව වර්ගීකරණය කොට වගුව 2.3 හි සඳහන් කොට ඇත. ව්‍යාපෘතියෙන් බලපෑමට ලක්වන පුද්ගලයන් 33 දෙනෙකු හට ඔවුන්ගේ ඉඩම් කොටසින් පර්චස් 1-2ක ප්‍රමාණයක් අහිමි වන අතර එක් පුද්ගලයෙකුට පර්චස් 2-3 අතර ප්‍රමාණයක්ද, තවත් එක් අයෙකුට ඉඩමෙන් පර්චස් 3-4ක් ප්‍රමාණයක් අහිමි වේ. එක් අයෙකු සතු ව්‍යාපාර ඉඩමෙන් පර්චස් 5කට වඩා අහිමි වේ.

වගුව 2.3: බලපෑමට ලක් වූ ඉඩම් ප්‍රමාණය අනුව

බලපෑමට ලක් වූ ඉඩම් (පර්චස්)	පරිහරණ රටාව			එකතුව
	නේවාසික ඉඩම් (කැබලි ගණන)	ව්‍යාපාර ඉඩම් (කැබලි ගණන)	නේවාසික හා ව්‍යාපාර ඉඩම් (කැබලි ගණන)	
1ට අඩු	1	0	0	1
1-2	33	0	3	36
2-3	1	0	0	1
3-4	0	0	1	1
4-5	0	0	0	0
5ට වැඩි	0	1	0	1
එකතුව	**35**	**1**	**4**	**40**

මෙම දත්ත වලට අනුව නේවාසික, ව්‍යාපාර සහ නේවාසික හා ව්‍යාපාර යන කාණ්ඩ තුනකට අයත් ඉඩම් පරිහරණ වර්ගවලට අයත් ඉඩම් බලපෑමට ලක් වේ. නේවාසික කාර්යය වෙනුවෙන්ම භාවිතා කරන පර්චස් 70ක පුද්ගලික ඉඩම් බලපෑමට ලක් වේ. එය බලපෑමට ලක්වන මුළු ඉඩම්වලින් 81%ක ප්‍රතිශතයක් වන අතර කුටුම්බ 35ක් බලපෑමට ලක් වේ. නේවාසික හා ව්‍යාපාර යන අරමුණු දෙක වෙනුවෙන්ම යෙදවූ පුද්ගලයන් 4 දෙනෙකු භුක්ති විඳින පර්චස් 9ක් එනම් ප්‍රතිශතයක් ලෙස 11%ක් බලපෑමට ලක් වේ. ව්‍යාපාර ඉඩමක පර්චස් 7ක් එනම් බලපෑමට

ලක්වන මුළු ඉඩම්වලින් 3%ක් බලපෑමට ලක්වන අතර ඉන් බලපෑමට ලක්වන පුද්ගලයන් ගණන 1කි. බලපෑමට ලක්වන ඉඩම්, පරිහරණ රටාව අනුව වර්ගීකරණය කර වගුව 2.4 හි දක්වා ඇත.

වගුව 2.4 : බලපෑමට ලක් වූ ඉඩම්, පරිහරණ රටාව අනුව

පරිහරණ රටාව	ඉඩම් කැබලි ගණන	මුළු ඉඩම් කැබලි ප්‍රතිශතය (%)	බලපෑමට ලක් වූ ප්‍රදේශය (පර්චස්)	බලපෑමට ලක් වූ ප්‍රතිශතය (%)
නේවාසික	35	87	70	81
ව්‍යාපාර	1	3	7	8
නේවාසික හා ව්‍යාපාර	4	10	9	11
එකතුව	**40**	**100**	**86**	**100**

මුළු විශාලත්වයට සාපේක්ෂව බලපෑමට ලක්වන ඉඩම්වල ව්‍යාපෘතියෙන් ඇති කරන බලපෑම්වල විශාලත්වය ප්‍රතිශතයක් ලෙස 2.5 වගුවේ සඳහන් කොට ඇත. ඊට අනුව ඉඩම් කැබලි 35ක් නේවාසික කටයුතු සඳහාත්, 4ක් නේවාසික හා ව්‍යාපාර අරමුණු සඳහාත්, එක් කොටසක් ව්‍යාපාර සඳහාත් භාවිතා කොට ඇත. අර්ධ වශයෙන් බලපෑමට ලක්වන ඉතිරි ඉඩම් කොටස් 5ක කොටස් අත්කර ගැනීමෙන් පසුව තවදුරටත් භාවිතා කළ හැකිය. එම ඉඩම් කොටස් 40න් කැබලි 34ක් බරපතල ආකාරයෙන් බලපෑමට ලක්වන අතර ඉන් බොහොමයක් ජාතික නිවාස සංවර්ධන අධිකාරියෙහි නියමානුකූල කරන ලද ඉඩම් වේ.

වගුව 2.5 : බලපෑම්වල ප්‍රමාණය (විශාලත්වය)

මුළු විශාලත්වයට සාපේක්ෂව බලපෑමට ලක් වූ ඉඩම් ප්‍රතිශතය (%)	පරිහරණ රටාව			එකතුව
	නේවාසික (කැබලි ගණන)	ව්‍යාපාර (කැබලි ගණන)	නේවාසික හා ව්‍යාපාර (කැබලි ගණන)	
5ට අඩු	0	0	0	0
5-10	1	0	0	1
11-15	0	0	0	0
16-20	1	1	1	3
21-30	0	0	0	0
31-50	2	0	0	2
50ට වැඩි	31	0	3	34
එකතුව	**35**	**1**	**4**	**40**

2.3 ඉදිකිරීම් මත ඇති කරන බලපෑම

“ii වන කොටසෙහි” සිදු කරන සංවර්ධන කාර්යය හේතුවෙන්, නෛතික හිමිකමක් සහිත පුද්ගලයන්, නෛතික හිමිකමක් නොමැති පුද්ගලයන්, රජයේ හා පොදු දේපළ සහ සංස්කෘතිකමය වටිනාකමක් සහිත ඉදිකිරීම් මත ඇති කරන සමස්ථ බලපෑම් 2.6 හා 2.7 වගුවලින් පෙන්නුම් කෙරේ.

වගුව 2.6 : බලපෑමට ලක් වූ කුටුම්බ හා ව්‍යාපාර ඉදිකිරීම්වල විස්තර

ඉඩම් පරිහරණය	හිමිකම්/ සහතික සහිත පුද්ගලයන්			නෛතික හිමිකමක් නොමැති පුද්ගලයන්			එකතුව
	සම්පූර්ණයෙන් බලපෑමට ලක් වූ	අර්ධ වශයෙන් බලපෑමට ලක් වූ: එම ස්ථානයේදීම දියුණු කිරීමට හැකියාව ඇත	අර්ධ වශයෙන් බලපෑමට ලක් වූ: එම ස්ථානයේදීම දියුණු කිරීමට හැකියාව නැත	සම්පූර්ණයෙන් බලපෑමට ලක් වූ	අර්ධ වශයෙන් බලපෑමට ලක් වූ: එම ස්ථානයේදීම දියුණු කිරීමට හැකියාව ඇත	අර්ධ වශයෙන් බලපෑමට ලක් වූ: එම ස්ථානයේදීම දියුණු කිරීමට හැකියාව නැත	
නේවාසික	32	03	01	205	0	0	241
ව්‍යාපාර	0	01	0	14	0	0	15
නේවාසික හා ව්‍යාපාර	3	01	0	11	0	0	15
එකතුව	35	05	01	230	0	0	271

බලපෑමට ලක් වූ 271ක් දෙනෙක් අතුරින් 230 දෙනෙකු ඉඩමට හිමිකමක් නොමැති පුද්ගලයන් වන අතර 41 දෙනෙකු ඉඩමට නෛතික හිමිකමක් සහිත පුද්ගලයන් වේ. නෛතික හිමිකමක් සහිත පුද්ගලයන් 41 දෙනා අතුරින් 35 දෙනෙකු ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සහතිකපත්ලාභීහු වෙති. ඉහත සඳහන් කරන ලද නෛතික හිමිකමක් නොමැති පුද්ගලයන් 230 දෙනා සම්පූර්ණයෙන්ම බලපෑමට ලක්වන අතර හිමිකම් සහිත පුද්ගලයන් 6 දෙනෙකු අර්ධ වශයෙන් බලපෑමට ලක්වූවන් වේ. ව්‍යාපෘතියෙන් බලපෑමට ලක්වන, ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සහතිකපත්ලාභීන් සම්පූර්ණයෙන්ම බලපෑමට ලක්වන්නන් වේ. එබැවින් ඔවුන් පූර්ණ වශයෙන් බලපෑමට ලක්වන කුටුම්බ ලෙස සැලකිය යුතුය. සිය ඉදිකිරීම්වල කොටසක් පමණක් බලපෑමට ලක්වන, ඉඩමට නෛතික හිමිකම සහිත පුද්ගලයන් පස් දෙනෙකු හට ඔවුන්ගේ බලපෑමට ලක්ව වූ ඉඩමට සහ ඉදිකිරීමට වන්දි ගෙවා ප්‍රතිස්ථාපනයෙන් තොරව එම ස්ථානයේදීම සංවර්ධනය කළ හැකිය. නමුත් සැලකිය යුතු මට්ටමේ බලපෑමකට ලක්වන ඉඩම් හිමියන් එසේ ස්ථානීය සංවර්ධනය කිරීමකට ලක් කළ නොහැකි වේ.

වගුව 2.7 : රජයේ හා පොදු සංස්කෘතිකමය වටිනාකමක් සහිත ඉදිකිරීම් මත ඇති කරන බලපෑම

කොටස	රජයේ ඉඩම්වල පිහිටි ඉදිකිරීම්				සංස්කෘතිකමය වටිනාකමක් සහිත ඉදිකිරීම්	
	දුම්රිය දෙපාර්තමේන්තුවේ නිල නිවාස	දුම්රිය දෙපාර්තමේන්තුවේ වෙනත් ඉදිකිරීම්	ලංකා විදුලි බල මණ්ඩලයේ ට්‍රාන්ස්ෆෝමරය පිහිටි නිවාසය	පොලිස් ස්ථානය	විවිධ ආගම්වලට අයත් පිළිම	ක්‍රීඩා පිට්ටනි
2 වන කොටස	33	15	1	1	4	2

2 වන කොටසේ දී බලපෑමට ලක්වන රජයේ හා පොදු දේපළ ඉදිකිරීම් සහ සංස්කෘතිකමය වටිනාකමක් සහිත දේපළ මත ඇති කරන සමස්ථ බලපෑම වගුව 2.8 හි දක්වා ඇත. මීට ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ නිල නිවාස 33ක්, දුම්රිය දෙපාර්තමේන්තුව සතු වෙනත් ඉදිකිරීම් අයත් වේ. මේවායෙහි විස්තර, පිළිවෙලින් ඇමුණුම 03 හා 04 වශයෙන් ඉදිරිපත් කොට ඇත. ලංකා විදුලිබල මණ්ඩලය සතු ට්‍රාන්ස්ෆෝමරය පිහිටි නිවාස 1ක්, පොලිස් ස්ථාන 1ක් (අර්ධ වශයෙන් බලපෑමට ලක් වේ) සහ ආගමික ස්ථාන වලට අයත් පිළිම 4ක් (බුද්ධ ප්‍රතිමා 2ක් හා කතෝලික ආගමික පිළිම 2ක්) අයත් වන අතර රජය සතු ඉඩම් වශයෙන් හඳුනාගත් ව්‍යාපෘති ප්‍රදේශයට ආසන්නව පිහිටි ක්‍රීඩා පිට්ටනි දෙකක් (සීවලී විදුහල් ක්‍රීඩා පිටිය සහ ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා පිටිය) සුළු වශයෙන් බලපෑමට ලක් වේ.

2.3.1 ඉදිකිරීම් සිදු කිරීම සඳහා භාවිතා කරනු ලබන අමුද්‍රව්‍ය

වගුව 2.9 : ඉදිකිරීම් සිදු කිරීම සඳහා භාවිතා කරනු ලබන අමුද්‍රව්‍ය

ගෙබිම/ බිත්ති/ වහළ සඳහා භාවිතා කරන අමුද්‍රව්‍ය	ඉදිකිරීම් ව්‍යුහ				
	නේවාසික	ව්‍යාපාර	නේවාසික සහ ව්‍යාපාර	වෙනත්	එකතුව
පැල්පත්	34	6	6	1	**47**
මැටි/ ගඩොල්/ උළු වහළ	5	0	0	0	**5**
සිමෙන්ති/ ගඩොල් හෝ සිමෙන්ති ගල්/ උළු හෝ ඇස්බැස්ටස් වහළ	149	8	7	3	**167**
සිමෙන්ති/ ගඩොල් හෝ සිමෙන්ති ගල්/ කොන්ක්‍රීට් වහළ	7	2	1	2	**12**
සිමෙන්ති/ ගඩොල් හෝ සිමෙන්ති ගල්/ ටකරං හෝ තාර ශීට් වහළ	44	0	1	0	**45**
එකතුව	**239**	**16**	**15**	**6**	**276**

2 වන කොටසේ බලපෑමට ලක්වන ඉදිකිරීම් සඳහා භාවිතා කර ඇති අමුද්‍රව්‍ය ඉහත වගුවෙන් දක්වා ඇත. බලපෑමට ලක් වූ ඉදිකිරීම් 276න් 167ක් සිමෙන්ති ගලින් බැඳ උළු හෝ ඇස්බැස්ටස් තහඩු සෙවිලි කොට ඇත. ඉතිරි ඉදිකිරීම් වලින් 45ක් සිමෙන්ති ගලින්/ ගඩොලින් නිමකර වහළය ටකරං හෝ තාර ශීට් සෙවිලි කර ඇත. 12ක් ගෙබිම සිමෙන්ති/ ගඩොල් යොදා බිත්ති සිමෙන්ති ගල් වලින් බැඳ, වහළය කොන්ක්‍රීට් වලින් නිමවා ඇත. නිවාස 47ක් පැල්පත් වන අතර ඉතිරි නිවාස 5, මැටි ගෙබිම, ගඩොල් බිත්ති හා උළු වහළයෙන් නිමවා ඇත.

2.3.2 එක් එක් අමුද්‍රව්‍ය වර්ගය යොදා ගෙන ඇති ගෙබිම වර්ග ප්‍රමාණය

වගුව 2.10 : එක් එක් අමුද්‍රව්‍ය වර්ගය යොදා ගෙන ඇති ගෙබිම වර්ග ප්‍රමාණය

ගෙබිම/ බිත්ති/ වහළ සඳහා භාවිතා කරන අමුද්‍රව්‍ය	ඉදිකිරීම් වල ගෙබිම වර්ග ප්‍රමාණය (වර්ග අඩි)				
	නේවාසික	ව්‍යාපාර	නේවාසික සහ ව්‍යාපාර	වෙනත්	එකතුව
පැල්පත්	1674	0	387	0	**2061**
මැටි/ ගඩොල්/ උළු වහළ	37653	1372	3988	1362	**44375**
සිමෙන්ති/ ගඩොල් හෝ සිමෙන්ති ගල්/ උළු හෝ ඇස්බැස්ටස් වහළ	2967	1050	579	546	**5202**
සිමෙන්ති/ ගඩොල් හෝ සිමෙන්ති ගල්/ කොන්ක්‍රීට් වහළ	23050	200	6303	0	**29553**
සිමෙන්ති/ ගඩොල් හෝ සිමෙන්ති ගල්/ ටකරං හෝ තාර ශීට් වහළ	5372	2020	1580	0	**8972**
එකතුව	**70776**	**4642**	**12837**	**1908**	**90163**

එක් එක් වර්ගයට අනුව ගෙබිම වර්ග ප්‍රමාණ ඉහත වගුවේ දක්වා ඇත. මුළු (ගෙබිම/ බිත්ති/ වහළ) වර්ග ප්‍රමාණ වර්ග අඩි 90,163 කි. ඒ අනුව සිමෙන්ති/ ගඩොල් හෝ සිමෙන්ති ගල්/ උළු හෝ ඇස්බැස්ටස් වහළ සහිත වර්ග අඩි 5202ක් සිමෙන්ති/ ගඩොල් හෝ සිමෙන්ති ගල්/ ටකරං හෝ තාර ශීට් වහළ සහිත වර්ග අඩි 8972ක්, සිමෙන්ති/ ගඩොල් හෝ සිමෙන්ති ගල්/ කොන්ක්‍රීට් වහළ සහිත වර්ග අඩි 29,553ක්, මැටි/ ගඩොල්/ උළු වහළ සහිත වර්ග අඩි 44,375ක් සහ කුඩා පැල්පත් වර්ග අඩි 2,061ක් සමන්විත වේ.

2.3.3 මායිම් තාප්ප

බලපෑමට ලක්වනු ඇති මායිම් තාප්පවල මුළු වර්ග ප්‍රමාණය වර්ග අඩි 157,150කි. ඉන් වර්ග අඩි 153,950ක්, පාසල් ක්‍රීඩා පිට්ටනි හා දුම්රිය දෙපාර්තමේන්තු ක්‍රීඩා පිටිය වටා පිහිටි මායිම් තාප්පද ඇතුළත්ව රජය හිමිකම් කියන මායිම් තාප්ප වන අතර ඉතිරි වර්ග අඩි 3200 පුද්ගලික හිමිකරුවන් සතු තාප්ප වේ.

2.3.4 ඉදිකිරීම්වල බලපෑමට ලක් වූ ගෙබිම වර්ග ප්‍රමාණය

වගුව 2.11 : ඉදිකිරීම් වර්ග හා ගෙබිම වර්ග එල

ඉදිකිරීම් වල ගෙබිම වර්ග ප්‍රමාණය (වර්ග අඩි)	ඉදිකිරීම් ව්‍යුහ				
	නේවාසික	ව්‍යාපාර	නේවාසික හා ව්‍යාපාර	වෙනත්	එකතුව
100ට අඩු	33	5	0	1	**39**
101 – 200	72	5	2	2	**81**
201 – 300	41	2	4	0	**47**
301 – 450	45	2	3	1	**51**
451 – 650	27	1	2	1	**31**
651 – 850	8	0	1	1	**10**
851 – 1000	3	0	1	0	**4**
1001 – 1250	3	0	0	0	**3**
1251 – 1500	1	0	0	0	**1**
1500ට වැඩි	3	1	2	0	**6**
නොමැති	3	0	0	0	**3**
එකතුව	**239**	**16**	**15**	**6**	**276**

ගෙබිම වර්ග ප්‍රමාණය මත පදනම්ව ඉදිකිරීම් වර්ගීකරණයක් ඉහත වගුවේ දැක්වෙයි. නේවාසික ඉදිකිරීම් 33ක, ව්‍යාපාර ස්ථාන 5ක සහ තවත් 1ක ගෙබිම වර්ග ප්‍රමාණය වර්ග අඩි 100ට වඩා අඩුය. නේවාසික ඉදිකිරීම් 72ක්, ව්‍යාපාර 5ක්, නේවාසික හා ව්‍යාපාර ඉදිකිරීම් 2ක් සහ වෙනත් කාණ්ඩයට ගැනෙන ඉදිකිරීම් 2ක ගෙබිම වර්ග ප්‍රමාණය වර්ග අඩි 101-200 දක්වා වේ. වර්ග ප්‍රමාණය 201-1500 දක්වා වන ප්‍රමාණය යටතට ගැනෙන ඉදිකිරීම් සංඛ්‍යාව 51 සිට 1 දක්වා වන පරාසයක පිහිටයි. වර්ග අඩි 1500 ඉක්මවන ඉදිකිරීම් 6ක් පමණක් පවතින අතර ඊට නේවාසික ඉදිකිරීම් 3ක්, ව්‍යාපාර ස්ථාන 1ක් හා නේවාසික හා ව්‍යාපාර යන කාණ්ඩයේ ඉදිකිරීම් 2ක් ඇතුළත් වේ.

2.3.5 බලපෑමට ලක් වූ ඉදිකිරීම් සඳහා පවතින පහසුකම්

වගුව 2.12 : බලපෑමට ලක් වූ ඉදිකිරීම් සඳහා පවතින පහසුකම්

බලපෑමට ලක් වූ ඉදිකිරීමට පවතින පහසුකම්	ඉදිකිරීම් ව්‍යුහ				
	නේවාසික	ව්‍යාපාර	නේවාසික හා ව්‍යාපාර	වෙනත්	එකතුව
දුරකථන	23	4	-	2	29
විදුලි බලය	192	9	11	2	214
නල ජලය	193	3	8	1	205

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අත්කර ගෙන කඩා දැමීමට යෝජිත ඉදිකිරීම් සමහරකට විදුලිය, නල ජලය හා දුරකථන පහසුකම් පවතින බව නිරීක්ෂණය වේ. විදුලි බලය, නල ජලය හා දුරකථන පහසුකම් පවතින ඉදිකිරීම් සංඛ්‍යාව ඉහත වගුවෙන් පෙන්නුම් කෙරෙයි. ඉදිකිරීම් 214ක් සඳහා විදුලි බලය පවතින අතර නල ජල පහසුකම් පවතින ඉදිකිරීම් ගණන 205 කි. ස්ථාවර දුරකථන පහසුකම් පවතින ඉදිකිරීම් සංඛ්‍යාව 29ක් වේ.

2.3.6 බෝග සහ ගස් වැල් මත ඇති කරන බලපෑම

ව්‍යාපෘති ප්‍රදේශයේ පවතින ශාක ගණන 2.13 වගුවෙහි දක්වා ඇත. එම ගස් 106 අතුරින් ඵල දරන ගස් ගණන 66ක් වන අතර, දැවමය ශාක 08ක්ද, පොල් ගස් 30ක්ද, අලංකරණය පිණිස වගා කොට ඇති ශාක 3ක්ද, නිරීක්ෂණය විණි. දුම්රිය මාර්ග රක්ෂිතයේ දුම්රිය මාර්ගයට වෙන්කළ බිම් තීරය තුළ පිහිටි නිවාසවල පදිංචිකරුවන් විසින් මෙම ශාක බොහොමයක් වගාකොට ඇත. 2 වන කොටස යටතට ගැනෙන පහත වගුවෙහි පෙන්නුම් කෙරෙන ශාක වෙනුවෙන්, ඒ සඳහා හිමිකම් ඉදිරිපත් කරන්නා වූ පදිංචිකරුවන් හට වන්දි ගෙවනු ලැබේ. දුම්රිය ආඥා පනතට අනුව, දුම්රිය මාර්ග රක්ෂිතයේ පවතින දැවමය වටිනාකමක් සහිත ශාකවල අයිතිය දුම්රිය දෙපාර්තමේන්තුව සතුවන අතර ඉදිකිරීම් කාර්යය වෙනුවෙන් කපා දමන ලද ගස් ඉවත් කිරීම පිළිබඳ තීරණය කිරීමේ බලය/ අධිකාරය දුම්රිය සාමාන්‍යාධිකාරීවරයා සතු වේ.

වගුව 2.13 : බලපෑමට ලක් වූ ගස්

ගස් වර්ගය	ගසේ නම	ගණන	එකතුව
ඵල හට ගන්නා	අඹ	28	66
	කෙසෙල්	17	
	ගස්ලබු	3	
	දොඩම්	2	
	අලි පේර	3	
	රට නෙල්ලි	4	
	ඩොංගා	1	
	පේර	3	
	ඇඹරැල්ලා	4	
	මිදි	1	
දැව	කොස්	6	7
	පිහිඹියා	1	
පොල්	පොල්	16	30
	තැඹිලි	14	
අලංකාරය පිණිස වගා කරන	රෙඩ් පාම්	3	3

3 වන පරිච්ඡේදය - සමාජ ආර්ථික පැතිකඩ

3.1 හැඳින්වීම

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වනාතමුල්ල ග්‍රාම නිලධාරී කොට්ඨාශය යටතට ගැනෙන ලොකෝ හන්දියේ සිට සීවලී පටුමග දක්වා (0+900m සිට 0+2200m දක්වා) වන කැළණිවැලි දුම්රිය මාර්ගයේ පළමු අදියර හි 2 වන කොටසේ සංවර්ධන කාර්යය හේතුවෙන් බලපෑමට ලක්වන පුද්ගලයන් ප්‍රතිස්ථානගත කිරීම සඳහා පළමු කණ්ඩායම වශයෙන් දැනටමත් තෝරාගෙන ඇත.

හඳුනාගත් ව්‍යාපෘති ප්‍රදේශය, කොළඹ නගරයේ නැගෙනහිර කොටසට වන්නට පිහිටා ඇති අතර ප්‍රවේශ මාර්ග හා දුම්රිය මාර්ග ඔස්සේ කොළඹ නගරයේ අනෙකුත් ප්‍රදේශවලට සම්බන්ධ වී ඇත. මෙම ප්‍රදේශය සහ අවට ප්‍රදේශය නේවාසික ප්‍රදේශයක් ලෙස සමාජීය වශයෙන් වර්ගීකරණය කර ඇති අතර එහි මැදි ආදායම් කාණ්ඩයේත්, වැඩි ආදායම් නාගරික කාණ්ඩයට අයත් පවුල් කිහිපයකුත්, වැඩි වශයෙන්අඩු ආදායම් ලබන ප්‍රජාවත් වාසය කරයි. පසුගිය දශක දෙකක කාල සීමාව තුළ, රජය විසින් ක්‍රියාත්මක කරනු ලැබූ විවිධ නාගරික සංවර්ධන වැඩසටහන් යටතේ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සහ නාගරික සංවර්ධන අධිකාරිය විසින් මෙම අඩු ආදායම් ලබන ප්‍රජාවට අයත් කුටුම්බ සඳහා ඔවුන් දැනට පදිංචි ප්‍රදේශයේම (onsite) ජනාවාස පිහිටුවා ඔවුන්ගේ තත්ත්වය ඉහළ දැමීමට කටයුතු කොට ඇත.

ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2017 වසරේ සිදු කරනු ලැබූ සමීක්ෂණයට අනුව කොළඹ දිස්ත්‍රික්කයේ ජනගහනය 2,419,000ක් වශයෙන් වාර්තා වී ඇත. මෙම ජනගහනයෙන් මෙම ග්‍රාම නිලධාරී කොට්ඨාශය තුළ වාසය කරන ජනගහනය 17,313 කි. (වගුව 3.1)

වගුව 3.1 : ජනගහන ව්‍යාප්තිය - වනාතමුල්ල ග්‍රාම නිලධාරී කොට්ඨාශය

පිහිටීම	ජනගහනය		මුළු ජනගහනය
	ස්ත්‍රී	පුරුෂ	
කොළඹ දිස්ත්‍රික්කය	1,187,000	1,232,000	2,419,000*
තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය	124,503	125,276	249,779**
වනාතමුල්ල ග්‍රාම නිලධාරී කොට්ඨාශය	8536	8777	17,313***

මූලාශ්‍ර: * වසර මැද ජනගහනය - 2017 දී ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

** 2018 දී සංඛ්‍යාලේඛන නිලධාරීන් විසින් ඇස්තමේන්තුගත කළ ජනගහනය - තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය

*** ප්‍රාදේශීය ලේකම් කාර්යාලයීය දත්ත - 2018 ඔක්තෝබර් යාවත්කාලීන කළ (thimbirigasyaya.ds@gov.lk)

3.2 ව්‍යාපෘතියෙන් බලපෑමට ලක් වූ කුටුම්බවල සමාජ ආර්ථික තත්ත්වය

කැළණිවැලි දුම්රිය මාර්ගය දිවෙන මාර්ගය දිගේ පවතින ඉඩම්වල ජීවත්වන, ව්‍යාපෘතියෙන් බලපෑමට ලක්වන ප්‍රජාවගේ සමාජ හා ආර්ථික තත්ත්වය විමර්ශනය කිරීම පිණිස එක්සත් ජාතීන්ගේ මානව ජනාවාස වැඩසටහන විසින් 2017 වසරේදී මූලික සමාජ ආර්ථික අධ්‍යයනය සිදු කරන ලදී. වනාතමුල්ල ග්‍රාම නිලධාරී කොට්ඨාශය සම්බන්ධයෙන් 2 වන කොටසේ සවිස්තරාත්මක සැලසුම් වලදී සොයා ගන්නා ලද දත්ත හා තොරතුරු වලට අනුව ව්‍යාපෘතියෙන් බලපෑමට ලක් වූ ප්‍රදේශය තුළ වාසය කරන කුටුම්බ පිළිබඳව කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතියේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ කාර්ය මණ්ඩලය විසින් සිදු කරන ලද "සමාජ-ආර්ථික දත්ත සමාලෝචන සමීක්ෂණය" හි ප්‍රතිඵල අනුව මෙම දත්ත යාවත්කාලීන කරන ලදී.

3.2.1. කුටුම්බවල විශාලත්වය

කැළණිවැලි දුම්රිය මාර්ගයේ පළමු අදියර හි තෝරාගත් කොටසේ දුම්රිය මාර්ගය සඳහා වෙන්කළ බිම් තීරය (ROW) ලෙස අවසන් නිගමනයකට පැමිණ යෝජිත කොටස වනාතමුල්ල ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ කොටසක් ආවරණය කරන අතර එහි නිවැසි ජනගහනය 1095කි. ඊට කාන්තාවන් 557ක් හා පුරුෂයන් 538ක් අයත් වේ. ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2016 වසරේදී සිදු කරනු ලැබූ "ගෘහ ඒකක ආදායම හා වියදම් සමීක්ෂණය"ට අනුව, ජාතික මට්ටමින් එක් පවුලක සාමාන්‍ය සාමාජිකයන් ගණන 4.0 දෙනෙකි. ව්‍යාපෘති ප්‍රදේශයේ කුටුම්බවල විශාලත්වය පහත වගුවේ දක්වා ඇත. (වගුව 3.2)

වගුව 3.2 : පවුල්වල විශාලත්වයේ ව්‍යාප්තිය

කුටුම්බවල විශාලත්වය	එකතුව	
	ගණන	ප්‍රතිශතය
1 - 2	65	25.49
3 - 4	80	31.37
5 - 6	64	25.10
7 - 8	30	11.76
9 සහ ඊට වැඩි	16	6.27
එකතුව	**255**	**100**

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය (2017-2018)

3.2.1.1. උප පවුල්

මෙම ව්‍යාපාති ප්‍රදේශයේ, ඇතැම් ගෘහ ඒකකවල පවුල් එකකට වඩා වැඩි ගණනක් වාසය කරයි. ඇතැම් උප පවුල් විස්තෘත පවුල් ලෙස එකම නිවසේ වාසය කරයි. කෙසේවුවත්, මෙම ප්‍රදේශයේ ජනතාවගේ ජීවන රටාව ඉතා සංකීර්ණ ස්වභාවයක් ගනු ලබන බැවින් සාමාන්‍ය නිර්ණායක භාවිතා කරමින් විස්තෘත පවුල් තුළ වාසය කරන උප පවුල් හඳුනා ගැනීම දුෂ්කරය. ස්වකීය දෙමාපියන් සමඟ එක්ව වාසය කරන උප පවුල් ඒකක පහත 3.3 වගුවේ දක්වා ඇත.

වගුව 3.3 : දෙමාපියන් සමඟ වාසය කරන විස්තෘත පවුල් ඒකක සංඛ්‍යාව

දෙමාපියන් සමඟ වාසය කරන උප පවුල් ඒකක සංඛ්‍යාව	නිවැසියන් සංඛ්‍යාව
1	16
2	02
3 හෝ ඊට වැඩි	02
එකතුව	**20**

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය (2017-2018)

3.2.2. කුටුම්බවල ආදායම හා වියදම

ව්‍යාපෘතියෙන් බලපෑමට ලක් වූ කුටුම්බවල ආදායම සලකා බැලීමේදී, ආසන්න වශයෙන් 35%ක් රු. 50,000/= සිට රු. 100,000/= දක්වා මාසික ආදායමක් ලබන අතර රු. 100,000/= කට වඩා උපයන සංඛ්‍යාව 12%කි. 0.75%ක් රු. 5,000/=ට වඩා අඩු මාසික ආදායමක් ලබයි. දත්ත වලට අනුව 50%කට වඩා කුටුම්බවල ආදායම රු. 50,000/=ට වඩා අඩුය. ඔවුන්ගේ වියදම් රටාව සම්බන්ධයෙන් ගත් කළ, බලපෑමට ලක්වූවන්ගෙන් 66%ක් පමණ රු. 25,000/= සිට රු. 100,000/=ක් අතර මුදලක් මාසිකව වැය කරයි. ප්‍රමාණයෙන් 12%ක් රු. 15,000/=ටත් වඩා අඩු මුදලක් වියදම් කරන අතර එය පවුලේ මූලික අවශ්‍යතා ආවරණය කර ගැනීමටවත් ප්‍රමාණවත් නොවන බව පෙනී යයි. ආදායම් හා වියදම් රටාව අධ්‍යයනය කිරීමේදී පෙනී යන්නේ ඔවුන් සිය මාසික ආදායම මුළුමනින්ම පවුලේ අවශ්‍යතා සපුරාලීම පිණිස භාවිතා කරන බව වන අතර එය එම සමාජයේ පොදු ලක්ෂණයක් වන බවත් පෙනී යයි. මේ අනුව, මෙම කොටසේ වාසය කරන පුද්ගලයන්ගෙන් සැලකිය යුතු සංඛ්‍යාවක් ප්‍රමාණවත් ආදායමක් ලබන අතර සුළු පිරිසක් අඩු ආදායමක් ලබයි.

වගුව 3.4 : ව්‍යාපෘතියෙන් බලපෑමට ලක්වන පුද්ගලයන්ගේ සාමාන්‍ය මාසික ආදායමේ ව්‍යාප්තිය

ආදායම් පරාසය (රු.)	ආදායම		වියදම	
	බලපෑමට ලක් වූ ගෘහ ඒකක සංඛ්‍යාව	ප්‍රතිශතය	බලපෑමට ලක් වූ ගෘහ ඒකක සංඛ්‍යාව	ප්‍රතිශතය
<5000	02	0.78	02	0.78
5,001 - 7,500	00	0.00	03	1.18
7,501- 10,000	04	1.57	02	0.78
10,001 – 15,000	11	4.31	22	8.63
15,001 - 25,000	27	10.59	40	15.69
25,001 – 50,000	88	34.51	99	38.82
50,001 - 100,000	88	34.51	70	27.45
>100,000	31	12.16	09	3.53
නොපවතින	04	1.57	08	3.14
එකතුව	**255**	**100.00**	**255**	**100.00**

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය (2017-2018)

3.3 ව්‍යාපෘතියෙන් බලපෑමට ලක්වන ගෘහ මූලිකයන්ගේ සමාජ ආර්ථික තත්ත්වය

ව්‍යාපෘතියෙන් බලපෑමට ලක්වන ගෘහ මූලිකයන් හා කුටුම්බ සාමාජිකයන් යන දෙආකාරයෙන්ම අවධානය යොමු කරමින් ව්‍යාපෘති බලපෑම් විශ්ලේෂණය කළ හැකිය. ඉඩම් අත්කර ගැනීම හා වන්දි ගෙවීම සම්බන්ධයෙන් වන කල්හි කුටුම්බ සාමාජිකයන් වෙත අවධානය යොමු කරනවාට වඩා ගෘහ මූලිකයන් පිළිබඳ සලකා බැලීම අවශ්‍ය කෙරේ. එසේ සලකා ලැබෙන අත්‍යාවශ්‍යය ලක්ෂණ පහත දක්වා ඇත.

3.3.1. ජන වර්ගය

2 වන කලාපයේ වාසය කරන ගහ මූලිකයන්ගේ ජන වර්ගය සලකා බැලීමේදී 60%ක් සිංහල, 32.5%ක් ද්‍රවිඩ, 5.5ක් ශ්‍රී ලංකා මුස්ලිම් හා 2%ක් වෙනත් යන වර්ග වලට අයත් වන අතර එම ව්‍යාප්තිය පහත 3.5 වගුවේ දක්වා ඇත.

වගුව 3.5 : ව්‍යාපෘතියෙන් බලපෑමට ලක්වන ගෘහමූලිකයන්ගේ ජන වර්ගය, ස්ත්‍රී පුරුෂ භාවය අනුව වෙන් වෙන් වශයෙන්

ජන වර්ගය	පුරුෂ	ස්ත්‍රී	මුළු ගණන	මුළු ගණනේ ප්‍රතිශතය
සිංහල	94	58	152	60%
දෙමළ	59	24	83	32.5%
මුස්ලිම්	13	01	14	5.5%
වෙනත්	04	02	06	2%
එකතුව	**170**	**85**	**255**	**100.00**

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය (2017-2018)

3.3.2. වයස සහ ස්ත්‍රී පුරුෂ භාවය

සමීක්ෂණයේ ප්‍රතිඵල වලට අනුව පුරුෂයන් 170ක් හා කාන්තාවන් 85ක් වාර්තා විණි. ගෘහ මූලිකයන්ගෙන් සැලකිය යුතු සංඛ්‍යාවක් වයස අවුරුදු 41-60 කාණ්ඩයට අයත් විණි. එය සංඛ්‍යාත්මකව 143ක් වන අතර මුළු ගණනින් ප්‍රතිශතයක් ලෙස සැලකූ විට 56.7%කි. 19%ක් පමණ වයස අවුරුදු 60ට වඩා වැඩි කණ්ඩායමට අයත් විණි. වයස අවුරුදු 18ට අඩු පුද්ගලයන්ගේ ප්‍රතිශතය 0.78%කි. ව්‍යාපෘතියෙන් බලපෑමට ලක් වූ ගෘහ මූලිකයන්ගේ වයස හා ස්ත්‍රී පුරුෂ භාවය අනුව සිදු කරන ලද වර්ගීකරණය පහත 3.6 වගුවේ දක්වා ඇත.

වගුව 3.6 : ව්‍යාපෘතියෙන් බලපෑමට ලක් වූ ගෘහ මූලිකයන්ගේ වයස් කාණ්ඩ, ස්ත්‍රී පුරුෂ භාවය අනුව වෙන් වෙන් වශයෙන්

වයස් කාණ්ඩය (අවුරුදු)	පුරුෂ		ස්ත්‍රී		මුළු ගණන	
	පුද්ගලයන් ගණන	%	පුද්ගලයන් ගණන	%	පුද්ගලයන් ගණන	%
18ට අඩු	02	1.18	0	-	2	0.78
18-30	17	10.00	4	6.25	21	8.247
31-40	35	20.59	6	7.29	41	16.08
41-60	94	55.29	49	57.29	143	56.07
61-70	18	10.59	22	23.36	40	15.70
71ට වැඩි	4	2.35	4	5.21	08	3.14
එකතුව	**170**	**100**	**85**	**100**	**255**	**100**

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය (2017-2018)

3.3.3. විවාහක අවිවාහක භාවය

ව්‍යාපෘතියෙන් බලපෑමට ලක් වූ ගෘහ මූලිකයන් අතුරින් 76.46%ක් විවාහක වූ අතර 20.78%ක් වැන්දඹු කාන්තාවන් විය. එය ප්‍රමාණාත්මකව වැන්දඹු පුරුෂයන්ට වඩා හතර ගුණයකින් වැඩි අගයකි. වගුව 3.7 මගින්, මෙම කොටසෙහි වාසය කරන ගෘහ මූලිකයන්ගේ විවාහක අවිවාහක භාවයෙහි සාරාංශයක් දැක්වේ.

වගුව 3.7 : ව්‍යාපෘතියෙන් බලපෑමට ලක් වූ පුද්ගලයන්ගේ විවාහක අවිවාහක භාවය, ස්ත්‍රී පුරුෂ භාවය අනුව වෙන් වෙන් වශයෙන්

	පුරුෂයින් ගණන	ප්‍රතිශතය	කාන්තාවන් ගණන	ප්‍රතිශතය	මුළු පුද්ගලයන් ගණන	ප්‍රතිශතය
විවාහක	159	93.53	36	42.35	195	76.46
නීතියෙන් වෙන් වූ	0	0	3	3.53	3	1.18
වෙන් වූ	1	0.50	3	3.53	4	1.57
වැන්දඹු පුරුෂ/ ස්ත්‍රී	10	5.88	43	50.59	53	20.78
එකතුව	**170**	**100**	**85**	**100**	**255**	**100**

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය (2017-2018)

3.3.4. අධ්‍යාපන මට්ටම

ව්‍යාපෘතියෙන් බලපෑමට ලක් වූ ගෘහ මූලිකයන් බොහෝ දෙනෙකු අ.පො.ස. (සා/පෙළ) දක්වා අධ්‍යාපනය ලබා ඇත. 14.12%ක් විධිමත් අධ්‍යාපනයක් ලබා නොමැති අතර අ.පො.ස. (උ/පෙළ) දක්වා අධ්‍යාපනය ලබා ඇති ප්‍රමාණය 06%කි. මෙම කොටසෙහි වාසය කරන ගෘහ මූලිකයන්ගේ අධ්‍යාපනය මට්ටම පහත වගුවෙන් පෙන්නුම් කරයි. සංසන්දනාත්මකව සලකා බැලීමේදී ස්ත්‍රීන්ට සාපේක්ෂව පුරුෂයන් වැඩි අධ්‍යාපනයක් ලබා ඇත.

වගුව 3.8 : ව්‍යාපෘතියෙන් බලපෑමට ලක් වූ ගෘහ මූලිකයන්ගේ අධ්‍යාපන මට්ටම, ස්ත්‍රී පුරුෂ භාවය අනුව වෙන් වෙන් වශයෙන්

අධ්‍යාපනය	පුරුෂයන් ගණන	ප්‍රතිශතය	ස්ත්‍රීන් ගණන[4]	ප්‍රතිශතය	මුළු පුද්ගලයන් ගණන	ප්‍රතිශතය
සාක්ෂරතාවය නොමැති විධිමත් අධ්‍යාපනයක් ලබා නොමැති	11	6.47	12	14.12	23	9.02
අත්සන තැබිය හැකි	5	2.94	8	9.41	13	5.10
පෙර පාසල්/ මූලික වසර	7	4.12	3	3.53	10	3.92
පස්වන ශ්‍රේණිය දක්වා	24	14.12	18	21.18	42	16.47
හයවන ශ්‍රේණියේ සිට අ.පො.ස. (සා/පෙළ) දක්වා	108	63.53	43	50.59	151	59.22
අ.පො.ස. (උ/පෙළ)	13	7.65	1	1.18	14	5.49
ඩිප්ලෝමා	1	0.59	0	-	1	0.39
නොමැති	1	0.59	0	-	1	0.39
එකතුව	**170**	**100**	**85**	**100**	**255**	**100**

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය (2017-2018)

3.3.5. වෘත්තීය රටාවන්

ප්‍රාථමික හා ද්විතියික වෘත්තීන් හි නියුතුව සිටින, ව්‍යාපෘතියෙන් බලපෑමට ලක්වන ගෘහ මූලිකයන්ගේ ආදායම් මූලාශ්‍ර 3.9 වගුවෙන් පෙන්නුම් කරයි. මූලිකව, ප්‍රාථමික වෘත්තීයන් සාමාන්‍යයෙන් ස්වභාවය සේම, පූර්ණ කාලීන සේවයේ නියුතු විය යුතු රැකියා වේ. ප්‍රධානම ආදායම් උත්පාදන මාර්ගය වනුයේ පුද්ගලික අංශයේ රැකියාවන් හි නියුතු වීම වේ. සමස්ථ සේවා නියුක්ති ජනගහනයෙන් 91ක් පමණ (35.68%)ක් පුද්ගලික අංශයේ සේවා නියුක්තියෙන් යුක්ත වේ. ආදායම් මාර්ග සැලකීමේදී දෙවන විශාලතම ආදායම් උත්පාදන මාර්ගය වනුයේ ස්වයං රැකියා නියුක්තියයි. එම ප්‍රමාණාත්මකව 30.58%කි. නුපුහුණු ශ්‍රමිකයන් වශයෙන් රැකියාවෙහි නියුක්ත ප්‍රමාණය 19.21%ක් වන අතර එය තෙවන ආදායම් උත්පාදන මාර්ගය වේ. ස්වයං රැකියාවල නියුක්ත පුරුෂයන් ගණන එම රැකියාවල නියුතු කාන්තාවන් මෙන් හතර ගුණයකි. සැලකිය යුතු සංඛ්‍යාවක් රජයේ රැකියාවලත්, විදේශ රැකියාවලත් නියුක්ත අතර එය පිළිවෙලින් 8.23%ක් හා 3.13% ක් වේ. පහත සඳහන් වගුවෙන් පෙන්නුම් කරන පරිදි සැලකිය යුතු පුද්ගලයන් ගණනක් විශේෂයෙන් කාන්තාවන් විරැකියාවෙන් (12.94%) පෙළෙන අතර කාන්තා රැකියා වියුක්තිය පුරුෂයන් මෙන් තුන් ගුණයකින් වැඩිය. ප්‍රාථමික ආදායම් මාර්ගවලට අමතරව ඇතැමෙක් ද්විතියික ආදායම් මාර්ගයක් වශයෙන්ද ස්වයං රැකියාවල නියුක්තව සිටිති.

[4]වගුව 3.14 හි අවදානම් තත්ත්වය යටතට ගැනෙන කාන්තා මූලික කුටුම්භ

වගුව 3.9 : ව්‍යාපෘතියෙන් බලපෑමට ලක් වූ ගෘහ මූලිකයන්ගේ ආදායම් උත්පාදන රටාව

ආදායම් මූලාශ්‍රය	පුරුෂ	ප්‍රතිශතය	ස්ත්‍රී	ප්‍රතිශතය	මුළු ගණන	ප්‍රතිශතය
මූලික මූලාශ්‍ර						
වැටුප් ලබන රැකියා (රජයේ)	19	11.17	2	2.35	21	8.23
වැටුප් ලබන රැකියා (පුද්ගලික)	34	20.00	8	9.41	42	16.47
නුපුහුණු/ දෛනික වැටුප් ලබන/ කොන්ත්‍රාත් කම්කරු	40	23.52	9	10.58	49	19.21
ස්වයං රැකියා	50	29.41	28	32.94	78	30.58
විශ්‍රාම වැටුප් සහිත විශ්‍රාමික	6	3.52	5	5.88	11	4.31
විදේශ රැකියාවේ නියුතු	5	2.94	3	3.52	8	3.13
රැකියා විරහිත	8	4.70	25	29.41	33	12.94
ව්‍යාපාරික	3	1.76	2	2.35	5	1.96
නොමැති	5	2.94	3	3.52	8	3.13
එකතුව	**170**	**99.96**	**85**	**99.96**	**255**	**99.69**
ද්විතියික මූලාශ්‍ර						
කම්කරු වැඩ	1	12.5	1	16.66	2	14.28
ගෙවල්/ කාමර කුලියට දීම	1	12.5	0	0	1	7.14
ස්වයං රැකියා	6	75.00	5	83.33	11	78.57
මුළු ගණන	**8**	**100**	**6**	**99.99**	**14**	**99.99**

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය (2017-2018)

3.4 ව්‍යාපෘතියෙන් බලපෑමට ලක් වූ කුටුම්බවල සාමාජිකයින්ගේ සමාජ ආර්ථික තත්ත්වය

කැළණිවැලි දුම්රිය මාර්ගයේ පළමු අදියර හි 2 වන කොටසේ ව්‍යාපෘතියෙන් බලපෑමට ලක් වූ වනාතමුල්ල ග්‍රාම නිලධාරී කොට්ඨාශයට අයත්වන කුටුම්බවල සාමාජිකයන්ගේ සමාජ ආර්ථික තත්ත්වය වෙන් වෙන් වශයෙන් විශ්ලේෂණය කොට පහත දක්වා ඇත.

3.4.1. වයස සහ ස්ත්‍රී පුරුෂ භාවය

මෙම කොටසට අයත්වන ජනගහනයේ පුරුෂයින් හා ස්ත්‍රීන් අතර අනුපාතය 1:3 ක්වේ. සමීක්ෂණයේදී ලද දත්තවලට අනුව අවුරුදු 6-17 දක්වා වන වයස් කාණ්ඩය හැරුණු විට අනෙකුත් සියලුම වයස් කාණ්ඩවල ස්ත්‍රී ජනගහනය පුරුෂ ජනගහනයට සාපේක්ෂව ඉහළ අගයක් ගනී. ජනගහනයෙන් 33%ක් පමණ වයස අවුරුදු 17ට අඩු ළමුන් නියෝජනය කරන අතර 4.2%ක් පමණ වයස අවුරුදු 60ට වැඩි පුද්ගලයන් නියෝජනය කරයි. මෙයින් පැහැදිලි වනුයේ මෙම කොටසට අයත් ප්‍රජාවගේ මුළු ජනගහනයෙන් 37.2%ක් පමණම යැපෙන්නන් වන බවයි. ඒ අනුව ක්‍රියාකාරී ශ්‍රම බලකායට අයත් වන ප්‍රතිශතය 63.0%ක් වන අතර එය වයස අවුරුදු 18ත් 60ත් අතර ස්ත්‍රීන් හා පුරුෂයන් අතර බෙදී පවතී. මෙම කොටසේ වාසය කරන කුටුම්බ සාමාජිකයන්ගේ වයස් කාණ්ඩ, ස්ත්‍රී පුරුෂ භාවය අනුව වෙන් වෙන් වශයෙන් පහත වගුවේ දක්වා ඇත.

වගුව 3.10 : ව්‍යාපෘතියෙන් බලපෑමට ලක් වූ පවුල්වල ගෘහ මූලිකයන් අයත්වන වයස් කාණ්ඩ ස්ත්‍රී පුරුෂ භාවය අනුව

වයස් කාණ්ඩය (අවුරුදු)	**පුරුෂ**		**ස්ත්‍රී**		**මුළු ගණන**	
	පුද්ගලයන් ගණන	ප්‍රතිශතය	පුද්ගලයන් ගණන	ප්‍රතිශතය	පුද්ගලයන් ගණන	ප්‍රතිශතය
5 සහ ඊට අඩු	34	23	48	10.17	82	9.76
6 – 17	102	27.7	92	19.50	194	23.10
18-30	112	30.43	129	27.33	241	28.69
31-40	57	15.5	79	16.74	136	16.19
41-60	49	13.32	102	21.61	151	17.98
61-70	06	1.63	14	3.00	20	2.38
71 සහ ඊට වැඩි	08	2.17	08	2.00	16	1.90
එකතුව	368	100	472	100	840	100

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය (2017-2018)

3.4.2. විවාහක අවිවාහක භාවය

ව්‍යාපෘතියෙන් බලපෑමට ලක් වූ කුටුම්බවල සාමාජිකයන්ගෙන් 62.98%ක් විවාහක, 2.86%ක් වැන්දඹු සහ 0.6%ක් විවාහයෙන් වෙන් වූ පුද්ගලයන් වේ. මුළු ජනගහනයෙන් ප්‍රතිශතයක් ලෙස සැලකූ විට වැන්දඹු ජනගහනය 2.86%ක් වන අතර වැන්දඹු පුරුෂ ජනගහනයට වඩා වැන්දඹු කාන්තා ජනගහනය දෙගුණයක් වැඩිය. කැළණිවැලි දුම්රිය මාර්ගයේ පළමු අදියර හි 2 වන කොටසේ වාසය කරන කුටුම්බවල සාමාජිකයන්ගේ විවාහක අවිවාහක භාවය පහත 3.11 වගුවේ දැක්වේ.

වගුව 3.11 : ව්‍යාපෘතියෙන් බලපෑමට ලක් වූ කුටුම්බවල සාමාජිකයන්ගේ විවාහක අවිවාහක භාවය අනුව සිදු කරන විශ්ලේෂණය

විවාහක අවිවාහක බව	පුරුෂයන් ගණන	ප්‍රතිශතය	ස්ත්‍රීන් ගණන	ප්‍රතිශතය	මුළු ගණන	ප්‍රතිශතය
විවාහක	**219**	**59.51**	**310**	**65.68**	**529**	**62.98**
නීතියෙන් වෙන් වූ	**01**	**0.27**	**03**	**0.64**	**04**	**0.48**
වෙන් වූ	**04**	**1.09**	**1**	**0.21**	**5**	**0.60**
වැන්දඹු පුරුෂ/ ස්ත්‍රී	**07**	**1.90**	**17**	**3.60**	**24**	**2.86**
අදාළ නොවේ (පාසල් ළමුන් හා වෙනත්)	**137**	**37.23**	**141**	**29.87**	**278**	**33.10**
එකතුව	**368**	**100.0**	**472**	**100.0**	**840**	**100.0**

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය (2017-2018)

3.4.3. අධ්‍යාපන මට්ටම

ව්‍යාපෘතියෙන් බලපෑමට ලක් වූ කුටුම්බවල සාමාජිකයන්ගෙන් 57.50%ක් අ.පො.ස. (සා/පෙළ) දක්වා අධ්‍යාපනය ලබා ඇත. ආසන්න වශයෙන් 05%ක් සාක්ෂරතාවයෙන් තොර වන අතර අත්සන තැබීමට පවා නොදනී. මොවුන්ගෙන් 8%ක් අ.පො.ස. (උ/පෙළ) දක්වා හෝ විශ්ව විද්‍යාල මට්ටම දක්වා අධ්‍යාපනය ලබා ඇත. මෙම ව්‍යාපෘති ප්‍රදේශයට අයත්වන කුටුම්බවල සාමාජිකයන් වන පුරුෂයන්ගේ හා ස්ත්‍රීන්ගේ අධ්‍යාපන මට්ටම්වල විශ්ලේෂණයක් වගුව 3.12න් පෙන්වා ඇත. සංසන්දනාත්මකව සලකා බැලීමේදී පුරුෂයන්ට සාපේක්ෂව කාන්තාවන් වැඩි පිරිසක් උසස් අධ්‍යාපනය ලබා ඇත.

වගුව 3.12 : ව්‍යාපෘතියෙන් බලපෑමට ලක් වූ කුටුම්බවල සාමාජිකයන්ගේ අධ්‍යාපන පසුබිම, ස්ත්‍රී පුරුෂ භාවය අනුව

අධ්‍යාපනය	පුරුෂයන් ගණන	ප්‍රතිශතය	ස්ත්‍රීන් ගණන	ප්‍රතිශතය	මුළු පුද්ගලයන් ගණන	ප්‍රතිශතය
සාක්ෂරතාවය නොමැති විධිමත් අධ්‍යාපනයක් ලබා නොමැති	10	2.72	18	3.81	28	3.33
අත්සන තැබිය හැකි	5	1.36	7	1.48	12	1.43
පෙර පාසල්/ මූලික වසර	13	3.53	18	3.81	31	3.69
පස්වන ශ්‍රේණිය දක්වා	72	19.57	84	17.80	156	18.57
හයවන ශ්‍රේණියේ සිට අ.පො.ස. (සා/පෙළ) දක්වා	213	57.88	270	57.20	483	57.50
අ.පො.ස. (උ/පෙළ)	31	8.42	34	7.20	65	7.74
වෘත්තීය පුහුණු/ සහතිකපත් පාඨමාලා	1	0.27	1	0.21	2	0.24
අභ්‍යාසලාභී/ උපාධිධාරී	3	0.82	7	1.48	10	1.19
දත්ත නොමැති	20	5.43	33	6.99	53	6.31
එකතුව	**368**	**100**	**472**	**100**	**840**	**100**

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය (2017-2018)

3.4.4. වෘත්තීය රටාවන්

ප්‍රාථමික හා ද්විතියික වෘත්තීන් හි නියුතුව සිටින, ව්‍යාපෘතියෙන් බලපෑමට ලක්වන කුටුම්බ සාමාජිකයන්ගේ ආදායම් මූලාශ්‍ර වගුව 3.13න් පෙන්නුම් කරයි. මූලිකව, ප්‍රාථමික වෘත්තීයන් ඒවායේ සාමාන්‍ය ස්වභාවය සේම, පූර්ණ කාලීන සේවයේ නියුතු විය යුතු රැකියා වේ. ප්‍රධානම ආදායම් උත්පාදන මාර්ගය වනුයේ පුද්ගලික අංශයේ රැකියාවන් හි නියුතු වීම වේ. සමස්ථ සේවා නියුක්ති ජනගහනයෙන් 107ක් පමණ (12.74%ක්) පුද්ගලික අංශයේ සේවා නියුක්තියෙන් යුක්ත වේ. ආදායම් මාර්ග සැලකීමේදී දෙවන විශාලතම ආදායම් උත්පාදන මාර්ගය වනුයේ ස්වයං රැකියා නියුක්තියයි. එම ප්‍රමාණාත්මකව 11.07%කි. පුහුණු හා නුපුහුණු ශ්‍රමිකයන් වශයෙන් රැකියාවෙන් නියුක්ත ප්‍රමාණය 09.05%ක් වන අතර එය තෙවන ආදායම් උත්පාදන මාර්ගයයි. ස්වයං රැකියාවල නියුක්ත පුරුෂයන් ගණන එම රැකියාවල නියුතු කාන්තාවන් මෙන් දෙගුණයකි. ඔවුහු අසල පිහිටි නගර හා ප්‍රදේශවල සේවය කරති. සැලකිය යුතු සංඛ්‍යාවක් රජයේ රැකියාවලත්, විදේශ රැකියාවලත් නියුක්ත අතර එය පිළිවෙලින් 2.50%ක් හා 3.3% ක් වේ. පහත සඳහන් වගුවෙන් පෙන්නුම් කරන පරිදි සැලකිය යුතු පුද්ගලයන් ගණනක් විශේෂයෙන් කාන්තාවන්, විරැකියාවෙන් (23.45%) පෙළෙන අතර කාන්තා රැකියා වියුක්තිය පුරුෂයන් මෙන් හතර ගුණයකින් වැඩිය. ප්‍රාථමික ආදායම් මාර්ගවලට අමතරව ඇතැමෙක් ද්විතියික ආදායම් මාර්ගයක් වශයෙන්ද ස්වයං රැකියාවල නියුක්තව සිටී.

වගුව 3.13 : ව්‍යාපෘතියෙන් බලපෑමට ලක්වන කුටුම්බ සාමාජිකයන්ගේ වෘත්තීය රටාවන්

ආදායම් මූලාශ්‍රය	පුරුෂ	ප්‍රතිශතය	ස්ත්‍රී	ප්‍රතිශතය	මුළු ගණන	ප්‍රතිශතය
මූලික මූලාශ්‍ර						
වැටුප් ලබන රැකියා (රජයේ)	16	4.35	05	1.06	21	2.50
වැටුප් ලබන රැකියා (පුද්ගලික)	58	15.76	49	10.38	107	12.74
නුපුහුණු/ දෛනික වැටුප් ලබන/ කොන්ත්‍රාත් කම්කරු	51	13.86	25	5.30	76	9.05
ස්වයං රැකියා	48	13.04	45	9.53	93	11.07
විශ්‍රාම වැටුප් සහිත විශ්‍රාමික	01	0.27	00	-	01	0.12
විදේශ රැකියාවේ නියුතු	11	2.99	17	3.60	28	3.33
රැකියා විරහිත	37	10.05	160	33.9	197	23.45
ව්‍යාපාරික	06	1.63	00	-	06	0.71
නොමැති	140	38.04	171	36.23	311	37.02
එකතුව	**368**	**100.00**	**472**	**100.00**	**840**	**100.00**
ද්විතියික මූලාශ්‍ර						
කම්කරු වැඩ	0	-	03	42.86	03	
ගෙවල්/ කාමර කුලියට දීම	0	-	00	-	0	9.09
ස්වයං රැකියා	03	100	04	57.14	7	81.81
එකතුව	**03**	**100.00**	**07**	**100.00**	**10**	**100.0**

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය (2017-2018) (රැකියා කළ නොහැකි ශිෂ්‍යයන්, ළදරුවන් සහ වයස්ගත පුද්ගලයන්ට අදාළ නොවේ.)

ආදායම් මාර්ගවලට අමතරව, ආදායම් මාර්ගවලින් ආදායම් උත්පාදන මට්ටම වැඩි කර ගන්නා කෙසේද යන්න පිළිබඳවද අවධානය යොමු කරන ලදී. වගුව 3.13 මගින් ව්‍යාපෘතියෙන් බලපෑමට ලක් වූ සාමාන්‍ය මාසික ආදායම් මට්ටමෙහි ව්‍යාප්තිය සහ වියදම් මට්ටම්වල සාමාන්‍යය දක්වා ඇත. ඒ අනුව 34.51%ක මාසික ආදායම රු. 100,000/=ක් වන අතර 12.16%ක් මාසිකව රු. 100,000/=කට වඩා වැඩි ආදායමක් උපයයි. බලපෑමට ලක්වන කුටුම්බ සාමාජිකයන්ගෙන් බහුතරයක් (එනම් 45.1%ක්) රු. 15,000/= සිට රු. 50,000/= වන මධ්‍යම මට්ටමේ ආදායමක් උපයන අතර 6.66%ක ප්‍රමාණයක් රු. 15,000/=කටත් වඩා අඩු මාසික ආදායමක් උපයයි. ව්‍යාපෘතියෙන් බලපෑමට ලක්වන පුද්ගලයන් අතුරින් මෙම කාණ්ඩය දිළිඳු යන කොටසට වර්ගීකරණය කළ හැකිය.

3.5 දිළිඳු සහ අවදානම් මට්ටමේ තත්ත්වයන්

ව්‍යාපෘතියෙන් බලපෑමට ලක්වන කුටුම්බ අතුරින් කුටුම්බ 11ක් රජයේ සමෘද්ධි වැඩසටහන යටතේ ලබාදෙන සහනාධාර ලබන අතර තවත් කුටුම්බ 4ක් රජයෙන් ලබාදෙන වෙනත් සහනාධාර ලබයි. සමීක්ෂණ දත්ත වලට අනුව කාන්තා මූලික කුටුම්බ 52ක් පවතින අතර සත්‍ය වශයෙන්ම ආදායම් උත්පාදනය කරනු ලබන කාන්තා ගෘහ මූලිකයන් සිටිනුයේ 10 දෙනෙකු පමණි. වයස්ගත ගෘහ මූලිකයන් සහිත කුටුම්බ 39ක් පවතින අතර ඔවුන් සියලු දෙනා නිල වශයෙන් දක්වන ලද වයස්ගත වයස් කාණ්ඩය වන වයස අවුරුදු 60 ඉක්මවූවන් වේ. මෙම සංඛ්‍යාවෙන් සිය පවුල වෙනුවෙන් ආදායම් උපයන්නන්ගේ සංඛ්‍යාව 10 දෙනෙකු පමණි. සිදු කරන ලද සමීක්ෂණයට අනුව ගෘහ මූලිකයන් 09 දෙනෙකුගේ මාසික ආදායම රු. 4,038/=කට වඩා අඩුවන අතර එය නිල දරිද්‍රතා මට්ටමට වඩා අඩු අගයකි. (2016 මැයි මස නිර්වචනය කළ පරිදි)

වගුව 3.14 : ව්‍යාපෘතියෙන් බලපෑමට ලක් වූ කුටුම්බවල අවදානම් සහිත තත්ත්වයන්

දරිද්‍රතා තත්ත්වය	කුටුම්බ සංඛ්‍යාව
දරිද්‍රතා මට්ටමට වඩා අඩු	**09**
සමෘද්ධි සහනාධාර ලබන	**11**
වෙනත් සුබසාධන ලබන	**04**
ස්ත්‍රී මූලික කුටුම්බ	**10**
වයෝවෘධ ගෘහමූලික කුටුම්බ	**09**
එකතුව	**43**

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය (2017-2018)

ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක් වූ, අවදානම් තත්ත්වයේ සිටින පුද්ගලයන්ගේ තත්ත්වය වගුව 3.15 මගින් පෙන්නුම් කරයි. සමීක්ෂණයෙන් අනාවරණය වූ ආකාරයට මින් බහුතරය, එනම් පුද්ගලයන් 84 දෙනෙකු (68.29%) වයස්ගත පුද්ගලයන් වේ. අවදානම් තත්ත්වයේ පසුවන දෙවන කාණ්ඩය වනුයේ නිදන්ගත රෝගවලින් පෙළෙන්නන් වේ. එය සංඛ්‍යාත්මකව 19 දෙනෙකු වන අතර 13 දෙනෙකු (10.56%ක්) ආබාධිත සහ සුළු කොටසක් (5.69%) මානසික ආබාධ සහිත පුද්ගලයන් වේ. සංසන්දනාත්මකව කාන්තාවන්ට වඩා පුරුෂයන් වැඩි

සංඛ්‍යාවක් ආබාධිත සහ නිදන්ගත රෝගවලින් පෙළෙති. වයස්ගත පුද්ගලයන් සලකා බැලීමේදී, වයස්ගත කාන්තාවන් සංඛ්‍යාව වයස්ගත පුරුෂයන්ට වඩා වැඩි අගයකි.

වගුව 3.15 : ව්‍යාපෘතියෙන් බලපෑමට ලක් වූ කුටුම්බවල අවදානම් සහිත තත්ත්වයන්

අවදානම් ස්වභාවයේ වර්ගය	**පුරුෂ**	**ස්ත්‍රී**	**එකතුව**	**ප්‍රතිශතය**
වයෝවෘධ ස්වභාවය	36	48	84	68.29
ආබාධිත පුද්ගලයන් සහිත කුටුම්බ	08	5	13	10.56
නිදන්ගත රෝගවලින් පෙළෙන්නන්	11	08	19	15.44
මානසික ගැටළු සහිත පුද්ගලයන්	04	03	07	5.69
එකතුව	**59**	**64**	**123**	**100.00**

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය (2017-2018)

4 වන පරිච්ඡේදය - මහජන සාකච්ඡා/ උපදේශන

4.1 බලපෑමට ලක් වූ පුද්ගලයන් හා අනෙකුත් පාර්ශවකරුවන් සමඟ සාකච්ඡා /උපදේශන ක්‍රියාවලිය

සමාජ ආරක්ෂණ ප්‍රතිපත්ති තුළ වැඩි ප්‍රමුඛතාවයක් උපදේශන හා සහභාගීත්වයට හිමි වේ. මක්නිසාදයත් පුරවැසියන් ඊට දායක වීම හා ව්‍යාපෘති සැලැස්ම හා එය ක්‍රියාත්මක කිරීමෙහිලා ප්‍රජාවගේ අදහස් ඒකාබද්ධ කිරීම සහතික කළ හැකි වීම යි. එය නියෝජිතායතන, ක්‍රියාවට නංවන පුද්ගලයන්, ප්‍රතිපත්ති සම්පාදකයන්, ප්‍රතිලාභීන් සහ බලපෑමට ලක් වූ පුද්ගලයන් විසින් සිය අදහස් සාකච්ඡා කරන හා හුවමාරු කර ගන්නා ක්‍රියාවලියකි. ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක්වන කුටුම්බ 260ක් පමණ නාගරික සංවර්ධන අධිකාරියට අයත් මහල් නිවාසවල දැනට භාවිතා කළ හැකි නිවාස ඒකකවල ප්‍රතිස්ථානගත කිරීමේ හා ඊට තෝරා ගැනීමේ අරමුණින්, එක්සත් ජාතීන්ගේ මානව ජනාවාස වැඩසටහනේ සමීක්ෂණ කණ්ඩායම සහ ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ සමාජ ආරක්ෂණ කණ්ඩායම විසින් දේශපාලන බලධාරීන්, රාජ්‍ය නිලධාරින් සහ වනාතමුල්ල ග්‍රාම නිලධාරි කොට්ඨාශය තුළ ලොකෝ හංදියේ සිට සීවලි මාවත දිගේ 02 කොටසෙහි (Section 02) වෙසෙන ඉලක්කගත ප්‍රජාව වැනි පාර්ශවකරුවන් සමඟ මහජන සාකච්ඡා /උපදේශන පවත්වන ලදී.

දැනුවත් කිරීමේ වැඩසටහන් හා රැස්වීම්වල දී ව්‍යාපෘතිය පිළිබඳ කෙටි විස්තරයක් හා එහි ප්‍රතිලාභ, ව්‍යාපෘති සැලසුම්, වන්දි ගෙවීමේ හා නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලිය, ව්‍යාපෘති ක්‍රියාකාරකම් සහ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය සම්බන්ධ කරගත හැකි ඇමතුම් විස්තර ඇතුළත්ව ව්‍යාපෘති ප්‍රචාරක පත්‍රිකා සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් බෙදා හරින ලදී.

යෝජිත ව්‍යාපෘතියේ නැවත පදිංචි කිරීමේ වැඩසටහන පිළිබඳ තොරුතුරු අනාවරණය කිරීම හා ඒ පිළිබඳ ඔවුන්ගේ අදහස් හා ආකල්ප ලබා ගැනීමේ අරමුණින් බලපෑමට ලක් වූ කාන්තා හා පිරිමි යන දෙපාර්ශවය හා රාජ්‍ය නිලධාරීන් සමඟ ප්‍රජා උපදේශන රැස්වීම්, ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡා හා ප්‍රධාන තොරතුරු සපයන සම්මුඛ සාකච්ඡා යනාදී ආකාරවලින් මහජන සාකච්ඡා/ උපදේශන පවත්වන ලදී. ව්‍යාපෘතිය හා එහි ක්‍රියාකාරකම් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීමෙන් පසු ඔවුන්ට ඇති ප්‍රශ්න ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දී ඒ සඳහා පිළිතුරු සැපයීම සිදු කරන ලදී. තොරතුරු හුවමාරු කර ගැනීම, ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක් වූ පුද්ගලයන්ගේ හා අනෙකුත් පාර්ශවකරුවන්ගේ සාකච්ඡා /උපදේශන හා සහභාගිත්වය මඟින් නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරකම් සැලැස්මෙහි විනිවිදභාවය සුරැකි අතර එමඟින් ගැටුම් අඩු වී ව්‍යාපෘතිය ප්‍රමාද වීමේ අවදානම ද අවම කෙරිණි.

නැවත පදිංචි කිරීමේ බලපෑම් අවම කිරීමට හා එක් අතකින් ප්‍රතිලාභ උපරිම කිරීමට හා නැවත පදිංචි කිරීමේ වැඩ රාමුව සහ නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරකම් සැලැස්ම සකස් කිරීමේ දී සුදුසු ආරක්ෂණ පියවර කල්පනාකාරීව සැලසුම් කිරීම සඳහා ව්‍යාපෘති සැලැස්ම සංශෝධනය කිරීමට අර්ථවත් මහජන සාකච්ඡා / උපදේශන හරහා ලැබෙන ප්‍රතිපෝෂණ උපකාරී වේ. නැවත පදිංචි කිරීමේ වැඩ රාමුව සහ නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරකම් සැලැස්ම ජාතික භාෂාවලට (සිංහල හා දෙමළ) පරිවර්තනය කෙරෙන අතර නැවත පදිංචි කිරීමේ වැඩ රාමුව සහ නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරකම් සැලැස්ම ප්‍රසිද්ධ කෙරෙන බවට ව්‍යාපෘති කළමනාකරණ ඒකකය සහතික වනු

ඇත. ඒ අනුව පැවැති ප්‍රජා සාකච්ඡා / උපදේශන 04ක, ඉලක්ක කණ්ඩායම් සාකච්ඡා 04ක හා ප්‍රධාන තොරතුරු සපයන සම්මුඛ සාකච්ඡා 04ක සාරාංශය පහතින් දැක්වේ. ඒවායේ ඡායාරූප ඇමුණුම 06ලෙස මෙහි අමුණා ඇත.

297 වත්තේ දී පවත්වන ලද ප්‍රජා සාකච්ඡා /උපදේශන රැස්වීම (01)

පළමු ප්‍රජා සාකච්ඡා / උපදේශන රැස්වීම තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ,වනාතමුල්ල ග්‍රාම නිලධාරී කොට්ඨාශයට අයත් 297 , වත්තෙහි පදිංචි බලපෑමට ලක් වූ පවුල්වල / කුටුම්බවල සාමාජිකයන් සඳහා පවත්වන ලදී .එම රැස්වීම 2017 ජුනි මස 27වන දින ප.ව 00 .2 .සිට ප.ව 4.30 .දක්වා ධර්ම ශාලාවේදී පැවැත්විණි .

කැළණිවැලි දුම්රිය මාර්ගය දිගේ පිහිටි 297වත්ත හා එළමඩුව යන ප්‍රදේශවලින් පැමිණි අනවසර පදිංචිකරුවන් බහුතරයක් මෙම රැස්වීමට සහභාගී වූහ. එම ප්‍රදේශ දෙකෙන් පැමිණ සහභාගී වූ පිරිසට කාන්තාවන් 63ක් හා පිරිමි 48ක් ඇතුළත් විය. වනාතමුල්ල ග්‍රාම නිලධාරීවරයා විසින් සිදු කල සමාරම්භක කතාවේ දී සත්කාරක ප්‍රජාව වෙත කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතියේ (CSRP) නිලධාරීන් හඳුන්වා දීම සිදු කරන ලදී. එහිදී ඇය අනාගත කැළණිවැලි දුම්රිය මාර්ගය වැඩිදියුණු කිරීමේ කටයුතු පහසු කිරීම සඳහා නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලියට එම කුටුම්බවල සහභාගීත්වය හා සහයෝගය ලබා දෙන මෙන් ඉල්ලා සිටියාය. නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂකවරයා (සමාජ හා පරිසර ආරක්ෂණ) සහභාගී වූ පිරිස පිළිගත් අතර, කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය හා යෝජිත කැළණිවැලි දුම්රිය මාර්ගය වැඩි දියුණු කිරීමේ කටයුතු පිළිබඳ කෙටි හඳුන්වා දීමක් සිදු කරන ලදී. ඉන් අනතුරුව ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය යටතේ කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය විසින් සිදු කරනු ලබන එක්සත් ජාතීන්ගේ මානව ජනාවාස වැඩසටහනේ සමාජ ආර්ථික සමීක්ෂණය හා නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලිය පිළිබඳ කෙටි පැහැදිලි කිරීමක් සිදු කරන ලදී. ව්‍යාපෘතිය පිළිබඳ කරුණු ඉදිරිපත් කිරීමෙන් පසු යෝජිත නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලිය පිළිබඳ ඔවුනට ගැටළු තිබේ නම් ඒවා විමසීමට ජනතාවට අවස්ථාව ලබා දුනි. සාකච්ඡාවේ සාරාංශය 4.1 වගුවේ දැක්වේ.

වගුව 4.1: ප්‍රශ්න හා පිළිතුරුවල සාරාංශය

අනු අංකය	අදහස් හා ප්‍රශ්න	කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතියේ නිලධාරීන් / ග්‍රාම නිලධාරී ලබාදුන් පිළිතුරු	නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරි සැලැස්ම වෙත යොමු වන කරුණු
01	නැවත පදිංචි කිරීමේ විකල්ප ස්ථානය පිළිබඳ සහභාගී වුවත් බොහෝ සෙයින් සැලකිලිමත් වූහ. නාගරික සංවර්ධන අධිකාරියේ හේනමුල්ල නිවාස ව්‍යාපෘතිය , නැවත පදිංචි කිරීමේ විකල්ප ස්ථානය ලෙස යෝජනා කළ විට ඒ ආසන්න ප්‍රදේශයක වෙසෙන කණ්ඩායමක් හා මෙම ප්‍රජාව අතර, පෞද්ගලික ගැටුමක් පවතින බව හා 297 වත්තේ වෙසෙන සමහර පවුල්වලට ජීවිත තර්ජන ඇති බව	යෝජිත නාගරික සංවර්ධන අධිකාරයේ හේනමුල්ල නිවාස ව්‍යාපෘතිය වෙනුවට ඔවුන්ගේ වර්තමාන නේවාසික ස්ථානයට ආසන්න, නැවත පදිංචි කිරීමේ විකල්ප ස්ථානයක් සොයා බැලීමට සහතික විය. නැවත පදිංචි කිරීමේ අරමුණ වන්නේ ඔවුන්ගේ වර්තමාන ජීවන තත්ත්වය වඩාත් යහපත් තත්ත්වයකට ඉහළ නැංවීම බවට නිලධාරීහු අවධාරණය කළහ.	විකල්ප නැවත පදිංචි කිරීමේ ස්ථාන තෝරා ගැනීම.

	පවසමින් බහුතරයක් ඊට විරෝධය පෑහ.		
02	දැනට 297 වත්තේ එම ප්‍රජාව පොදු වැසිකිළි භාවිතා කරන අතර, ඒවා පදිංචිකරුවන්ට ප්‍රමාණවත් නොවේ.	සෑම නිවාස ඒකකයකටම එක් වැසිකිළිය බැගින් පවතින නව නිවාස සංකීර්ණයේ ජනතාව නැවත පදිංචි කිරීමෙන් පසු වැසිකිළි හිඟය සඳහා විසඳුමක් ලැබෙනු ඇත.	නැවත පදිංචි කිරීම මගින් බලපෑමට ලක් වූ පුද්ගලයන් හට වඩා යහපත් ජීවන තත්ත්වයක් හිමි වේ.
03	297 වත්තේ වෙසෙන කාන්තාවන් හා ළමුන් සම්බන්ධ ගැටළු පිළිබඳ සාකච්ඡා කිරීමට ප්‍රජා සංවිධානයක් හෝ වෙනත් අවස්ථාවක් නොමැත.	නැවත පදිංචි කිරීමෙන් පසු නව ප්‍රජා සංවිධාන පිහිටවනු ඇත. එහෙත් ප්‍රජාවන් අතරින් තෝරා ගන්නා පිරිසකගෙන් සමන්විත තාවකාලික නියෝජිත කමිටු පත් කෙරෙන අතර ව්‍යාපෘතිය ආරක්ෂණ නිලධාරීන් විසින් නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලියේ පහසුව සඳහා නායකයන් නම් කරනු ඇත.	තීරණ ගැනීම ඇතුළු නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලියට සහභාගී වීමට ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක් වන පුද්ගලයන් දිරිගැන්වීම.
04	අපගේ පදිංචි ස්ථානවලින් යෝජිත නාගරික සංවර්ධන අධිකාරියේ නිවාස සංකීර්ණය වෙත යාමේ දී අපට ඒ සම්බන්ධයෙන් ප්‍රශ්න ගැටළු ඇතිවිය හැකිය. එවිට පැමිණිලි කරන්නේ කෙසේ ද? අපගේ ප්‍රශ්න විසඳා ගැනීමට අප හමු විය යුත්තේ කවුරුන් ද?	අපගේ ආරක්ෂණ නිලධාරීන් ඔබේ ප්‍රශ්නවලට පිළිතුරු දීමට හා ගැටළු නිරාකරණය කර දීමට සූදානමින් සිටී. ඊට අමතරව, ව්‍යාපෘතිය තුල "දුක් ගැනවිලි සඳහා සහන සැලසීමේ යාන්ත්‍රණය" ඔබේ ගැටළු විසඳීම සඳහා පිහිටුවනු ඇති අතර ඒ පිළිබඳ විස්තර පසුව ඔබට දැනුම් දෙනු ඇත.	"දුක් ගැනවිලි සඳහා සහන සැලසීමේ යාන්ත්‍රණය" බලපෑමට ලක් වූ පුද්ගලයන් හට නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලිය තුල ඔවුන්ගේ ගැටළු විසඳා ගැනීම සඳහා පිහිටවනු ඇත.

297 වත්තේ දී පවත්වන ලද මහජන සාකච්ඡා/ උපදේශන රැස්වීම (02)

දෙවන ප්‍රජා සාකච්ඡා/ උපදේශන රැස්වීම තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, වනාතමුල්ල ග්‍රාම නිලධාරී කොට්ඨාශයට අයත්, 297 වත්තෙහි පදිංචි බලපෑමට ලක් වූ ප්‍රජාවන්හි සාමාජිකයන් සඳහා පවත්වන ලදී. එම රැස්වීම 2017 ජූලි මස 21 වන දින ප.ව. 3.00 සිට ප.ව. 5.00 දක්වා වනාතමුල්ල ධර්ම ශාලාවේ දී පැවැත්විණි. කැළණිවැලි දුම්රිය මාර්ගය දිගේ පිහිටි 297 වත්තේ හා එළමඩුව යන ප්‍රදේශවල වෙසෙන අනවසරයෙන් පදිංචි කුටුම්බ සාමාජිකයින් එම රැස්වීමට සහභාගි වූ අතර කාන්තාවන් 48ක් හා පිරිමි 40ක් සහභාගිවූවන් අතර විය.

ප්‍රධාන වශයෙන්ම එම ප්‍රජාව වෙත, කැළණිවැලි දුම්රිය මාර්ගය දිගේ II වන කොටසේ සිය නේවාසික පදිංචිය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලේඛන පිළිබඳ දැනුවත් කිරීම සඳහා එම රැස්වීම පවත්වන ලදී. එහිදී සමාජ ආරක්ෂණ විශේෂඥවරයා සියලු සහභාගිවූවන් පිළිගත් අතර කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතියේ යෝජිත හිමිකම් ගෙවීමේ ක්‍රමවේදයට අනුව වන්දි සඳහා සුදුසුකම් ලැබීමට ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක්වන පුද්ගලයන් හඳුනා ගැනීමේ ක්‍රියාවලිය හඳුන්වා දෙන ලදී. නිවාසවල පදිංචිය ඔප්පු කිරීමට අවශ්‍ය ලේඛනවල ලැයිස්තුව දැන්වීම් පුවරුවක් මඟින් ප්‍රදර්ශනය කළ අතර එය සහභාගිවූවන්ට පැහැදිලි කර දුනි. ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක් වූ

පුද්ගලයන්, ව්‍යාපෘතිය විසින් ප්‍රකාශ කරන ලද අවසන් දිනයට පෙර එම නිවෙස්වල පදිංචිව සිටි බවට ඔවුන් ඉදිරිපත් කළ යුතු සියලු ලේඛන මඟින් ඔප්පු විය යුතු බව එහි දී අවධාරණය කරන ලදී. ගෘහමූලිකයන්ගේ හැඳුනුම්පත්වල පිටපත්, ඔවුන්ගේ වර්තමාන නිවසේ පදිංචිය තහවුරු කරන ග්‍රාම නිලධාරි සහතික හා ඡන්ද හිමි නාම ලේඛන, විදුලි/ ජල බිල්පත් සහ හෝ උප්පැන්න, මරණ සහතික හා ළමුන්ගේ සෞඛ්‍ය කාඩ්පත් ආදි වූ වෙනත් ඕනෑම වලංගු ලේඛන මෙම ලැයිස්තුවට අන්තර්ගත විය. ඉන් අනතුරුව නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලියට අදාළ ගැටලු සම්බන්ධයෙන් ප්‍රශ්න ඇසීමට ජනතාවට අවස්ථාව ලබා දුනි.

වගුව 4.2: ප්‍රශ්න හා පිළිතුරුවල සාරාංශය

අනු අංකය	අදහස් හා ප්‍රශ්න	කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතියේ නිලධාරීන් ලබාදුන් පිළිතුරු	නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම වෙත යොමු වන කරුණු
01	එම ප්‍රජාවේ සාමාජිකයන් සිය නේවාසික පදිංචිය ඔප්පු කිරීමට අවශ්‍ය වඩාත් වැදගත් ලේඛන කවරේද යන්න දැන ගැනීමට බොහෝ සෙයින් උනන්දු වූහ.	වඩාත් වැදගත් ලේඛන වන්නේ, වර්තමාන ලිපිනයේ ලියාපදිංචි පවුලේ සාමාජිකයන්ගේ නම් ඇතුළත් ඡන්ද හිමි නාම ලේඛනය සහ පදිංචිය ඔප්පු කිරීම සඳහා ග්‍රාම සේවා සහතිකයයි. අවශ්‍ය අනෙකුත් ලේඛන වන්නේ ගෘහ මූලිකයාගේ හැඳුනුම්පත, උප්පැන්න සහතිකය, විවාහ සහතිකය, විදුලිය, ජලය, දුරකථන බිල්පත්, කොළඹ නගර සභාවේ වරිපනම් ලදුපත්, ළමුන්ගේ සෞඛ්‍ය කාඩ්පත්, බැංකු පාස් පොත් ආදියේ පිටපත්. මෙම සියලු ලේඛන මඟින් කැළණිවැලි දුම්රිය මාර්ගයේ II කොටස සඳහා ප්‍රකාශ කරන ලද අවසන් දිනය වූ 2007අගෝස්තු 14 දිනට පෙර පවුලේ සාමාජිකයන්ගේ පදිංචිය තහවුරු විය යුතුය.	පුද්ගලයෙකුගේ අනන්‍යතාවය පරීක්ෂා කිරීම සඳහා, එම පුද්ගලයා එම ලිපිනය යටතේ ම ඡන්දදායක ලැයිස්තුවේ ලියාපදිංචි වී ඇද්ද යන්න පරීක්ෂා කිරීම සඳහා සහ ඔහුගේ / ඇයගේ වර්තමාන ලිපිනයේ පදිංචිය ඔප්පු කිරීම සඳහා
02	ලේඛනවල පවතින නම්වල හා ලිපිනයන්හි වූ වෙනස්කම් නිවැරදි කරන්නේ කෙසේද, එසේ නොමැතිව පවතින ආකාරයෙන්ම ඉදිරිපත් කළහොත් එම ලේඛන වලංගු වන්නේද ?	ලේඛනවල පවතින දෝෂ සඳහා දිවුරුම් ප්‍රකාශ ඉදිරිපත් කිරීම මඟින් පවතින අඩුපාඩු නිවැරදි කළ හැකි ය.	
03	පදිංචිය තහවුරු කිරීමට කිසිදු ලේඛනයක් නොමැති නම් කුමක් කළ යුතුද?	ව්‍යාපෘති කළමනාකරණ ඒකකය ලබා දුන් ලැයිස්තුවට අනුව පදිංචිය තහවුරු කළ හැකි වෙනත් අදාළ ලේඛන ග්‍රාම සේවා සහතිකයක් සමඟ ඉදිරිපත් කිරීම. ඔවුන් සුදුසුකම් නොලබන මුත් මෙම ගැටලුව වෙනුවෙන් ව්‍යාපෘතිය විසින් පිහිටුවනු ලබන "දුක් ගැනවිලි සඳහා සහන සැලසීමේ කමිටුව" වෙත ඔවුන්ට අභියාචනයක් ඉදිරිපත් කළ හැකි ය.	"දුක් ගැනවිලි සඳහා සහන සැලසීමේ යාන්ත්‍රණය" හරහා ඊට සුදුසු යාන්ත්‍රණයක් පිහිටුවිය යුතු ය.

297 වත්තේ දී පවත්වන ලද මහජන /සාකච්ඡා /උපදේශන රැස්වීම **(03)**

තෙවන ප්‍රජා සාකච්ඡා /උපදේශන රැස්වීම කැළණිවැලි දුම්රිය මාර්ගය දිගේ පිහිටි 297 වත්තේ හා එළුමඩුවේ අනවසරයෙන් පදිංචි කුටුම්බ සඳහා පවත්වන ලදී. එම රැස්වීම 2018 ඔක්තෝම්බර් මස 17 වන දින පව. 2.00 සිට ප.ව. 4.00 දක්වා තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, වනාතමුල්ල ග්‍රාම නිලධාරී කොට්ඨාශයට අයත් වනාතමුල්ල ධර්ම ශාලාවේ දී පැවැත්විණි. එම රැස්වීම සඳහා කාන්තාවන් 54ක් හා පිරිමි 52ක් සහභාගි වූහ. සමාජ හා පරිසර ආරක්ෂණ අංශයට අයත් කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතියේ නිලධාරින් හා DOHWA ආයතනයේ උපදේශකවරු විසින් රැස්වීම පවත්වන ලදී .

එම රැස්වීමේ අරමුණ වූයේ නැවත පදිංචි කිරීමේ ස්ථාන හා නැවත පදිංචි කිරීම ක්‍රියාත්මක කිරීමේ අපේක්ෂිත කාල රාමුව ආදී වෙනත් අදාළ තොරතුරු පිළිබඳ පදිංචිකරුවන් දැනුවත් කිරීම යි. තව ද යෝජිත නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලිය හෝ යෝජිත නිවාස යෝජනා ක්‍රම හා සම්බන්ධ ගැටලු වේ නම් ඒවා ඉදිරිපත් කිරීමට ජනතාවට අවස්ථාව ලබා දුනි.

නියෝජ්‍ය අධ්‍යක්ෂ (පරිසර හා සමාජ ආරක්ෂණ අංශය) සහභාගිවූවන් පිළිගත් අතර සංවර්ධන කාර්යයට අදාළ යෝජිත අවසන් පෙළ ගැස්ම හා ක්‍රියාකාරකම් පිළිබඳ පැහැදිලි කළේය. ඉන් අනතුරුව යෝජිත නාගරික සංවර්ධන අධිකාරියේ නිවාස යෝජනා ක්‍රම, ඒවා පිහිටි ස්ථාන හා එක් එක් නිවාස යෝජනා ක්‍රමයේ දැනට ඉඩ ඇති නිවාස ඒකක හා යටිතල පහසුකම් පිළිබඳ තොරුතුරු ප්‍රජාවට විස්තර කරන ලදී.

4.3 වගුව : ප්‍රශ්න හා පිළිතුරුවල සාරාංශය

අනු අංකය	අදහස් හා ප්‍රශ්න	කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතියේ නිලධාරීන් ලබාදුන් පිළිතුරු	නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරි සැලැස්ම වෙත යොමු වන කරුණු
01	ඔවුන් ඉඩ ඇති සියලු නිවාස යෝජනා ක්‍රමවල තොරතුරු, වර්තමාන පදිංචි ස්ථානයේ සිට ඊට ඇති දුර, ගෙබිම් වර්ග ප්‍රමාණය හා අනෙකුත් පහසුකම් පිළිබඳ විමසූහ. ඔවුන්ගේ වර්තමාන පදිංචි ස්ථානයට සමීප පෙදෙසකින් විකල්ප නිවාස ක්‍රම තෝරා ගැනීම හේතුවෙන් ඔවුන්ගේ එදිනෙදා කටයුතුවලට හෝ දරුවන්ගේ පාසල් ගමනට ඉන් බාධාවක් නොවන හෙයින් ඒ පිළිබඳ සහභාගි වූවන් සතුටු වූහ.	තෝරාගත් නාගරික සංවර්ධන අධිකාරියේ නිවාස යෝජනා ක්‍රම තුනම මෙම ප්‍රජාවට කිමී. 0.5 – 2.00 අතර දුරින් පිහිටා තිබේ. (ලක්හිරු සෙවණ = වර්ග අඩි 400 සියපත් සෙවණ = වර්ග අඩි 500 මෙත්සර උයන = වර්ග අඩි 400) සියලුම නිවාස ඒකක වෙන් වෙන් වශයෙන් ජල සැපයුම, විදුලි සම්බන්ධතා හා සනීපාරක්ෂක පහසුකම්වලින් සමන්විත වේ.	නැවත පදිංචි කිරීම සඳහා වෙන් කරන ලද නිවාස යෝජනා ක්‍රම හා නිවාස ඒකක බැලීමට යෑමට අවස්ථාව ප්‍රජාව වෙත ලබා දුනි.
02	එකම නිවසේ වෙසෙන උප පවුල් ඒකක සහිත කුටුම්බ සඳහා ඇති විකල්ප කවරේ ද ?	පොදු නිර්ණායකයක් යටතේ ප්‍රදේශයේ වෙසෙන උප පවුල් ඒකක හඳුනා ගැනීම දුෂ්කර ය .එහෙයින් වැඩි සමාජික	අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් පසු ලකුණු

		සංඛ්‍යාවක් සිටින පවුල් සඳහා විසඳුමක් ලබා දීමට ලකුණු ක්‍රමයක් සකස් කිරීමට ව්‍යාපෘතිය යෝජනා කරන ලදී.	ක්‍රමය හා සුදුසු නිවාස ඒකක පිළිබඳ ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක් වූ පුද්ගලයන් දැනුවත් කළ යුතුය.
03	සමහර නිවෙස්වල ඔවුන් ස්වයං රැකියා කටයුතුවල නිරත වේ; එම ස්වයං රැකියා කටයුතුවල නිරත වීමට නාගරික සංවර්ධන අධිකාරියේ නිවාස යෝජනා ක්‍රමවල පවතින අවස්ථා කවරේ ද ?	ජීවනෝපාය ප්‍රතිෂ්ඨාපන වැඩසටහන් හරහා නිවාස මූලික ස්වයං රැකියා සඳහා වැඩසටහන් හඳුන්වා දෙනු ලැබේ.	ප්‍රතිස්ථානගත කිරීමට පෙර ජීවනෝපාය ප්‍රතිෂ්ඨාපන වැඩසටහන් ආරම්භ කළ යුතු ය.
04	නාගරික සංවර්ධන අධිකාරියේ මහල් නිවාස ක්‍රම තුළ දරුවන්ගේ හා කාන්තාවන්ගේ පරිස්සම හා ආරක්ෂාව තහවුරු කරන්නේ කෙසේ ද ?	දරුවන්ගේ හා කාන්තාවන්ගේ පරිස්සම හා ආරක්ෂාව තර කිරීම සඳහා ප්‍රජාව වෙත නව පරිසරයට හැඩ ගැසීම සඳහා උපදේශන වැඩසටහන් පවත්වනු ලැබේ.	නැවත පදිංචි කිරීමට පෙර නව පරිසරයට හැඩ ගැසීම සඳහා වන උපදේශන වැඩසටහන් නිමා කළ යුතු ය.
05	අපගේ පදිංචි ස්ථානවලින් නව ස්ථානයකට ගිය පසු අපට විවිධාකාරයේ ප්‍රශ්න හා ගැටලු මතු විය හැකි ය .එවිට ඒ පිළිබඳ අප විමසන්නේ කවුරුන්ගෙන් ද, හමුවිය යුත්තේ කවුරුන් ද?	ප්‍රචාරක පත්‍රිකාවේ සඳහන් පරිදි ඔබගේ ගැටළු ව්‍යාපෘති අධ්‍යක්ෂක වෙත යොමු කළ හැකි ය. ජනතාවගේ පහසුව සඳහා "දුක් ගැනවිලි සඳහා සහන සැලසීමේ යාන්ත්‍රණය" පිහිටුවනු ලබන අතර ගැටලු ඉදිරිපත් කිරීම පිණිස "යෝජනා" බහාලීම සඳහා පෙට්ටි ප්‍රදේශයේ තැන්පත් කරනු ඇත.	විශේෂයෙන් සිය ගැටලුවලට විසඳුම් වඩාත් ඉක්මනින් හා විනිවිද භාවයෙන් යුතුව ලබා ගැනීම පහසු කිරීම සඳහා නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්මෙ හි "දුක් ගැනවිලි සඳහා සහන සැලසීමේ යාන්ත්‍රණය" සකස් කෙරෙනු ඇත.

සීවලි පටුමග බී කොටසේ පවත්වන ලද මහජන /සාකච්ඡා /උපදේශන රැස්වීම (04)

බේස් ලයින් මාවතේ සිට සීවලි පටුමග දක්වා කැළණිවැලි දුම්රිය මාර්ගයේ දෙපස ඒ සඳහා වෙන් කළ මාර්ගය දිගේ වනාතමුල්ලේ සීවලිපුර බී කොටසේ වෙසෙන අනවසර නිවැසියන්, ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ ඔප්පු හිමියන් හා කුටුම්බ කාඩ්පත් හිමියන් සඳහා මෙම ප්‍රජා සාකච්ඡා / උපදේශන රැස්වීම පවත්වන ලදී. මෙම රැස්වීම 2018 දෙසැම්බර් මස 02 වන දින පෙ.ව. 10.00 සිට ප.ව. 12.30 දක්වා තිඹිරිගස්යාය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයට අයත් වනාතමුල්ල ග්‍රාම නිලධාරි වසමේ සීවලීපුර Block B හි පිහිටි ප්‍රවේශ මාර්ගයක වූ හන්දියක පවත්වන ලදී. ඊට කාන්තාවන් 88ක් හා පිරිමි 102ක් සහභාගි වූහ.

නියෝජ්‍ය අධ්‍යක්ෂක (පරිසර හා සමාජ ආරක්ෂණ අංශය) සහභාගීවූවන් පිළිගත් අතර, කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතියේ නිලධාරින් ප්‍රජාවට හඳුන්වා දී, කැළණිවැලි දුම්රිය මාර්ග වැඩිදියුණු කිරීමේ කටයුතු යටතේ යෝජිත බේස්ලයින් දුම්රිය ස්ථානයේ සංවර්ධන කටයුතුවල ප්‍රගතිය පිළිබඳ තොරතුරු කෙටියෙන් පැහැදිලි කළේ ය. එක්සත් ජාතීන්ගේ මානව ජනාවාස වැඩසටහන විසින් පවත්වන ලද සමාජ ආර්ථික සමීක්ෂණය සහ කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය මඟින් සිදුකරනු ලබන නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලිය පිළිබඳ පැහැදිලි කිරීමක් සිදු කරන ලදී. කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතියේ නිලධාරින් ප්‍රජාවෙන් නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලිය සඳහා ඔවුන්ගේ සහයෝගය ලබා දෙන මෙන් හා ඒ හරහා අනාගත කැළණිවැලි දුම්රිය මාර්ග වැඩිදියුණු කිරීමේ කටයුතුවලට මං සලසන ලෙසට ඉල්ලා සිටියහ. සිය ප්‍රජාව සම්බන්ධයෙන් යෝජිත නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලිය පිළිබඳ ජනතාව ප්‍රශ්න නැඟුහ.

4.4 වගුව : ප්‍රශ්න හා පිළිතුරුවල සාරාංශය

අනු අංකය	අදහස් හා ප්‍රශ්න	කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතියේ නිලධාරීන් ලබාදුන් පිළිතුරු	නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරි සැලැස්ම වෙත යොමු වන කරුණු
01	නිවාසවලින් ඉවත් කිරීම හා යෝජිත නිවාස ක්‍රමවල නැවත පදිංචි කිරීම සඳහා වන කාල රාමුව කුමක්ද?	බොහෝ විට 2019ජුනි මසට පෙර. කෙසේ නමුත් නිවෙස්වලින් ඉවත් කිරීමට පෙර සියලු පදිංචිකරුවන්ට පූර්ව දැනුම්දීමක් සිදු කරනු ඇත.	බලපෑමට ලක් වූ පාර්ශවයන් වෙත නැවත පදිංචි කිරීමේ කාල සීමාවන් පිළිබඳ දැනුවත්භාවය ඇති කිරීම හා තොරතුරු අනාවරණය කිරීම
02	නිවාස යෝජනා ක්‍රමවලින් විකල්ප නිවාස ඒකකයක් සැපයීම සඳහා කිසියම් ගෙවීමක් කළ යුතු ද ?	ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක් වන නිවාස සඳහා හිමි වන නිවාස ඒකක සැපයීම නොමිලේ සිදු කෙරේ.	අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලද විගස බලපෑමට ලක් වූ පාර්ශව වෙත හිමිකම් ගෙවීමේ ක්‍රමවේදය දේශීය භාෂාවෙන් අනාවරණය කළ යුතු ය.
03	ජාතික නිවාස සංවර්ධන අධිකාරිය නියමානුකූල කළ නිවාස කිසියම් වන්දි ක්‍රමයකට හිමිකම් ලබයිද ?	නිවසේ වටිනාකම අඩු කොට ඉඩම හා ඉදිකිරීම් සඳහා වන්දියක් ඔප්පු හිමියන් හට ගෙවනු ඇත .මෙම පහසුකම ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මඟින් නියමානුකූල කළ කුටුම්බ කාඩ්පත් හිමියන්ට ද ලබා දීමට සාකච්ඡා කෙරේ.	දුම්රිය මාර්ගයේ දෙපස ඒ සඳහා වෙන් කළ මාර්ගයෙහි බලපෑමට ලක් වූ නිවාස සහ ඉඩම් සඳහා වන්දි ගෙවීම
04	බලපෑමට ලක්වන නිවාස සඳහා ලබා දීමට යෝජිත නිවාස ඒකකවල ගෙබිම් වර්ග ප්‍රමාණය, උප පවුල් ඒකක හා ජීවත් වීමට	අතිරේක නිවාස ඒකක ලබා දීම සඳහා පවුලේ ප්‍රමාණය හා දැනට පදිංචි ගෙබිම් වර්ග ප්‍රමාණය මත පදනම් වූ ලකුණු	හිමිකම් ගෙවීමේ ක්‍රමවේදය මඟින් මෙම ගැටලුව විසඳනු ඇත.

	ප්‍රමාණවත් නොවන හෙයින් ව්‍යාපෘතිය මඟින් මෙම ගැටලුව විසඳීමට සැලසුම් කොට ඇත්තේ කෙසේ ද?	ක්‍රමයක් හඳුන්වා දෙනු ලැබේ.	
05	කඩහිමියන් වන්දි ලැබීමට හිමිකම් ලබයි ද ?	ඔව් ,හිමිකම් ගෙවීමේ ක්‍රමවේදයෙහි සඳහන් කාල සීමාව සලකා ආදායම් අහිමි වීම වෙනුවෙන් ගෙවීමක් සිදු කරනු ඇත. නේවාසික හා වාණිජ ඒකාබද්ධ නිවාස හිමියන්හට ඔවුන්ගේ ව්‍යාපාර පවත්වා ගෙන යාම සඳහා නිවාස යෝජනා ක්‍රමයේ පහත මහල්වල නිවසක් හිමි වනු ඇත.	දුම්රිය මාර්ගයේ දෙපස ඒ සඳහා වෙන් කළ මාර්ගය තුළ බලපෑමට ලක් වූ කඩ හිමියන්ට හා ආදායම් ප්‍රතිෂ්ඨාපනය වෙනුවෙන් වන්දි ගෙවීම. අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් පසු බලපෑමට ලක් වූ කඩහිමියන්ට හිමිකම් ගෙවීමේ ක්‍රමවේදය අනාවරණය කිරීම.
06	නැවත පදිංචි කිරීමෙන් පසු ළමුන්ට පාසල් ලබා ගැනීම සඳහා වර්තමාන පදිංචි ස්ථානයේ ලිපිනය භාවිතා කිරීමට හැකියාවක් පවතී ද ?	අධ්‍යාපන දෙපාර්තමේන්තුව සම්බන්ධීකරණය කොට ඒ සඳහා විධිවිධාන සැලසීමට උත්සාහ කරන්නෙමු.	
07	අපගේ ජනතාව නැවත පදිංචි කිරීමේ දී ඇති වන ගැටලුවල දී විසඳුමක් ලබා ගැනීමට එම ගැටලු යොමු කළ හැක්කේ කවුරුන් හට ද ?	එම දුක්ගැනවිලි අපගේ ව්‍යාපෘති අධ්‍යක්ෂක වෙත ආරක්ෂණ නිලධාරින් හරහා වාචිකව ද ,ඔබට ලබා දුන් ප්‍රචාරක පත්‍රිකාවේ සඳහන් ලිපිනය මඟින් ලිඛිතව ද යොමු කළ හැකි ය .ඊට අමතරව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හේතුවෙන් මතු වන නොවිසඳුනු ගැටලු සඳහා විසඳුම් ලබා ගැනීමේ පහසුව සඳහා "දුක් ගැනවිලි සඳහා සහන සැලසීමේ යාන්ත්‍රණය" පිහිටුවනු ඇත.	කැළණිවැලි දුම්රිය මාර්ගයේ එම කොටසට ගැළපෙන පරිදි වඩාත් පහසුවෙන් විසඳුම් ලබා ගැනීම සඳහා "දුක් ගැනවිලි සඳහා සහන සැලසීමේ යාන්ත්‍රණය" පිහිටවනු ඇත. මෙම යාන්ත්‍රණය පිළිබඳ නැවත පදංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්මට විශේෂ පරිච්ඡේදයක් ඇතුළත් කෙරෙනු ඇත.

තිඹිරිගස්යාය ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ දී පවත්වන ලද ප්‍රජා සාකච්ඡා උපදේශන රැස්වීම (05)

තිඹිරිගස්යාය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය තුළ කැළණිවැලි දුම්රිය මාර්ගයේ දෙපස ඒ සඳහා වෙන් කළ මාර්ගය තුළ වෙසෙන බලපෑමට ලක් වූ පුද්ගලයන් හට වන්දි ගෙවීම සඳහා වූ හිමිකම් ගෙවීමේ ක්‍රමවේදයේ කෙටුම්පතෙහි අන්තර්ගතය පිළිබඳ ජනතාව දැනුවත් කිරීම උදෙසා එක්සත් ජාතීන්ගේ මානව ජනාවාස වැඩසටහනේ කණ්ඩායම විසින් මෙම රැස්වීම සංවිධානය කරන ලදී. එය එක්සත් ජාතීන්ගේ මානව ජනාවාස වැඩසටහනේ කණ්ඩායම් නායක හා නැවත පදිංචි කිරීමේ ප්‍රවීණයෙන්, සහකාර ව්‍යාපෘති අධ්‍යක්ෂක (සමාජ ආරක්ෂණ) කොළඹ තදාසන්න

දුම්රිය ව්‍යාපෘතිය, සහකාර ප්‍රාදේශීය ලේකම් තිඹිරිගස්යාය යන අයගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි. ඊට සහභාගිවූවන් අතර තෝරාගත් ප්‍රජා නායකයන්, බලපෑමට ලක් වූ නිවෙස්වල කාන්තාවන් හා පිරිමින්, එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය නියෝජනය කරන බස්නාහිර පළාත් සභාවේ හා කොළඹ නගර සභාවේ දේශපාලන අධිකාරීන් වූහ. එම රැස්වීම 2018 සැප්තැම්බර් මස 10 වන දින පෙ.ව. 10.00 සිට ප.ව. 12.30 දක්වා පැවැත්විණි.

පළමුව, සහකාර ප්‍රාදේශීය ලේකම් සහභාගිවූවන් පිළිගෙන, මෙම දුම්රිය මාර්ගය වැඩි දියුණු කිරීමේ ජාතික වැඩසටහනට සහයෝගය ලබා දෙන ලෙස හා නව නිවාස ඒකක හරහා ඔවුන්ගේ ජීවන තත්ත්වයන් ඉහළ නංවා ගැනීමට ලැබෙන ප්‍රතිලාභ ලබා ගන්නා ලෙස සහභාගි වූවන්ගේ ඉල්ලා සිටියේ ය. දෙවනුව එක්සත් ජාතීන්ගේ මානව ජනාවාස වැඩසටහනේ කණ්ඩායම් නායක රැස්වීමේ අරමුණු පැහැදිළි කොට යෝජිත හිමිකම් ගෙවීමේ ක්‍රමවේදය සඳහා ඔවුන්ගේ අදහස් හා විකල්ප යෝජනා ලබා දෙන මෙන් ඉල්ලා සිටියේ ය. ඉන් අනතුරුව, කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතියෙහි සහකාර ව්‍යාපෘති අධ්‍යක්ෂක මූලික ව්‍යාපෘති සංරචක හා එහි ජාතික වැදගත්කම පිළිබඳ කෙටි හඳුන්වාදීමක් සමඟ පවර්පොයින්ට් ඉදිරිපත් කිරීමක් සිදුකොට කැළණිවැලි දුම්රිය මාර්ගයේ දෙපස ඒ සඳහා වෙන් කළ මාර්ගය තුළ වෙසෙන බලපෑමට ලක් වූ පාර්ශව වෙත හිමි වන්දි විකල්පයන් පිළිබඳ යෝජනා කළේය.

එම ඉදිරිපත් කිරීමෙන් අනතුරුව, ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක් වූ පුද්ගලයන් හට ඔවුන් අයත් වන කාණ්ඩය අනුව වන්දි ගෙවන ආකාරය / ඒ සඳහා ඇති විකල්ප පිළිබඳ ඔවුන්ගේ අදහස් හා යෝජනා පළ කිරීමට සහභාගිවූවන් හට අවස්ථාව ලබා දුනි. එම සාකච්ඡාවේ සාරාංශය 4.5 වගුවෙහි දැක්වේ.

4.5 වගුව: ප්‍රශ්න හා පිළිතුරුවල සාරාංශය

අනු අංකය	අදහස් හා ප්‍රශ්න	කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතියේ /එක්සත් ජාතීන්ගේ නිලධාරීන් ලබාදුන් පිළිතුරු	නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම වෙත යොමු වන කරුණු
01	අප නැවත පදිංචි කිරීම සඳහා වන නිවාස යෝජනා ක්‍රම පිහිටා ඇත්තේ කොහි ද ?	හිමිකම් ලබන ඔබ සියලු දෙනා කි.මී. 2ක දුර සීමාව තුළ ප්‍රතිස්ථානගත කෙරෙනු ඇත. නාගරික සංවර්ධන අධිකාරියේ සියලුම නිවාස යෝජනා ක්‍රම මෙම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කැළණිවැලි දුම්රිය මාර්ගයේ බලපෑමට ලක් වන ප්‍රජාවන්ට ආසන්නයෙන් පිහිටා ඇත.	ආසියානු සංවර්ධන බැංකුවේ ආරක්ෂණ ප්‍රතිපත්ති හා ස්වකැමැත්තෙන් තොරව අවතැන්වූවන් නැවත පදිංචි කිරීමේ ජාතික ප්‍රතිපත්තියේ මාර්ගෝපදේශ අනුව බලපෑමට ලක් වන පුද්ගලයන්ගේ සමාජයීය හා ආර්ථික කටයුතුවලට බලපෑමක් ඇති නොවන ලෙස, නැවත පදිංචි කිරීම ඊට ආසන්නතම ස්ථානයක සිදු කෙරෙනු ඇත.

02	අපට ලැබෙන විකල්ප නිවාස ඒකකවල ගෙබිම් වර්ග ප්‍රමාණය කොපමණ ද ? වර්ග අඩි 400ක නිවෙස්වලට යාමට අප කැමති නැත.	වර්ග අඩි 400 හා වර්ග අඩි 500 ලෙස ප්‍රමාණයන් දෙකකින් යුත් නිවාස ඒකක ඇත. බලපෑමට ලක් වූ නිවැසියන්ගෙන් බහුතරයක් දැනට වර්ග අඩි 400ට අඩු නිවාසවල ජීවත් වේ. ඊට වැඩි භූමි ප්‍රමාණයක වෙසෙන අයට වර්ග අඩි 500ක නිවාස ඒකක ලැබෙනු ඇත.	වන්දි සමඟ නිවාස ඒකක හරහා බලපෑමට ලක් වූ පුද්ගලයන් හට ප්‍රමාණවත් වන්දියක් ලැබෙනු ඇත.
03	අපගේ පවුල්වල සාමාජිකයන් විශාල සංඛ්‍යාවක් සිටින හෙයින් විකල්ප නිවාස ලෙස එක් නිවාස ඒකකයක් ප්‍රමාණවත් නොවේ.	මෙම හිමිකම් ගෙවීමේ ක්‍රමවේදය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලදහොත් නිවාස වෙන් කිරීමේ දී ගෙබිම් වර්ග ප්‍රමාණය හා පවුලේ සාමාජිකයන් ගණන පිළිබඳ සලකා බලනු ඇත.	අනෙකුත් අමතර වන්දි ගෙවීම් සමඟ බලපෑමට ලක් වූ නිවැසියන් සඳහා වූ වන්දිය නිවසට නිවසක් යන්න මත පදනම් වේ.
04	වාණිජ ව්‍යාපාර සඳහා වන විකල්ප අවස්ථා කවරේ ද ? ඔවුන්ට එම කඩ සඳහා වෙනම ගොඩනැගිලි හෝ ඊට සුදුසු වෙනම නිවාස ඒකක ලබා දෙන්නේ ද ?	හිමිකම් ලබන කඩ සඳහා බලපෑමට ලක් වූ අදාළ කාලසීමාව අනුව ආදායම අහිමි වීම වෙනුවෙන් හා එය දුම්රිය මාර්ගයේ දෙපස ඒ සඳහා වෙන් කළ මාර්ගයෙහි පිහිටා ඇත්නම් ඉදිකිරීමේ සංවර්ධන පිරිවැය වෙනුවෙන් වන්දි ලබා දෙනු ඇත.	බලපෑමට ලක් වූ පුද්ගලයන්හට ප්‍රමාණවත් වන්දි ගෙවනු ලබන අතර එමඟින් සමාජයීය හා ආර්ථික තත්ත්වය ඉහළ නංවනු ඇත.
05	අප ජීවත් වන්නේ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය නියමානුකූල කළ නිවෙස්වලයි. එවැනි නිවසකට වන්දි ලැබෙන්නේ කෙසේ ද ?	නියමානුකූල කළ ඉඩමක නිවස පිහිටා තිබේ නම් හා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් අයිතිකරු වෙත ඔප්පුව ලබා දී තිබේ නම් එවැනි නිවසක් හා ඉඩමක් පෞද්ගලික නිවසක් හා ඉඩමක් සේ සළකා වන්දි ලබා දෙනු ඇත.	බලපෑමට ලක් වූ පුද්ගලයන්හට ප්‍රමාණවත් වන්දි ගෙවනු ලබන අතර එමඟින් සමාජයීය හා ආර්ථික තත්ත්වය ඉහළ නංවනු ඇත.

ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ ආරක්ෂණ ඒකකය විසින් සමජාතීය කණ්ඩායම් සඳහා ඉලක්ක කණ්ඩායම් සාකච්ඡා වාර පවත්වන ලදි. නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලියේ දී හඳුනා ගත් ගැටලු මත පදනම්ව එම කණ්ඩායම් තෝරා ගන්නා ලදී. එම කණ්ඩායම් අතර කාන්තා මූලික පවුල්, තරුණයන් හා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය නියමානුකූල කළ කුටුම්බ විය. කාන්තාවන්, තරුණයන් හා ළමුන්ගේ ආරක්ෂාව සම්බන්ධ ගැටලු හඳුනා ගැනීමට හා විසඳීමට මෙම සාකච්ඡා මඟින් මං සැලසිණි. ඉලක්ක කණ්ඩායම් සාකච්ඡාවල සාරාංශය පහතින් දැක්වේ.

එළුමඩුවේ දී පවත්වන ලද ඉලක්ක කණ්ඩායම් සාකච්ඡාව (01)

කැළණිවැලි දුම්රිය මාර්ගයේ අදියර 01 හි II කොටසෙහි එළුමඩුවෙහි වෙසෙන ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක් වූ කාන්තා ප්‍රජාව සඳහා පළමු ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡාව 2017 ජූනි 28 වන දින ප.ව. 2.00 සිට ප්ව 3.30 දක්වා ටී වත්ත, වනාතමුල්ල ග්‍රාම නිලධාරි වසමේ අංක 246/7 දරණ ස්ථානයේ දී පැවැත්විණි. කැළණිවැලි දුම්රිය මාර්ගයේ යෝජිත දුම්රිය මාර්ග වැඩිදියුණු කිරීම්වල දී ඍජුවම බලපෑමට ලක් වන කාන්තා සාමාජිකාවන් 12ක් එම සාකච්ඡාවට සහභාගි වූහ.

එහිදී, කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතියෙහි නියෝජ්‍ය අධ්‍යක්ෂක (පරිසර හා සමාජ ආරක්ෂණ) සහභාගි වූවන් පිළිගෙන, කැළණිවැලි දුම්රිය මාර්ගයේ අදියර 01 පිළිබඳ කෙටියෙන් විස්තරයක් ඉදිරිපත් කළේය. නැවත පදිංචි කිරීම හා කාන්තාවන්ගේ කාර්යභාරය හා නිවාස සංකීර්ණවල ජීවිතය පිළිබඳ අවධාරණය කරමින් ඔවුනට ඒ සම්බන්ධ ගැටලු ඉදිරිපත් කරන ලෙසත් නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලියට දායකත්වය ලබා දෙන ලෙසත් ඔහු ඉල්ලා සිටියේය. සහභාගි වූ මෙම කාන්තාවන් ඉදිරිපත් කළ ගැටලු සම්බන්ධයෙන් ව්‍යාපෘති කළමනාකරණ ඒකකය සාකච්ඡා කරන ලදී. සාකච්ඡාවේ සාරාංශය 4.5 වගුවෙහි දක්වා ඇත.

4.6 වගුව :ප්‍රශ්න හා පිළිතුරුවල සාරාංශය

අනු අංකය	අදහස් හා ප්‍රශ්න	කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතියෙහි නිලධාරීන් ලබාදුන් පිළිතුරු	නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම වෙත යොමු වන කරුණු
01	අවට ප්‍රදේශවල රැකියාවලට යන හා කුඩා ව්‍යාපාරවල නිරත වන කාන්තාවන් මෙහි සිටිනවා. ඔවුන්ගේ පාරිභෝගිකයන් ද සිටින්නේ මේ අවටම යි. එහෙයින් ප්‍රතිස්ථානගත කිරීම හේතුවෙන් ඔවුන්ගේ රැකියාවලට හා ව්‍යාපාරවලට එය බලපානු ඇත.	ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක් වූ පුද්ගලයන් ඔවුන් දැනට පදිංචි ස්ථානයට ආසන්න, කිලෝමීටර 1.5ක දුරක් ඇතුළත පිහිටි නිවාස යෝජනා ක්‍රමයක නැවත පදිංචි කෙරේ .මෙම ප්‍රජාවේ සියලුදෙනා එකම නිවාස යෝජනා ක්‍රමයක නැවත පදිංචි කෙරෙන හෙයින් පාරිභෝගිකයන් අහිමි වීමක් සිදු නොවනු ඇත. ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක් වූ පුද්ගලයන් හට විකල්ප ආදායම් මාර්ග සොයා ගැනීම සඳහා ජීවනෝපාය ප්‍රතිෂ්ඨාපන වැඩසටහන් හා තෝරාගත් ක්ෂේත්‍ර සම්බන්ධයෙන් වෘත්තීය පුහුණුව ලබා දෙනු ඇත.	ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක් වූ පුද්ගලයන් සඳහා විකල්ප නැවත පදිංචි ස්ථානයේ ආදායම් ප්‍රතිෂ්ඨාපනය. අයවැය ප්‍රතිපාදන සහිත පුළුල් ආදායම් ප්‍රතිෂ්ඨාපන වැඩසටහන් නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම තුළ යෝජනා කරන ලදී.
02	පදිංචිය වෙනස් වීම හේතුවෙන් මතු වන පාසල් යාමේ ගැටලු	වර්තමාන පදිංචි ස්ථානයට ආසන්න ස්ථානයක නැවත පදිංචි කිරීම සිදු කෙරෙන හෙයින් ළමුන්ට දැනට යන පාසලට ම යාමේ ගැටලුවක් මතු නොවේ.	වර්තමාන පදිංචි ස්ථානයට ආසන්න ස්ථානයක් නැවත පදිංචි කිරීම සඳහා තෝරා ගැනීමෙන් ඇති විය හැකි සෘණාත්මක සමාජ බලපෑම් අවම කර ගත හැකි ය.
03	මෙම ප්‍රජාවට අයත් ජනතාවට නිවාස යෝජනා ක්‍රමවල ජීවත් වී පුරුද්දක් නොමැති හෙයින් ඊට අනුවර්තනය වීමේ ගැටලු මතු විය හැක.	ව්‍යාපෘතිය මඟින් නව පරිසරයට හැඩ ගැසීම සඳහා නිවාස යෝජනා ක්‍රමවල ජීවත් වීම හා චර්යාත්මක වෙනස්කම් පිළිබඳ උපදේශන වැඩසටහන් පවත්වනු ලැබේ.	අලුතින් නැවත පදිංචි කෙරෙන පුද්ගලයන් සඳහා අයවැය ප්‍රතිපාදන සහිතව නැවත පදිංචි කෙරෙන ස්ථානයේ සමාජ ආරක්ෂාව සහතික කෙරෙනු ඇත.

297 වත්තේ දී පවත්වන ලද ඉලක්ක කණ්ඩායම් සාකච්ඡාව (02)

දෙවන ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡාව ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක් වන 297 වත්තේ කාන්තා මූලික කුටුම්බ සඳහා පවත්වන ලදී. එම සාකච්ඡාව 2018 දෙසැම්බර් මස 13 වන දින පෙ.ව. 10.00 සිට පෙ.ව. 11.00 දක්වා තිඹිරිගස්යාය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයට අයත් වනාතමුල්ල ග්‍රාම නිලධාරි වසමේ පිහිටි ධර්මශාලාවේ දී පවත්වන ලදී. ඊට කැළණිවැලි දුම්රිය මාර්ගයේ යෝජිත දුම්රිය මාර්ග වැඩිදියුණුකිරීම් හේතුවෙන් සෘජුවම බලපෑමට ලක් වූ කාන්තාවන් 14 දෙනෙකු සහභාගි වූහ.

කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතියෙහි නියෝජ්‍ය අධ්‍යක්ෂක (පරිසර හා සමාජ ආරක්ෂණ) විසින් සහභාගි වූ පිරිස පිළිගැනීමෙන් රැස්වීම ආරම්භ කෙරිණි. එහිදි ඔහු විසින් කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතියෙහි සංරචක හා කැළණිවැලි දුම්රිය මාර්ගය වැඩිදියුණු කිරීමේ කටයුතුවල ප්‍රගතිය පිළිබඳ විස්තරාත්මකව පැහැදිලි කරන ලදී. එමෙන්ම මෙම කණ්ඩායම නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලිය තුළ දී සහයෝගය අවශ්‍ය වන අවදානම් කණ්ඩායමක් ලෙස සැලකෙන හෙයින් ඔවුනට ව්‍යාපෘති කාර්යමණ්ඩලය හා සහයෝගයෙන් කටයුතු කරන මෙන් ඔහු ඉල්ලා සිටියේ ය. තවද, ආදායම් ප්‍රතිෂ්ඨාපන හා ජීවනෝපාය ඉහළ නැංවීමේ වැඩසටහනේ දී ඔවුන්ගේ ආර්ථික කටයුතු පිළිබඳ සලකා බැලෙන අතර නැවත පදිංචි කිරිමෙන් පසු ව්‍යාපෘති කාලසීමාව පුරාවටම ඒ පිළිබඳ අධීක්ෂණය කෙරෙන බව ද දන්වා සිටියේ ය. සාකච්ඡාවේ සාරාංශය 4.7 වගුවෙහි දැක්වේ.

4.7 වගුව :ප්‍රශ්න හා පිළිතුරුවල සාරාංශය

අනු අංකය	අදහස් හා ප්‍රශ්න	කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතියෙහි නිලධාරීන් ලබාදුන් පිළිතුරු	නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරි සැලැස්ම වෙත යොමු වන කරුණු
01	නැවත පදිංචි කිරීම සිදු කරන විට ප්‍රජාවට ඔවුන්ගේ නිවෙස්වල බඩු / ලී බඩු ආදිය රැගෙන යාමට සිදු වේ. එම නිසාවෙන් ඒ සඳහා මුදල් ගෙවීමට හා වාහන යොදා ගැනීමට ප්‍රජාව කලින් දැනුවත් කළ යුතු වේ.	ව්‍යාපෘතිය විසින් කම්කරු ගාස්තු ද ඇතුළත් ප්‍රවාහන දීමනාවක් ලබා දෙනු ඇත.	හිමිකම් ගෙවීමේ ක්‍රමවේදය තුළින් මෙම ගැටලුව විසඳිය යුතු ය.
02	මහල් රැසකින් යුත් නිවාස යෝජනා ක්‍රමවල ජීවත් වන විට කාන්තාවන් හා ළමුන්ගේ ආරක්ෂාව පිළිබඳ ගැටලු මතු විය හැකිය. ව්‍යාපෘතිය මඟින් කාන්තාවන් හා ළමුන්ගේ ආරක්ෂාව පිළිබඳ සිදුකරන යෝජනා කවරේද ?	නිවාස යෝජනා ක්‍රමය තුළ ස්ථාපිත සභාධිපත්‍ය අධිකාරිය හා පොලිස් ඒකකය විසින් පදිංචිකරුවන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් වන ගැටලු විසඳනු ඇත. ව්‍යාපෘතිය මඟින් ආරක්ෂාව පිළබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වනු ඇත.	නැවත පදිංචි කිරීමේ ස්ථානවල සමාජ ආරක්ෂාව
03	ප්‍රතිස්ථානගත කිරීම මඟින් ස්වයං රැකියාවල නිරතවන්නන් හට බලපෑමක් ඇති වනු ඇත. මෙම ගැටලුව විසඳීම සඳහා ව්‍යාපෘතිය යෝජනා කෙරෙන විකල්පයක් තිබේද ?	ව්‍යාපෘතිය විසින් මෙවැනි ගැටලු විසඳීමට හා ස්වයං රැකියාවල නිරත පුද්ගලයන්හට නව ආදායම් මාර්ග හා වෘත්තිය පුහුණු වැඩසටහන් හඳුන්වාදීම සඳහා ආදායම් ප්‍රතිෂ්ඨාපන වැඩසටහන යෝජනා කර ඇත.	ආදායම් ප්‍රතිෂ්ඨාපන හා ජීවනෝපාය වැඩසටහන්
04	ආබාධිත හා නිදන්ගත රෝගවලින්	නිවාස යෝජනා ක්‍රමවල මහල් වෙන්	අවදානම් කාණ්ඩයට

	පෙළෙන පුද්ගලයන් පිරිසක් මේ අතර වේ. මහල් නිවාස යෝජනා ක්‍රමවල නිවාස ඒකක වෙන් කිරීමේ දී මෙවැනි පුද්ගලයන් පිළිබඳ විශේෂ අවධානයක් යොමු කිරීම අවශ්‍ය වේ.	කිරීමේ දී මේ පිළිබඳ සළකා බැලේ. මෙම නිවාස යෝජනා ක්‍රම පිළිගත් ප්‍රමිතීන්වලට අනුව ඉදිකොට ඇති අතර ප්‍රවේශයේ පහසුව සඳහා විදුලි සෝපාන ද පවතී .	අයත් පුද්ගලයන් විශේෂ කණ්ඩායමක් ලෙස සැළකීම.

297 වත්තේ දී පවත්වන ලද ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡාව (03)

තෙවන ඉලක්ක කණ්ඩායම් සාකච්ඡාව තිඹිරිගස්යාය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයට අයත් වනාතමුල්ල ග්‍රාම නිලධාරි වසමේ, 297 වත්තේ, ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක් වන තරුණයන් සඳහා 2018 දෙසැම්බර් මස 13 වන දින පෙ.ව. 11.00 සිට ප.ව. 12.30 දක්වා පවත්වන ලදී.

කැළණිවැලි දුම්රිය මාර්ගයේ යෝජිත වැඩිදියුණු කිරීමේ කටයුතු හේතුවෙන් ඍජුවම බලපෑමට ලක් වූ පවුල්වලට අයත් ගැහැණු ළමුන් 08ක් හා පිරිමි ළමුන් 04ක් ඇතුළු තරුණයන් 12ක් එම සාකච්ඡාවට සහභාගි වූහ.

කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතියේ නියෝජ්‍ය අධ්‍යක්ෂක (පරිසර හා සමාජ ආරක්ෂණ), කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතියෙහි සංවරක හා කැළණිවැලි දුම්රිය මාර්ගය වැඩිදියුණු කිරීමේ කටයුතුවල ප්‍රගතිය පිළිබඳ කෙටියෙන් පැහැදිලි කළේ ය. එහිදී යෝජිත නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලිය පිළිබඳ හා ඔවුන්ගේ අනාගත සැලසුම් පිළිබඳ සිය අදහස් ඉදිරිපත් කරන මෙන් ඔහු ඉල්ලා සිටියේ ය. ව්‍යාපෘතිය මඟින් රජයේ පුහුණු අධිකාරින් හා සම්බන්ධ වී නව පුහුණු අවස්ථා සංවිධානය කෙරෙන බව ඔහු තවදුරටත් පැහැදිලි කළ අතර එම පුහුණු වැඩසටහන් සඳහා අයැදුම් කිරීමට තරුණයන් දිරි ගැන්වූයේ ය. සාකච්ඡාවේ සාරාංශය 4.8 වගුවේ දැක්වේ.

4.8 වගුව: සාකච්ඡා කරන ලද ප්‍රශ්න හා පිළිතුරුවල සාරාංශය

අනු අංකය	අදහස් හා ප්‍රශ්න	කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතියෙහි නිලධාරීන් ලබාදුන් පිළිතුරු	නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරි සැලැස්ම වෙත යොමු වන කරුණු
01	මෙම බාලවයස්කරුවන්ගෙන් සමහරෙක් පාසල් ජීවිතය අතරමඟ නවතා දමා ඇත. බහුතරයක් දෙනා රැකියාවක් කිරීමට හෝ නිපුණතා පුහුණු කටයුතුවල නිරත වීමට කැමැත්තෙන් පසුවෙති. ඔවුන්ගෙන් සමහරෙක් ප්‍රජාව තුළ දැනටමත් නව ස්වයං රැකියා කටයුතුවල නිරත වන නමුත් රැකියා සොයමින් සිට .	සුදුසු ආදායම් ප්‍රතිෂ්ඨාපන වැඩසටහන් මඟින් නව නිපුණතා සංවර්ධන පුහුණු වැඩසටහන් පිළිබඳ දැනුවත් කෙරෙනු ඇත. එවැනි පහසුකම් ලබා ගැනීම සඳහා රජයේ වෘත්තිය පුහුණු අධිකාරින් හා සම්බන්ධීකරණය සිදු කෙරෙනු ඇත.	නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්මට අනුව ආදායම් ප්‍රතිෂ්ඨාපන හා ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් සංවිධානය කෙරෙනු ඇත.

සීවලිපුර 'බී' කොටසෙහි පවත්වන ලද ඉලක්ක කණ්ඩායම් සාකච්ඡාව (04)

තිඹිරිගස්යාය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයට අයත් වනාතමුල්ල ග්‍රාම නිලධාරි වසමේ සීවලිපුර 'බී' කොටසෙහි පිහිටි ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් නියමානුකූල කළ කොටසෙහි ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක් වූ කුටුම්බ සඳහා ඉලක්ක කණ්ඩායම් සාකච්ඡාව, 2018 දෙසැම්බර් මස 13 වන දින ප.ව 2.00 .සිට ප.ව 3.00 .දක්වා පැවැත්විණි. ව්‍යාපෘතිය හේතුවෙන් සෘජුවම බලපෑමට ලක්වන කාන්තාවන් 08ක් හා පිරිමි 07ක් ඇතුළු ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක් වූ කුටුම්බ 15ක් මෙම සාකච්ඡාවට සහභාගි වූහ.

නියෝජ්‍ය අධ්‍යක්ෂක (පරිසර හා සමාජ ආරක්ෂණ) ව්‍යාපෘතිය හා කැළණිවැලි දුම්රිය මාර්ගය වැඩිදියුණු කිරීමේ කටයුතුවල ප්‍රගතිය පිළිබඳ කෙටියෙන් පැහැදිලි කළේය. ව්‍යාපෘතිය මඟින් ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ කුටුම්බ වෙත සපයනු ලබන විශේෂ සහයෝගය පිළිබඳ ඔහු සහභාගිවූවන්ට පැහැදිලි කළේය. මෙම කුටුම්බ සතුව ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මඟින් නිකුත් කළ ඔප්පු පවතින හෙයින් නිවාස සංවර්ධන අධිකාරියේ නිවාස යෝජනා ක්‍රමයෙන් නිවාස ඒකක ලබා ගැනීමට ඔවුන් අකමැති නම් ඔවුන්ගේ ඉඩම් හා ඉදිකිරීම සඳහා වන්දි ලබා දීමට එම ඔප්පු ඉදිරිපත් කරන මෙන් ඔහු ඉල්ලා සිටියේය .එම සාකච්ඡාව අතරතුර දී ප්‍රතිස්ථානගත කිරීමේ ක්‍රියාවලිය පිළිබඳ සහභාගිවූවන් ප්‍රශ්න නැඟුහ. ප්‍රශ්න හා ලබා දුන් පිළිතුරුවල සාරාංශය 4.9 වගුවෙහි දැක්වේ.

4.9 වගුව: සාකච්ඡා කරන ලද ප්‍රශ්න හා පිළිතුරුවල සාරාංශය

අනු අංකය	අදහස් හා ප්‍රශ්න	කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතියෙහි නිලධාරීන් ලබාදුන් පිළිතුරු	නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරි සැලැස්ම වෙත යොමු වන කරුණු
01	ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් නිවාස ඉදිකිරීම සඳහා නිවාස ණය, උපදේශන සේවාවන් හා නිවාස සඳහා ඔප්පු හෝ කුටුම්බ කාඩ්පත් ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ කුටුම්බවලට ලබා දී ඇත. එහෙයින් දුම්රිය මාර්ගය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ නැවත පදිංචි කිරීම සිදු කිරීමේ දී ඔවුනට සිය ඉඩම් හා නිවාස සඳහා සාධාරණ වන්දි පැකේජයක් ලැබේ දැයි නිශ්චය කරගත යුතු විය.	ඔප්පු සහිත කුටුම්බ සඳහා නිවාස ඒකකයක් හා ඉඩම් කොටසට වන්දියක් හිමි වේ. වන්දි ලබා දීමේ දි ඔප්පුහිමියන් ද කුටුම්බ කාඩ්පත් හිමියන් හා සමසේ සැලකීම පිළිබඳ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සමඟ ව්‍යාපෘතිය සාකච්ඡා කරනු ඇත.	ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක් වන පුද්ගලයන් සඳහා සාධාරණ වන්දි ලබා දීම සඳහා වූ ප්‍රතිපාදන හිමිකම් ගෙවීමේ ක්‍රමවේදය සතු වේ.
02	වර්තමාන නිවසේ හා නාගරික සංවර්ධන අධිකාරියේ නිවාස ඒකකය අතර පවතින වටිනාකමේ වෙනස සඳහා අයැදුම් කිරීමට හැකියාවක් පවතී ද ?	මෙම ගැටලුව විසඳීම සඳහා ප්‍රතිපාදන සහිතව හිමිකම් ගෙවීමේ ක්‍රමවේදය සකස් කොට ඇත. ඊට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය හිමි විය යුතු ය.	සාධාරණ වන්දි ගෙවීම සඳහා ප්‍රතිපාදන හිමිකම් ගෙවීමේ ක්‍රමවේදය සතු වේ.
03	බලපෑමට ලක් වන නිවස දෙමහල් නිවසක් නම් එම නිවසේ එක් එක් මහල වෙනුවෙන් ව්‍යාපෘතිය නිවාස ඒකක වෙන් කරන්නේ කෙසේ ද ?	බලපෑමට ලක් වන නිවසේ මුළු ගෙබිම් වර්ග ප්‍රමාණය හා එහි පදිංචි පුද්ගල සංඛ්‍යාව මත නිවාස ඒකක වෙන් කිරීමට හිමිකම් ගෙවීමේ ක්‍රමවේදය යෝජනා කර ඇත.	සාධාරණ වන්දි ගෙවීම සඳහා ප්‍රතිපාදන හිමිකම් ගෙවීමේ ක්‍රමවේදය සතු වේ.
04	ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ	ඔප්පු සහිත කුටුම්බ සඳහා නිවාස	සාධාරණ වන්දි ගෙවීම

	ඔප්පුහිමියන් මෙන්ම කුටුම්බ කාඩ්පත් හිමියන් ද සිටිති .ඒ අනුව ඉඩම හා නිවස සඳහා වූ වන්දි ගෙවීම බලපෑමට ලක් වූ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය නියමානුකූල කළ ඔප්පු හිමියන්ට හා කුටුම්බ කාඩ්පත් හිමියන්ට වෙනස් වන්නේ කෙසේද ?	ඒකකයක් හා ඉඩම් කොටසට වන්දියක් හිමි වේ. කුටුම්බ කාඩ්පත් හිමියන් ද ඔප්පු හිමියන් හා සමසේ සැළකීමට ව්‍යාපෘතිය යෝජනා කර ඇත.	සඳහා ප්‍රතිපාදන හිමිකම් ගෙවීමේ ක්‍රමවේදය සතු වේ.

ව්‍යාපෘතිය මඟින් ප්‍රජාව වෙත ප්‍රතිලාභ සැලසෙන අතර එමඟින් රටේ සංවර්ධනයට මඟපෑදෙන බවට ඔවුන් විශ්වාස කළ හෙයින් කැළණිවැලි දුම්රිය මාර්ගයේ අදියර 01 හි යෝජිත කටයුතුවලට දුම්රිය මාර්ගය දෙපස ජීවත් වන ප්‍රජාවන් විරෝධය නොපෑහ. ඔවුන් ව්‍යාපෘතිය සඳහා දැඩි සහයෝගයක් දැක්වූහ. මන්දයත් එම ප්‍රදේශයෙන් ම ලැබෙන මහල් නිවාස සංකීර්ණයක නිවාස ඒකකයක හිමිකරුවන් වීම මඟින් ඔවුන්ට වඩාත් යහපත් ජීවන තත්ත්වයක් හා ගුණාත්මක ජීවිතයක් හිමි වන හෙයින් ඔවුන් ඒ පිළිබඳ ආශාවෙන් පසු වූහ. ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට පෙර ප්‍රතිස්ථානගත කරන මෙන් ඔවුහු අවධාරණය කළහ. ප්‍රධාන වශයෙන් ම ඔවුන්ගේ ජීවනෝපායන් හා දරුවන්ගේ අධ්‍යාපන කටයුතු අඛණ්ඩව කරගෙන යාම සඳහා ඔවුනට වර්තමාන පදිංචි ස්ථානයට ආසන්න ස්ථානයක නැවත පදිංචි වීමට අවශ්‍ය විය.

ව්‍යාපාරික ප්‍රජාවෙන් ඉතා සුළු පිරිසක් බලපෑමට ලක් වේ. දෙමටගොඩ පාර හා බේස්ලයින් පාර හරහා දුම්රිය මාර්ගය ගමන් කරන ස්ථාන දෙකක ඔවුන්ගේ ව්‍යාපාර පිහිටා ඇත. ව්‍යාපෘති කළමනාකරණ ඒකකය කණ්ඩායම එම ව්‍යාපාරවල සියලු අයිතිකරුවන් හා කුලියට ගත් පුද්ගලයන් හමු වී සාකච්ඡා කළ අතර එහිදී දුම්රිය මාර්ග වැඩිදියුණු කිරීම් කටයුතු හේතුවෙන් ව්‍යාපාර අහිමි වුවහොත් ඔවුනට ලැබෙන හිමිකම් පිළිබඳ පැහැදිලි කරන ලදී. ඔවුන්ගේ ව්‍යාපාර ඉදිකිරීම් පිළිබඳ මිනුම් ගන්නා අතර ඔවුන්ගෙන් ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතික වැනි තොරතුරු ලේඛන හා අනෙකුත් මූලික තොරතුරු ලබා ගන්නා ලදී. එහිදී බහුතරයක් සිය ව්‍යාපාර කටයුතු දුම්රිය මාර්ගයට හා මහාමාර්ගයට වෙන් කළ සීමාවේ පවත්වා ගෙන යන බවට හෙළි විය. සැලැස්මට අනුව ගොඩනැඟිලි අර්ධ වශයෙන් බලපෑමට ලක් වන හෙයින් බොහොමයක් ස්ථානවල පිහිටි කඩවල ව්‍යාපාරය පවත්වා ගත හැකි ය. මෙය DD & FS උපදේශනයේ දී තහවුරු විය. සිය කඩ අර්ධ වශයෙන් බලපෑමට ලක් වන ව්‍යාපාර කණ්ඩායම ඔවුන්ගේ ව්‍යාපාර වර්තමාන ස්ථානයේ ම පවත්වාගෙන යාමට කැමැත්ත පළ කළහ. 297 වත්තේ සුළු පිරිසක් සිල්ලර කඩ හෝ ආහාර විකිණීමේ කුඩා කඩ, එම කඩ පිහිටා ඇත්තේ දුම්රිය මාර්ගයට මුහුණලා වුවද, ඔවුන්ගේ නිවසේ ම කොටසක පවත්වා ගෙන යති. ඔවුන් සිය ව්‍යාපාර පවත්වා ගෙන යාම සඳහා නැවත පදිංචි කිරීමේ මහල් නිවාසයේ බිම් මහලේ හෝ පහළ මහලේ නිවාස ඒකක ඉල්ලා සිටියහ.

ප්‍රධාන තොරතුරු සපයන සම්මුඛ සාකච්ඡා (KII)

ප්‍රධාන තොරතුරු සපයන සම්මුඛ සාකච්ඡා බොහොමයක් යෝජිත දුම්රිය මාර්ග වැඩි දියුණු කිරීම් කටයුතු හේතුවෙන් අර්ධ වශයෙන් බලපෑමට ලක් වන ආයතනවල රජයේ නිලධාරින් සමඟ පවත්වන ලදී. එම විස්තර පහත වගුවේ දැක්වේ.

4.10 වගුව: ප්‍රධාන තොරතුරු සපයන සම්මුඛ සාකච්ඡාවල සාරාංශය

රජයේ නිලධාරියා (තනතුර)	ප්‍රධාන තොරතුරු සපයන සම්මුඛ සාකච්ඡා වාරයේ දී පළ කළ අදහස්
විදුහල්පති -සීවලිපුර මධ්‍ය මහා විද්‍යාලය ස්ථානය - සීවලිපුර මධ්‍ය මහා විද්‍යාලය, වනාතමුල්ල දිනය - 2018.12.03 වේලාව - ප.ව. 3.30	යෝජිත දුම්රිය මාර්ගය වැඩි දියුණු කිරීමේ වැඩසටහනට සිය පූර්ණ සහයෝගය විදුහල්පතිතුමා පළ කළ අතර පැල්පත් නිවාස ඉවත් කිරීම මඟින් ක්‍රීඩා පිටියේ මෙන් ම පාසලේ ද පෙනුම ඉහළ යන බවට තවදුරටත් සඳහන් කළේය. ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක් වන්නා වූ ක්‍රීඩා පිටියේ තාප්පය නැවත ඉදි කරන බවට ව්‍යාපෘතිය සහතික විය. කෙසේ නමුත් සියලු රාජකාරිමය කටයුතු කොළඹ කාර්යාලයේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකවරයාගේ සහභාගිත්වයෙන් සිදු කෙරෙනු ඇත.
පොලිස් ස්ථානාධිපති - දෙමටගොඩ පොලීසිය ස්ථානය - දෙමටගොඩ පොලිස් ස්ථානය දිනය - 2018.12.05 වේලාව - පෙ.ව. 10.00	කොළඹ මහානගර සභාවට අයත් පර්චස් 50ක් පොලිස් ස්ථාන පරිශ්‍රයේ පවතින බව දෙමටගොඩ පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයා පැවසීය. ව්‍යාපෘතිය හේතුවෙන් රථගාලේ කොටසක්, ආපන ශාලාව හා බාහිර වැසිකිළි 02ක් බලපෑමට ලක් වන අතර ඒවා ඉතිරි භූමි ප්‍රමාණය තුළ නැවත ඉදි කළ හැකි ය. බලපෑමට ලක් වූ පහසුකම් නැවත ස්ථාපිත කිරීම ව්‍යාපෘතියෙන් ඔහු අපේක්ෂා කරයි.
ප්‍රධාන ප්‍රාදේශීය ඉංජිනේරු - ලංකා විදුලිබල මණ්ඩලය - නැගෙනහිර කොළඹ ස්ථානය - ලංකා විදුලිබල මණ්ඩලය , බොරැල්ල දිනය - 2018.12.05 වේලාව - ප.ව. 12.00	දැනට පවතින ට්‍රාන්ස්ෆෝමරය පිහිටි නිවාසය ව්‍යාපෘතිය විසින් ලබා දෙන ආසන්න ප්‍රදේශයක පිහිටි විකල්ප ස්ථානයකට රැගෙන යා හැකි බව ලංකා විදුලිබල මණ්ඩලයේ ප්‍රධාන ප්‍රදේශීය ඉංජිනේරුවරයා පැවසීය. කෙසේ නමුත් සියලු රාජකාරි කටයුතු ලංකා විදුලිබල මණ්ඩලයේ නැගෙනහිර කොළඹ අධ්‍යක්ෂක සාමාන්‍යාධිකාරිගේ සහභාගිත්වයෙන් සිදුවිය යුතු ය.
උප සභාපති - Mt. Mary දුම්රිය ක්‍රීඩා පිටිය - දෙමටගොඩ ස්ථානය - ශ්‍රී ලංකා දුම්රිය සේවය බොරැල්ල කාර්යාලය දිනය - 2019.02.06 වේලාව - ප.ව. 3.00	මෙම ව්‍යාපෘතියට උප සභාපතිවරයා සිය පූර්ණ සහයෝගය පළ කළ අතර යෝජිත ගුවන්ගතව ඉදිවන (elevated) දුම්රිය ස්ථානය යටතේ ප්‍රතිස්ථානගත කිරීම සඳහා දැනට පවතින ක්‍රීඩාංගන ගොඩනැඟිල්ල මාරු කරන ලෙසත් යෝජනා කළ පරිදි ක්‍රිකට් තණතීරුව සකස් කර ප්‍රතිසංස්කරණය කරන ලෙසත් ඉල්ලා සිටියේ ය.
වනාතමුල් ,තිඹිරිගස්යාය - ග්‍රාම නිලධාරි ස්ථානය - ව්‍යාපෘති කළමනාකරණ ඒකක කාර්යාලය දිනය - 2019.02.02 වේලාව - ප.ව. 1.00	ඇතැමුන් වැරදි තොරුතුරු සපයන හෙයින් දුම්රිය මාර්ගය දිගේ 02 වන කොටසට අයත් ප්‍රදේශයේ සැබෑ ලෙස ම බලපෑමට ලක් වූ පුද්ගලයන් හඳුනා ගැනීමට සහාය ලබා දෙන බවට වනාතමුල්ල ග්‍රාම නිලධාරිවරයා සහතික විය.

4.2 මහජනායාට අනාවරණය කිරීම හා තොරතුරු බෙදා හැරීම

එක්සත් ජාතීන්ගේ මානව ජනාවාස වැඩසටහනේ සහ ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ ආරක්ෂණ කණ්ඩායම විසින් සිදුකරන ලද සමීක්ෂණවල දී හඳුනාගත් ව්‍යාපෘති ප්‍රදේශයේ සෑම නිවසකටම ඔවුන් පැමිණියහ. එහිදී ජනතාව හා අනෙකුත් පාර්ශවකරුවන් සමඟ බලපෑමට ලක් වූ ප්‍රදේශයට අදාළ ව්‍යාපෘති තොරතුරු, පවත්නා මාර්ගයේ ඇති විය හැකි වෙනස්කම්, ධනාත්මක හා සෘණාත්මක බලපෑම්, ඉඩම් අත්කර ගැනීම, වන්දි ගෙවීම, නැවත පදිංචි කිරීම හා නැවත පදිංචි කිරීමේ ආධාර, දුක්ගැනිවිලි විසඳීමේ ක්‍රියාපටිපාටිය පිළිබඳ තොරතුරු බෙදා ගන්නා ලදී. ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ කණ්ඩායම රාජ්‍ය භාෂා තුනෙන් ම වූ විස්තර පත්‍රිකා ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක් වූ පුද්ගලයන් අතර බෙදා දුන් අතර වැඩිදුර පැහැදිලි කිරීම් සඳහා ව්‍යාපෘති කාර්යාලයට සම්බන්ධ වන ලෙස ඔවුන්ට දන්වා සිටියහ.

හිමිකම් ගෙවීමේ ක්‍රමවේදය සිංහල හා දෙමළ භාෂාවන්ට පරිවර්තනය කොට ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක් වන පුද්ගලයන් වෙත ලබා දෙනු ඇත. නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරකම් සැලැස්මේ පිටපත් ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ, ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ, ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ ,ඉඩම් අත්කර ගැනීමේ කාර්යාලයේ හා ග්‍රාම නිලධාරි කාර්යාලයේ තබනු ලැබේ. නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරකම් සැලැස්ම අවසන් කර යාවත්කාලීන කළ පසු, එය ආසියානු සංවර්ධන බැංකුවේ හා ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ වෙබ් අඩවිවල පළ කරනු ඇත.

4.3 අඛණ්ඩ උපදේශනය / සාකච්ඡා සහභාගිත්වය

අඛණ්ඩ මහජන අදහස් විමසීම සහ සහභාගිත්වය සඳහා පහත සඳහන් පියවර අනුගමනය කිරීමට අපේක්ෂිතය :

- අහිතකර බලපෑම් වළක්වා ගැනීම හෝ අවම කර ගැනීම සඳහා ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක් වූ පුද්ගලයන් හා අඛණ්ඩ උපදේශන / සාකච්ඡාවල නිරත වීමට ව්‍යාපෘති කළමනාකරණ ඒකකය මගින් ආරක්ෂණ කණ්ඩායමේ නැවත පදිංචි කිරීමේ නිලධාරීන්, නැවත පදිංචි කිරීමේ අධීක්ෂණ උපදේශකවරුන් හා කොන්ත්‍රාත්කරුවන් යොමු කිරීම.
- ව්‍යාපෘති කළමනාකරණ ඒකකය ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක් වන කුටුම්බ අතර හිමිකම් ගෙවීමේ ක්‍රමවේදය පිළිබඳ තොරතුරු බෙදා හරිනු ලබන අතර ඔවුන් විසින් අනුමත කරන ලද නිසි ප්‍රතිස්ථානගත කිරීමේ විකල්පය සමඟ ඔවුන්ගේ හිමිකම් හඳුනා ගැනීමට ඔවුනට සහාය වනු ඇත.
- ව්‍යාපෘති කළමනාකරණ ඒකකය අවසාන සැලැස්මේ විස්තර, වන්දි ගෙවීමේ තත්ත්වය ,ප්‍රතිස්ථානගත කිරීම හා නැවත පදිංචි කිරීමේ ආධාර පිළිබඳ දැනුම් දීමට ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක් වූ පුද්ගලයන් සමඟ රැස්වීම් පවත්වනු ඇත.
- ව්‍යාපෘති කළමනාකරණ ඒකක, නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම යාවත්කාලීන කිරීමට හා ක්‍රියාත්මක කිරීමේ සැලසුම් සංශෝධනය කිරීමට ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක් වන පුද්ගලයන් සමඟ උපදේශන /සාකච්ඡා පවත්වනු ඇත.
- ආසියානු සංවර්ධන බැංකුවට ඉදිරිපත් කිරීමට පෙර අවසාන නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක් වන පුද්ගලයන් සහ අනෙකුත් පාර්ශවකරුවන් අතර බෙදා හැරීම.

- ස්වකැමැත්තෙන් තොරව නැවත පදිංචි කිරීමේ අනපේක්ෂිත හෝ වක්‍රාකාර ප්‍රතිවිපාක පිළිබඳ උපදේශන / සාකච්ඡා පවත්වනු ඇත.
- © ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක් වූ පුද්ගලයන්හට තොරතුරුවලට ප්‍රවේශ වීමට, හිමිකම් සඳහා ලේඛන සකස් කිරීමට හා නැවත පදිංචි කිරීමේ ආධාර අනෙකුත් ප්‍රතිලාභ ලැබීමට සහය වීම.
- නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරකම් සැලැස්ම, ප්‍රගති වාර්තාවල හා අධීක්ෂණ වාර්තාවල පිටපත් මහජන පරීක්ෂාව සඳහා ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ හා මෙම කොටසේ ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක් වන පුද්ගලයන්හට පහසුවෙන් ප්‍රවේශ විය හැකි ග්‍රාම නිලධාරි කාර්යාලය හා බෙස්ලයින් දුම්රිය ස්ථානය වැනි මහජන කාර්යාලවල තැබීම.
- ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කාල සීමාව තුළ දී තොරතුරු බෙදා හැරීමේ සැසිවාර පැවැත්වීම, ප්‍රජා සහභාගිත්වය ඉල්ලා සිටීම හා පෝෂණය කිරීම.
- ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක් වන පුද්ගලයන්ට හා අවදානම් කණ්ඩායම්වලට තොරතුරු ලබා ගැනීමට සහය වීම.
- නැවත පදිංචි කළ ප්‍රජාව සමඟ යහපත් සම්බන්ධතාවයක් ගොඩනඟා ගැනීමට සත්කාරක ප්‍රජාව දැනුවත් කිරීම.
- ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් යටතේ ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක් වන පුද්ගලයන් සඳහා රැකියා අවස්ථා ලබා දීම.
- දුක් ගැනවිලි සඳහා විසඳුම් ලබා දීමට ඵලදායී "දුක් ගැනවිලි සඳහා සහන සැලසීමේ යාන්ත්‍රණය" ක් ක්‍රියාත්මක කිරීම.
- ප්‍රජා සාමාජිකයන් හා කාන්තා නියෝජිතයන් "දුක් ගැනවිලි සඳහා සහන සැලසීමේ කමිටුව" ට පත් කිරීම.

5 වන පරිච්ඡේදය - දුක්ගැනවිලි සඳහා සහන සැලසීමේ යාන්ත්‍රණය

5.1 හැඳින්වීම

මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘති පුද්ගලයන් මත විවිධාකාරයෙන් බලපෑම් ඇති කළ හැකිය. සංවර්ධන ව්‍යාපෘති හේතුවෙන් පුද්ගලයන් මත බලපෑම් ඇති කරනු ලබන්නේ; ඉඩම් හෝ දේපළ අත්කර ගැනීමෙන්, වන්දි ගෙවීම හා ප්‍රතිස්ථානගත කිරීමේ සහාය ලබාදීමේදී සිදුවන ප්‍රමාදයන් හේතුවෙන් සහ ඉදිකිරීම් සඳහා බිම එළිකිරීම, හෑරීම් සිදු කිරීම, පස් තැලීම් සිදු කිරීම සහ පිපිරවීම් වැනි ක්‍රියාකාරකම් හේතුවෙන් සිදුවන බාධාකිරීම් වලිනි. ඉඩම් අත්කර ගැනීම සහ නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලිය මගින් සමාජීය, ආර්ථික, සංස්කෘතික සහ පාරිසරික ගැටළු පැන නගින අතර මෙම ගැටළු ඉතා සංකීර්ණ මෙන්ම ව්‍යාපෘතියෙන් බලපෑමට ලක්වන පුද්ගලයන්ගේ ජීවනෝපාය වෙනස් කිරීමට පවා හේතුකාරක වේ. එවන් ගැටළු හේතුවෙන් ව්‍යාපෘතියෙන් අහිතකර බලපෑමට ලක්වන පුද්ගලයන් හට විවිධ දුක්ගැහැට වලට මුහුණ පෑමට සිදු වේ.

ව්‍යාපෘතියෙන් බලපෑමට ලක්වන පුද්ගලයන්ගේ එවන් දුක්ගැනවිලි සඳහා සහන සැලසීම පිණිස කඩිනම් පියවර ගතයුතු වේ. එවැනි දුක්ගැනවිලි සහ පැමිණිලි වෙනුවෙන් සහන ලැබීමට ඔවුනට හිමිකමක් පවතින අතර එබැවින් එම ගැටළු ලබා ගැනීමටත්, ඒවා විසඳීමටත් මෙන්ම සමස්ථයක් ලෙස ව්‍යාපෘති බලපෑම් සම්බන්ධයෙන් කටයුතු කළ යුතු බැවින් ද විධිමත්ව ස්ථාපිත මනා කාල රාමුවක් සහිත දුක්ගැනවිලි සඳහා සහන සැලසීමේ යාන්ත්‍රණයක් අවශ්‍ය කෙරේ. ව්‍යාපෘති කටයුතු වලට සිදුවිය හැකි අනවශ්‍ය ප්‍රමාදයන් වළක්වාලමින් සහ ඊට එරෙහි මහජන විවේචන සහ විරෝධතා වළක්වමින් බොහොමයක් මහජන ගැටළුවලට වැඩබිම් මට්ටමේදීම විසඳුම් ලබාදීමට දුක්ගැනවිලි සඳහා සහන සැලසීමේ එවන් යාන්ත්‍රණයකට හැකියාව ලැබෙයි.

ඉඩම් අත්කර ගැනීම, වන්දි මුදල් ගෙවීම හා නැවත පදිංචි කිරීමේ සහාය ලබා දීමේදීත්, නැවත පදිංචි කිරීමේ නේවාසික ඒකක ලබාදීම ආදියේදීත් ප්‍රමාද වීම සහ ඉඩමේ අයිතිය සම්බන්ධ ගැටළු වැනි ඉඩම් ගැටළු සම්බන්ධයෙන් "දුක් ගැනවිලි සඳහා සහන සැලසීමේ කමිටුව" කටයුතු කරනු ඇත. ව්‍යාපෘතියෙන් බලපෑමට ලක් වූ පුද්ගලයන් හට සිය ගැටළුව, "දුක් ගැනවිලි සඳහා සහන සැලසීමේ කමිටුව" වෙත ලිඛිතව හෝ ව්‍යාපෘති කළමනාකරණ ඒකකයෙහි හෝ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකයෙහි සමාජ ආරක්ෂණ නිලධාරියා වෙත වාචිකව ඉදිරිපත් කළ හැකිය. දුක් ගැනවිලි සඳහා සහන සැලසීමේ කමිටුව එහිදී ස්ත්‍රී පුරුෂ භාවය පිළිබඳ අවධානය යොමු කරමින්, සංස්කෘතික වශයෙන් සුදුසු සහ ව්‍යාපෘතියෙන් බලපෑමට ලක්වන ඕනෑම පුද්ගලයෙකුට පහසුවෙන් ප්‍රවේශ විය හැකි කිසිදු මුදලක් වැය නොවන, විනිවිදභාවයකින් යුතු ක්‍රියාවලියක් තුළින් එම ගැටළුවලට පිළියම් ලබාදෙනු ඇත.

දුක් ගැනවිලි සඳහා සහන සැලසීමේ යාන්ත්‍රණය යනු, කැළණිවැලි දුම්රිය මාර්ග ව්‍යාපෘතියේ පළමු අදියර හේතුවෙන් සිදුවන ස්වකැමැත්තෙන් තොරව නැවත පදිංචි කිරීමේ කටයුතු හා සම්බන්ධයෙන්, ව්‍යාපෘතියෙන් බලපෑමට ලක්වන පුද්ගලයන්ට මුහුණපෑමට සිදුවන දුක් ගැනවිලි සඳහා පිළියම් හා සහන ලබා ගැනීම සඳහා පවතින පහසුවෙන් ප්‍රවේශ විය හැකි විශ්වසනීය වැඩපිළිවෙලකි. ව්‍යාපෘතියෙන් බලපෑමට ලක් වූ පුද්ගලයන් සාකච්ඡා/ උපදේශන මගින් කොතෙක් දුරට කරුණු අවබෝධ කර ගන්නේද සහ සාකච්ඡා තුළින් හා එකඟතාවය

පැමිණීම හරහා දුක් ගැනවිලි සඳහා සහන සැපයිය හැකිද යන්න විස්තර කිරීමක්ද "දුක් ගැනවිලි සඳහා සහන සැලසීමේ යාන්ත්‍රණය" තුළින් සිදු වේ. දුක් ගැනවිලි සඳහා සහන සැලසීමේ යාන්ත්‍රණයෙහි "දුක් ගැනවිලි සඳහා සහන සැලසීමේ කමිටුවට" වන්දි වශයෙන් මුදල් ගෙවීමේදී එම පැකේජ හෝ ගාස්තු පිළිබඳ පාලන බලයක් නොමැත. දුක් ගැනවිලි සඳහා සහන සැලසීමේ යාන්ත්‍රණයෙහි අරමුණ වනුයේ; ඉඩම්/ දේපළ අත්කර ගැනීම්, වන්දි ගෙවීම් හා ප්‍රතිස්ථාපනය සම්බන්ධයෙන් හට ගන්නා ගැටුම්/ ගැටළු විසඳා ගැනීම සඳහා වැඩි කාලයක් හා මුදලක් වැය වන අධිකරණමය ක්‍රියාවලියකට නොගොස් මූලික මට්ටමේදීම විසඳා ගැනීම වේ. කෙසේවුවද, අධිකරණයේ විභාග වෙමින් පවතින කරුණක් සම්බන්ධයෙන් දුක් ගැනවිලි සඳහා සහන සැලසීමේ යාන්ත්‍රණයෙන් මැදිහත් වීමක් සිදු නොවේ.

ඉහත සඳහන් අංශයන් කෙරෙහි අවධානය යොමු කරමින් කැළණිවැලි දුම්රිය මාර්ගයේ පළමු අදියර හි 2 වන කොටස සඳහා දුක්ගැනවිලි සඳහා සහන සැලසීමේ යාන්ත්‍රණයක් (GRM) සකස් කළ යුතු වේ.

5.2 කැළණිවැලි දුම්රිය මාර්ගයේ පළමු අදියර සඳහා වන දුක්ගැනවිලි සඳහා සහන සැලසීමේ යාන්ත්‍රණයෙහි ක්‍රියාකාරී අංශයන්

ඇතැම්විට ව්‍යාපෘතියක් හේතුවෙන් පුද්ගලයන් ඍජු බලපෑමට ලක් නොවුනද, යෝජිත සංවර්ධන මැදිහත්වීම් සම්බන්ධයෙන් ඉල්ලීම් හෝ යෝජනා ඉදිරිපත් විය හැකිය. කොළඹ මහනගර සභා සීමාව තුළ පිහිටි කැළණිවැලි දුම්රිය මාර්ගයේ පළමු අදියර හි 2 වන කොටස සංවර්ධන කාර්යයේ ක්‍රියාත්මක අදියරේදී ද මහජන ඉල්ලීම්, යෝජනා හෝ පැමිණිලි ඉදිරිපත් විය හැකිය. එබැවින්, ව්‍යාපෘති ප්‍රදේශයේ වාසය කරන ප්‍රජාවන්ගේ එදිනෙදා ජීවිතයට බලපාන්නා වූ ගැටළු සම්බන්ධයෙන් ඉදිරිපත් වන මහජන පැමිණිලි වෙනුවෙන් අවධානය යොමු කිරීම සහ ක්‍රියා කිරීම ඉතා වැදගත් වේ.

දුක්ගැනවිලි සඳහා සහන සැලසීමේ යාන්ත්‍රණය සාර්ථකව ක්‍රියාත්මක කිරීමට නම් අදාළ පුද්ගලයන් හට දුක්ගැනවිලි සඳහා සහන සැලසීමේ යාන්ත්‍රණය සහ දුක්ගැනවිලි සඳහා සහන සැලසීමේ කමිටුව පිළිබඳව මනා දැනුමක් පැවතිය යුතු වේ. එබැවින්, බලපෑමට ලක්වන පුද්ගලයන්, රාජ්‍ය ආයතන සහ සිවිල් සමාජ සංවිධාන වැනි පාර්ශවකරුවන් දැනුවත් කිරීම පිණිස පුළුල් ප්‍රචාරයක් අවශ්‍ය කෙරේ. දුක්ගැනවිලි සඳහා සහන සැලසීමේ යාන්ත්‍රණය පිළිබඳව මනා අවබෝධයක් පැවතීමෙන් එක් එක් පුද්ගලයාට තම පැමිණිල්ලේ ස්වභාවය අනුව තමාට ලැබෙන විකල්ප මොනවාද යන්න සම්බන්ධයෙන් මනා අවබෝධයක් ලබා ගැනීමට හැකියාව ලැබේ. ඒ අනුව, සුදුසුකම් ලැබීමේ ක්‍රමවේදය පිළිබඳව දැනුම් දෙනු ලබන අතර දුක්ගැනවිලි සඳහා සහන සැලසීමේ කමිටුවෙහි කාර්යභාරය හා කර්තව්‍ය පිළිබඳව ප්‍රසිද්ධියක් ලබාදීමට දැනුවත් කිරීමේ වැඩසටහනක් දියත් කරනු ඇත. පළමුව, ව්‍යාපෘති කළමනාකරණ ඒකකයෙහි සමාජ ආරක්ෂණ නිලධාරියා විසින් ව්‍යාපෘති කළමනාකරණ ඒකකය වෙත ලද සියලු දුක්ගැනවිලි සඳහා විසඳුම් ලබාදීමට උත්සාහ ගනු ඇත. එසේ කිරීම අපහසු බව පෙනී ගියහොත් සමාජ ආරක්ෂණ නිලධාරියා විසින් එය දුක්ගැනවිලි සඳහා සහන සැලසීමේ කමිටුවෙහි පළමු මට්ටම වන වැඩබිම් මට්ටම වෙත ඉදිරිපත් කරනු ඇත.

මෙම දුක්ගැනවිලි සඳහා සහන සැලසීමේ යාන්ත්‍රණය සම්බන්ධයෙන් මට්ටම් තුනකින් යුතුව පිහිටවනු ලැබූ දුක්ගැනවිලි සඳහා සහන සැලසීමේ කමිටුව මගින් ගැටළු හා දුක්ගැනවිලි සඳහා සහන සැලසීමට කටයුතු කරනු ඇත. ඒ අනුව දුක්ගැනවිලි හෝ පැමිණිලිවල ස්වභාවය සහ ප්‍රමාණය/ බරපතල බව මත පදනම්ව එම ගැටළු අදාළ මට්ටමේ දුක්ගැනවිලි සඳහා සහන සැලසීමේ කමිටුව වෙත යොමු කරනු ලැබේ. පළමු මට්ටමේ දුක්ගැනවිලි සඳහා සහන සැලසීමේ කමිටුව, අදාළ වසමේ ග්‍රාම නිලධාරීවරයා සභාපතිත්වය දරන අතර ලැබෙන පැමිණිලි/ දුක්ගැනවිලි සම්බන්ධයෙන් වැඩබිම් මට්ටමේදීම පිළිතුරු ලබාදීමට උත්සාහ දරයි. දෙවන මට්ටම, ප්‍රාදේශීය මට්ටම වන අතර වැඩබිම් මට්ටමේදී විසඳුම් ලබාදීමට නොහැකි වූ සරළ ගැටළු වලට පිළිතුරු ලබා දෙනු ඇත. වඩාත් සංකිර්ණ ගැටළු හා දුක්ගැනවිලි වෙනුවෙන් කටයුතු කිරීම සඳහා පත් කළ තුන්වන මට්ටම අමාත්‍යාංශ ලේකම්වරයාගේ සභාපතීත්වයෙන් යුක්ත වන අතර ප්‍රාදේශීය මට්ටමේදී විසඳුම් ලබාදීමට නොහැකි වූ ජාතික මට්ටමේ ගැටළු සම්බන්ධයෙන් කටයුතු කරනු ලබයි. මෙම දුක්ගැනවිලි සඳහා සහන සැලසීමේ කමිටු තුනෙහි අවම සංයුතිය පහත සඳහන් කොට ඇත.

1. ක්ෂේත්‍ර මට්ටම

I.	ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී	සභාපති
II.	ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ නියෝජිතයෙකු	ලේකම්
III.	ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ උපදේශකගේ නියෝජිතයෙකු (PIC)	සාමාජික
IV.	කොන්ත්‍රාත්කරුගේ නියෝජිතයෙකු	සාමාජික
V.	(CBO/NGO/) නියෝජිතයෙකු/ ආගමික නායකයෙකු	සාමාජික
VI.	ප්‍රදේශයේ ජනතාව නියෝජනය කරන කාන්තා නියෝජනයක්	සාමාජික

2. ප්‍රාදේශීය මට්ටම

I.	ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්වරයා	සභාපති
II.	ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ නියෝජිතයෙකු	ලේකම්
III.	ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ උපදේශකගේ නියෝජිතයෙකු (PIC)	සාමාජික
IV.	සමථ මණ්ඩලයේ සාමාජිකයෙකු	සාමාජික
V.	කොන්ත්‍රාත්කරුගේ නියෝජිතයෙකු	සාමාජික
VI.	(CBO/NGO/) නියෝජිතයෙකු/ ආගමික නායකයෙකු	සාමාජික
VII.	ප්‍රදේශයේ ජනතාව නියෝජනය කරන කාන්තා නියෝජනයක්	සාමාජික

අවශ්‍ය වන්නේ නම්, ඉහත කමිටු දෙක සඳහාම රේඛීය ආයතනයක/ ආයතනවල නියෝජිතයන් සහභාගී කරවාගත හැකිය.

3. ජාතික මට්ටම

I.	අමාත්‍යාංශ ලේකම්	සභාපති
II.	ව්‍යාපෘති අධ්‍යක්ෂ, ව්‍යාපෘති කළමනාකරණ ඒකකය	ලේකම්
III.	ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ උපදේශකගේ නියෝජිතයෙකු (PIC)	සාමාජික
IV.	ප්‍රජා පාදක සංවිධානයක සාමාජිකයෙකු	සාමාජික

දුක්ගැනවිලි සඳහා සහන සැලසීමේ කමිටුව වෙත ඉදිරිපත් කෙරෙන දුක්ගැනවිලි/ පැමිණිලි සම්බන්ධයෙන් විසඳුම් ලබාදීමේදී ඒවා ඉදිරිපත් කරන්නාගේ ස්ත්‍රී පුරුෂ භාවය නොසලකා සැමට සමාන අයුරින් සලකා කටයුතු කරනු ඇත. දුක්ගැනවිලි සඳහා සහන සැලසීමේදී ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයට සමව සැලකීම පිණිස අවම වශයෙන් එම ප්‍රජාව නියෝජනය කරන එක් කාන්තාවක්වත් දුක්ගැනවිලි සඳහා සහන සැලසීමේ කමිටුවට ඇතුළත් කරනු ඇත.

ලියුම්, දුරකථන ඇමතුම් හෝ ඊ-තැපැල යන කවර හෝ ආකාරයකින් ඉල්ලීම් සහ පැමිණිලි බාරගනු ලැබේ. එසේම මහජනතාවට හෝ පාර්ශවකරුවන්ට සිය යෝජනා, ඉල්ලීම් හෝ පැමිණිලි ව්‍යාපෘති කළමනාකරණ ඒකකය, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ උපදේශක හෝ කොන්ත්‍රාත්කරු/ කොන්ත්‍රාත්කරුවන් වෙත වාචිකව ඉදිරිපත් කළ හැකිය. ව්‍යාපෘති කළමනාකරණ ඒකකය සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ උපදේශක නිලධාරීන් සම්බන්ධ කරගත හැකි දුරකථන අංක, ව්‍යාපෘති භූමියෙහි තබා ඇති ව්‍යාපෘති තොරතුරු ප්‍රදර්ශනය කරන දැන්වීම් පුවරුවෙහි ප්‍රදර්ශනය කොට ඇත. සිය යෝජනා, ඉල්ලීම් සහ පැමිණිලි ලිඛිතව (ලියුම් වශයෙන්) සෑම කොන්ත්‍රාත් වැඩබිමකම/ ප්‍රතිස්ථානගත කිරීමේ භූමියකම පිහිටි ආරක්ෂක කුටියේ තබා ඇති පැමිණිලි පෙට්ටියට බහාලීමට මහජනතාවට සහ පාර්ශවකරුවන් හට අවස්ථාව පවතී. යෝජනා, ඉල්ලීම් හෝ පැමිණිලි සෘජුවම ව්‍යාපෘති කළමනාකරණ ඒකකය සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ උපදේශක වෙත ලිඛිතව භාරදිය හැකිය.

ව්‍යාපෘතියෙන් බලපෑමට ලක්වන පුද්ගලයන් ඉදිරිපත් කරන යෝජනා, පැමිණිලි හෝ ඉල්ලීම් භාරගෙන සටහන් කරගැනීම/ ලේඛනගත කිරීම සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ උපදේශකගේ නියෝජිතයෙකු (PIC) ව්‍යාපෘති කළමනාකරුගේ කාර්යාලයේ "ප්‍රධාන රෙජිස්ටරයක්" පවත්වාගෙන යනු ඇත. දුක්ගැනවිලි සඳහා සහන සැලසීමේ කමිටු රැස්වීම්වල රැස්වීම් වාර්තා සහ ඒවායේදී ගනු ලබන තීරණ සමාජ ආරක්ෂණ නිලධාරියා විසින් සටහන් කර ගන්නා අතර එම තීරණ "ප්‍රධාන රෙජිස්ටරයෙහි" ද සටහන් කරනු ඇත. "ප්‍රධාන රෙජිස්ටරය" පවත්වා ගැනීමේ හා යාවත්කාලීන කිරීමේ වගකීම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ උපදේශකගේ නියෝජිතයෙකු (PIC) පරිසර නිලධාරී/ සමාජ නිලධාරී විසින් ගනු ඇත.

දුක්ගැනවිලි සඳහා සහන සැලසීමේ යාන්ත්‍රණයෙහි නිර්දේශිත පියවර සහ ඒ සඳහා වැයවන කාලය සටහන 2 හි දක්වා ඇත.

5.3 දුක්ගැනවිලි සඳහා සහන සැලසීමේ යාන්ත්‍රණය සහ දුක් ගැනවිලි සඳහා සහන සැලසීමේ කමිටුව සුපරීක්ෂණය හා ඇගයීම

දුක්ගැනවිලි සඳහා සහන සැලසීමේ යාන්ත්‍රණයෙහි සමස්ථ ඵලදායීතාවය සහ බලපෑම, ඇගයීම් ක්‍රියාවලියක් හරහා තක්සේරු කිරීම සිදු කරනු ඇත. කැළණිවැලි දුම්රිය මාර්ගයේ පළමු අදියර හි ඇගයීම් ක්‍රියාවලිය වසර 2කට වරක් සිදුවනු ඇති අතර එහි ප්‍රතිඵල; දුක්ගැනවිලි සඳහා සහන සැලසීමේ යාන්ත්‍රණයෙහි කාර්ය සාධනය වර්ධනය කිරීම, පැමිණිලිවල ස්වභාවය සුපරීක්ෂණය කිරීම සහ ක්‍රියාත්මක කිරීම් සිදුවන ආකාරය පරීක්ෂා කිරීම, කාලෝචිත නිවැරදි තීරණ ගැනීම සහ අවශ්‍ය අවස්ථා වලදී උපාය මාර්ගික වෙනස්කම් සිදු කිරීම පිණිස ව්‍යාපෘති කළමනාකරණ ඒකකය වෙත ප්‍රතිපෝෂණය ලබාදීම යන කාර්යයන් සඳහා යොදාගත හැකිය. එසේම, ව්‍යාපෘතිය සම්බන්ධයෙන්, ඉන් බලපෑමට ලක්වූවන් සෑහීමට පත්වන්නේද යන කාරණය පිළිබඳව ප්‍රතිපෝෂණයක්ද මෙමගින් ලබාදෙයි.

5.4 අතෘප්තියට පත් පාර්ශවයන්ට සිය දුක්ගැනවිලි ඉදිරිපත් කළ හැකි වෙනත් ආයතන

ඉඩම් අත්කර ගැනීමේ සමාලෝචන මණ්ඩලය/ Land Acquisition Review Board (LARB)

කිසියම් අත්කර ගැනීමකදී තක්සේරු දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද ව්‍යවස්ථාපිත තක්සේරුව සම්බන්ධයෙන් යම් අතෘප්තියට පත් පාර්ශවයකට, ඉඩම් අත්කර ගැනීමේ සමාලෝචන මණ්ඩය වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැකිය යන බවට ප්‍රතිපාදන ඉඩම් අත්කර ගැනීමේ පනතේම අන්තර්ගතව ඇත. ඉඩම් අත්කර ගැනීමේ පනතේ 17 වන වගන්තිය යටතේ වන්දි ප්‍රදානය ලැබී දින 21ක් ඇතුළත එම අභියාචනය ඉදිරිපත් කළ යුතුය.

සමථ මණ්ඩලය – SM (Board of Mediation)

සෑම අධිකරණ දිස්ත්‍රික්කයක් වෙනුවෙන්ම ගැටුම් විසඳීම සඳහා අධිකරණ අමාත්‍යාංශය විසින් පත් කරන ලද, සමාජයේ ගෞරවාන්විත පුරවැසියන්ගෙන් සමන්විත කමිටුවක් වන අතර සමථ මණ්ඩලය විසින් ගනු ලබන තීරණ ගැටුමට පාදක වූ එකදු පාර්ශවයකටවත් පාක්ෂික නොවේ. තීරණයක් බලාත්මක කිරීමට අධිකාරී බලයක් එය සතු නොවන අතර දීර්ඝ කාලයක් ගතවන නඩු මාර්ගයකට නොයා මිත්‍රශීලීව ගැටුම් සමථයකට පත් කිරීම සඳහා අදාළ පාර්ශවයන් උනන්දු කරවනු පිණිස ව්‍යාපෘතියෙන් බලපෑමට ලක් වූ පුද්ගලයන් අතර පවතින ආරවුල් ද සමථ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ හැකිය.

මානව හිමිකම් කොමිසම - Human Rights Commission (HRC)

රජයේ නිලධාරීන් සහ ආයතන විසින් සිදු කරන මානව හිමිකම් කඩකිරීම් සම්බන්ධයෙන් කටයුතු කිරීම සහ විමර්ශනය කිරීම පිණිස ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ස්ථාපිත කරන ලද කොමිෂන් සභාවකි. රජයේ නිලධාරීන් විසින් සිදු කරන අල්ලස් හා නීති විරෝධී කටයුතු වලින් පුරවැසියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම පිණිස රජය විසින් පිහිටවනු ලැබ ඇති යාන්ත්‍රණය ව්‍යාපෘතියෙන් බලපෑමට ලක්ව අතෘප්තියට පත් වූ පාර්ශවයන්ට මානව හිමිකම් කොමිසමෙන් සහන අපේක්ෂා කළ හැකිය.

පාර්ලිමේන්තුවේ ඔම්බුඩ්ස්මන්වරයා - Parliamentary Ombudsman

මහජනතාව විසින් ඔහුගේ අවධානය වෙත ඉදිරිපත් කොට ඇති ගැටළු හා දුක්ගැනවිලි විමර්ශනය කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පත් කරනු ලැබ ඇති ස්වාධීන නිලධාරියෙකි.

පාර්ලිමේන්තු පෙත්සම් කාරක සභාව - Parliament Petition Committee (PPC)

අතෘප්තියට පත් යම් පාර්ශවයකට සිය දුක්ගැනවිලි පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු හරහා (මහජන නියෝජිතයෙකු හරහා) පාර්ලිමේන්තුවේ කථානායකවරයා වෙත ඉදිරිපත් කළ හැකිය. අනතුරුව එම ගැටළුව, ගරු කථානායකවරයා විසින් පාර්ලිමේන්තු කාරක සභාව වෙත ඉදිරිපත් කරනු ඇත. ගැටළුව ඉදිරිපත් කරනු ලැබූ පුද්ගලයාගේ ඉල්ලීම් සාධාරණ බව කමිටුවට හැඟී ගියහොත් අගතියට පත් පාර්ශවය වෙත අදාළ සහන ලබාදෙන මෙන් වරදකාර පාර්ශවයට කමිටුව විසින් දන්වනු ලැබේ.

නඩු කටයුතු - Litigation

ඉඩම් අත්කර ගැනීම් ක්‍රියාත්මක කිරීමේදී සහ ක්‍රියාත්මක කිරීමේ කාර්යයයේදී කවර හෝ රජයේ නිලධාරියෙකු විසින් ලබාදෙන යම් තීරණයක් හේතුවෙන් අතෘප්තියට පත්වන පාර්ශවයක් අදාළ නිලධාරීන් සමඟ සාකච්ඡා කොට සඳහා සාධාරණ සහනයක් ලබා ගැනීමට අපොහොසත් වන අවස්ථාවකදී සුදුසු අධිකරණයකදී එම පාර්ශවයට එම තීරණය අභියෝගයට ලක්කළ හැකිය.

නීති ආධාර කොමිසම - Legal Aid Commission

ස්වකීය ගැටළු වලට විසඳුම් ලබා ගැනීමේ අරමුණින් අධිකරණයේ පිහිට පැතීමට අපේක්ෂා කරන නමුත් ඊට අවශ්‍ය වියදම් සපයා ගැනීමට නොහැකි වන පුද්ගලයන් හට උදවු කිරීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් ස්ථාපිත කරනු ලැබූ ආයතනයකි. ස්වකීය ආදායම් තත්ත්වය පිළිබඳ පිළිගත හැකි සාක්ෂි සහිතව නීති ආධාර කොමිසමේ ලේකම් වෙත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් පසුව අදාළ අතෘප්තියට පත් පාර්ශවය වෙනුවෙන් කිසිදු අයකිරීමකින් තොරව නඩු කටයුතු වෙනුවෙන් පෙනී සිටිනු ඇත.



සටහන 2: කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය සඳහා යෝජිත දුක්ගැනවිලි සඳහා සහන සැලසීමේ යාන්ත්‍රණය

6 වන පරිච්ඡේදය - නීතිකාරකය සහ ප්‍රතිපත්ති රාමුව

කැළණිවැලි දුම්රිය මාර්ගයේ පළමු අදියර සඳහා අදාළ වන ඉඩම් අත්කර ගැනීම හා නැවත පදිංචි කිරීම සඳහා වන නීති කාරකය සහ ප්‍රතිපත්ති රාමුව මෙම පරිච්ඡේදය මගින් සාකච්ඡා කරනු ලබයි. අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටි කවරේද යන්න මෙමගින් පැහැදිලි කෙරේ.

6.1 අදාළ වන නීති

6.1.1 ඉඩම් අත්කර ගැනීමේ පනත (LAA)

මහජන කාර්යයන් වෙනුවෙන් ඉඩම් සහ පරවශ්‍යතාව අත්කර ගැනීම සඳහාත්, ඊට ආනුෂාංගික කරුණු වෙනුවෙනුත් විධිවිධාන සලසන වඩාත් වැදගත් නෛතික ප්‍රතිපාදනය 1950 ඉඩම් අත්කර ගැනීමේ පනත වේ. ඉඩම්, ඉදිකිරීම් සහ බෝග වෙනුවෙන් වෙළඳපල වටිනාකම මත වන්දි ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන මෙම පනත මගින් සැලසෙයි. 1950 ඉඩම් අත්කර ගැනීමේ පනත ප්‍රධාන වශයෙන්ම ඉඩම් අත්කර ගැනීම සම්බන්ධ පනත් (English Land Clauses Acts) ආදර්ශ කොටගෙන සම්පාදනය කොට ඇති අතර 1919 ඉඩම් අත්කර ගැනීමේ පනත හා Acquisition of Land Authorization Procedure Act 1946 සහ 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ සංශෝධන පනත ලෙස විකාශනය වී ඇත.

දැනට පවතින ඉඩම් අත්කර ගැනීමේ පනත විවිධ සංශෝධන වලට භාජනය වී ඇති අතර අවසන් සංශෝධනය 1986 දී සිදුකර ඇත. ඉඩම් අත්කර ගැනීමේ පනතට 2008 වසරේදී හඳුන්වා දෙනු ලැබූ නියෝග අංක 1585/7 හා 2009 ජනවාරි 20 වන අඟහරුවාදා අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද අතර එම නියෝග වලට අනුව ප්‍රතිස්ථාපන පිරිවැය මත පදනම්ව වන්දි ලබාදීම මගින් නැවත පදිංචි කිරීම සැලසුම් කිරීමේදී සැලකිය යුතු බලපෑමක් ඇතිකොට ඇත.

වගුව 6.1: ඉඩම් අත්කර ගැනීමේ පටිපාටිය

කාර්යය	වගකීම දරන නියෝජිත ආයතනය
අත්කර ගැනීමේ යෝජනාව සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම	ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ආයතනය/ ක්‍රියාත්මක කිරීමේ නියෝජිත ආයතනය
අත්කර ගැනීමේ නියෝගය නිකුත් කිරීම (ඉඩම් අත්කර ගැනීමේ පනත - 2 වන වගන්තිය)	ඉඩම් අමාත්‍යාංශය
2 වන වගන්තිය යටතේ දැන්වීම් සකස්කර ප්‍රදර්ශනය කිරීම	ප්‍රාදේශීය ලේකම්
ප්‍රගමන අනුරේඛනය සකස් කිරීම	මිනින්දෝරු දෙපාර්තමේන්තුව
ඉඩම අත්කර ගැනීම සඳහා නියෝගය නිකුත් කිරීම (4 වන වගන්තිය)	ඉඩම් අමාත්‍යාංශය
4 වන වගන්තිය යටතේ දැන්වීම් සකස්කර පළ කිරීම	ප්‍රාදේශීය ලේකම්, රජයේ මුද්‍රණාලය

විරෝධතා පරීක්ෂණය	ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ආයතනය/ ක්‍රියාත්මක කිරීමේ නියෝජිත ආයතනය
5 වන වගන්තිය යටතේ ප්‍රකාශය ගැසට් පත්‍රයේ පළ කිරීම	ප්‍රාදේශීය ලේකම්, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව
මූලික පිඹුර සකස් කිරීම	මිනින්දෝරු දෙපාර්තමේන්තුව
7 වන වගන්තිය යටතේ දැන්වීම ගැසට් පත්‍රයේ පළ කිරීම	ප්‍රාදේශීය ලේකම්
9 වන වගන්තිය යටතේ විමර්ශනය සිදු කිරීම	ප්‍රාදේශීය ලේකම්
10-1 වගන්තිය යටතේ තීරණය ගැනීම	ප්‍රාදේශීය ලේකම්
තක්සේරු කිරීම	තක්සේරු දෙපාර්තමේන්තුව
17 වන වගන්තිය යටතේ ප්‍රදානය	ප්‍රාදේශීය ලේකම්
වන්දි ගෙවීම	ප්‍රාදේශීය ලේකම්
38 (a) වගන්තිය යටතේ ආඥාව නිකුත් කිරීම	ඉඩම් අමාත්‍යාංශය, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව
38 (a) වගන්තිය යටතේ අතුරු විධාන ආඥාව නිකුත් කිරීම	ඉඩම් අමාත්‍යාංශය, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව
ඉඩමේ හිස් අයිතිය බාර ගැනීම	ප්‍රාදේශීය ලේකම්, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ආයතනය/ ක්‍රියාත්මක කිරීමේ නියෝජිත ආයතනය
ඉඩම ලියාපදිංචි කිරීම	ප්‍රාදේශීය ලේකම්, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ආයතනය/ ක්‍රියාත්මක කිරීමේ නියෝජිත ආයතනය

ඉඩම් අත්කර ගැනීම සහ ස්වකැමැත්තෙන් තොරව අවතැන් වූවන් නැවත පදිංචි කිරීම හා සම්බන්ධ අහිතකර බලපෑම් සියල්ලට ප්‍රතිකර්ම සැපයීම පිණිස ඉඩම් අත්කර ගැනීමේ පනතේ පවතින ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවේ. ඉඩම අහිමිවන තැනැත්තාගේ සමාජ ආර්ථික තත්ත්ව සහ ඔවුන්ගේ ආදායම් හා ජීවනෝපාය කෙරෙහි එමඟින් ඇති කරන දීර්ඝකාලීන බලපෑම් පිළිබඳවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතෙහි ප්‍රමාණවත් විධිවිධාන නොමැත. ඉඩම් හිමියෙකු විවෘත වෙළඳපලේ ස්වකීය ඉඩම විකුණනු ලැබුවහොත් ඒ සඳහා ලැබෙන මුදලට සමාන මුදලක් එනම්, වෙළඳපල වටිනාකම, වන්දි වශයෙන් ගෙවිය යුතු බව ඉඩම් අත්කර ගැනීමේ පනතේ විස්තර වන නමුත් ආසියානු සංවර්ධන බැංකුවේ 2009 සමාජ ආරක්ෂණ ප්‍රතිපත්ති ප්‍රකාශනයෙහි සඳහන් වනුයේ වෙළඳපල වටිනාකම සහ නැවත පදිංචි කිරීමේ වෙනත් සහාය අන්තර්ගත පැකේජ ඇතුළත් 'ප්‍රතිස්ථාපන පිරිවැය' වන්දි වශයෙන් ගෙවිය යුතු බවයි. නැවත පදිංචි කිරීමේ බලපෑම් පිළිබඳව අත්කර ගැනීමෙන් පසු සිදු කරන සුපරීක්ෂණය පිළිබඳව විධි විධානද ඉඩම් අත්කර ගැනීමේ පනතේ අන්තර්ගත නොවේ.

6.1.2 2008 වන්දි ගෙවීමේ ජාතික ප්‍රතිපත්තිය සහ 2008 ඉඩම් අත්කර ගැනීමේ රෙගුලාසි

ප්‍රමාණවත් වන්දි මුදලක් ඉඩම්හිමියන් සඳහා ලබාදීම පිණිස ඒකීය ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම පිණිස ඉඩම් අත්කර ගැනීමේ පනත, ස්වකැමැත්තෙන් තොරව අවතැන්වූවන් නැවත පදිංචි කිරීමේ ජාතික ප්‍රතිපත්තිය සහ ඉඩම් අත්කර ගැනීම හා නැවත පදිංචි කිරීම වෙනුවෙන් අනුගත කළ හැකි වෙනත් නීති රාශියක් මත පදනම්ව වන්දි ගෙවීමේ ජාතික ප්‍රතිපත්තිය 2008 නොවැම්බර් මාසයේදී අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කොට ඇත.

6.1.3 ඉඩම් අත්කර ගැනීමේ හා නැවත පදිංචි කිරීමේ කමිටුව (ලාර්ක් හා සුපර් ලාර්ක්) 2013

අංක 1585/7 හා 2009 ජනවාරි 20 දිනැති ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ 2008 ඉඩම් අත්කර ගැනීමේ නියෝග පැනවීමෙන් පසු ලාර්ක් හා සුපර් ලාර්ක් කමිටු ක්‍රමය අවසන් කරන ලදී. නමුත් 2008 අගෝස්තු 31 දිනට පෙර ආරම්භ කරනු ලැබූ නිශ්චිත ව්‍යාපෘති වශයෙන් අනුමැතිය ලබාගෙන ඇති මාර්ග ව්‍යාපෘති වෙනුවෙන් මෙම ක්‍රමය තවමත් බලපැවැත්වේ.

කෙසේවුවද, ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය විසින් පනවනු ලැබ අංක 1864/54 හා 2014.05.30 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ව්‍යාපෘති සමහරකටද 2014 වසරේදී නැවත වරක් ලාර්ක්/ සුපර් ලාර්ක් ක්‍රමය හඳුන්වා දෙන ලදී.

6.1.4 1935 ඉඩම් සංවර්ධන ආඥා පනත - Land Development Ordinance (1935)

මෙම ආඥා පනතේ සහ ඊට පසුව ඒ සඳහා හඳුන්වා දුන් සංශෝධන ප්‍රකාරව, රජයේ ඉඩම් භුක්ති විඳින පුද්ගලයන් හට, ප්‍රශ්නගත ඉඩම නියමානුකූල කිරීමට අවසර ලබාදෙන මෙන් ප්‍රාදේශීය ලේකම්ගෙන් ඉල්ලීමක් කළ හැකිය. අදාළ ඉඩම (රක්ෂිතයක්) ලෙස වෙන්කළ ඉඩමක් නොවන්නේ නම් සහ රජයේ වෙනත් අරමුණක් වෙනුවෙන් අවශ්‍ය නොවන්නේ නම් අත්කර ගැනීමේ නිලධාරියා මේ පිළිබඳව විමර්ශනයක් සිදුකොට, මූලික වශයෙන් එක් අවුරුදු බලපත්‍රයක් නිකුත් කිරීමට නිර්දේශ කරයි. අනතුරුව ඉඩමට නෛතික හිමිකමක් සහිත දීර්ඝකාලීන බලපත්‍රයක් නිකුත් කරනු ලබන අතර මෙම ඉඩම බැහැර කිරීමේ අයිතිය බලපත්‍රලාභියා සතු නොවේ. මෙම දීමනාපත්‍ර ආකාරය 'ස්වර්ණ භූමි' හෝ 'ජය භූමි' ලෙස හැඳින්වේ.

6.1.5 1903 අංක 1 දරන දුම්රිය ආඥා පනත (සංශෝධිත)

එකී ආඥා පනතේ 31 වගන්තිය ප්‍රකාරව "දුම්රිය මාර්ගයට හෝ දුම්රිය දෙපාර්තමේන්තුව සතු වෙනත් කවර හෝ ඉඩමකට, දුම්රිය ස්ථානයකට හෝ වෙනත් භූමියකට ඇතුළු වීම දඬුවම් ලැබිය හැකි වරදකි". එහි තවදුරටත් සඳහන් වනුයේ "එසේ ඇතුළු වූ තැනැත්තෙකු හට දුම්රිය මාර්ගයෙන් හෝ ඉඩමකින්, දුම්රිය ස්ථානයකින් හෝ ඊට අයත් වෙනත් භූමියකින් ඉවත් වන ලෙස කවර හෝ දුම්රිය නිලධාරියෙකු ඉල්ලා සිටි විට.. එසේ කිරීම ප්‍රතික්ෂේප කරයි නම්, .. එය දඬුවම් ලැබිය හැකි වරදක්" වන අතර "එවන් නිලධාරියෙකු හට එම පුද්ගලයා ඉන් ඉවත් කළ හැකිය". 1935 දී නිකුත් කළ ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දුවකින් පැහැදිලි කරනුයේ.. "දුම්රිය මාර්ගය" යන්නට දැනට ඉදිකර ඇති සියලු දුම්රිය මාර්ගත්, ඉදිකිරීමට නියමිත භූමියත් අයත් වන බැවින් දුම්රිය මාර්ගයක එම දුම්රිය මාර්ගය දෙපස වෙන්කළ බිම් තීරය අත්කරගත නොහැකිය.

6.1.6 1947 අංක 8 දරන රජයේ ඉඩම් ආඥා පනත

මෙම ආඥා පනත 1947 අංක 8 දරන රජයේ ඉඩම් ආඥා පනත නමින් හඳුන්වනු ලැබේ. සිදු කළ හැකි ඉඩම් ප්‍රදාන සහ එම ප්‍රදාන සඳහා වන බදු මුදල සම්බන්ධයෙන් ආඥා පනතේ (b) වගන්තියෙන් විස්තර කෙරෙයි.

22 වන වගන්තියේ සඳහන් වන ආකාරයට ප්‍රදානයක කාල සීමාව වසර 50ක් දක්වා වන අතර ආඥා පනතේ නියම කර ඇති ආදර්ශ ආකෘතිය සම්පූර්ණ කොට එම ප්‍රදානයේ අත්සන් තැබීම සඳහා බලය පවරා ඇති නිලධාරියා විසින් අත්සන් තැබිය යුතු වේ. යම් පුද්ගලයෙකු රජයේ ඉඩමක් ලබා ගැනීමට අපේක්ෂා කරයි නම් ඔහු/ ඇය අදාළ

ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්වරයා වෙත ඉල්ලීමක් ඉදිරිපත් කළ යුතුය. එම පුද්ගලයන් ඉඩම ලද පසු ඒ වෙනුවෙන් ඉඩම් කොමසාරිස් හෝ ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නියම කරනු ලබන මුදලක් බදු මුදල් වශයෙන් ගෙවිය යුතු වේ.

දුම්රිය සාමාන්‍යාධිකාරීවරයාගේ විෂය පථය යටතට ගැනෙන ඉඩම් බදු දීම සඳහා ද එම සාමාන්‍යාධිකාරීවරයා වෙත විධිවිධාන සලසා ඇත. මෙම ව්‍යාපෘතිය හේතුවෙන් එවන් ඉඩම් බලපෑමට ලක්වන්නේ නම් දුම්රිය දෙපාර්තමේන්තුව සමඟ එළැඹී ගිවිසුම ප්‍රකාරව ඉතිරි කාල පරිච්ඡේදය සඳහා වන්දි ලබාදිය හැකිය.

6.1.7 1970 අංක 7 දරන රජයේ ඉඩම් (සන්තකය ආපසු ගැනීමේ) පනත

යම් රජයේ ඉඩම් කොටසක් කිසියම් පුද්ගලයෙකු අනවසර ආකාරයෙන් භුක්ති විඳීම හෝ සන්තකයේ තබාගෙන ඇත්තේද යන්න නිශ්වය කිරීම පනත යටතේ පත් කරනු ලැබූ නිසි බලධාරියාට සිදුකළ හැකිය. එවන් අවස්ථාවකදී, දින 30ක් ඇතුළත එම ඉඩම් කොටසින් ඉවත් වී බලධාරීන්ට භාරදිය යුතු බව එවන් පුද්ගලයෙකුට දන්වමින් බලධාරීන් විසින් නිවේදනයක් නිකුත් කරනු ඇත. එවන් දැන්වීමක් සම්බන්ධයෙන් කිසියම් නඩු කටයුත්තක් සිදු කිරීමට හෝ ඉදිරිපත් කිරීමකට එවන් පුද්ගලයෙකු හිමිකම් නොලබයි.

6.1.8 1871 අංක 22 දරන කාලාවරෝධී ආඥා පනත

පුද්ගලික ඉඩමක් අනවසරයෙන් අල්ලාගෙන අවුරුදු 10කට වඩා වැඩි කාලයක් එය භුක්ති විඳි පුද්ගලයන් හට මෙම ආඥා පනතේ 3 හා 13 වගන්ති ප්‍රකාරව, ඉඩමේ කාලාවරෝධී අයිතිය සඳහා අධිකරණයේ පිහිට පැතිය හැකිය.

මින් පසුව බලාත්මක වූ වෙනත් ව්‍යවස්ථාපිත නීති පහත දක්වා ඇත. විශේෂිත අවශ්‍යතාවයන් සඳහා අනිවාර්යයෙන් දේපළ මිලදී ගැනීම හෝ ‘වෙළඳපල මිල’ මත පදනම්ව වන්දි ගෙවීමට මැදිහත් වීමත් වන්දි ගෙවීම මගින් පනවා ඇති නීති ප්‍රතිපාදන අනුව රජය විසින් අනිවාර්යයෙන් දේපළ අත්කර ගන්නා විට සහ රජය වෙත පැවරෙන අවස්ථාවලදී දේපලෙහි වටිනාකම නිශ්වය කිරීමේදී ඇතැම් සීමා කිරීම්, කොන්දේසි සහ අවස්ථාවන් නියම කිරීමත් මෙමගින් සිදුවෙයි.

- 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරී නීතිය
- 1979 අංක 17 දරන ජාතික නිවාස සංවර්ධන අධිකාරී පනත
- 1978 අංක 4 දරන මහකොළඹ ආර්ථික කොමිෂන් සභා නීතිය
- 1946 නගර සහා ගම් සැලසුම් කිරීමේ ආඥා පනත
- 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ නීතිය - 1972 අංක 26 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනත
- 1968 අංක 15 දරන කොළඹ දිස්ත්‍රික්කයේ (පහත් බිම්) ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ මණ්ඩල පනත
- 1972 අංක 7 දරන ගෙවල් කුලී පනත සහ ඒ සඳහා පනවනු ලැබූ සංශෝධිත 1980 අංක 55 සහ 2002 අංක 26 දරන පනත්
- 1972 අංක 5 දරන සමූපකාර සංගම් පනත
- 1973 අංක 1 දරන නිවාස දේපළ උපරිම සීමා නීතිය
- 1973 අංක 11 දරන බද්ධ නිවාස අයිතිවාසිකම් ආඥා පනත
- වෙරළ සංරක්ෂණ පනත
- 1979 අංක 58 දරන ගොවිජන සේවා පනත
- 1956 අංක 45 දරන මාර්ග සහ මංමාවත් පනත සහ 1973 අංක 73 දරන නීතිය

මෙම ව්‍යාපෘතියෙන් බලපෑමට ලක්වන මෙම කොටස තුළද නියමානුකූල කරන ලද ඉඩම්වල පිහිටි නිවාස භුක්ති විඳින පදිංචිකරුවන් සිටින අතර එම ඉඩම් සඳහා ඔවුන්ගේ හිමිකම් ජාතික නිවාස සංවර්ධන අධිකාරී පනත යටතේ එකී අධිකාරිය මගින් සහතික කර ඔප්පු ලබා දී ඇත.

6.1.9 1931 අංක 19 දරන බෞද්ධ විහාර දේවාලගම් ආඥා පනත

මෙම මුල් පනත බ්‍රිතාන්‍යයන් විසින් 1886 වසරේදී හඳුන්වා දී ඇති අතර නැවත 1931 වසරේදී සංශෝධනය කර ඇත. පාලකයින් විසින් පූජා ඔප්පු හෝ අතීතයේ රජවරුන් විසින් සන්නස් ලෙස හෝ විහාර සහ දේවාල (දෙවියන් උදෙසා ඉදි කළ හෝ වැඳුම් පිදුම් කිරීම සඳහා පිළිම පිහිටවූ ඉඩම්) වෙනුවෙන් ඉඩම් පූජා කිරීම හා සම්බන්ධයෙන් විධිවිධාන සපයයි.

උදාහරණ ලෙස 1931 අංක 19 දරන බෞද්ධ විහාර දේවාලගම් ආඥා පනතෙහි විෂය පථය යටතට ගැනෙන පන්සල්වලට අයත් දේපල පාලනය කිරීමේ වගකීම ඒ සඳහා පත් කරනු ලැබූ භාරකාර මණ්ඩලයක් වෙත පවරා ඇත. එවන් පූජා භූමි දේපළ වලින් සැලකිය යුතු කොටසක් සංවර්ධනය කර නොමැති අතර අවම භාවිතය සමඟ වල්වැදී ඇත. ඒවා භාරකාර මණ්ඩලයේ කළමනාකරණය යටතේ පවතී. මෙම ආඥා පනතේ පවතින අනෙකුත් විධිවිධාන අතර, මෙම දේපළ පොදු මහජන කාර්යයන් වෙනුවෙන් අත්කර ගැනීමේදී ඒ වෙනුවෙන් ලබා දෙන වන්දිය ලබා ගැනීමට පන්සල් හා දේවාලවල භාරකාරවරුන්ට අයිතියක් පවතින බව සඳහන් වේ.

6.1.10 1980 සහ 1988 දරන ජාතික පාරිසරික පනත

1988 අංක 56 දරණ පනතින් සංශෝධනය කරන ලද 1980 අංක 47 දරණ ජාතික පරිසර පනතෙහි (NEA) ස්වකැමැත්තෙන් තොරව අවතැන්වූවන් නැවත පදිංචි කිරීමට අදාළ විධිවිධාන සමහරක් පවතී. ජාතික පරිසර පනතේ IV වන කොටසේ - ‘C’ ප්‍රකාරව මධ්‍යම පරිසර අධිකාරියේ අනුමැතිය අවශ්‍ය ව්‍යාපෘති හා කාර්යයන් කවරේද යන්න අංක 859/14 දී හා 1995 පෙබරවාරි 23 දිනැති ගැසට් පත්‍රයේ නිශ්චිතව සඳහන් කොට ඇත. යම් ව්‍යාපෘතියක් හේතුවෙන් බලපෑමට ලක්වන ස්වකැමැත්තෙන් තොරව නැවත පදිංචි කිරීමට සිදුවන කුටුම්බ සංඛ්‍යාව 100ක් හෝ ඊට වඩා වැඩි වන්නේ නම්, නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරකම් සැලැස්මක් සකස් කළ යුතු බව උපලේඛනයේ අයිතම 12 යටතේ දක්වා ඇත. මෙම නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරකම් සැලැස්ම පාරිසරික තක්සේරු වාර්තාවේ අතිරේක සැලසුම් ලියවිල්ලක් වනු ඇත.

6.1.11 දිළිඳු සහන ආඥා පනත Poor Law Ordinance

මූලික වශයෙන් කොළඹ, මහනුවර හා ගාල්ල යන මහනගර සභා සඳහා 1939 අංක 30 දරන **දිළිඳු සහන ආඥා පනත** හඳුන්වා දෙනු ලැබූ අතර රටේ අනෙක් කොටස්වලටද සමාජ ආරක්ෂණ ජාලය ව්‍යාප්ත කරමින් 1947 සමාජ සේවා කොමිසම විසින් තවදුරටත් ශක්තිමත් කරන ලදී. දිළිඳු පුද්ගලයන් වෙනුවෙන් පනවනු ලැබූ එවන් සමාජ සුරක්ෂිතතා ජාල බොහොමයක් මේ මත පදනම් වී ඇත. උදාහරණ ලෙස දිළිඳු බව පිටුදැකීම උදෙසා ක්‍රියාත්මක ජන සවිය වැඩසටහනත් දැනට ක්‍රියාත්මක වන සමෘද්ධි වැඩසටහනත් මෙම ආඥා පනත මත පදනම්ව සකස් කර ඇත. මෙම වැඩසටහන් වල අරමුණ වනුයේ දිළිඳු යැයි හඳුනාගත් පුද්ගලයන්ගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීමයි.

6.1.12 කාන්තාවන් සහ ළමුන් ආරක්ෂා කිරීමේ ආඥා පනත

ළමුන් සහ තරුණ පුද්ගලයන් සේවයේ යෙදවීම සඳහා පවතින නීති ප්‍රතිපාදන ඉතා සංකීර්ණ වන අතර ආඥා පනත් ගණනාවක් මෙම ගැටළු සම්බන්ධයෙන් විධිවිධාන සපයයි. මෙම ආඥා පනත්වල අරමුණ වනුයේ ළමුන් ආරක්ෂා කිරිම සහ ඔවුන්ගේ අධ්‍යාපනය හා විවේකය වෙනුවෙන් සාමකාමී පරිසරයක් ලබා දීමයි.

1993 මාර්තු මාසයේදී ස්ථාපිත කරනු ලැබූ ශ්‍රී ලංකා රජයේ කාන්තා ප්‍රඥප්තිය ඉහත සඳහන් කරනු ලැබූ කාරණයම විස්තර කරනු ලබයි. මීට අමතරව, 1995 සහ 1998 වර්ෂ වලදී ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහයට හඳුන්වා දෙනු ලැබූ සංශෝධන මගින් ලිංගික හිංසනය, අපචාර සහ නීතිවිරෝධී ලෙස කාන්තාවන් ජාවාරම් කිරීම යන වරද සම්බන්ධයෙන් දෙන දඬුවම් පිළිබඳව පැහැදිලිවම විධිවිධාන සපයන අතර මෙම වරද සම්බන්ධයෙන් වන දඬුවම් වැඩි කිරීමද සිදුකර ඇත. තවද, 2005 අංක 34 දරන ගෘහස්ථ හිංසනය වැළැක්වීමේ පනත මගින් ළමුන් හා කාන්තාවන්ට සිදුව ඇති ලිංගික හිංසනය, අපචාර සහ නීතිවිරෝධී ලෙස කාන්තා හා ළමා ජාවාරම් කිරීම සම්බන්ධයෙන් ආරක්ෂා කිරිම සඳහා නීති ප්‍රතිපාදන සැපයෙයි.

6.1.13 කම්කරු නීතිය

කම්කරුවන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ වන නීති පද්ධතිය ආඥා පනත් 25කින් සමන්විත වන අතර ඒවායේ පරිපාලන අධිකාරීත්වය දරනුයේ කම්කරු දෙපාර්තමේන්තුවේ කොමසාරිස්වරයායි. කෙසේවුවද, ඒ අතුරින් පහත සඳහන් නීති වඩාත් වැදගත් සේ සලකනු ලබයි.

- 1941 අංක 21 දරන පඩිපාලක සභා ආඥා පනත
- 1943 අංක 19 දරන සේවකයින්ගේ වන්දි ආඥා පනත
- 1935 අංක 14 දරන සේවක සංගම් ආඥා පනත
- 1954 අංක 19 දරන සාප්පු හා කාර්යාල ආඥා පනත
- 1865 අංක 11 දරන සේවා කොන්ත්‍රාත් ආඥා පනත
- 1983 අංක 12 දරන අර්ථසාධක අරමුදල් ගෙවීමේ ආඥා පනත
- 1956 අංක 47 දරන කාන්තාවන්, තරුණයින් සහ ළමුන් සේවයේ යෙදවීමේ පනත
- 1988 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂණ අධිකාරී පනත
- 1980 අංක 46 දරන සේවක භාරකාර අරමුදල
- 1958 අංක 15 දරන සේවක භාරකාර අරමුදල

6.2 ප්‍රතිපත්ති වැඩ රාමුව

ඉඩම් අත්කර ගැනීමේ පනත මගින් විධිවිධාන සැපයෙනුයේ ඉඩම්, ඉදිකිරීම් සහ බෝග වර්ග වෙනුවෙන් වන්දි ගෙවීම සඳහා පමණක් වන අතර ඉඩම් අත්කර ගැනීම හේතුවෙන් ජනතාව මත ඇති කරන බලපෑම් අඩු කිරීම හෝ වැළැක්වීම වැනි නැවත පදිංචි කිරීම හා සම්බන්ධ ප්‍රධාන ගැටළු පිළිබඳව විධිවිධාන සපයනු නොලබයි. ඊට අමතරව, ඉඩමට නෛතික හිමිකමක් නොමැති, බලපෑමට ලක්වන කුටුම්බ සම්බන්ධයෙන් මෙන්ම සහ ඉඩම මත ජීවනෝපාය සලසා ගන්නා පුද්ගලයන්ටද ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ සහාය ලබාදිය නොහැකි වේ.

ව්‍යාපෘතියක් හේතුවෙන් මහජනතාව මත ඇති කරන බලපෑම් වැළැක්වීමට හෝ අවම කිරීමට ව්‍යාපෘති විකල්ප සොයා ගැනීම වැනි නැවත පදිංචි කිරීම හා සම්බන්ධ ප්‍රධාන ගැටළු වලට පිළියම් යෙදීමේදී ඉඩම් අත්කර ගැනීමේ පනතෙහි දැනට පවතින පරතරයන් පියවීම පිණිස ශ්‍රී ලංකා රජය (අමාත්‍ය මණ්ඩලය හරහා) ස්වකැමැත්තෙන් තොරව අවතැන්වූවන් නැවත පදිංචි කිරීමේ ජාතික ප්‍රතිපත්තිය (NIRP) 2001 මැයි මස 24 වන දින ක්‍රියාවට නංවා ඇත. ව්‍යාපෘතියක් හේතුවෙන් බලපෑමට ලක්වන පුද්ගලයන් සමඟ සාකච්ඡා කිරීමේ වැදගත්කමත් නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලියේදී ඔවුන්ගේ ක්‍රියාකාරී සහභාගීත්වය ඒ සඳහා ලබා ගැනීමේ වැදගත්කමත් එම ජාතික ප්‍රතිපත්තිය මගින් පැහැදිලි කොට ඇත.

6.2.1 ස්වකැමැත්තෙන් තොරව අවතැන්වූවන් නැවත පදිංචි කිරීමේ ජාතික ප්‍රතිපත්තිය

පහත සඳහන් කරුණු සහතික කිරීම පිණිස රජය විසින් 2001 ස්වකැමැත්තෙන් තොරව අවතැන්වූවන් නැවත පදිංචි කිරීමේ ජාතික ප්‍රතිපත්තිය සම්මත කොට ඇත. එනම්; *(i)* ව්‍යාපෘතියෙන් බලපෑමට ලක්වූවන් වෙත ප්‍රමාණවත් හා සෑහීමට පත්වන ආකාරයෙන් වන්දි ලබාදීම, ප්‍රතිස්ථානගත කිරීම සහ පුනරුත්ථාපනය සිදු කිරීම *(ii)* ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදය සහ පිරිවැය සීමාව ඉක්මවා යාම අඩු කිරිම *(iii)* ව්‍යාපෘතියෙන් බලපෑමට ලක්වූවන් හා සත්කාරක ප්‍රජාව අතර මනා ප්‍රජා සම්බන්ධතාවයක් ගොඩනැඟීම *(iv)* ව්‍යාපෘතියෙන් බලපෑමට ලක්වූවන්ගේ ආදායම් හා ජීවනෝපාය මාර්ග, බලපෑමට ලක්වීමට පෙර පැවති තත්ත්වයට පත් කිරිම සහ වර්ධනය කිරීම.

ඉඩම් අත්කර ගැනීමේ පනත හා එහි සංශෝධන, 1988 සංශෝධිත 1980 ජාතික පාරිසරික පනත හා නාගරික සංවර්ධන අධිකාරී පනත හා වෙරළ සංරක්ෂණ පනත වැනි වෙනත් අදාළ නීති, පනත්වල අන්තර්ගත රෙගුලාසි මෙන්ම ඉඩම් අත්කර ගැනීම, වන්දි ගෙවීම, උපදේශන/ සාකච්ඡා සහ ආදායම ප්‍රතිස්ථාපනය සහ වැඩි කිරීම ආදිය සම්බන්ධයෙන් අධිකරණයෙන් ලබා දී ඇති තීරණ ආදිය මත ස්වකැමැත්තෙන් තොරව අවතැන්වූවන් නැවත පදිංචි කිරීමේ ජාතික ප්‍රතිපත්තිය පදනම් වී ඇත.

ප්‍රතිපත්තියේ අරමුණු වනුයේ;

- ව්‍යාපෘතියෙන් බලපෑමට ලක්වූවන් ඵලදායී සහ තමාටම යැපිය හැකි මට්ටමකට පුනරුත්ථාපනය කිරීම මඟින් නැවත පදිංචි කිරීමේ ඍණාත්මක බලපෑම් වැළැක්වීම, අඩු කිරීම සහ අවම කිරිම.
- ව්‍යාපෘතියෙන් බලපෑමට ලක්වූවන් සම්පූර්ණයෙන්ම හා මනා ලෙස වන්දි ලබාදී සාර්ථකව නැවත පදිංචි කොට ඇති බව සහතික කිරීම. අවතැන් වූ පුද්ගලයන්ගේ ජීවනෝපාය යළි ස්ථාපිත කළ යුතු අතර ඔවුන්ගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කළ යුතු බව.
- සංවර්ධන අරමුණු වෙනුවෙන් රජය විසින් අනිවාර්යය ඉඩම් අත්කර ගැනීමේ ප්‍රතිඵලයක් ලෙස ව්‍යාපෘතියෙන් බලපෑමට ලක් වූ පුද්ගලයන් ඔවුන් පෙර සිටියාටත් වඩා වැඩි දරිද්‍රතා මට්ටමකට පත් නොවන බවට සහතික විම.
- අනිවාර්යය ඉඩම් අත්කර ගැනීම හේතුවෙන් ඇති කරන මානසික, සංස්කෘතික, සමාජීය සහ වෙනත් බලපෑම්වලින් මිදීම පිණිස ව්‍යාපෘතියෙන් බලපෑමට ලක් වූ පුද්ගලයන් හට සහාය වීම.
- ව්‍යාපෘතියෙන් බලපෑමට ලක්වූවන්ට සහන සැලසීම පිණිස පහසුවෙන් ප්‍රවේශ විය හැකි හා කඩිනමින් ප්‍රතිචාර දක්වන, දුක්ගැනවිලි සඳහා සහන සැලසීමට යාන්ත්‍රණයක් පවතින බව පිළිබඳව ඔවුන් සියලු දෙනාම දැනුවත් කිරීම.

- ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ආයතනය සහ ව්‍යාපෘතියෙන් බලපෑමට ලක් වූ පුද්ගලයන් එකඟත්වයට පැමිණි, නිශ්චිත කාල රාමුවක් සහිත, සාකච්ඡා කළ හැකි, විනිවිදභාවයෙන් යුතු සහ වගකියනු ලබන නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලියක් පවතින බව.

ප්‍රතිපත්තියේ මූලධර්ම වනුයේ;

- ව්‍යාපෘතිය සඳහා වන විකල්ප මෙන්ම ව්‍යාපෘතිය තුළ පවතින විකල්පද සමාලෝචනය කරමින්, ස්වකැමැත්තෙන් තොරව අවතැන්වීම් හැකි උපරිම අයුරින් වැළැක්වීම.
- ස්වකැමැත්තෙන් තොරව අවතැන්වීම් වැළැක්විය නොහැකි අවස්ථාවලදී ව්‍යාපෘතියෙන් බලපෑමට ලක්වූවන් හට ඔවුන්ගේ ජීවිත යලි ස්ථාපිත කර ගැනීමත්, එහි තත්ත්වය වර්ධනය කර ගැනීමටත් සඳහා සහාය වීම.
- ස්ත්‍රී පුරුෂ සමානත්වය සහ සාධාරණත්වය සහතික කළ යුතු අතර එය ව්‍යාපෘතිය පුරාවට පවත්වාගත යුතුය.
- නැවත පදිංචි කිරීමේ ස්ථාන තෝරා ගැනීමේදී ජීවනෝපාය වන්දි පැකේජ සහ සංවර්ධන විකල්ප තෝරා ගැනීමේදී පළමු අවස්ථාවේදීම ව්‍යාපෘතියෙන් බලපෑමට ලක්වූවන් සම්පූර්ණයෙන්ම සම්බන්ධ කරගත යුතු වේ.
- ඉඩමක් අහිමිවන අවස්ථාවේදී ඒ වෙනුවෙන් වෙනත් ඉඩමක් ලබාදීම විකල්පයක් වන අතර එසේ ලබා දීමට විකල්ප ඉඩම් නොමැති අවස්ථාවලදී වන්දි මුදලක් ලබාදීම විකල්පයක් වේ.
- ඉඩම්, ඉදිකිරීම්, වෙනත් වත්කම් සහ ආදායම් හා ජීවනෝපාය අහිමිවීම සඳහා වන්දි ගෙවීමේදී එය පූර්ණ ප්‍රතිස්ථාපන පිරිවැය මත පදනම් විය යුතු අතර එය කඩිනමින් ගෙවිය යුතු වේ. මෙයට හුවමාරු වීමේ පිරිවැය (transaction costs) ඇතුළත් විය යුතුය.
- නැවත පදිංචි කිරීම සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම ප්‍රාදේශීය හා පළාත් පාලන බලධාරීන්ගේ පූර්ණ සහභාගීත්වයෙන් සිදුකළ යුතුය.
- ආර්ථික වශයෙන් සහ සාමාජීය වශයෙන් බලපෑමට ලක්වූවන්ට සහාය වීම සඳහා පියවර ගැනීමේදී සහභාගීත්ව සාකච්ඡා තුළින් සැලසුම් කිරීමත්, ක්‍රියාත්මක කිරීමත් සිදුකළ යුතු වේ. ව්‍යාපෘතියෙන් බලපෑමට ලක්වූවන් ඔවුන්ගේ සත්කාරක ප්‍රජාව සමඟ ඒකාබද්ධ කිරීමේදී පැහැදිලි සැලැස්මක් තිබිය යුතුය.
- නැවත පදිංචිවන්නන් සහ ඔවුන්ගේ සත්කාරක ප්‍රජාව වෙත පොදු දේපළ සම්පත් සහ ප්‍රජා හා පොදු සේවා ලබාදිය යුතුය.
- ව්‍යාපෘතියෙන් බලපෑමට ලක්වූවන් නැවත පදිංචි කිරීම සංවර්ධන ක්‍රියාකාරකමක් සේ සළකා සැලසුම් කළ යුතු අතර ව්‍යාපෘතිය හේතුවෙන් ඔවුන් පෙර සිටි තත්ත්වයට වඩා වැඩි දරිද්‍රතා මට්ටමකට පත් නොවිය යුතුය.
- ස්වකීය ඉඩමට හිමිකම් ඔප්පු නොමැති, ව්‍යාපෘතියෙන් බලපෑමට ලක්වන පුද්ගලයන් හට සාධාරණ හා යුක්තිසහගත සැලකිල්ලක් හා වන්දියක් ලැබිය යුතුය.
- අවදානමට ලක්වූවන්ගේ කාණ්ඩයට ගැනෙන පුද්ගලයන් හඳුනාගෙන ඔවුන්ගේ ජීවන තත්ත්වය

ප්‍රවර්ධනය කිරීම සඳහා සුදුසු සහායක් ලබාදිය යුතුය.

- වන්දි ගෙවීම, නැවත පදිංචි කිරිම සහ ආදායම් ප්‍රතිස්ථාපනය හා ප්‍රවර්ධනය සඳහා වැයවන මුළු පිරිවැය ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ආයතනය විසින් දැරිය යුතු වේ.

මෙම ප්‍රතිපත්තිය අදාල වනුයේ;

- රජය විසින් ඉඩම් අත්කර ගැනීම් සහ සන්තකය ආපසු ලබා ගැනීම සිදු කරන සියලුම සංවර්ධන කාර්යයන්, සහ
- සියලුම ව්‍යාපෘති, මෙහිදී ව්‍යාපෘතිය සඳහා අරමුදල් සපයන මූලාශ්‍රය සලකා බලනු නොලැබේ.

ස්වකැමැතෙන් තොරව අවතැන්වූවන් නැවත පදිංචි කිරීමේ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ වගකීම ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය සතු වේ. මෙය, මධ්‍යම පරිසර අධිකාරිය, මිනින්දෝරු දෙපාර්තමේන්තුව, තක්සේරු දෙපාර්තමේන්තුව, අදාළ අනෙකුත් අමාත්‍යාංශ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල යන රාජ්‍ය ආයතන ජාලයක සහභාගීත්වයෙන් සිදු කරනු ලබයි.

ව්‍යාපෘතියෙන් බලපෑමට ලක්වන පුද්ගලයන් හට සාධාරණ හා සමාන ආකාරයෙන් සලකනු ලබන බවටත්, ඉඩම් අත්කර ගැනීමේ සහ නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලියේදී ඔවුන් පෙර සිටි තත්ත්වයට වඩා වැඩි දරිද්‍රතා මට්ටමකට පත් නොවන බවටත්, ස්වකැමැත්තෙන් තොරව නැවත පදිංචි කිරීමේ ජාතික ප්‍රතිපත්තිය මගින් සහතික වේ. ස්වකැමැත්තෙන් තොරව අවතැන්වූවන් නැවත පදිංචි කිරීම පිළිබඳ ආසියානු සංවර්ධන බැංකුවේ ආරක්ෂණ ප්‍රතිපත්ති මූලධර්ම ඇතුළුව ස්වකැමැත්තෙන් තොරව අවතැන්වූවන් නැවත පදිංචි කිරීමේදී ජාත්‍යන්තර පරිචයන් ළඟාකරගත හැකි ව්‍යාපෘති සැලසුම් කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ රාමුවක් ස්ථාපිත කිරීමට මෙම ප්‍රතිපත්තියෙන් හැකි වේ.

6.2.2 2009, ආසියානු සංවර්ධන බැංකුවේ සමාජ ආරක්ෂණ ප්‍රතිපත්ති ප්‍රකාශය (*SPS*)

ස්වකැමැත්තෙන් තොරව අවතැන්වූවන් නැවත පදිංචි කිරීම පිළිබඳ ආසියානු සංවර්ධන බැංකුවේ සමාජ ආරක්ෂණ ප්‍රතිපත්තියේ අරමුණු වනුයේ; හැකි සෑම අවස්ථාවකදීම ස්වකැමැත්තෙන් තොරව අවතැන්වීම් වැළැක්වීම; ව්‍යාපෘති හා ව්‍යාපෘති සැලසුම් විකල්ප සොයා බලමින් එවන් අවතැන්වීම් අවම කිරීම; ව්‍යාපෘතියෙන් බලපෑමට ලක් වූ සියලු පුද්ගලයන්ගේ ජීවනෝපාය ඔවුන් ව්‍යාපෘතියෙක් බලපෑමට පෙර පැවති තත්ත්වයට වැඩි තත්ත්වයකට පත් කිරීම හෝ අවම වශයෙන් පෙර පැවති තත්ත්වයටවත් පත් කිරීම; සහ අවතැන්වූ දිළිඳු සහ අවදානම් කාණ්ඩයට ගැනෙන වෙනත් කණ්ඩායම්වල ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම වේ.

ස්වකැමැත්තෙන් තොරව නැවත පදිංචි කිරීමෙන් (IR); (i) ස්වකැමැත්තෙන් තොරව ඉඩම් අත්කර ගැනීම හෝ (ii) ඉඩම් පරිහරණය හෝ නීතියෙන් නම්කරන ලද උද්‍යාන සහ සංරක්ෂිත ප්‍රදේශවලට ප්‍රවේශ වීම මත ඇති කරන සීමා කිරීම්වල ප්‍රතිඵලයක් ලෙස සිදුවන භෞතික අවතැන්වීම් (ප්‍රතිස්ථාපනය, නේවාසික ඉඩම් අහිමිවීම හෝ වාසස්ථාන අහිමි වීම) සහ ආර්ථික ප්‍රතිස්ථාපනය (ඉඩම් අහිමි වීම, වත්කම් අහිමි වීම, වත්කම් සඳහා ප්‍රවේශය, ආදායම් මාර්ග අහිමි වීම හෝ ජීවනෝපාය මාර්ග අහිමි වීම) ආවරණය කෙරේ. එවන් අහිමි වීම හා ස්වකැමැත්තෙන් තොරව සිදුවන සීමා කිරීම සම්පූර්ණයෙන් හෝ කොටසකට සිදු වන්නේද තාවකාලිකද නැතහොත් ස්ථිරද යන්න මත

ස්වකැමැත්තෙන් තොරව නැවත පදිංචි කිරීමේ සමාජ ආරක්ෂණ උපායමාර්ග අදාළ වේ.

ස්වකැමැත්තෙන් තොරව නැවත පදිංචි කිරීමේ ප්‍රතිපත්ති මූලධර්ම වනුයේ;

- අතීත වර්තමාන හා අනාගතයේ සිදුවන ස්වකැමැත්තෙන් තොරව නැවත පදිංචි කිරීමේ බලපෑම් හා අවදානම් පිළිබඳව කලින්ම ව්‍යාපෘතිය මගින් අනාවරණය කිරීම. විශේෂයෙන්ම නැවත පදිංචි කිරීමේ බලපෑම් සහ අභියෝග හා සම්බන්ධව ස්ත්‍රී පුරුෂ විශ්ලේෂණයන් ඇතුළත්ව, අවතැන් වූ පුද්ගලයන් සම්බන්ධයෙන් සිදු කරන සමීක්ෂණයක් සහ/ හෝ සංගණනයන් හරහා නැවත පදිංචි කිරීමේ සැලසුම්වල විෂය පථය නිශ්චය කිරීමයි.
- බලපෑමට ලක් වූ පුද්ගලයන්, සත්කාරක ප්‍රජාව සහ අදාළ රාජ්‍ය නොවන සංවිධාන සමඟ හරවත් සාකච්ඡා පැවැත්වීම. ඔවුනට ලැබෙන හිමිකම් සහ නැවත පදිංචි කිරීමේ විකල්ප පිළිබඳව අවතැන් වූ සියලුම පුද්ගලයන් හට දැනුම් දීම. නැවත පදිංචි කිරීමේ වැඩසටහන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ සුපරීක්ෂණය හා ඇගයීම සිදු කිරීමේදී ඔවුන්ගේ සහභාගීත්වය සහතික කිරීම. අවදානමට ලක් වූ පුද්ගල කාණ්ඩයට ගැනෙන කණ්ඩායම්වල එනම්, දරිද්‍රතා රේඛාවට වඩා පහළ මට්ටමේ පුද්ගලයන්, ඉඩම් නොමැති පුද්ගලයන්, මහළු, කාන්තා හා ළමා සහ ස්වදේශීය ජනතාව සහ ඉඩමට නෛතික හිමිකමක් නොමැති පුද්ගලයන්ගේ අවශ්‍යතා සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමුකිරීම සහ සාකච්ඡා සඳහා ඔවුන්ගේ සහභාගීත්වය සහතික කිරීම. බලපෑමට ලක් වූ පුද්ගලයන්ගේ අපේක්ෂාවන් පිළිබඳ යෝජනා ලබා ගැනීම හා ඒවා මුදුන්පමුණුවාලනු පිණිස දුක්ගැනවිලි සඳහා සහන සැලසීමේ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම. බලපෑමට ලක් වූ පුද්ගලයන්ගේ සහ ඔවුන්ගේ සත්කාරක ප්‍රජාවගේ සමාජීය හා සංස්කෘතික ආයතනවලට සහාය වීම. ස්වකැමැත්තෙන් තොරව නැවත පදිංචි කිරීමේ බලපෑම් සහ අවදානම් වඩාත් සංකීර්ණ හා සංවේදී වන අවස්ථාවන් හිදී, සමාජ සූදානම් කිරීමේ අදියරකදී වන්දි ගෙවීමේ සහ නැවත පදිංචි කිරීමේ තීරණ ගත යුතු වේ.

- පහත සඳහන් ක්‍රියාමාර්ග මගින්, බලපෑමට ලක් වූ සියලුම පුද්ගලයන්ගේ ජීවනෝපාය වර්ධනය කිරීම හෝ අවම වශයෙන් පෙර පැවති තත්ත්වයට පත් කිරීම සිදු කළ යුතුය. (i) බලපෑමට ලක් වූ පුද්ගලයන්ගේ ජීවනෝපාය මාර්ගය ඉඩම මත පදනම් වුණි නම්, හැකි සෑම අවස්ථාවකම ඉඩම මත පාදක වූ නැවත පදිංචි කිරීමේ උපාය මාර්ග ගැනීම හෝ ඉඩම අහිමි වීමෙන් ජීවනෝපායන්ට අගතියක් සිදු නොවේ නම් ඉඩම සඳහා ප්‍රතිස්ථාපන පිරිවැය මත පදනම්ව වන්දි මුදල් ගෙවීම. (ii) සමාන හෝ වැඩි වටිනාකමක වත්කම් ලබාදීම සඳහා ප්‍රවේශය සහිතව වත්කම් කඩිනමින් ප්‍රතිස්ථාපනය කිරීම. (iii) ප්‍රතිස්ථාපනය කළ නොහැකි වත්කම් සඳහා පූර්ණ ප්‍රතිස්ථාපන පිරිවැය මත කඩිනමින් වන්දි ලබාදීම සහ (iv) හැකි අවස්ථාවලදී ප්‍රතිලාභ හුවමාරු කිරීමේ යෝජනා ක්‍රම හරහා අතිරේක ආදායම් හා සේවාවන් ලබාදීම.

- භෞතික හා ආර්ථික වශයෙන් අවතැන් වූ පුද්ගලයන් වෙත අවශ්‍ය සහාය ලබාදීම. ඊට පහත කරුණු ඇතුළත් වේ; (i) ප්‍රතිස්ථානගත කිරීම සිදු වේ නම්, ප්‍රතිස්ථානගත කරනු ලබන ඉඩම සඳහා වඩාත් සුරක්ෂිත භුක්තියක් සහතික කිරීම, රැකියා හා නිෂ්පාදන අවස්ථා සඳහා සාපේක්ෂ ප්‍රවේශය සහිත නැවත පදිංචි කිරීමේ ස්ථානයකින් වඩාත් හොඳ නිවාස ලබාදීම සහ සත්කාරක ප්‍රජාවට ද ව්‍යාපෘතියේ ප්‍රතිලාභ ව්‍යාප්ත වීම. (ii)

ඉඩම් සංවර්ධනය, ණය පහසුකම්, පුහුණු හෝ රැකියා අවස්ථා වැනි එක් ස්ථානයක සිට තවත් ස්ථානයක් වෙත පැමිණීමේදී අවශ්‍යවන උපකාර සහ සංවර්ධන සහාය, සහ (iii) ප්‍රජා යටිතල පහසුකම් සහ ප්‍රජා සේවාවන් අවශ්‍ය පරිදි ලබාදීම.

- අවතැන් වූ දිළිඳු ජනතාවගේ සහ කාන්තාවන්ද ඇතුළුව අවදානමට ලක් වූ කාණ්ඩවල ජීවන මට්ටම අවම වශයෙන් ජාතික මට්ටමේ අවම තත්ත්වයට වඩා වැඩි අගයකට වැඩි කිරීම. ග්‍රාමීය ප්‍රදේශවල දී ඔවුන්ට ඉඩම් හා සම්පත් සඳහා නෛතික හිමිකමක් හා දැරිය හැකි මට්ටමේ ප්‍රවේශයක් ලබාදීම සහ නාගරික ප්‍රදේශවල දී ඔවුන්ට සුදුසු ආදායම් මාර්ග සඳහා ප්‍රවේශය සහ නිවාස සඳහා නෛතික හිමිකමක් හා දැරිය හැකි මට්ටමේ ප්‍රවේශයක් ලබාදීම.

- ඉඩම් අත්කර ගැනීම, සාකච්ඡාකොට එකඟත්වයට පැමිණීම තුළින් සිදු කරන්නේ නම්, එසේ සාකච්ඡාවෙන් එකඟත්වයට පත්වන පුද්ගලයන් ආදායම හා ජීවන තත්ත්වය වඩාත් හොඳ තත්ත්වයට පත් කිරීම හෝ අවම වශයෙන් පැවති තත්ත්වයෙන් පවත්වාගෙන යාම තහවුරු කිරීම පිණිස, විනිවිදභාවය සහිත, ස්ථිර සහ අපක්ෂපාතී ආකාරයේ ක්‍රියාපටිපාටි වැඩිදියුණු කිරීම.

- ඉඩමට හිමිකමක් හෝ කිසිදු පිළිගත් නෛතික අයිතියක් නොමැතිව අවතැන් වන පුද්ගලයන්ගේ ඉඩම් නොවන වත්කම් සඳහා නැවත පදිංචි කිරීමේ සහාය සහ වන්දි ලැබීමට ඔවුන් සුදුසුකම් ලබන බව සහතික කිරීම.

- අවතැන් වන පුද්ගලයන්ගේ හිමිකම්, ආදායම් හා ජීවනෝපාය ප්‍රතිෂ්ඨාපන කිරීමේ උපාය මාර්ග, ආයතනික ක්‍රියාමාර්ග, සුපරීක්ෂණ හා වාර්තාකරණ රාමුව, අයවැය, කාල රාමුව සහිත ක්‍රියාත්මක කිරීමේ කාර්ය සටහන විස්තර කරමින් නැවත පදිංචි කිරීමේ සැලැස්මක් සකස් කිරීම.

- නැවත පදිංචි කිරීමේ සැලැස්මෙහි කෙටුම්පත, බලපෑමට ලක් වූ පුද්ගලයන් සහ පාර්ශවකරුවන් සියලු දෙනාටම පහසුවෙන් තේරුම් ගත හැකි ආකාරයෙන් හා භාෂාවකින් සකස් කොට, ඔවුන්ට පහසුවෙන් ප්‍රවේශ විය හැකි ස්ථානයකදී එය ප්‍රදර්ශනය කිරීම. මෙය ව්‍යාපෘති ඇගයීමට පෙර සිදු කළ යුතු අතර ඊට සාකච්ඡාවල තොරතුරු ඇතුළත් කළ යුතුය. අවසන් නැවත පදිංචි කිරීමේ සැලැස්ම සහ එහි යාවත්කාලීන කරන ලද තොරතුරු, බලපෑමට ලක් වූ පුද්ගලයන් සහ වෙනත් පාර්ශවකරුවන් වෙත ඒ ආකාරයෙන්ම ලබාදිය යුතුය.

- සංවර්ධන ව්‍යාපෘතියේ හෝ වැඩසටහනේ කොටසක් වශයෙන් ස්වකැමැත්තෙන් තොරව අවතැන්වූවන් නැවත පදිංචි කිරීම ඇතුළත් කිරීම සහ ක්‍රියාත්මක කිරීම. නැවත පදිංචි කිරීම සඳහා වැය වන මුළු පිරිවැය, ව්‍යාපෘති පිරිවැය හා ප්‍රතිලාභ ඉදිරිපත් කිරීමේදී ඇතුළත් කිරීම. සැලකිය යුතු තරම් නැවත පදිංචි කිරීමේ බලපෑම් සහිත ව්‍යාපෘතියක් සඳහා, ස්වකැමැත්තෙන් තොරව නැවත පදිංචි කිරීමේ සංරචකය ක්‍රියාත්මක කිරීම තනි ක්‍රියාකාරකමක් සේ සලකා කටයුතු කිරීම.

- වන්දි ගෙවීම සහ නැවත පදිංචි කිරීමේ වෙනත් හිමිකම් ලබාදීම, භෞතික හෝ ආර්ථික ප්‍රතිස්ථාපනයට පෙරාතුව සිදු කිරීම. නැවත පදිංචි කිරීමේ සැලැස්ම ක්‍රියාත්මක කිරීම සමීප අධීක්ෂණයක් යටතේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන මුළු කාල සීමාව පුරාම සිදු කිරීම.

- නැවත පදිංචි කිරීමේ ප්‍රතිඵල, අවතැන් වූ පුද්ගලයන්ගේ ජීවන තත්ත්වය මත ඒවායින් ඇති කරන බලපෑම සහ නැවත පදිංචි කිරීමේ සැලැස්මෙහි අරමුණු ළඟාකර ගෙන තිබේද යන බව පාදක කොන්දේසි සහ නැවත පදිංචි කිරීමේ සුපරීක්ෂණය කිරීමේ ප්‍රතිඵල සැලකිල්ලට ගනිමින් සුපරීක්ෂණය කිරීම සහ තක්සේරු කිරීම.

ව්‍යාපෘතියේ ස්වකැමැත්තෙන් තොරව අවතැන් වූවන් නැවත පදිංචි කිරීමේ මූලධර්ම

ශ්‍රී ලංකාවේ භාවිතා වන විවිධ නැවත පදිංචි කිරීමේ ප්‍රතිපත්ති, නීති, රෙගුලාසි සහ මාර්ගෝපදේශ සහ ස්වකැමැත්තෙන් තොරව අවතැන්වූවන් නැවත පදිංචි කිරීම සම්බන්ධයෙන් ආසියානු සංවර්ධන බැංකුවේ ප්‍රතිපත්ති සහ නැවත පදිංචි කිරීමේ සම්බන්ධ පරිචයන් මත පදනම්ව මෙම ව්‍යාපෘතිය සඳහා පහත සඳහන් නැවත පදිංචි කිරීමේ මූලධර්ම සකස් කොට ඇත. ඒවා දැනට හඳුනාගෙන ඇති සහ හඳුනා ගැනීමට නියමිත එහි සියලුම උප ව්‍යාපෘති වලට අදාළ කරගනු ඇත. පහත සඳහන් නැවත පදිංචි කිරීමේ මූලධර්ම ක්‍රියාත්මක වන්නේද යන බව නිශ්චය කිරීමට සහ අවශ්‍ය කෙරෙන නැවත පදිංචි කිරීමේ සැලසුම්වල විෂය පථය නිශ්චය කිරීම පිණිස සෑම උප ව්‍යාපෘතියක් හෝ සංරචකයක්ම ආවරණය කිරීම.

- භෞතික අවතැන්වීම සහ/ හෝ ජීවනෝපාය හා ආදායම් මාර්ග සහ ප්‍රජා සම්පත් හා යටිතල පහසුකම් මත ඇති කරන වෙනත් අහිතකර බලපෑම් ඇතිවීම වැළැක්වීම සඳහා හැකි සෑම උත්සාහයක්ම ගැනීම. යම් හෙයකින් භෞතික හා ආර්ථික අවතැන්වීම නොවැළැක්විය හැකි නම් එවන් අවස්ථාවලදී, පහත සඳහන් ක්‍රියාමාර්ග ගනු ඇත. (අ) ඉඩම සඳහා මුදල්, ඉඩම සඳහා ඉඩමක්, වාසස්ථානයක් වෙනුවෙන් වාසස්ථානයක් ලබාදීම තුළින් ප්‍රමාණවත් වන්දියක් ලබාදීම සහතික වීම (ආ) ඔවුන්ගේ ආදායම් සහ ජීවනෝපාය වර්ධනය කිරීම හෝ අවම වශයෙන් පෙර පැවති තත්ත්වයට පත් කිරීම සහ (ඇ) නැවත පදිංචි කිරීමේ ස්ථාන සහ ප්‍රතිස්ථාපනය සඳහා කුටුම්බ තෝරා ගැනීම වඩාත් සැලකිල්ලෙන් සිදු කිරීම මගින් ඔවුන්ගේ පෙර පැවති සමාජ-සංස්කෘතික විධි/ සම්ප්‍රදායන් නැවත ගොඩනගා ගැනීමට පහසුකම් සැලසීම.

- ඉඩම්/ වාසස්ථාන අත්කර ගැනීම, වන්දි පැකේජ, ආදායම් යථා තත්ත්වයට පත් කිරීම හා වෙනත් හිමිකම් සහ දුක්ගැනවිලි සඳහා සහන සැලසීමේ යාන්ත්‍රණය පිළිබඳව ව්‍යාපෘතියෙන් බලපෑමට ලක්වන සියලුම පුද්ගලයන් සමඟ සාකච්ඡා කිරීම සහ දැනුම් දීම සිදු කිරීම.

- බලපෑමට ලක් වූ, අවදානමට ලක් වූ කාණ්ඩයට ගැනෙන දිළිඳු පුද්ගලයන්, ඉඩම් අහිමි පුද්ගලයන්, වයස්ගත පුද්ගලයන්, කාන්තා මූලික කුටුම්බ, බඳුකරුවන්, කුලී නිවැසියන්, අවිධිමත් පදිංචිකරුවන් හා අනවසරකරුවන්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා විශේෂ ව්‍යාපෘති සහාය ලබාදීම.

- බලපෑමට ලක්වන සියලුම වාසස්ථාන ඒකක සඳහා ප්‍රතිස්ථාපන පිරිවැය මත මුදල් ගෙවීමෙන් හෝ වාසස්ථාන ඒකකයක් වෙනුවට වාසස්ථාන ඒකකයක් ලබාදීම මගින් බලපෑමට ලක්වන සියලුම වාසස්ථාන ඒකක වෙනුවෙන් වන්දි ගෙවීම.

- බලපෑමට ලක් වූ පුද්ගලයන්, විශේෂයෙන්ම දිළිඳු සහ අවදානම් තත්ත්වයේ කුටුම්බ වෙනුවෙන් මනා ලෙස සැලසුම් කළ හා නිසි අයවැයකින් යුතු ආදායම් ප්‍රතිස්ථාපන හා වැඩි කිරීමේ වැඩසටහන් ලබාදීම.

- උප ව්‍යාපෘතියක් හෝ සංරචකයක් හේතුවෙන් අහිමිවන සියලුම පොදු දේපළ සම්පත් ක්‍රියාත්මක කිරීමේ ආයතනය (EA) මගින් මනා ලෙස ප්‍රතිස්ථාපනය කිරීම හෝ වන්දි ගෙවීම සිදු කිරීම. බලපෑමට ලක් වූ ප්‍රජාවේ නියෝජිතයන් හට මුදල් වන්දි ලබා දෙනු ඇත.

- ඉඩම්/ දේපළ අත්කර ගැනීම සිදු කරනුයේ සාකච්ඡාකොට එකඟතාවයට පැමිණීමෙන් නම්, එසේ එකඟත්වයට පැමිණි පුද්ගලයන් ව්‍යාපෘතිය හේතුවෙන් අවතැන් වීමෙන් පසුවද ඔවුන්ගේ ආදායම් සහ ජීවනෝපාය වඩා හොඳ තත්ත්වයට හෝ අවම වශයෙන් පෙර පැවති තත්ත්වයටවත් පත් කිරීම පිළිබඳව උප ව්‍යාපෘති හෝ සංරචකය සහතික වනු ඇත.

- ව්‍යාපෘතියෙන් බලපෑමට ලක්වන, ඉඩමට නෛතික හිමිකමක් නොමැති පුද්ගලයන්ද නැවත පදිංචි කිරීමේ සහාය ලබා ගැනීමට සුදුසුකම් ලබයි. ඔවුන්ගේ වාසස්ථාන අහිමි වුවහොත් ඒ සඳහා ඔවුන්ගේ වර්තමාන අයිතිවාසිකම කුමන ආකාර වුවද ප්‍රතිස්ථානගත කිරීමේ වාසස්ථානයක් ලැබීමට ඔවුන් සුදුසුකම් ලබයි.

- සංවර්ධන ව්‍යාපෘතියේ හෝ වැඩසටහනේ කොටසක් වශයෙන්, ස්වකැමැත්තෙන් තොරව අවතැන්වූවන් නැවත පදිංචි කිරීම ඇතුළත් කිරීම සහ ක්‍රියාත්මක කිරීම නැවත පදිංචි කිරීම සඳහා වැය වන මුළු පිරිවැය ව්‍යාපෘති පිරිවැය හා ප්‍රතිලාභ ඉදිරිපත් කිරීමේදී ඇතුළත් කිරීම සැලකිය යුතු තරම් නැවත පදිංචි කිරීමේ බලපෑම් සහිත ව්‍යාපෘතියක් සඳහා, නැවත පදිංචි කිරීම සඳහා වැය වන මුළු පිරිවැය ව්‍යාපෘති පිරිවැය හා ප්‍රතිලාභ ඉදිරිපත් කිරීමේදී ඇතුළත් කිරීම ව්‍යාපෘතියේ නැවත පදිංචි කිරීමේ සංරචකය ක්‍රියාත්මක කිරීම තනි ක්‍රියාකාරකමක් සේ සැලකීම.

- ඉඩම් අත්කර ගැනීම, වන්දි ගෙවීම සහ ප්‍රතිස්ථාපනය සඳහා වැයවන මුළු පිරිවැය ව්‍යාපෘති පිරිවැයට ඇතුළත් වනු ඇත.

- භෞතික අවතැන්වීම සිදු වීමට *පෙර* සහ කවර හෝ ඉදිකිරීම් කාර්යයක් ආරම්භ කිරීමට *පෙර*, අවතැන් වූ සෑම පුද්ගලයෙකුටම හෝ කුටුම්බයකට වන්දි ලබාදීම සහ වෙනත් හිමිකම් ලබාදීම.

- නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සුපරීක්ෂණය හා තක්සේරු කිරීම සහ ආසියානු සංවර්ධන බැංකුව, බලපෑමට ලක් වූ පුද්ගලයන් සහ වෙනත් පාර්ශවකරුවන් වෙත ලබාදීම සඳහා සුපරීක්ෂණ වාර්තා අර්ධ වාර්ෂිකව සකස් කිරීම. නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කරන පළමු දෙවසරක කාලය තුළ නැවත පදිංචි කිරීමේ සුපරීක්ෂණ වාර්තා කාර්තුමය වශයෙන් සකස් කරනු ඇත. සියලුම සුපරීක්ෂණ වාර්තා සමාලෝචනය කිරීම පිණිස ආසියානු සංවර්ධන බැංකුව වෙත ඉදිරිපත් කරනු ඇත. ක්‍රියාත්මක කිරීමේ ආයතනය (EA) විසින් සියලුම සුපරීක්ෂණ වාර්තා දේශීය භාෂාවන්ගෙන් සකස්කර බලපෑමට ලක් වූ පුද්ගලයන් සහ කුටුම්බ වෙත ලබාදෙනු ඇත.

ඉහත සඳහන් කරන ලද, ස්වකැමැත්තෙන් තොරව අවතැන්වූවන් නැවත පදිංචි කිරීමේ මූලධර්මවලට වලට අනුව, බලපෑමට ලක් වූ පුද්ගලයන් ඔවුන්ගේ දේපළවලට පවතින අයිතිවාසිකමේ ස්වභාවය හෝ භුක්තියෙහි ස්වභාවය හෝ ආදායමේ හෝ ජීවනෝපායේ අහිමි වීමේ ස්වභාවයට අනුකූලව ඒකාබද්ධ වන්දි පැකේජ සහ නැවත පදිංචි කිරීමේ හෝ ප්‍රතිස්ථාපන සහාය ලැබීමට හිමිකම් ලබයි.

6.3 අහිමි වූ සහ බලපෑමට ලක් වූ දේපළ තක්සේරු කිරීම

උප ව්‍යාපෘතියක්/ සංරචකයක් සඳහා අත්කරගත් දේපළක් සහ නේවාසික ස්ථාන ඒකකවල 'ප්‍රතිෂ්ඨාපන පිරිවැය' නිශ්චය කිරීම සඳහා "ක්‍රියාත්මක කිරීමේ ආයතනය (EA)"/ "ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන නියෝජිත ආයතනය (IA)" සහ ව්‍යාපෘතියෙන් බලපෑමට ලක්වූවන් සහභාගී වනු ඇත. දේපළෙහි වෙළඳපල වටිනාකම සහ ස්වකැමැත්තෙන් තොරව අවතැන්වූවන් නැවත පදිංචි කිරීමේ ජාතික ප්‍රතිපත්තිය සහ 2008 ඉඩම් අත්කර ගැනීමේ නියෝග ආදියෙහි විස්තරාත්මකව සඳහන් කොට ඇති වෙනත් වන්දි පැකේජ, ප්‍රතිස්ථාපන පිරිවැයට අන්තර්ගත වේ. අත්කර ගැනීමට යෝජිත ඉඩම හෝ නේවාසික ඒකකය පිහිටි අදාළ ප්‍රාදේශීය ලේකම්වරයාගේ ඉල්ලීම මත තක්සේරු දෙපාර්තමේන්තුව විසින්, අත්කර ගැනීමට යෝජිත දේපළෙහි වටිනාකම තක්සේරු කරනු ඇත. ප්‍රාදේශීය ලේකම්වරයා හෝ නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ (ඉඩම්)/ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා වශයෙන් ක්‍රියා කරයි. තක්සේරු දෙපාර්තමේන්තුව, 2008 ඉඩම් අත්කර ගැනීමේ නියෝග වලට අනුකූලව, සම්පූර්ණයෙන් අත්කර ගන්නා ලද, කොටසක් අත්කර ගන්නා ලද සහ හානියට පත් වූ හෝ කොටසක් හානියට පත් වූ ඉදිකිරීම්වල ප්‍රතිස්ථාපන පිරිවැය ගණනය කරනු ලබයි.

අත්කර ගන්නා ලද ඉඩමට විධිමත් නීතිමය අයිතියක් සහිත පුද්ගලයන්ගේ ඉඩම් සහ නේවාසික ස්ථාන සම්බන්ධයෙන් අහිමි වූ ඉඩම සහ ඉදිකිරීම් සඳහා ඉඩමේ ප්‍රතිස්ථාපන පිරිවැය මත වන්දියක් හෝ ඉඩම වෙනුවට විකල්ප ඉඩමක් සහ ඉඩමෙහි පවතින ඉදිකිරීම් සඳහා ප්‍රතිස්ථාපන පිරිවැය හෝ නැවත පදිංචි කිරීමේ භූමියකින් පදිංචි ස්ථාන ඒකකයක් ලබා ගැනීම සඳහා අයිතිය පවතී. ඉඩමට අයිතියක් නොමැති නමුත් එම ඉඩමට හෝ දේපළට 'උනන්දුව දක්වන්නා වූ' හෝ 'හිමිකම් පාන' පුද්ගලයන්ද වන්දි ලැබීමට හිමිකම් ලබයි. එවන් පුද්ගලයන්ගේ නිවසක් අහිමි වූවොත් ප්‍රතිස්ථානගත කිරීමේ භූමියකින් නව නිවාස ඒකකයක් ඔහුට/ ඇයට ලැබෙනු

ඇති අතර ඉඩමේ වෙනත් ඉදිකිරීම්වල සහ ඉඩමට සිදුකර ඇති වෙනත් වැඩිදියුණු කිරීම්වල පිරිවැය අඩු කිරීමෙන් පසු ඉතිරිවන මුදල, වන්දි මුදලක් වශයෙන්ද හිමි වනු ඇත. නැවත පදිංචි කිරීමේ සහාය ලබා ගැනීමේදී සුදුසුකම් ලැබීම සඳහා අදාළ වන කඩඉම් දිනය අදාළ වනු ඇත. අවතැන්වීම් සහ ප්‍රතිස්ථාපනය අතර යම් කාල පරාසයක් පැවතියහොත් භෞතිකව අවතැන් වූ පුද්ගලයන් සඳහා, නැවත පදිංචි කිරීමේ සහාය ලබා දෙන තෙක් මුදල්වලින් සහ යැපීම් සඳහා සහාය ලබාදීම, ක්‍රියාත්මක කිරීමේ ආයතනය (EA)/ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන නියෝජිත ආයතනය (IA) සිදු කරනු ඇත. මෙම සහන ලබාදීම හිමිකම් ගෙවීමේ ක්‍රමවේදය අනුව සිදු වේ.

ඉඩම මත පාදක වූ ජීවනෝපායන් සහිත, ව්‍යාපෘතියෙන් බලපෑමට ලක් වූ පුද්ගලයන් සම්බන්ධයෙන් වන විටදී, ඔවුනට ඒ වෙනුවෙන් ඉඩමක් ලබා දීම සම්බන්ධයෙන් ප්‍රමුඛතාවය දැක්වීමට ක්‍රියාත්මක කිරීමේ ආයතනය (EA)/ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන නියෝජිත ආයතනය (IA) කටයුතු කරනු ඇත. පැවති ඉඩමට ප්‍රමාණයෙන් හා ස්වභාවයෙන් සමාන සුදුසු ඉඩමක් සොයා ගැනීමේ වගකීම ක්‍රියාත්මක කිරීමේ ආයතනය (EA)/ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන නියෝජිත ආයතනය (IA) සතු වේ. කුඹුරු ඉඩමක් හෝ වගා කළ ගොඩ ඉඩමක් සම්බන්ධයෙන් ප්‍රතිස්ථාපන ඉඩමක් ලබාදෙන අවස්ථාවලදී, අත්කරගත් ඉඩමට අවම වශයෙන් ප්‍රමාණයෙන් හා ස්වභාවයෙන් සමාන ඉඩම් කොටසක් ආර්ථික වශයෙන් අවතැන් වූ පුද්ගලයන් හට ලබාදෙනු ඇත. එසේ ප්‍රතිස්ථාපනය වූ ඉඩමින්, අවම වශයෙන් ඔවුනට ව්‍යාපාරයක් වැනි ජීවනෝපායකින් හෝ ඔවුන්ගේ ආර්ථිකය වර්ධනය කර ගැනීමට හෝ පෙර පැවති තත්ත්වයට පත්කර ගැනීමට හැකිවනු ඇත.

යාවත්කාලීන කරන ලද කාර්යාලයීය නිල වාර්තා, ක්ෂේත්‍රයේ දී සිදු කරන ලද නිරීක්ෂණ, අවට ප්‍රදේශයේ පවතී නම්, වර්තමානයේ එම ඉඩම්වල වෙළඳපල වටිනාකම සහ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද තක්සේරුව යන සාධක මත ඉඩමේ වටිනාකම පදනම් වේ. ඉඩමේ වටිනාකම නිශ්චය කිරීමේදී, එහි නෛතික හිමිකම වැනි තොරතුරු ඇතුළත් ඉඩමේ සම්බන්ධ වාර්තා සහ ඉඩම වර්ගීකරණය කිරීම යන කරුණු සලකා බලනු ලැබේ. ඉඩමේ ප්‍රතිස්ථාපන පිරිවැය මත පදනම්ව උප ව්‍යාපෘතිය/ සංරචකය සඳහා අත්කර ගැනීමට අවශ්‍ය වන සියලුම කැබලි සඳහා වන්දි ගෙවනු ලබන අතර ඉඩම වෙනුවට ඉඩමක් හෝ වාසස්ථානයක් වෙනුවට වාසස්ථානයක් ලබාදීමේ විකල්ප යොදාගත නොහැකි වුවහොත් මුදල් වන්දියක් ලබා දෙනු ඇත.

6.4 සාකච්ඡාකොට එකඟතාවයට පැමිණි ඉඩම් අත්කර ගැනීම්

'කැමැත්තෙන් විකුණන්නෙකු' සිටීම යනු එකඟතාවයට පැමිණි ඉඩම් අත්කර ගැනීමේ පූර්ව කොන්දේසියක් වශයෙන් ඉඩම් අත්කර ගැනීමේ පනතේ හඳුන්වා ඇත. මෙමගින් රජයේ අධිකාරීත්වය යොදවා ('eminent domain') පුද්ගලයන් ඔවුන්ගේ ඉඩමෙන් ඉවත්කර ඉඩම් අත්කර ගැනීමෙන් වළකාලයි. එය, ඉඩමට නෛතික හිමිකම් නොමැතිව ඉඩම භුක්ති විඳින පුද්ගලයන්ද ඇතුලුව ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක්වන පුද්ගලයන් සමඟ සාකච්ඡා/ උපදේශන මත පදනම් වේ. සාකච්ඡා කොට එකඟත්වයට පැමිණි ඉඩම් අත්කර ගැනීම මගින් ඉඩම් ලබා ගැනීමද ඉඩම් අත්කර ගැනීමේ පනත ප්‍රකාරව සිදු කරන ලද සාමාන්‍ය අත්කර ගැනීම් වැනිය. හිමිකම පිළිබඳ ගැටළු පවතින ඉඩම් රජයට පැවරීම වැළැක්වීමට මෙය හේතු වේ. ඉඩම් අත්කර ගැනීමේ රාමුව තුළ එකඟත්වයට පැමිණි ඉඩම් අත්කර ගැනීම් යොදා ගැනීම අපහසු නමුත්, ඉඩම් අත්කර ගැනීමේ පනතට අනුව වන්දි ගණනය කිරීමේදී 'එකඟත්වයට පැමිණි ඉඩම් අත්කර ගැනීම්' හඳුනාගනු ලබයි. ශ්‍රේෂ්ඨාධිකරණය අර්ථ නිරූපණය කරන

ආකාරයට **'කැමැත්තෙන් විකුණන්නෙකු'** 'වෙළඳපල වටිනාකම අනුව නියම වන්දි මුදලක් ලැබීමට හැකියාව ඇත.' ඉඩම් අත්කර ගැනීම සහ වන්දි ගෙවීම සඳහා අනිවාර්යය කෙරෙන ඉඩම් අත්කර ගැනීමේ පනත හා සම්බන්ධ ප්‍රමාදයන්, විධි නියමයන් සහ ඒ සඳහා වන වියදම් නිසා එකඟතාවයට පැමිණි ඉඩම් අත්කර ගැනීමේ ප්‍රායෝගික නොවන බව පිළිබඳව අධිකරණය පෙන්වා දී ඇත.

6.5 ප්‍රතිස්ථාපන පිරිවැය තක්සේරු කිරීම

'වෙළඳපල වටිනාකම' මත පදනම්ව වන්දිය නිශ්වය කිරීම සම්බන්ධ විධිවිධාන ඉඩම් අත්කර ගැනීමේ පනත මගින් සැපයෙයි. ඒ අනුව 'වෙළඳපල වටිනාකම' යනු; යම් ඉඩමක් සම්බන්ධයෙන් 7 වන වගන්තිය යටතේ දැන්වීමක් පළකර තිබේද මේ පනතෙහි කාර්යයන් සඳහා ඒ ඉඩමේ වෙළඳ මිල මෙහි මින් මතු විධිවිධාන සලස්වනු ආකාරයට යටත්ව, ඒ දැන්වීම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ දිනයෙහි කැමැත්තෙන් විකුණන්නෙකු විසින් ඒ ඉඩමට තනි ඒකකයක් වශයෙන් ප්‍රසිද්ධ වෙළඳපලෙහි විකුණනු ලදහොත් එයින් ලබා ගැනීමට බලාපොරොත්තු විය හැකි මුදල විය යුතුය. [46(1) වගන්තිය]. ස්වකැමැත්තෙන් තොරව අවතැන්වූවන් නැවත පදිංචි කිරීමේ ජාතික ප්‍රතිපත්ති පනත අනුව අත්කරගත් ඉඩමක සහ ඉදිකිරීමක් සඳහා වන්දි මුදල ප්‍රතිස්ථාපන පිරිවැය මත පදනම් වනු ඇත. ඉඩමක්, ඉදිකිරීමක්, වෙනත් වත්කමක් හා ආදායමක් සඳහා ගෙවිය යුතු වන්දි මුදල මුළු ප්‍රතිෂ්ඨාපන පිරිවැය මත පදනම් වන අතර අප්‍රමාදව ගෙවිය යුතු වේ. මෙයට හුවමාරු පිරිවැය ද ඇතුළත් විය යුතු වේ. [ප්‍රතිපත්තිය අංක 6].

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 63 (2) (f) වගන්තිය යටතේ පනවනු ලැබූ 2008 ඉඩම් අත්කර ගැනීමේ රෙගුලාසි මගින් 'ප්‍රතිස්ථාපන පිරිවැය' වන්දි සඳහා පදනම් කරගනු නොලබයි, ඉඩම් අත්කර ගැනීමේ පනත එම සංකල්පය භාවිතා නොකරන බැවිනි. ඒ වෙනුවට එහිදී වෙනත් සමාජ ආරක්ෂණ ප්‍රතිපත්තිවල මෙන්ම ඉඩම් අත්කර ගැනීමේ පනතේ දක්වා ඇති ආකාරයක 'වෙළඳපල වටිනාකම' තක්සේරු කිරීමේ සහ නිශ්වය කිරීම ක්‍රමවේදයෙන් හටගත් අසමානතා ඉවත් කිරීම සඳහා භාවිතා කෙරිණි. එමගින් වන්දිය යන්න 'ප්‍රතිස්ථාපන පිරිවැය' යන මට්ටමට උත්ශ්‍රේණිගත කෙරිණි.

ස්වකැමැත්තෙන් තොරව අවතැන්වූවන් නැවත පදිංචි කිරීම පිළිබඳ දැනට පවතින නියාමන රාමුව මගින්, ඉඩම් අත්කර ගැනීමෙන් බලපෑමට ලක් වූ පුද්ගලයන් හා කුටුම්බ විසින් ප්‍රතිස්ථාපන පිරිවැය ලැබීම සහතික කරයි. එමගින්, ඉඩම් අත්කර ගැනීමට පෙර ඔවුන් අත්විඳි සමාජ ආර්ථික තත්ත්වය පවත්වා ගැනීම හෝ විශේෂයෙන්ම, දිළිඳු හා අවදානම් කාණ්ඩයට අයත්වන කුටුම්බ සම්බන්ධයෙන් වන කල්හි පූර්ව අත්කර ගැනීමේ කාලයේදී ඔවුන්ගේ ජීවන තත්ත්වය හා සසඳා බැලීමේදී ඊට වඩා උසස් තත්ත්වයකට ජීවන තත්ත්වය වර්ධනය කර ගැනීම සඳහා සහාය වීම සහතික කරයි. ඉහත දක්වන ලද ආකාරයට, බලපෑමට ලක් වූ පුද්ගලයන්ගේ දේපළ අත්කර ගන්නා කාල සීමාව තුළදී ඒ සඳහා ඔවුන්ගෙන් වියදම් වූ සෑම වියදමකටම වන්දි ලබාදීම සඳහා අවශ්‍ය කෙරෙන විධිවිධාන, 2008 ඉඩම් අත්කර ගැනීමේ රෙගුලාසි වල 'බාධා කිරීම්' යටතේ සඳහන් කොට ඇත. 2008 ඉඩම් අත්කර ගැනීමේ රෙගුලාසිවල "අයිතිකරුට/ වන්දිහිමියාට අනන්‍ය වන සේ" යටතේ, ඉඩම් අත්කර ගැනීම මගින් ඇතිවිය හැකි විශාල පරාසයක් යටතට ගැනෙන 'බාධා කිරීම්' රාශියක් දක්වා ඇත. වන්දි සහ වෙනත් ගෙවීම් සඳහා වන මුළු පැකේජය මගින් වන්දි යන්න 'ප්‍රතිස්ථාපන පිරිවැය' යන මට්ටමට රැගෙන යන අතර එය ජාත්‍යන්තර වශයෙන් ඉතා

හොඳ පරිචයක් වේ. මහජන ව්‍යාපෘතියක් වෙනුවෙන් ඉඩමක් අහිමි වූ පුද්ගලයන් වෙත, 2008 ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ පහත සඳහන් වන්දි පැකේජ හඳුන්වා දී ඇත.

- ඉඩමකින් කොටසක් අත්කර ගනු ලැබූ විට තනි ඒකකයක් වශයෙන් එහි වෙළඳ වටිනාකම එම දේපළ සඳහා වෙළඳපොළේ වටිනාකම අඩුවන අවස්ථාවන් හි එම අත්පත් කර ගනු ලැබූ කොටසේ වෙළඳ වටිනාකම මුල් ඉඩමේ වෙළඳ වටිනාකමට අනුපාතිකව විය යුතුය.

- අත්කරගනු ලැබූ ඉඩම් අභිප්‍රේත අත්කර ගැනීම පිළිබඳ දැන්වීම් ප්‍රසිද්ධ කළ දිනයේ දී පදිංචිය හා/ හෝ ව්‍යාපාරික කටයුතු සඳහා යොදාගත් හෝ පදිංචිය හා/ හෝ ව්‍යාපාරික කටයුතු සඳහා ඉදිරියේ දී යොදා ගැනීමේ අපේක්ෂිත ගොඩනැගිල්ලක් වන අවස්ථාවන් හිදී සහ එය නැවත තැනීමට සහ/ හෝ නැවත තැනීමට අපේක්ෂිත අවස්ථාවන් හිදී එසේ නැවත තැනීමට යන වියදම් සහ ඉහත 1.1 යටතේ වටිනාකම ගණනය කිරීම සඳහා පදනම් කරගත් ගොඩනැගිල්ලේ වෙළඳ මිල අතර වෙනස අමතර වන්දියක් ලෙස ගෙවිය යුතුය.
- කුඹුරු ඉඩමක් වන විට එය පිරවීම සඳහා ගොවිජන කොමසාරිස් ජනරාල්ගේ අනුමැතිය ලබාගෙන ඇති අවස්ථාවන් හිදී සංවර්ධනයට යෝග්‍ය ඉඩමක් සේ සලකා එහි වෙළඳ වටිනාකම විය යුතුය.
- අත්කර ගනු ලැබූ ගොඩනැගිල්ල 1972 අංක 7 දරන (පසුව සංශෝධනය කළ) ගෙවල් කුලී පනතේ විධි විධාන යටතේ ගැනෙන කුලීකරුවෙකු/ ව්‍යවස්ථාපිත කුලීකරුවෙකු පදිංචි ස්ථානයක් වූ විට 2002 අංක 26 දරන ගෙවල් කුලී (සංශෝධන) පනතේ විධි විධානවලට යටත්ව වන්දි මුදල අනුපාතිකව ගණනය කළ යුතුය.

අහිතකර බලපෑම් සහ වෙන් කිරීම් සඳහා වන සම්පූර්ණ වන්දි මුදල විය යුතුය. බාධා කිරීම් සඳහා 'අයිතිකරුට/ වන්දි හිමියාට අනන්‍ය වන සේ' බාධා කිරීම් සඳහා ගෙවිය යුතු අමතර වන්දි මුදල් ලිඛිත වන්දි ඉල්ලීම් පදනම් කරගෙන ගෙවීම් කරනු ලැබේ.

- 9 වැනි වගන්තිය යටතේ වූ හිමිකම් පරීක්ෂණයට පෙනී සිටීම සඳහා වියදම
- විකල්ප ස්ථාන සොයා ගැනීමේ වියදම්
- පදිංචිය වෙනස් කිරීමේදී දැරූ වියදම්
- ප්‍රචාරණ වියදම්
- ගෘහ භාණ්ඩ සහ සවි කිරීම සඳහා නැවත සවිකිරීම සඳහා කළ යුතු වියදම්
- ප්‍රවාහන වියදම් අදාළ පරිදි
- ව්‍යාපාර හානිය (පනත යටතේ දැනට දක්වා ඇති සීමාවන්ට යටත්ව)
- වැඩිවන පොදු කාර්යය පිරිවැය
- ද්විගුණනය විය හැකි වියදම්
- අත්කර ගැනීම නිසා ඉඩම් හිමියාට සිදුවන වෙනත් සියලු වියදම්

- වෙනත් බාධා කිරීම් සඳහා වන වන්දි හෝ ඉඩම් අත්කර ගැනීමේ පනතේ වෙනත් කවර හෝ උප වගන්තියක් යටතේ නොගෙවනු ලැබූ ඉඩම් වටිනාකම් හා සෘජු සබඳතාවක් නොමැති වෙනත් හානියක් සඳහා වන්දි මුදලක්
- නිවසක අයිතිකරුවෙකු හෝ ආයෝජන දේපළක් විස්ථාපනය (අවතැන්) වන අවස්ථාවකදී අත්කරගත් දේපළේ වෙළඳපල වටිනාකමින් 10%ක අතිරේක ගෙවීමක්

කෙසේවුවද, IV වන පරිච්ඡේදයේ විස්තර කළ පරිදි මෙරට ජාතික ප්‍රතිපත්තින් සහ ආසියානු සංවර්ධන බැංකුවේ 2009 සමාජ ආරක්ෂණ ප්‍රතිපත්ති ප්‍රකාශය අතර පවතින පරතරය පියවීම සඳහා ප්‍රමාණවත් විධි විධාන එමගින් සපයනු නොලබයි. එසේම, අත්කර ගැනීමේදී සිදුවන තක්සේරු කිරීම් ක්‍රියාවලිය සහ වන්දි ගෙවීම් මගින් ප්‍රමාණවත් පරිදි ප්‍රතිලාභ නොලබන පුද්ගලයන් හටද මුහුණපෑමට සිදුවන අභියෝග සම්බන්ධයෙන්ද ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැත. එසේම ස්වකීය ඉඩම හෝ නිවාස අහිමිව බලපෑමට ලක් වූ පුද්ගලයා ප්‍රධාන තක්සේරුකරු විසින් නිශ්චය කරන ලද ව්‍යවස්ථාපිත වන්දි මුදල සම්බන්ධයෙන් සෑහීමට පත් නොවන අවස්ථාවක වුවද, මෙම ව්‍යාපෘතිය 2013 නියෝග යටතේ විශේෂිත ව්‍යාපෘති යටතේ ඇතුළත් නොවන බැවින් ඉඩම් අත්කර ගැනීමේ පනතේ 2013 ඉඩම් අත්කර ගැනීමේ රෙගුලාසි ප්‍රකාරව, ‘ඉඩම් අත්කර ගැනීමේ සහ ප්‍රතිස්ථාපන පිරිවැය සහ ප්‍රතිස්ථාපනය කිරීමේ කමිටුව (LARC) මගින් විධි විධාන සැපයෙන කරුණාසහගත ගෙවීම සඳහා අයදුම් කිරීමට නොහැකිය. තවද, භුක්ති විඳින රජයේ ඉඩම්වල සන්තකය ආපසු ගැනීමකදී, ඉඩම් නොවන ආර්ථික අවතැන් වීමකදී එනම්, අනවසරකරුවන්, ජංගම වෙළෙඳුන්, අඳ ගොවීන් වැනි ඉඩමට නෛතික හිමිකමක් නොමැති පුද්ගලයන් විසින් වන්දි ගෙවීම පිළිබඳ ප්‍රතිපාදන ඉඩම් අත්කර ගැනීමේ පනතේ හෝ 2008 අත්කර ගැනීමේ රෙගුලාසි වලින් සපයනු නොලැබේ.

මේ අනුව, නැවත පදිංචි කිරීමේ වැඩ රාමුවෙහි සඳහන් හිමිකම් ගෙවීමේ ක්‍රමවේදය මගින් සිදු කෙරෙන යෝජනා මාලාව තුළින් මෙම පරතරයන් පියවීමට අපේක්ෂා කරයි. එහි, 2013 ඉඩම් අත්කර ගැනීමේ රෙගුලාසි වල සඳහන් ගාස්තුවලට අනුකූල වන වන්දි සහ/ හෝ පුනරුත්ථාපන සහ ප්‍රතිස්ථාපන සහායක් ලබාදීම අන්තර්ගත වේ. මීට අමතරව, මෙම නැවත පදිංචි කිරීමේ වැඩ රාමුව සඳහා සකස් කළ හිමිකම් ගෙවීමේ ක්‍රමවේදයේ මුදල්මය වන්දිය සහ මුදල් නොවන නැවත පදිංචි කිරීමේ සහාය යන දෙආකාරයෙන් වන වන්දි අන්තර්ගත වන අතර අභියාචනා සලකා බලා කරුණාසහගත ගෙවීම් නිශ්චය කිරීම සඳහා හිමිකම් තක්සේරු කිරීමේ කමිටුවක් ද ස්ථාපිත කරනු ඇත. හිමිකම් ගෙවීමේ ක්‍රමවේදයෙන් යෝජනා කෙරෙන අතිරේක දීමනා ගෙවීම සඳහා සහ හිමිකම් තක්සේරු කිරීමේ කමිටුව සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය අවශ්‍ය කෙරේ.

පවතින නීති, ප්‍රතිපත්ති සහ රෙගුලාසි මත පදනම්ව සහ ව්‍යාපෘතිය හා එහි උප ව්‍යාපෘති/ සංරචක හේතුවෙන් ඇති විය හැකි බලපෑම් සහ සිදුවිය හැකි අහිමිවීම්වල ස්වභාවය අනුව බලපෑම් වර්ග සහ හිමිකම් ලබන හිමිකරුවන්ගේ ලේඛනයක් සකස් කොට 7 වන පරිච්ඡේදය යටතේ ඉදිරිපත් කොට ඇති හිමිකම් ගෙවීමේ ක්‍රමවේදයේ දක්වා ඇත.

6.6 හිමිකම් තක්සේරු කිරීමේ කමිටුව ස්ථාපිත කිරීම

1950 ඉඩම් අත්කර ගැනීමේ පනත සහ 2008 ඉඩම් අත්කර ගැනීමේ රෙගුලාසි යටතේ ඉඩම් අත්කර ගැනීමෙන් බලපෑමට ලක් වූ පුද්ගලයන් වෙත වන්දි ගෙවීම නිශ්චය කිරීමේ නෛතික බලධාරියා වනුයේ තක්සේරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන තක්සේරුකරු වේ. ප්‍රධාන තක්සේරුකරු විසින් නිශ්චය කරන ලද ව්‍යවස්ථාපිත වන්දි මුදල පිළිබඳව, බලපෑමට ලක් වූ පුද්ගලයා සෑහීමට පත් නොවන්නේ නම් 2013 ඉඩම් අත්කර ගැනීමේ රෙගුලාසි මගින් ඉදිරිපත් කෙරෙන ලාර්ක් හා සුපර් ලාර්ක් ක්‍රමවේදයන් හරහා කරුණාසහගත දීමනාවක් ගෙවීමට බලය පැවරී ඇත. නමුත් කැළණිවැලි දුම්රිය මාර්ගයේ පළමු අදියර වැඩසටහන 2013 ඉඩම් අත්කර ගැනීමේ රෙගුලාසි හි 'නිශ්චිත ව්‍යාපෘති' යටතේ සඳහන්ව නොමැති බැවින්, ලාර්ක් හා සුපර් ලාර්ක් ක්‍රමවේදය මෙම ව්‍යාපෘතිය සඳහා අදාළ නොවේ. එසේම, 2008 ඉඩම් අත්කර ගැනීමේ රෙගුලාසි වල, එවන් අවස්ථාවලදී හෝ ඉඩම් නොවන ආර්ථික අවතැන් වීමකදී හෝ කරුණාසහගත ගෙවීම් නිශ්චය කරනුයේ කවුරුන්ද යන්න සඳහන් නොකරයි. මෙවන් වාතාවරණයක් යටතේදී, කැළණිවැලි දුම්රිය මාර්ගයේ පළමු අදියර වෙනුවෙන් පිහිටුවන ලද 'හිමිකම් තක්සේරු කිරීමේ කමිටුව' එම ගැටළුවට පිළිතුරු සපයනු ඇත.

හිමිකම් තක්සේරු කිරීමේ කමිටුව පහත සඳහන් කාර්භාරය ඉටු කරනු ඇත.

- දැනට පවතින නීති රීති මගින් ආවරණය නොවන, කරුණාසහගත ප්‍රතිලාභ සහ නැවත පදිංචි කිරීමේ හා ප්‍රතිසංස්කරණය කිරීමේ වෙනත් සහාය ලබාදීම් නිශ්චය කිරීම.
- කඩඉම් දිනයට පෙර යෝජිත භූමියේ සිටි අනවසරකරුවන් හඳුනා ගැනීම සඳහා පදිංචිය සනාථකර ගැනීම.
- අත්කර ගැනීමෙන් පසුව ඉතිරිවන ඉඩම්/ ඉදිකිරීම් තවදුරටත් ප්‍රයෝජනවත් කාර්යයක යෙදවීමේ හැකියාව ඇත්දැයි නිශ්චය කිරීම.
- තාවකාලික/ ස්ථිර නවාතැන් පහසුකම් අවශ්‍ය කාල සීමාව නිශ්චය කිරීම.

හිමිකම් තක්සේරු කිරීමේ කමිටුව; කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතියෙහි ව්‍යාපෘති අධ්‍යක්ෂ හා නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ (පරිසර සහ සමාජ ආරක්ෂණ), ඉඩම් අමාත්‍යාංශයේ නියෝජිතයෙකු, තක්සේරු දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු, දුම්රිය දෙපාර්තමේන්තුවේ ඉඩම් නිලධාරී විසින් නම් කරන ලද නියෝජිතයෙකු, සිවිල් සමාජයේ නියෝජිතයෙකු (ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන ප්‍රදේශයේ අදාළ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නම් කළ යුතු වේ) යන නියෝජිතයන්ගෙන් සමන්විත වේ. බලපෑමට ලක් වූ පුද්ගලයින්ගේ ව්‍යාපෘතියෙන් බලපෑමට ලක් වූ දේපළවල මූල්‍යමය වටිනාකම තක්සේරු කිරීම පිණිස බලයලත් තක්සේරුකරුවන් හා වරලත් ප්‍රමාණ සමීක්ෂකයින් වැනි විශේෂඥයින්ගෙන් සමන්විත තාක්ෂණික කමිටුවක් හිමිකම් තක්සේරු කිරීමේ කමිටුවට සහාය වනු ඇත. ව්‍යාපෘතියෙන් බලපෑම ලක්වන පුද්ගලයන් වෙත ලබාදෙන වන්දිය තක්සේරු කිරීමේ ක්‍රියාවලිය සඳහා හිමිකම් ගෙවීමේ ක්‍රමවේදයේ සඳහන් වන හිමිකම් පරාමිතීන් අනුගමනය කරමින් හිමිකම් තක්සේරු කිරීමේ කමිටුව කටයුතු කරනු ඇත. ව්‍යාපෘතියෙන් බලපෑමට ලක් වූ සියලුම ආකාරයේ පුද්ගලයන් සෑම දෙනා වෙතම වන්දි ලබාදෙන ආකාරය සහ නැවත පදිංචි කිරීමේ සහාය සහ ඔවුන්ට සිදු වූ හානි පියවීම සහ ඔවුන්ගේ ජීවන තත්ත්වය නංවාලීම හෝ අවම වශයෙන් පෙර පැවති තත්ත්වයෙන් පවත්වා

ගැනීම මෙම හිමිකම් ගෙවීමේ ක්‍රමවේදය මගින් යෝජනා කෙරේ. හිමිකම් ගෙවීමේ ක්‍රමවේදයෙහි දක්වා ඇති අතිරේක දිමනා ගෙවීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගත යුතු වේ. කඩඉම් දිනය පසුව අදාළ ප්‍රදේශයේ අනවසරයෙන් පදිංචිවන හෝ පදිංචි වන කවර හෝ පුද්ගලයෙකු වන්දි ලබා ගැනීමට හෝ වෙනත් කුමන ආකාරයේ හෝ නැවත පදිංචි කිරීමේ සහාය ලබා ගැනීමට හිමිකම් නොලබයි.

6.7 ව්‍යාපෘති මෙහෙයවීමේ ජාතික කමිටුව (NPSC)

ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම දැනට පවතින රාජ්‍ය ආයතන සහ ඒවායේ විෂය පථය හරහා සිදු කරනු ඇත. ව්‍යාපෘති මෙහෙයවීමේ ජාතික කමිටුවක් ස්ථාපිත කොට ඇති අතර එය පහත සඳහන් නිලධාරීන්ගෙන්/ ආයතනවලින් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ගෙන් සමන්විත වනු ඇත.

- ලේකම්, ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය
- සාමාන්‍යාධිකාරී, දුම්රිය දෙපාර්තමේන්තුව
- මැනුම්පති, මිනින්දෝරු දෙපාර්තමේන්තුව
- ප්‍රධාන තක්සේරුකරු, තක්සේරු දෙපාර්තමේන්තුව
- ලේකම්, ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය
- ලේකම්, පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය
- අධ්‍යක්ෂ ජනරාල්, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව
- සභාපති/ අධ්‍යක්ෂ ජනරාල්, නාගරික සංවර්ධන අධිකාරිය
- සභාපති, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය
- සභාපති/ සාමාන්‍යාධිකාරී, ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව
- නාගරික කොමසාරිස්/ නියෝජ්‍ය නාගරික කොමසාරිස් (ඉංජිනේරු සේවා), කොළඹ මහනගර සභාව
- අධ්‍යක්ෂ ජනරාල්, වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව
- සාමාන්‍යාධිකාරී, ලංකා විදුලිබල මණ්ඩලය
- සාමාන්‍යාධිකාරී, ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය
- අධ්‍යක්ෂ ජනරාල්, මධ්‍යම පරිසර අධිකාරිය
- අධ්‍යක්ෂ, ජාතික අයවැය දෙපාර්තමේන්තුව
- අධ්‍යක්ෂ (සැලසුම්), මුදල් අමාත්‍යාංශය
- ව්‍යාපෘති අධ්‍යක්ෂ සහ අනෙකුත් අය අවශ්‍ය අවස්ථාවලදී, සාමාජිකයන් වශයෙන් සහභාගී වී සහයෝගය ලබාදෙනු ඇත.

ව්‍යාපෘති මෙහෙයවීමේ ජාතික කමිටුව දෙමසකට වරක් රැස්වනු ඇත. එම කමිටුවෙහි වගකීම් සමහරක් පහත සඳහන් වේ.

- ව්‍යාපෘති වාර්තා මත පදනම්ව සමස්ථ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ කාර්යයම මෙහෙයවීම.
- ක්‍රියාත්මක කිරීමේදී ඇතිවන ගැටළු වලට විසඳුම් ලබාදීම.

- ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධ වන ජාතික මට්ටමේ රාජ්‍ය ආයතන සමඟ සම්බන්ධීකරණය සිදු කිරීම. ව්‍යාපෘති මෙහෙයවීමේ ජාතික කමිටුව දෙමසකට වරක් රැස්වනු ඇත.

6.8 ඉඩම් අත්කර ගැනීමේ පනත හා ස්වකැමැත්තෙන් තොරව අවතැන්වූවන් නැවත පදිංචි කිරීමේ ජාතික ප්‍රතිපත්තිය අතරත් ඒ සම්බන්ධයෙන් ආසියානු සංවර්ධන බැංකුවේ 2009 සමාජ ආරක්ෂණ ප්‍රතිපත්ති ප්‍රකාශය අතරත් දැනට පවතින පරතරය

ඉඩම් අත්කර ගැනීම හා වන්දි ගෙවීම සඳහා වන ප්‍රවේශය සම්බන්ධයෙන් ඉඩම් අත්කර ගැනීමේ පනතේ හා ස්වකැමැත්තෙන් තොරව අවතැන් වූවන් නැවත පදිංචි කිරීමේ ප්‍රතිපත්ති ප්‍රතිපාදනත් ආසියානු සංවර්ධන බැංකුවේ 2009 සමාජ ආරක්ෂණ ප්‍රතිපත්ති ප්‍රකාශයේ ප්‍රතිපාදනයත් අතර වෙනස්කම් පවතී. ස්වකැමැත්තෙන් තොරව අවතැන් වූවන් නැවත පදිංචි කිරීමේ ජාතික ප්‍රතිපත්තිය සහ සමාජ ආරක්ෂණ ප්‍රතිපත්ති ප්‍රකාශය තරමක් දුරට එක සමාන වන නමුත් ඉඩම් අත්කර ගැනීමේ පනත සහ සමාජ ආරක්ෂණ ප්‍රතිපත්ති ප්‍රකාශය එකිනෙකට වෙනස්ය. ඉඩම් අත්කර ගැනීමේ පනත, ස්වකැමැත්තෙන් තොරව අවතැන්වූවන් නැවත පදිංචි කිරීමේ ජාතික ප්‍රතිපත්තිය යටතෙහි පවතින්නක් නොවන නමුත් වන්දි ගෙවීමේදී එම ජාතික ප්‍රතිපත්තියේත් සමාජ ආරක්ෂණ ප්‍රතිපත්ති ප්‍රකාශයෙහිත් විධිවිධාන අනුගමනය කරනු ලැබේ. ඉඩම් අත්කර ගැනීමේ පනතත්, ස්වකැමැත්තෙන් තොරව අවතැන්වූවන් නැවත පදිංචි කිරීමේ ජාතික ප්‍රතිපත්තිය හා ආසියානු සංවර්ධන බැංකුවේ සමාජ ආරක්ෂණ ප්‍රතිපත්ති ප්‍රකාශයත් අතර පවතින පරතරයන් වගුව 6.2 හි විශ්ලේෂණය කර ඇත.

ජාතික ප්‍රතිපත්තිය සහ ආසියානු සංවර්ධන බැංකුවේ 2009 සමාජ ආරක්ෂණ ප්‍රතිපත්ති ප්‍රකාශය අතර සංසන්දනයක් පහත සඳහන් කොට ඇත.

1950 ඉඩම් අත්කර ගැනීමේ පනත (1986 සංශෝධිත) සහ ඊට පනවනු ලැබූ රෙගුලාසි මගින් මහජන කාර්යයන් වෙනුවෙන් පෞද්ගලික ඉඩම් අත්කර ගැනීම සම්බන්ධයෙන් විධිවිධාන සලසන අතර ඉඩමට නෛතික හිමිකමක් සහිත පුද්ගලයන් පමණක් වන්දි ලබාදීමේදී ප්‍රතිලාභ ලබයි. ඉඩම් අත්කර ගැනීමේ පනත හා ඊට අදාළ රෙගුලාසි ප්‍රකාරව, ඉඩම් හා දේපළ අහිමි වීම සඳහා ප්‍රතිස්ථාපන පිරිවැය මත පදනම්ව වන්දි ගෙවීමක් සිදු නොවේ. එය ස්වකැමැත්තෙන් තොරව අවතැන්වූවන් නැවත පදිංචි කිරීමේ ජාතික ප්‍රතිපත්තිය හඳුන්වා දීමෙන්, නැවත පදිංචි කිරීම හා සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ පවතින ගැටළුවලට විසඳුම් සැපයීම සඳහා ක්‍රමානුකූල ප්‍රවේශයක් සපයන අතරම ඉඩම් අත්කර ගැනීම හා වන්දි ගෙවීම සම්බන්ධ ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රතිපත්ති සහ ඒ සම්බන්ධ ආසියානු සංවර්ධන බැංකුවේ ප්‍රතිපත්ති අතර පරතරය සැලකිය යුතු මට්ටමකට අඩු කිරීමට එහි ප්‍රතිපාදන වලට හැකියාව ලැබී ඇත.

වගුව 6.2: ණය ගැනුම්කරු සහ ආසියානු සංවර්ධන බැංකුවේ සමාජ ආරක්ෂණ ප්‍රතිපත්ති ප්‍රකාශය අතර සංසන්දනය

	ක්‍රියාකාරකම	ශ්‍රී ලංකා රජයේ නීති/ ප්‍රතිපත්ති	ආසියානු සංවර්ධන බැංකුවේ සමාජ ආරක්ෂණ ප්‍රකාශය	පරතරය පියවීමට ගනු ලබන පියවර
1	ව්‍යාපෘතිය ආවරණය කිරීම	ඉඩම් අත්කර ගැනීමේ පනත හා ස්වකැමැත්තෙන් තොරව අවතැන්වූවන් නැවත පදිංචි කිරීමේ පනත අනුව අවශ්‍ය කෙරේ.	අතීත, වර්තමාන හා අනාගත ස්වකැමැත්තෙන් තොරව නැවත පදිංචි කිරීමේ බලපෑම් හා අවදානම් හඳුනා ගැනීම සඳහා ව්‍යාපෘතිය ආවරණය කිරීම අවතැන් වූ පුද්ගලයන් සම්බන්ධයෙන් ස්ත්‍රී පුරුෂ භාවය පිළිබඳ විශ්ලේෂණයන් ඇතුළත්ව විශේෂයෙන්ම නැවත පදිංචි කිරීම සම්බන්ධයෙන් සමීක්ෂණයක් සහ/ හෝ සංගණනයක් සිදු කිරීම.	පරතරයක් නොමැත
2	පාර්ශවකරුවන් සමඟ සාකච්ඡා කිරීම සහ දුක්ගැනවිලි සඳහා සහන සැලසීමේ යාන්ත්‍රණය	සංශෝධිත ඉඩම් අත්කර ගැනීමේ පනත ප්‍රකාරව අවශ්‍ය නොවේ. ස්වකැමැත්තෙන් තොරව අවතැන්වූවන් නැවත පදිංචි කිරීම (NIRP) යටතේ අවශ්‍යතාවයකි. දුක්ගැනවිලි සඳහා සහන සැලසීම ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අවශ්‍යතාවයක් නොවුවද, ස්වකැමැත්තෙන් තොරව අවතැන්වූවන් නැවත පදිංචි කිරීම (NIRP) යටතේ අවශ්‍යතාවයකි.	පාර්ශවකරුවන් සමඟ හරවත් උපදේශන/ සාකච්ඡා පැවැත්වීම. සියලුම අවතැන් වූ පුද්ගලයන් හට ඔවුන්ගේ හිමිකම් පිළිබඳවත්, නැවත පදිංචි කිරීමේ විකල්ප පිළිබඳවත් දැනුම් දීම. නැවත පදිංචි කිරීමේ වැඩසටහන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා සුපරීක්ෂණයේදී ඔවුන්ගේ සහභාගීත්වය සහතික කිරීම. බලපෑමට ලක් වූ පුද්ගලයන්ගේ ගැටළු හා දුෂ්කරතා බාර ගැනීමටත්, ඒවාට පිළියම් ලබාදීමටත් දුක්ගැනවිලි සඳහා සහන සැලසීමේ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම.	පරතරයක් නොමැත

3.	අවතැන් වූ සියලුම පුද්ගලයන්ගේ ජීවනෝපාය වර්ධනය කිරීම හෝ අවම වශයෙන් පෙර පැවති තත්ත්වයට පත් කිරීම සහ ප්‍රතිස්ථාපන පිරිවැය මත වන්දි ගෙවීම.	ඉඩම් අත්කර ගැනීමේ පනතේ ප්‍රතිපාදන නොමැත. නමුත් ආදායම් ප්‍රතිස්ථාපනය හා ජීවන තත්ත්වය වර්ධනය කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව ස්වකැමැත්තෙන් තොරව අවතැන්වූවන් නැවත පදිංචි කිරීමේ ප්‍රතිපත්තියෙහි සඳහන් වේ. ස්වකැමැත්තෙන් තොරව අවතැන්වූවන් නැවත පදිංචි කිරීම (NIRP) හි ප්‍රතිපාදන සපයයි. 2009 ජනවාරි 20 දින ගැසට් පත්‍රයෙහි නියෝග පරිදි ප්‍රතිස්ථාපන පිරිවැය මත.	පහත සඳහන් ආකාරයට අවතැන් වූ පුද්ගලයන්ගේ ජීවනෝපාය වර්ධනය කිරීම හෝ අවම වශයෙන් පෙර පැවති තත්ත්වයට පත් කිරීම. (i) බලපෑමට ලක්වූවන්ගේ ජීවනෝපාය ඉඩම පාදක වූවක් විණි නම්, හැකි සෑම විටම ඉඩම පාදක නැවත පදිංචි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම නැතහොත් ඉඩම අහිමිවීමෙන් ජීවනෝපායට බාධා සිදු නොවේ නම්, ප්‍රතිස්ථාපන පිරිවැය මත වන්දි මුදලින් ගෙවීම, (ii) අහිමි වූ වත්කම් වලට සමාන හෝ වැඩි වටිනාකමකින් යුතු වත්කම් ලබාදීමෙන් වත්කම ප්‍රතිස්ථාපනයට කඩිනම් පියවර ගැනීම. (iii) ප්‍රතිස්ථාපනය කළ නොහැකි වත්කම් සඳහා පූර්ණ ප්‍රතිස්ථාපන පිරිවැය මත කඩිනමින් වන්දි ගෙවීම, සහ (iv) හැකි සෑම අවස්ථාවකම ප්‍රතිලාභ බෙදා හැරීම තුළින් අතිරේක ආදායම් හා සේවාවන් ලබාදීම.	පරතරයක් නොමැත
4.	අවතැන් වූ පුද්ගලයන් සඳහා සහාය	ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ ප්‍රතිපාදන නොමැත. නමුත් ස්වකැමැත්තෙන් තොරව අවතැන් වූවන් නැවත පදිංචි කිරීමේ ජාතික ප්‍රතිපත්තිය අනුව සහාය ලබාදීම අවශ්‍ය කෙරේ.	භෞතික හා ආර්ථික වශයෙන් අවතැන් වූ පුද්ගලයන් හට අවශ්‍ය සහාය ලබාදීම.	පරතරයක් නොමැත
5.	අවදානම් කාණ්ඩය යටතට ගැනෙන කණ්ඩායම් අවතැන් වූ විට ඔවුන්ගේ ජීවන තත්ත්වය වර්ධනය කිරීම.	ඉඩම් අත්කර ගැනීමේ පනත සම්බන්ධයෙන් කිසිවක් ප්‍රකාශ නොකරයි. ස්වකැමැත්තෙන් තොරව අවතැන්වූවන් නැවත පදිංචි කිරීම (NIRP) යටතේදී මෙවන් අවදානම් කාණ්ඩය යටතට ගැනෙන කණ්ඩායම් සඳහා විශේෂ සහායක් අවශ්‍ය කෙරේ.	අවතැන් වූ දිළිඳු ජනතාව හා වෙනත් අවදානම් කාණ්ඩයේ පුද්ගලයන් හෝ ජීවන තත්ත්වය වර්ධනය කිරීම.	පරතරයක් නොමැත

6.	ස්වකැමැත්තෙන් තොරව අවතැන්වූවන් නැවත පදිංචි කිරීම (NIRP) හි ප්‍රතිපාදන ඇත. ඉඩම් අත්කර ගැනීමේ පනතේ ප්‍රතිපාදන නොමැත.	ඉඩම් අත්කර ගැනීමේ පනත මගින් අවරණය නොවේ.	ඉඩම් අත්කර ගනුයේ සාකච්ඡා කොට එකඟත්වයට පැමිණි ඉඩම් අත්කර ගැනීමක් නම් එම අත්කර ගැනීමෙන් පසුවත්, බලපෑමට ලක් වූ පුද්ගලයන්ගේ ආදායම් හා ජීවනෝපාය පෙර පැවති තත්ත්වයට හෝ ඊට වඩා වැඩි තත්ත්වයකට පත් කිරීම සහතික කරමින්, විනිවිදභාවයෙන් යුතු ස්ථිර සහ අපක්ෂපාතී ක්‍රියාපටිපාටි.	කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය **ආසියානු සංවර්ධන, බැංකුවේ** SPS අනුගමනය කරනු ඇත
7.	ඉඩමට හිමිකමක් නොමැති පුද්ගලයන් සඳහා වන්දි.	ස්වකැමැත්තෙන් තොරව අවතැන්වූවන් නැවත පදිංචි කිරීම (NIRP) හි ප්‍රතිපාදන ඇත. ඉඩම් අත්කර ගැනීමේ පනතේ ප්‍රතිපාදන නොමැත.	ඉඩමට හිමිකමක් නොමැතිව අවතැන් වන හෝ හඳුනාගත් ඉඩමට නීතිමය හිමිකමක් නොමැති පුද්ගලයන් නැවත පදිංචි කිරීමේ සහාය සහ ඉඩම් නොවන වත්කම් අහිමි වීම වෙනුවෙන් වන්දි ලැබෙන බව සහතික කිරීම.	කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය **ආසියානු සංවර්ධන, බැංකුවේ** SPS අනුගමනය කරනු ඇත
8.	නැවත පදිංචි කිරීමේ සැලැස්මේ අවශ්‍යතාවය.	සංශෝධිත ඉඩම් අත්කර ගැනීමේ පනත ප්‍රකාරව අවශ්‍ය නොවේ. ස්වකැමැත්තෙන් තොරව අවතැන් වූවන් නැවත පදිංචි කිරීමේ ජාතික ප්‍රතිපත්තිය අනුව, කිසියම් ව්‍යාපෘතියකින් අවතැන් වන සංඛ්‍යාව කුටුම්බ 20කට වඩා වැඩි නම් විස්තරාත්මක නැවත පදිංචි කිරීමේ සැලැස්ම අවශ්‍ය වන අතර 20කට වඩා අඩු නම් විස්තරාත්මක බවින් අඩු නැවත පදිංචි කිරීමේ සැලැස්ම සකස් කළ යුතුය. කුටුම්බ 100ක් බලපෑමට ලක් වේ නම් එය NEA යටතේ නිශ්චිත ව්‍යාපෘතියක් වශයෙන් සලකනු ලබයි. එවන් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට ප්‍රථම ඒ සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ අනුමැතිය ලබාගත යුතුය, නමුත් නැවත පදිංචි කිරීමේ ගැටළු සඳහා පිළියම් නොදෙයි.	බලපෑමට ලක් වූ පුද්ගලයන්ගේ හිමිකම්, ආදායම් හා ජීවනෝපාය ප්‍රතිස්ථාපනය කිරීමේ උපාය මාර්ග, ආයතනික වැඩපිළිවෙල, සුපරීක්ෂණය හා වාර්තාකරණ වැඩරාමුව, අයවැය හා කාල සටහනකින් යුතු ක්‍රියාත්මක කිරීමේ උපලේඛනය විස්තර කරමින් නැවත පදිංචි කිරීමේ සැලැස්ම සකස් කළ යුතුය. A හා B කාණ්ඩවල ව්‍යාපෘති සඳහා අවශ්‍ය කෙරේ.	පරතරයක් නොමැත

9.	මහජන අනාවරණය	සංශෝධිත ඉඩම් අත්කර ගැනීමේ පනත ප්‍රකාරව අවශ්‍ය නොවන අතර ස්වකැමැත්තෙන් තොරව අවතැන්වූවන් නැවත පදිංචි කිරීම (NIRP) හි විධිවිධාන සලසයි. ව්‍යාපෘතිය සඳහා IEE හෝ EIA සකස් කළ යුතු වන්නේ නම්, මහජනතාවගේ දැන ගැනීම සඳහා හෝ මහජන අදහස් විමසීම සඳහා එම වාර්තා ලබාදිය යුතු වේ.	ව්‍යාපෘතිය ඇගයීම සිදු කිරීමට ප්‍රථම ක්‍රමිකව සිදු කරන ලද උපදේශන/ සාකච්ඡා ක්‍රියාවලිය ලේඛනයක ආකාරයෙන් නැවත පදිංචි කිරීමේ සැලැස්මෙහි කෙටුම්පතට ඇතුළත් කොට, ව්‍යාපෘතියෙන් බලපෑමට ලක් වූ පුද්ගලයන් හට හා පාර්ශවකරුවන්ට තේරුම්ගත හැකි භාෂාවකින් අනාවරණය කළ යුතු වේ. අවසාන නැවත පදිංචි කිරීමේ සැලැස්ම හා එහි යාවත්කාලීන කරන ලද තොරතුරු බලපෑමට ලක්වූවන්ට හා වෙනත් පාර්ශව වලට අනාවරණය කළ යුතු වේ.	පරතරයක් නොමැත
10.	නැවත පදිංචි කිරීමේ පිරිවැය	අදාළ ව්‍යාපෘති සඳහා රජයන් මගින් වෙන් කරන අයවැය.	සංවර්ධන ව්‍යාපෘතියේ හෝ වැඩසටහනේ කොටසක් ස්වකැමැත්තෙන් තොරව නැවත පදිංචි කිරීම ක්‍රියාත්මක කරනු ඇත. ව්‍යාපෘතියේ පිරිවැය හා ප්‍රතිලාභ, නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘති පිරිවැය හා ප්‍රතිලාභ ඇතුළත් කෙරේ.	පරතරයක් නොමැත

11.	වන්දි ගෙවීමට පෙර සන්තකය බාර ගැනීම	ස්වකැමැත්තෙන් තොරව අවතැන්වූවන් නැවත පදිංචි කිරීම (NIRP) මගින් අවසර ලබා නොදේ. ව්‍යවස්ථාපිත වන්දිය වාරික වශයෙන් ගෙවීම සම්බන්ධ ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ ප්‍රතිපාදන ඇත. ස්වකැමැත්තෙන් තොරව අවතැන්වූවන් නැවත පදිංචි කිරීම (NIRP) ප්‍රතිපාදන නොසලසයි. හදිසි අත්කර ගැනීම සඳහා ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 (a) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව වන්දි ගෙවීමකින් තොරව පැය 48ක් තුළ ඉඩම් අත්කර ගැනීමට ප්‍රතිපාදන ඇත. එය ව්‍යවස්ථාපිත පනතක් නොවන බැවින්, ස්වකැමැත්තෙන් තොරව අවතැන්වූවන් නැවත පදිංචි කිරීම (NIRP) අනුව ප්‍රතිස්ථාපන පිරිවැය ගෙවීමකින් තොරව හා ප්‍රමාණවත් දැනුම් දීමකින් තොරව සිදුකළ නොහැකිය. නමුත් අවතැන් වූ පිරිසට සහන සැලසීම සඳහා ශ්‍රී ලංකා රජයේ අමාත්‍ය මණ්ඩලයේ විධානය මත ස්වකැමැත්තෙන් තොරව අවතැන්වූවන් නැවත පදිංචි කිරීම (NIRP) ක්‍රියාත්මක කරනු ලැබේ.	භෞතික හෝ ආර්ථික අවතැන්වීම සිදුවීමට පෙර වන්දි ගෙවීම හා අනෙකුත් නැවත පදිංචි කිරීමේ හිමිකම් ලබාදීම. ව්‍යාපෘති ක්‍රියාත්මක කරන කාලසීමාව පුරාවටම සමීප පරීක්ෂාව යටතේ නැවත පදිංචි කිරීමේ සැලැස්ම ක්‍රියාත්මක කිරීම.	නැවත පදිංචි කිරීමේ ක්‍රියාත්මක සැලැස්මෙහි සඳහන් කොට ඇති පරිදි ස්වකැමැත්තෙන් තොරව අවතැන්වූවන් නැවත පදිංචි කිරීම (NIRP) හි ආසියානු සංවර්ධන බැංකුවේ සමාජ ආරක්ෂණ ප්‍රතිපත්ති ප්‍රකාශය, කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය විසින් අනුගමනය කරනු ඇත. කවරාකාරයේ හෝ භෞතික හෝ ආර්ථික අවතැන් වීමක් සිදුවීමට ප්‍රථමව, ප්‍රතිස්ථාපන පිරිවැය මත පදනම්ව සම්පූර්ණ වන්දි මුදලම අවතැන් වූ පුද්ගලයන් වෙත ලබාදිය යුතු වේ. පහත සඳහන් අවශ්‍යතා සම්පූර්ණ වන තෙක් භෞතික හෝ ආර්ථික අවතැන්වීම් සිදු නොවන බවට කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය සහතික වනු ඇත. (1) අවතැන් වූ සෑම පුද්ගලයෙකු වෙතම, ප්‍රතිස්ථාපන පිරිවැය මත පදනම්ව වන්දි ගෙවීම, (2) අවතැන් වූ පුද්ගලයන් වෙත, නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් කොට ඇති වෙනත් හිමිකම් ලබාදෙන බව, (3) ප්‍රමාණවත් අයවැයකින් සමන්විත ආදායම් හා ජීවනෝපාය පුනරුත්ථාපනය කිරීමේ වැඩසටහනක්, අවතැන් වූ පුද්ගලයන් වෙනුවෙන් පවතින බව.

12.	සුපරීක්ෂණය	ස්වකැමැත්තෙන් තොරව අවතැන්වූවන් නැවත පදිංචි කිරීම (NIRP) යටතේ අවශ්‍ය කෙරේ.	නැවත පදිංචි කිරීමේ ප්‍රතිඵල අවතැන් වූ පුද්ගලයන්ගේ ජීවන තත්ත්වය මත ඒවායේ බලපෑම් සුපරීක්ෂණය හා තක්සේරු කිරීම සහ පාදක කොන්දේසි සහ නැවත පදිංචි කිරීම් සුපරීක්ෂණය කිරීමේ ප්‍රතිඵල සලකා බලා නැවත පදිංචි කිරීමේ සැලැස්මෙහි අරමුණු ළඟාකර ගෙන ඇත්දැයි සොයා බැලීම සුපරීක්ෂණ වාර්තා අනාවරණය කිරීම.	කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය **ආසියානු සංවර්ධන, බැංකුවේ** SPS අනුගමනය කරනු ඇත

7 වන පරිච්ඡේදය - හිමිකම්, සහාය සහ ප්‍රතිලාභ

7.1 හැඳින්වීම

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හේතුවෙන් පුද්ගලයන් භෞතික වශයෙන් හා ආර්ථික වශයෙන් අවතැන්වීම, සැලකිය යුතු මට්ටමකම සිදුවිය හැකිය. මේ අනුව ඉඩමට නෛතික හිමිකමක් පවතින පුද්ගලයන්, බදුකරුවන්, කුලී නිවැසියන් මෙන්ම අනවසරකරුවන්, බලහත්කාරයෙන් භුක්ති විඳින්නන් වැනි ඉඩමට නෛතික හිමිකමක් නොමැති පුද්ගලයන්, ශ්‍රම බලකායට අයත් අයවලුන්, දෛනික වැටුප් ලබන්නන් සහ අවදානම් කාණ්ඩයට ගැනෙන පුද්ගලයන්ද මෙසේ බලපෑමට ලක්වෙයි. මෙසේ බලපෑමට ලක්වන්නන්ට අත්විඳීමට සිදුවන අහිමි වීම් පියවා ගැනීම සඳහා බලපෑමට ලක්වන සියලු දෙනා හට වන්දි ගෙවීම් සිදු කරන ආකාරයත්, නැවත පදිංචි කිරීමේ සහාය ලබාදෙන ආකාරයත් ව්‍යාපෘතියෙන් බලපෑමට ලක්වීමට පෙර ඔවුන්ගේ පැවති ජීවන තත්ත්වය හෝ ඊට වැඩි තත්ත්වයක් ඔවුනට ලබාදීමත් මෙම හිමිකම් ගෙවීමේ ක්‍රමවේදය මගින් විස්තර කරයි. ඒ අනුව වන්දි/ වෙනත් සහාය ලබා ගැනීමට හෝ තමා විසින්ම පුනරුත්ථාපනය වීමට යම් කිසිවෙකු අපේක්ෂා කරන්නේ නම් ව්‍යාපෘතිය විසින් යෝජනා කෙරෙන සුදුසුකම් ලැබීමේ ක්‍රමවේදය අනුව අවශ්‍ය කෙරෙන අවශ්‍යතා ඔහු/ ඇය විසින් සපුරාලිය යුතු වේ. ශ්‍රී ලංකා රජය විසින් පනවා දැනට වලංගුව පවතින නීති, රෙගුලාසි, ප්‍රතිපත්ති සහ මූලධර්ම සහ ආසියානු සංවර්ධන බැංකුවේ සමාජ ආරක්ෂණ ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව ව්‍යාපෘතිය විසින් මෙම ක්‍රමවේදය සකස් කර ඇත.

කැළණිවැලි දුම්රිය මාර්ගයේ පළමු අදියර යටතේ සකස් කළ නැවත පදිංචි කිරීමේ වැඩ රාමුවට සහ 1950 ඉඩම් අත්කර ගැනීමේ පනත සහ 2008 ඉඩම් අත්කර ගැනීමේ ප්‍රතිපාදන ප්‍රකාරව සකස් කළ ශ්‍රී ලංකාවේ නීති හා නියාමන රාමුවෙහි ප්‍රතිපාදන ප්‍රකාරව හිමිකම් ගෙවීමේ ක්‍රමවේදය සකස් කර ඇත. 2013 ඉඩම් අත්කර ගැනීමේ රෙගුලාසි වලදී සම්මත කර ගනු ලැබූ නවතම මිල ගණන් යොදා ගැනීම සඳහා සහ ඉඩම මත පදනම් නොවූ අත්කර ගැනීම් හේතුවෙන් ඉඩමට නෛතික හිමිකමක් නොමැති පුද්ගලයන් ආර්ථික වශයෙන් අවතැන්වීම සහ වන්දි ලබා ගැනීමට ඔවුනට ඇති අයිතිය සම්බන්ධයෙන් ප්‍රමාණවත් විධිවිධාන ඉහත කී නෛතික හා නියාමන රාමුව මගින් ලබා නොදෙයි. ඒ අනුව, ව්‍යාපෘතියෙන් බලපෑමට ලක් වූ සියලු පුද්ගලයන් වෙත වන්දි ලබාදීම සහ/ හෝ පුනරුත්ථාපනය සහ ප්‍රතිස්ථාපනය සහාය ලබාදීම සම්බන්ධයෙන් විධිවිධාන ඇතුළත් මෙම නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරකම් සැලැස්ම මගින් එවන් අඩුපාඩුකම් සපුරාලනු ලැබේ. එබැවින්, ආසියානු සංවර්ධන බැංකුවේ අනුකූලතා ඒකකයේ එකඟත්වය ලැබුණු පසු හිමිකම් ගෙවීමේ ක්‍රමවේදය සහ නැවත පදිංචි කිරීමේ අයවැය ඇතුළත් නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරකම් සැලැස්ම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමට කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය කටයුතු කරනු ඇත.

ඉඩමට නීතිමය අයිතිය සහිත පුද්ගලයන් සඳහා සුදුසුකම් ලැබීමේ කඩඉම් දිනය ලෙස සලකන්නේ ඉඩම් අත්කර ගැනීම පිණිස, 1950 ඉඩම් අත්කර ගැනීමේ පනතේ 2 වන වගන්තිය යටතේ අත්කර ගැනීමේ නිවේදනය නිකුත් කළ දිනය වන අතර ඉඩමට හිමිකමක් නොමැති පුද්ගලයන් සඳහා කඩඉම් දිනය ලෙස සලකන්නේ සමාජ ආර්ථික හා දේපළ සමීක්ෂණය සිදුකළ අවසාන දිනයයි. කඩඉම් දිනයට පසුව ව්‍යාපෘති ප්‍රදේශයේ පදිංචි වන පුද්ගලයන් වන්දි හෝ නැවත පදිංචි කිරීමේ හෝ ප්‍රතිස්ථානගත කිරීමේ සහාය ලැබීම සඳහා සුදුසුකම් නොලබයි.

7.2 හිමිකම්/ සහාය/ ප්‍රතිලාභ සඳහා සුදුසුකම් ලැබීම

හිමිකම් සහාය සහ ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා සුදුසුකම් ලැබීම පහත වගුවේ පැහැදිලි කොට ඇත.

වගුව 7.1: හිමිකම්, සහාය සහ ප්‍රතිලාභ සඳහා සුදුසුකම් ලැබීම

අනුක්‍රමික අංකය	සුදුසුකම් ලැබීම
1	ඉඩමට නෛතික හිමිකමක් රහිත පුද්ගලයන් සඳහා සුදුසුකම් ලැබීමේ කඩඉම් දිනය වනුයේ 2017 අගෝස්තු 14 වන දින වන අතර ඉඩමට නෛතික හිමිකමක් සහිත පුද්ගලයන් සඳහා අදාළ වනුයේ ඉඩම් අත්කර ගැනීමේ පනතේ 2 වන වගන්තිය යටතේ නිවේදනය ප්‍රසිද්ධ කළ දිනය වේ.
2	ව්‍යාපෘතිය මගින් බලපෑමට ලක්වන විවිධ වර්ගයන්ට අයක් පුද්ගලයන් සුදුසුකම් ලබන ආකාරය නිශ්චය කිරිම වගුව 7.4 යටතේ සඳහන් කොට ඇති හිමිකම් ගෙවීමේ ක්‍රමවේදය අනුව සිදු වේ.
3	වන්දි/ සහාය/ පුනරුත්ථාපනය සඳහා හිමිකම් ලැබීමේ ඒකකය වශයෙන් සලකනු ලබන්නේ කුටුම්බ ඒකකයයි.
4	අවතැන් වන පුද්ගලයන්ගේ පදිංචිය පිළිබඳ නීතිමය අයිතියේ ස්වභාවය නොසලකා අවතැන් වූ සියලුම පුද්ගලයන්ට වන්දි සහ සහාය ලබාදෙන අතර එහිදී අහිමි වීම් වර්ගය හා ස්වභාවය, බලපෑම්වල විශාලත්වය හා බලපෑමට ලක් වූ දේපළට පැවති හිමිකමේ ස්වභාවය සහ සමාජ ආර්ථික වශයෙන් පවතින අවදානම් සහගත තත්ත්වය සඳහා බලනු ඇත.
5	ව්‍යාපෘතියෙන් බලපෑමට ලක් වූ පුද්ගලයෙකු යම් හෙයකින් සංගණනයේ දී ගණනය කර ගැනීමට නොහැකි වූවා නම් සහ ප්‍රකාශයට පත් කළ අවසාන දිනයට පෙර ඔහු/ ඇය එම ප්‍රදේශයේ සිටියේ යැයි ඔප්පු කළ හැකි සාක්ෂි පවතී නම්, දුක්ගැනවිලි සඳහා සහන සැලසීමේ කමිටුව මගින් සත්‍යාපනය කර ගැනීමෙන් අනතුරුව ඔහුගේ/ ඇයගේ නම, බලපෑමට ලක් වූ පුද්ගලයන්ගේ නාම ලේඛනයට ඇතුළත් කරනු ඇත.
6	අවදානම් තත්ත්වය අයත් කාණ්ඩය යටතට ගැනුණු පුද්ගලයන්, හිමිකම් ගෙවීමේ ක්‍රමවේදයෙහි සඳහන් අතිරේක ප්‍රතිපාදන ලැබිම සඳහා හිමිකම් ලබයි.
7	අවසන් දිනයට පෙර පුද්ගලයෙකු/ කුටුම්බයක් වෙත නෙරපීමේ නිවේදනයක් නිකුත් කර ඇත්නම් සහ අධිකරණයක ඒ සම්බන්ධයෙන් නඩු කටයුත්තක් පවතින්නේ නම්, ව්‍යාපෘතියෙන් බලපෑමට ලක්වන පුද්ගලයන්ගේ සුදුසුකම් ලැබීම නිශ්චය කිරීම අධිකරණ තීන්දුව අනුව සිදුවන අතර එම බලපෑමට ලක්වූවන් වන්දි/ සහාය ලබා ගැනීම සඳහා නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරකම් සැලැස්ම අනුව සුදුසුකම් ලබයි.

7.3 හිමිකම් ගෙවීමේ ක්‍රමවේදය

හිමිකම් ගෙවීමේ ක්‍රමවේදය වගුව 7.4 යටතේ සඳහන් කොට ඇත. බලපෑමට ලක්වන පුද්ගලයන්ගේ හිමිකමේ ස්වභාවය, අහිමි වූ වත්කම් සඳහා පවතින හිමිකම, බලපෑම් වර්ග සහ සමාජ ආර්ථික තත්ත්වය මත පදනම්ව වන්දි හා සහාය ලබා ගැනීම සඳහා එසේ බලපෑමට ලක්වන පුද්ගලයන් සුදුසුකම් ලබයි. ව්‍යාපෘතියෙන් බලපෑමට ලක්වන

පුද්ගලයන් නැවත පදිංචි කිරීමේදී විකල්ප දෙකක් හිමිකම් ගෙවීමේ ක්‍රමවේදයෙහි දක්වා ඇති අතර සිය කැමැත්ත අනුව එම විකල්ප දෙකින් එකක් තෝරා ගැනීමේ නිදහස, බලපෑමට ලක් වූවන්ට පවතී. එම විකල්ප දෙක වනුයේ;

විකල්ප 1: බලපෑමට ලක් වූ පුද්ගලයන් පදිංචිව සිටි ප්‍රදේශයට ආසන්නව පිහිටි නාගරික සංවර්ධන අධිකාරියට අයත් නිවාස යෝජනා ක්‍රමයකින් මිලදීගත් නිවාස ඒකකයක එම බලපෑමට ලක් වූ කුටුම්බ පදිංචි කළ හැකිය.

විකල්ප 2: බලපෑමට ලක් වූ පුද්ගලයන් හට තමා කැමති ස්ථානයක ස්වයං ප්‍රතිස්ථාපනය විය හැකි අතර හිමිකම් ගෙවීමේ ක්‍රමවේදය ප්‍රකාරව ඒ වෙනුවෙන් ස්වයං ප්‍රතිස්ථාපන දීමනාවක් ලබාදිය හැකිය.

නාගරික සංවර්ධන අධිකාරියේ නිවාස ඒකකවල නැවත පදිංචි වීමට අපේක්ෂා කරන පුද්ගලයන් හට පහත සඳහන් වගුවෙහි දැක්වෙන පටිපාටියට අනුව තමාට ලැබෙන නිවස තීරණය කළ හැකිය. මෙහිදී නිවසේ ගෙබිම වර්ග ප්‍රමාණය සහ බලපෑමට ලක් වූ කුටුම්බයේ සාමාජිකයන් සංඛ්‍යාව සලකා බලනු ලැබේ.

වගුව 7.2: ගෙබිම වර්ග ප්‍රමාණය සහ පවුලේ සාමාජිකයන් සංඛ්‍යාව අනුව ලකුණු ලැබෙන ආකාරය

කාණ්ඩය	**පරාසය**	**ලකුණු**
ගෙබිම වර්ග ප්‍රමාණය	450 – 650 (වර්ග අඩි)	20
	651- 850 (වර්ග අඩි)	30
	851- 1000 (වර්ග අඩි)	40
	1001- 1500 (වර්ග අඩි)	50
	1501 සහ ඊට වැඩි	60
පවුලේ සාමාජිකයන් ගණන	5 – 6	30
	7 – 8	40
	9 සහ ඊට වැඩි	60

ඉහත 7.2 වගුවට අනුව ලබාගත් ලකුණු සංඛ්‍යාව මත පදනම්ව ඒ ඒ කුටුම්බය සඳහා ලැබෙන නිවසේ ප්‍රමාණය තීරණය වේ. ගෙබිම වර්ග ප්‍රමාණය හා පවුලේ සාමාජිකයන් ගණනට හිමි වූ ලකුණු සංඛ්‍යා එකතු කිරීමෙන් අදාළ ලකුණු සංඛ්‍යාව ලැබෙන අතර එය 7.3 වගුවේ සඳහන් කොට ඇත.

වගුව 7.3: ගෙබිම වර්ග ප්‍රමාණය/ නිවසේ ප්‍රමාණය නිශ්චය කරන ලකුණු පදනම

ලකුණු පරාසය	**නිවසේ විශාලත්වය**
50ට අඩු	400 වර්ග අඩි
51 - 60	500 වර්ග අඩි
61 සහ ඊට වැඩි	400 x 2

වගුව 7.4: හිමිකම් ගෙවීමේ ක්‍රමවේදය

අනුක්‍රමික අංකය	වර්ගය සහ උප වර්ගය	අහිමිවීම් කාණ්ඩය	හිමිකම් ලබන පුද්ගලයන්ගේ අර්ථ නිරූපණය	හිමිකම්	ක්‍රියාත්මක කිරීමේ ආයතනය	සටහන්
	A	**ඉඩම් අහිමි වීම**				
1	A 1	ගෙවත්ත, වාණිජ්‍ය ඉඩම් හෝ හිස්/ මුඩු ඉඩම්	නෛතික හිමිකමක් හෝ ලියාපදිංචි සහතිකයන් සහිත හිමිකරුවෙකු	(a) අත්කර ගනු ලැබූ ඉඩමේ ප්‍රතිස්ථාපන පිරිවැය[5] මත පදනම්ව ඉඩම සඳහා වන්දි මුදලක් (b) ඉඩමේ කොටසක් අත්කර ගෙන ඇත්නම් සහ ඉතිරි වූ ඉඩම් කොටස තවදුරටත් පරිහරණය කිරීමට සුදුසු තත්ත්වයේ පවතින අවස්ථාවකදී ප්‍රතිස්ථාපන පිරිවැය මත පදනම්ව, බලපෑමට ලක් වූ ඉඩම් කොටස සඳහා පමණක් වන්දි ගෙවනු ඇත. (c) ඉතිරිවන ඉඩම් කොටස ආර්ථික වශයෙන් වටිනාකමක් නොමැති වන අවස්ථාවකදී ව්‍යාපෘතිය සම්පූර්ණ ඉඩම් කොටසම අත්කර ගනු ලබන අතර එයට ප්‍රතිස්ථාපන පිරිවැය මත පදනම්ව වන්දි ගෙවනු ඇත. (d) ඉඩමෙන් ඉවත් වීම සඳහා දැනුම් දීමක් මාස තුනකට පූර්වයෙන් ලිඛිතව සිදු කිරීම.	1. ඉඩම් අත්කර ගැනීමේ පනතේ සහ 2008 රෙගුලාසි ප්‍රකාරව ප්‍රධාන තක්සේරුකරු විසින් සියලු තක්සේරු කිරීම් සිදු කිරීම. 2. අවශ්‍ය වන්නේ නම් කරුණාසහගත දීමනාවක් ගෙවීම සහ අර්ධ වශයෙන් බලපෑමට ලක් වූ ඉඩමේ ඉතිරි කොටස තවදුරටත් පරිහරණය කිරීමට පවතින හැකියාව පිළිබඳව හිමිකම් තක්සේරු කිරීමේ කමිටුව තීරණය කරනු ඇත. 3. ප්‍රාදේශීය ලේකම්/ නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ (ඉඩම්), කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය අත්කර ගැනීමේ නිලධාරියා ලෙස කටයුතු කරන අතර අත්කර ගැනීමේ ක්‍රියාවලිය සහ ගෙවීම් කිරීම සිදු කරයි.	
2	A 2	ගෙවත්ත, වාණිජ්‍ය ඉඩම් හෝ හිස්/ මුඩු ඉඩම්	කුලී නිවැසියන් සහ බදුකරුවන්	(a) ඉඩම සඳහා වන්දියක් හිමි නොවේ. (b) බලපෑමට ලක් වූ ඉඩම් කොටසින් ලද දළ ආදායම අහිමි වීම වෙනුවෙන් බදු ගිවිසුමෙහි	1. ඉඩම් අත්කර ගැනීමේ පනතේ සහ 2008 රෙගුලාසි ප්‍රකාරව ප්‍රධාන තක්සේරුකරු විසින්	

				ඉදිරි කාල සීමාව සඳහා මූල්‍යමය වන්දියක් (c) ඉඩමෙන් ඉවත් වීම සඳහා මාස 3ක පූර්ව දැනුම් දීම සිදු වේ.	සියලු තක්සේරු කිරීම් සිදු කිරීම. 2. අවශ්‍ය වන්නේ නම් කරුණාසහගත දීමනාවන් ගෙවීමට හිමිකම් තක්සේරු කිරීමේ කමිටුව තීරණය කරනු ඇත. 3. ප්‍රාදේශීය ලේකම්/ නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ (ඉඩම්), කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය අත්කර ගැනීමේ නිලධාරියා ලෙස කටයුතු කරන අතර අත්කර ගැනීමේ ක්‍රියාවලිය සහ ගෙවීම් කිරීම සිදු කරයි.	
	B	ඉදිකිරීම් ව්‍යුහයන් අහිමි වීම				
3	B1	නේවාසික ඉදිකිරීම් අහිමි වීම	නෛතික හිමිකමක් හෝ ලියාපදිංචි සහතිකයන් සහිත හිමිකරුවෙකු	විකල්ප අංක එක: ස්වයං ප්‍රතිස්ථාපනය (a) ඉදිකිරීම් ව්‍යුහයේ ප්‍රතිස්ථාපන පිරිවැය මත පදනම්ව බලපෑමට ලක් වූ ඉදිකිරීම් සඳහා වන්දි මුදලක් (ක්ෂය කිරීම් රහිතව) (b) ඉදිකිරීම් ව්‍යුහයේ කොටසක් අත්කර ගෙන ඇත්නම් සහ ඉතිරි වූ කොටස තවදුරටත් පරිහරණය කිරීමට/ වාසය කිරීමට සුදුසු වන අවස්ථාවකදී ප්‍රතිස්ථාපන පිරිවැය මත පදනම්ව, බලපෑමට ලක් වූ ඉදිකිරීම් ව්‍යුහයේ කොටස සඳහා පමණක් වන්දි ගෙවනු ඇත. (ක්ෂය කිරීම් රහිතව) සත්‍ය හානියට අනුව, පැවති ඉදිකිරීම එහි නියම ස්වභාවයට අලුත්වැඩියා කිරීමට හෝ නැවත ඉදිකිරීම සඳහා (c) ඉදිකිරීමෙහි කොටසක් පමණක් බලපෑමට ලක්ව ඇත්නම් සහ ඉතිරිව ඇති කොටස ව්‍යුහාත්මකව තවදුරටත් පරිහරණය කිරීම	1. ඉඩම් අත්කර ගැනීමේ පනතේ සහ 2008 රෙගුලාසි ප්‍රකාරව ප්‍රධාන තක්සේරුකරු විසින් සියලු තක්සේරු කිරීම් සිදු කිරීම. 2. දීමනා / දිරිදීමනාවක් ගෙවීම සහ අර්ධ වශයෙන් බලපෑමට ලක් වූ ඉදිකිරීම් ව්‍යුහයේ ඉතිරි කොටස තවදුරටත් පරිහරණය කිරීමට පවතින හැකියාව පිළිබඳව හිමිකම් තක්සේරු කිරීමේ කමිටුව තීරණය කරනු ඇත. 3. ප්‍රාදේශීය ලේකම්/ නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ (ඉඩම්), කොළඹ තදාසන්න දුම්රිය	2016 සංශෝධන සහ 2013 ලාර්ක් ප්‍රතිපාදන අනුව ස්වයං ප්‍රතිස්ථාපන දීමනාවක්

				සඳහා වටිනාකමකින් යුතු නොවේ නම් සම්පූර්ණ නිවසේ ප්‍රතිස්ථාපන පිරිවැය (ක්ෂය කිරීම රහිතව) මත පදනම්ව වන්දි ගෙවනු ලැබේ. (d) කඩා දැමූ ඉදිකිරීමෙහි කොටස් කිසිදු අයකිරීමකින් තොරව ඉවත්කර ගැනීමට අයිතිය (e) පළාත් පාලන ආයතනයේ කාණ්ඩය මත පදනම්ව රු. 1,000,000.00ක ස්වයං ප්‍රතිස්ථාපන දීමනාවක් ගෙවනු ලැබේ. (f) ඉදිකිරීමෙන් ඉවත් වීම සඳහා මාස 3ක පූර්ව දැනුම්දීමක් ලිඛිතව සිදු කිරීම. විකල්ප අංක දෙක: විකල්ප නිවාස (a) බලපෑමට ලක් වූ නිවසේ ගෙබිම් වර්ග ප්‍රමාණය සහ නිවැසියන් සංඛ්‍යාව මත පදනම්ව නාගරික සංවර්ධන අධිකාරියේ නිවාස සංකීර්ණයක ඉදිකරන ලද වැඩි පහසුකම් සහිත නිවසක් අහිමි වූ නිවස වෙනුවට ලබාදීම. (b) බලපෑමට ලක් වූ නිවසට වඩා විකල්ප නිවාස ඒකකයේ අඩු ප්‍රතිස්ථාපන වටිනාකමක් පවතින්නේ නම්, හිමිකම් කියන්නා, එක් නිවාස ඒකකයකට සහ ප්‍රතිස්ථාපන පිරිවැය (ක්ෂය වීම් අඩු නොකළ) සඳහා ලද වන්දි වටිනාකමෙහි ඉතිරි මුදල සඳහා ද හිමිකම් ලබයි. (c) කඩා දැමූ ඉදිකිරීමෙහි කොටස් කිසිදු අයකිරීමකින් තොරව ඉවත්කර ගැනීමට අයිතිය (d) බලපෑමට ලක් වූ ඉදිකිරීමෙන් ඉවත් වීම සඳහා මාස 3ක පූර්ව දැනුම්දීමක් ලිඛිතව සිදු කිරීම.	ව්‍යාපෘතිය අත්කර ගැනීමේ නිලධාරියා ලෙස කටයුතු කරන අතර අත්කර ගැනීමේ ක්‍රියාවලිය සහ ගෙවීම් කිරීම සිදු කරයි.	

4	B 2	නේවාසික ඉදිකිරීම් අහිමි වීම	නෛතික හිමිකමක් නොමැතිව පදිංචිවූවන්	<u>විකල්ප අංක එක: ස්වයං ප්‍රතිස්ථාපනය</u> (a) සම්පූර්ණ නිවසේ ප්‍රතිස්ථාපන පිරිවැය (ක්ෂයවීම් රහිතව) මත පදනම්ව පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් බලපෑමට ලක් වූ ඉදිකිරීම සඳහා මුදල් වන්දියක් (b) කඩා දැමූ ඉදිකිරීමෙහි කොටස් කිසිදු අයකිරීමකින් තොරව ඉවත්කර ගැනීමට අයිතිය (c) පළාත් පාලන ආයතනයේ කාණ්ඩය මත පදනම්ව රු. 1,000,000.00ක ස්වයං ප්‍රතිස්ථාපන දීමනාවක් ගෙවනු ලැබේ. (d) බලපෑමට ලක් වූ ඉදිකිරීමෙන් ඉවත් වීම සඳහා මාස3ක පූර්ව දැනුම්දීමක් ලිඛිතව සිදු කිරීම. <u>විකල්ප අංක දෙක: විකල්ප නිවාස</u> (a) බලපෑමට ලක් වූ නිවසේ ගෙබිම් වර්ග ප්‍රමාණය සහ නිවැසියන් සංඛ්‍යාව මත පදනම්ව නාගරික සංවර්ධන අධිකාරියේ නිවාස සංකීර්ණයක ඉදිකරන ලද වැඩි පහසුකම් සහිත නිවසක් අහිමි වූ නිවස වෙනුවට ලබාදීම. (b) බලපෑමට ලක් වූ නිවසට වඩා විකල්ප නිවාස ඒකකයේ අඩු ප්‍රතිස්ථාපන වටිනාකමක් පවතින්නේ නම්, හිමිකම් කියන්නා, එක් නිවාස ඒකකයකට සහ ප්‍රතිස්ථාපන පිරිවැය (ක්ෂය වීම් අඩු නොකළ) සඳහා ලද වන්දි වටිනාකමෙහි ඉතිරි මුදල සඳහා ද හිමිකම් ලබයි. (c) කඩා දැමූ ඉදිකිරීමෙහි කොටස් කිසිදු අයකිරීමකින් තොරව ඉවත්කර ගැනීමට අයිතිය (d) බලපෑමට ලක් වූ ඉදිකිරීමෙන් ඉවත් වීම	1. ඉඩම් අත්කර ගැනීමේ පනතේ සහ 2008 රෙගුලාසි ප්‍රකාරව ප්‍රධාන තක්සේරුකරු විසින් සියලු තක්සේරු කිරීම් සිදු කිරීම. 2. දීමනා / දිරිදීමනාවක් ගෙවීම පිළිබඳව හිමිකම් තක්සේරු කිරීමේ කමිටුව තීරණය කරනු ඇත. 3. ප්‍රාදේශීය ලේකම්/ නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ (ඉඩම්), කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය අත්කර ගැනීමේ ක්‍රියාවලිය කළමනාකරණය සහ ගෙවීම් කිරීම සිදු කරයි.	2016 සංශෝධන සහ 2013 ලාර්ක් ප්‍රතිපාදන අනුව ස්වයං ප්‍රතිස්ථාපන දීමනාවක්

				සඳහා මාස 3ක පූර්ව දැනුම්දීමක් ලිඛිතව සිදු කිරීම.		
5	B 3	වෙනත් සියලු ඉදිකිරීම් ව්‍යුහ අහිමි වීම.[6]	නෛතික හිමිකමක් හෝ ලියාපදිංචි සහතිකයන් සහිත හිමිකරුවෙකු	(a) සම්පූර්ණ ඉදිකිරීම් ව්‍යුහයේ ප්‍රතිස්ථාපන පිරිවැය (ක්ෂයවීම් රහිතව) මත පදනම්ව බලපෑමට ලක් වූ ඉදිකිරීම සඳහා මුදල් වන්දියක් (b) ඉදිකිරීම් ව්‍යුහයේ කොටසක් බලපෑමට ලක් වී ඇත්නම් සහ ඉතිරි වූ ඉඩම් කොටස තවදුරටත් පරිහරණය කිරීමට/ වාසය කිරීමට සුදුසු වටිනාකමකින් යුතු වන අවස්ථාවකදී ප්‍රතිස්ථාපන පිරිවැය මත පදනම්ව, බලපෑමට ලක් වූ ඉදිකිරීම් කොටස සඳහා පමණක් ((ක්ෂය කිරීම් රහිතව) සත්‍ය හානියට අනුව, පැවති ඉදිකිරීම එහි නියම ස්වභාවයට අලුත්වැඩියා කිරීමට හෝ නැවත ඉදිකිරීම සඳහා) වන්දි ගෙවනු ඇත. (c) ඉදිකිරීමෙහි කොටසක් පමණක් බලපෑමට ලක්ව ඇත්නම් සහ ඉතිරිව ඇති කොටස ව්‍යුහාත්මකව තවදුරටත් පරිහරණය කිරීම සඳහා වටිනාකමකින් යුතු නොවේ නම් සම්පූර්ණ නිවසේ ප්‍රතිස්ථාපන පිරිවැය (ක්ෂය කිරීම රහිතව) මත පදනම්ව වන්දි ගෙවනු ලැබේ. (d) කඩා දැමූ ඉදිකිරීමෙහි කොටස් කිසිදු අයකිරීමකින් තොරව ඉවත්කර ගැනීමට අයිතිය (e) බලපෑමට ලක් වූ ඉදිකිරීමෙන් ඉවත් වීම සඳහා මාස 3ක පූර්ව දැනුම් දීමක් ලිඛිතව සිදු කිරීම.	1. ඉඩම් අත්කර ගැනීමේ පනතේ සහ 2008 රෙගුලාසි ප්‍රකාරව ප්‍රධාන තක්සේරුකරු විසින් සියලු තක්සේරු කිරීම් සිදු කිරීම. 2. දීමනා හෝ දිරිදීමනා ගෙවීම සහ අර්ධ වශයෙන් බලපෑමට ලක් වූ ඉඩමේ ඉතිරි කොටස තවදුරටත් පරිහරණය කිරීමට පවතින හැකියාව පිළිබඳව හිමිකම් තක්සේරු කිරීමේ කමිටුව තීරණය කරනු ඇත. 3. ප්‍රාදේශීය ලේකම්/ නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ (ඉඩම්), කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය අත්කර ගැනීමේ ක්‍රියාවලිය කළමනාකරණය සහ ගෙවීම් කිරීම සිදු කරයි.	

6	B 4	වෙනත් සියලුම ඉදිකිරීම් ව්‍යුහ අහිමි වීම[7]	නෛතික හිමිකමක් රහිත පුද්ගලයන්	(a) සම්පූර්ණ නිවසේ ප්‍රතිස්ථාපන පිරිවැය (ක්ෂයවීම් රහිතව) මත පදනම්ව පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් බලපෑමට ලක් වූ ඉදිකිරීම සඳහා මුදල් වන්දියක් (b) කඩා දැමූ ඉදිකිරීමෙහි කොටස් කිසිදු අයකිරීමකින් තොරව ඉවත්කර ගැනීමට අයිතිය (c) බලපෑමට ලක් වූ ඉදිකිරීමෙන් ඉවත් වීම සඳහා මාස 3ක පූර්ව දැනුම් දීමක් ලිඛිතව සිදු කිරීම.	1. ඉඩම් අත්කර ගැනීමේ පනතේ සහ 2008 රෙගුලාසි ප්‍රකාරව ප්‍රධාන තක්සේරුකරු විසින් සියලු තක්සේරු කිරීම් සිදු කිරීම. 2. දීමනා/ දිරිදීමනා ගෙවීම සහ අර්ධ වශයෙන් බලපෑමට ලක් වූ ඉඩමේ ඉතිරි කොටස තවදුරටත් පරිහරණය කිරීමට පවතින හැකියාව පිළිබඳව හිමිකම් තක්සේරු කිරීමේ කමිටුව තීරණය කරනු ඇත. 3. ප්‍රාදේශීය ලේකම්/ නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ (ඉඩම්), කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය අත්කර ගැනීමේ ක්‍රියාවලිය කළමනාකරණය සහ ගෙවීම් කිරීම සිදු කරයි.	
7	B 5	කුලියට ලබාගත් වාසස්ථාන අහිමි වීම	කුලී නිවැසියන් සහ බදුකරුවන්	(a) ගෙවල් කුලී පනත යටතේ ලියාපදිංචි වූ බදු ගැනුම්කරුවන් සඳහා කල් ඉකුත් නොවූ කුලී හෝ බදු කාල සීමාව සඳහා වන්දි (b) ආරක්ෂිත (Protected) බදු ගැනුම්කරුවන් 2002 අංක 26 දරන ගෙවල් කුලී (සංශෝධිත) පනත ප්‍රකාරව හිමිකම් ලබයි. කුලියට ලබාගත් වාසස්ථානයෙහි කොටසකට පමණක් හානි සිදු වී ඇත්නම් හිමිකරුගේ එකඟත්වය ඇතිව එහිම තවදුරටත් රැඳී සිටීමටත්, නැතහොත් වාසස්ථානය සම්පූර්ණයෙන්ම හානියට පත්ව ඇත්නම් සහ ඉන් ඉවත්වීමට කුලීකරු අදහස් කරන්නේ නම්, ප්‍රතිස්ථාපන වටිනාකම සහ ව්‍යවස්ථාපිත ගෙවීම අතර	1. ඉඩම් අත්කර ගැනීමේ පනතේ සහ 2008 රෙගුලාසි ප්‍රකාරව ප්‍රධාන තක්සේරුකරු විසින් සියලු තක්සේරු කිරීම් සිදු කිරීම. 2. දීමනා/ දීමනා ගෙවීම සහ අර්ධ වශයෙන් පිළිබඳව හිමිකම් තක්සේරු කිරීමේ කමිටුව තීරණය කරනු ඇත. 3. ප්‍රාදේශීය ලේකම්/ නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ (ඉඩම්), කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය අත්කර ගැනීමේ ක්‍රියාවලිය කළමනාකරණය	2013 ලාර්ක් ප්‍රතිපාදන මගින් යෝජනා කර ඇති පරිදි වාසය කළ කාලය සහ වන්දි ප්‍රතිශතය

<table>
<tr>
<td></td>
<td></td>
<td></td>
<td></td>
<td>වෙනස පහත සඳහන් පරිදි පදිංචිකරු සහ නිවාස හිමියා අතර බෙදනු ඇත.
<table>
<tr><td>භුක්ති විඳින කාල සීමාව
(අවුරුදු ගණන)</td><td>කුලී නිවැසියාට වන්දිය
(මුළු ගණනින් % ලෙස)</td><td>නිවාස හිමියාට වන්දිය
(මුළු ගණනින් % ලෙස)</td></tr>
<tr><td>20 <</td><td>75</td><td>25</td></tr>
<tr><td>10 ≤ 20</td><td>50</td><td>50</td></tr>
<tr><td>5 ≤ 10</td><td>25</td><td>75</td></tr>
<tr><td>< 5</td><td>10</td><td>90</td></tr>
</table>
(c) හිමිකරුගේ එකඟත්වය සහිතව ඉදිකිරීමට සිදු කරන ලද කවර හෝ සංවර්ධන හෝ වැඩි දියුණු කිරිම වෙනුවෙන් ප්‍රතිස්ථාපන පිරිවැය මත පදනම්ව වන්දියක්.
(d) කුලී පදනම මත ලබාගත් වාසස්ථානයේ කොටසක් පමණක් අහිමිවන්නේ නම් පනත මඟින් කුලීකරු ආරක්ෂා කරනු නොලැබේ. නිවාස හිමියාගේ එකඟත්වය ඇතිව තවදුරටත් එහි රැඳී සිටීමේ විකල්පය කුලීකරු සතු වේ. නැතහොත් අවතැන් වූ නිවැසියන් ඉන් පිටවීම විකල්පය ලෙස තෝරා ගන්නේ නම් මුදල්මය සහායක් (මාස හයක කුලී වටිනාකමට සමාන මුදලක්) ලැබේ.
(e) ප්‍රතිස්ථාපනය සඳහා මාස 3ක පූර්ව දැනුම් දීමක් ලිඛිතව සිදු කිරීම.</td>
<td>සහ ගෙවීම් කිරීම සිදු කරයි.</td>
<td></td>
</tr>
<tr>
<td>8</td>
<td>B 6</td>
<td>කුලියට ලබාගත් වාසස්ථාන අහිමි වීම</td>
<td>රජයේ නිල නිවාස/ ව්‍යුහයන් භාවිතා</td>
<td>(a) රු. 50,000.00ක කරුණාසහගත දීමනාවන්
(b) බලපෑමට ලක් වූ නිල නිවාස, ව්‍යාපෘතිය</td>
<td>1. දීමනා/ දිරිදීමනා/ කරුණාසහගත දීමනා පිළිබඳ</td>
<td></td>
</tr>
</table>

			කරන්නන්	මගින් නැවත ඉදිකරනු ඇත. ප්‍රමුඛතා පදනම මත නැවත ඉදිකරනු ලබන නිල නිවාසවල නේවාසික පහසුකම් සැපයීම පිළිබඳව, සේවා අවශ්‍යතාවය මත පදනම්ව ලබාදීම පිළිබඳව පදිංචිකරුවන් වෙත සහතික වනු ඇත. (c) වැඩිදියුණු කරන ලද පහසුකම් සහිතව රජයේ ඉදිකිරීම් නැවත ඉදිකරනු ඇත. (d) ප්‍රතිස්ථාපනය සඳහා මාස 3ක පූර්ව දැනුම් දීමක් ලිඛිතව සිදු කිරීම.	අමාත්‍ය මණ්ඩලය තීරණය කරනු ඇත. 2.ප්‍රාදේශීය ලේකම්/ නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ (ඉඩම්), කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය අත්කර ගැනීමේ ක්‍රියාවලිය කළමනාකරණය සහ ගෙවීම් කිරීම සිදු කරයි.	
	C	බෝග සහ ශාක අහිමි වීම				
9	C 1	බෝග සහ ශාක අහිමි වීම	නෛතික හිමිකමක් හෝ ලියාපදිංචි සහතිකයක් සහිත හිමිකරුවන්	(a) වගා කර ඇති කන්න (seasonal) බෝග නෙලා ගැනීමට හැකිවන පරිදි ප්‍රමාණවත් කාලයක් ලබාදෙමින් පූර්ව දැනුම්දීමක් සිදු කිරිම හෝ හානි වූ හෝ විනාශ වූ බෝග වෙනුවෙන් මුදල් වන්දියක් ලබාදිම. (b) බලපෑමට ලක් වූ වාර්ෂික බෝග සහ ඵල දරණ ශාක වෙනුවෙන් ඒවායේ වර්තමාන වෙළඳපල වටිනාකම මත පදනම්ව මුදල් වන්දියක් ලබාදීම. (c) කපා දමන ලද ගස් කිසිදු අයකිරීමකින් තොරව තබා ගැනීමට ඉඩ ලබාදීම.	1. ඉඩම් අත්කර ගැනීමේ පනතේ සහ 2008 රෙගුලාසි ප්‍රකාරව ප්‍රධාන තක්සේරුකරු විසින් සියලු තක්සේරු කිරීම් සිදු කිරීම. 2. දීමනා/ දිරිදීමනා/ කරුණාසහගත දීමනාවන් පිළිබඳ හිමිකම් තක්සේරු කිරීමේ කමිටුව තීරණය කරනු ඇත. 3. ප්‍රාදේශීය ලේකම්/ නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ (ඉඩම්), කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය අත්කර ගැනීමේ ක්‍රියාවලිය කළමනාකරණය සහ ගෙවීම් කිරීම සිදු කරයි.	
	C 2	බෝග සහ ශාක අහිමි වීම	නෛතික හිමිකම නොමැති පුද්ගලයා	(a) වගා කර ඇති කන්න (seasonal) බෝග නෙලා ගැනීමට හැකිවන පරිදි ප්‍රමාණවත් කාලයක් ලබාදෙමින් පූර්ව දැනුම්දීමක් සිදු කිරිම හෝ හානි වූ හෝ විනාශ වූ බෝග වෙනුවෙන් මුදල් වන්දියක් ලබාදීම. (b) බලපෑමට ලක් වූ වාර්ෂික බෝග සහ ඵල	1. ඉඩම් අත්කර ගැනීමේ පනතේ සහ 2008 රෙගුලාසි ප්‍රකාරව ප්‍රධාන තක්සේරුකරු විසින් සියලු තක්සේරු කිරීම් සිදු කිරීම. 2. දීමනා/ දිරිදීමනා/	

				දරණ ශාක වෙනුවෙන් ඒවායේ වර්තමාන වෙළඳපල වටිනාකම මත පදනම්ව මුදල් වන්දියක් ලබාදීම. (c) ශ්‍රී ලංකා දුම්රිය සේවය සතු ඉඩම්වල පවතින ගස් ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ රෙගුලාසිවලට අනුකූලව ඉවත් කරනු ඇත.	කරුණාසහගත දීමනාවන් පිළිබඳ හිමිකම් තක්සේරු කිරීමේ කමිටුව තීරණය කරනු ඇත. 3. ප්‍රාදේශීය ලේකම්/ නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ (ඉඩම්), කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය අත්කර ගැනීමේ ක්‍රියාවලිය කළමනාකරණය සහ ගෙවීම් කිරීම සිදු කරයි. 4. ශ්‍රී ලංකා දුම්රිය සේවයට අයත් ඉඩම්වල පිහිටි ගස් ඉවත් කිරීම.	
	D	ආදායම් අහිමි වීම				
10	D 1	ව්‍යාපාර ආදායම තාවකාලිකව අහිමි වීම	ලියාපදිංචිය සහිත/ රහිත ව්‍යාපාර හිමිකරුවන් හෝ ව්‍යාපාර පවත්වන්නන්	(a) ව්‍යාපාර පරිසරයක (දැනට පවතින හෝ සැලසුම් කළ) හෝ කවර හෝ පොදු වෙළඳ සංකීර්ණයක පිහිටි වැඩි පහසුකම් සහිත විකල්ප ව්‍යාපාර ස්ථානයක්/ වෙළඳසැලක් බදු වාරිකය ගෙවා, කෙටිකාලීන බදු පදනම යටතේ සොයා ගැනීමට සහාය වීම. (b) සුදුසු විකල්ප ව්‍යාපාර ස්ථානයක් සොයා ගැනීමට ව්‍යාපෘතිය අපොහොසත් වන්නේ නම්, ආසන්න මාස තුනක සාමාන්‍ය ආදායම මත පදනම්ව මාස 6 කාල සීමාවක් සඳහා රු. 15,000.00ක මුදල් වන්දියක් ගෙවනු ලබයි. (හෝ නැතහොත් වන්දි මුදල් කොපමණ කාල සිමාවක් සඳහා ලබාදෙන්නේ දැයි හිමිකම් තක්සේරු කිරීමේ කමිටුව තීරණය කළ හැකිය.) (c) ප්‍රවාහනය කිරීම සඳහා පවතින භාණ්ඩ සහ අමුද්‍රව්‍ය ප්‍රමාණ පිළිබඳ සලකා බලා ඒ අනුව ව්‍යාපෘතිය මගින් භාණ්ඩ සහ අමුද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම හෝ ප්‍රවාහනය කිරීම සඳහා	1. ඉඩම් අත්කර ගැනීමේ පනතේ සහ 2008 රෙගුලාසි ප්‍රකාරව ප්‍රධාන තක්සේරුකරු විසින් සියලු තක්සේරු කිරීම් සිදු කිරීම. 2. දීමනා/ දිරිදීමනා/ කරුණාසහගත දීමනාවන් පිළිබඳ හිමිකම් තක්සේරු කිරීමේ කමිටුව තීරණය කරනු ඇත. 3. ප්‍රාදේශීය ලේකම්/ නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ (ඉඩම්), කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය අත්කර ගැනීමේ ක්‍රියාවලිය කළමනාකරණය සහ ගෙවීම් කිරීම සිදු කරයි.	2013 ලාර්ක් ප්‍රතිපාදන මගින් යෝජිත පරිදි රු.15,000ක මාසික දීමනාවක්

				ව්‍යාපාර හිමිකරුට මුදල් ගෙවීමක් සිදු කිරීම.		
11	D 2	ව්‍යාපාර ආදායම ස්ථිරවම අහිමි වීම	ව්‍යාපාර නාම ලියාපදිංචිය සහිත ආදායම් බදු ගෙවන ව්‍යාපාර හිමිකරුවන්	(a) ව්‍යාපාර පරිසරයක (දැනට පවතින හෝ සැලසුම් කළ) හෝ කවර හෝ පොදු වෙළඳ සංකීර්ණයක පිහිටි වැඩි පහසුකම් සහිත විකල්ප ව්‍යාපාර ස්ථානයක්/ වෙළඳසැලක් බදු වාරිකය ගෙවා, දීර්ඝකාලීන බදු පදනම යටතේ සොයා ගැනීමට සහාය වීම. (b) සුදුසු විකල්ප ව්‍යාපාර ස්ථානයක් සොයා ගැනීමට ව්‍යාපෘතිය අපොහොසත් වන්නේ නම්, බදු ප්‍රකාශන ලේඛන මත ආසන්න මාස තුනක සාමාන්‍ය ලාභය මත පදනම්ව මාස 32ක කාල සීමාවක් දක්වා මුදල් වන්දියක් ගෙවනු ලබයි. (c) ව්‍යාපෘතිය මගින් භාණ්ඩ සහ අමුද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම හෝ ප්‍රවාහනය කිරීම සඳහා පවතින භාණ්ඩ සහ අමුද්‍රව්‍ය ප්‍රමාණ පිළිබඳ සලකා බලා ඒ අනුව ප්‍රවාහනය කිරීම සඳහා ව්‍යාපාර හිමිකරුට මුදල් ගෙවීමක් සිදු කිරීම.	1. ඉඩම් අත්කර ගැනීමේ පනතේ සහ 2008 රෙගුලාසි ප්‍රකාරව ප්‍රධාන තක්සේරුකරු විසින් සියලු තක්සේරු කිරීම් සිදු කිරීම. 2. දීමනා/ දිරිදීමනා/ කරුණාසහගත දීමනාවන් පිළිබඳ හිමිකම් තක්සේරු කිරීමේ කමිටුව තීරණය කරනු ඇත. 3. ප්‍රාදේශීය ලේකම්/ නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ (ඉඩම්), කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය අත්කර ගැනීමේ ක්‍රියාවලිය කළමනාකරණය සහ ගෙවීම් කිරීම සිදු කරයි.	
12	D 3	ව්‍යාපාර ආදායම ස්ථිරවම අහිමි වීම	අවිධිමත් ව්‍යාපාර හිමිකරුවන්	(a) ව්‍යාපාර පරිසරයක (දැනට පවතින හෝ සැලසුම් කළ) හෝ කවර හෝ පොදු වෙළඳ සංකීර්ණයක පිහිටි වැඩි පහසුකම් සහිත විකල්ප ව්‍යාපාර ස්ථානයක්/ වෙළඳසැලක් බදු වාරිකය ගෙවා, දීර්ඝකාලීන බදු පදනම යටතේ සොයා ගැනීමට සහාය වීම. (b) විකල්ප ව්‍යාපාර ස්ථානයක් සොයා ගැනීමට ජීවනෝපාය සහායක් ලබාදීමට ව්‍යාපෘතිය අපොහොසත් වන්නේ නම්, රු. 15,000ක මාසික මුදල් දීමනාවක් මාස 18ක කාල සීමාවක් සඳහා ලබාදීම හෝ ආසන්න මාස තුනක ආදායමේ සාමාන්‍යය සලකා ඒ මත පදනම්ව ලබාදෙන මුදල් වන්දිය උපරිම මාස 18ක කාලයක් ලබාදීම යන දීමනාවන්ගෙන් වැඩි අගය ලබාදීම.	1. ඉඩම් අත්කර ගැනීමේ පනතේ සහ 2008 රෙගුලාසි ප්‍රකාරව ප්‍රධාන තක්සේරුකරු විසින් සියලු තක්සේරු කිරීම් සිදු කිරීම. 2. දීමනා/ දිරිදීමනා/ කරුණාසහගත දීමනාවන් පිළිබඳ හිමිකම් තක්සේරු කිරීමේ කමිටුව තීරණය කරනු ඇත. 3. ප්‍රාදේශීය ලේකම්/ නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ (ඉඩම්), කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය අත්කර ගැනීමේ ක්‍රියාවලිය කළමනාකරණය	2013 ලාර්ක් ප්‍රතිපාදන මගින් යෝජිත පරිදි රු.15,000ක මාසික දීමනාවක්

				(c) ව්‍යාපෘතිය මගින් භාණ්ඩ සහ අමුද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම හෝ ප්‍රවාහනය කිරීම සඳහා පවතින භාණ්ඩ සහ අමුද්‍රව්‍ය ප්‍රමාණ පිළිබඳ සලකා බලා ඒ අනුව ප්‍රවාහනය කිරීම සඳහා ව්‍යාපාර හිමිකරුට මුදල් ගෙවීමක් සිදු කිරීම.	සහ ගෙවීම් කිරීම සිදු කරයි.	
13	D 4	වැටුප් ලබන කම්කරු සහ රැකියා වලින් ලබන ආදායම් තාවකාලිකව අහිමි වීම	කම්කරුවන්, ශ්‍රමිකයන් ඇතුළත්ව වැටුප් ලබන සේවකයන්	(a) ජීවනෝපාය සහාය සඳහා වන රු. 45,000ක් හෝ ආසන්න මාස තුනක කාලයක ආදායම/ වේතන වල සාමාන්‍ය මත පදනම්ව උපරිම මාස 3ක් සඳහා මුදල් වන්දියක් යන අගයන්ගෙන් වැඩි අගය ගෙවීම. (b) ප්‍රතිස්ථානගත වීම සඳහා මාස 3ක පූර්ව ලිඛිත දැනුම්දීමක්.	1. දීමනා/ දිරිදීමනා/ කරුණාසහගත දීමනාවන් ගෙවීමට හිමිකම් තක්සේරු කිරීමේ කමිටුව තීරණය කරනු ඇත. 2. ප්‍රාදේශීය ලේකම්/ නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ (ඉඩම්), කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය අත්කර ගැනීමේ ක්‍රියාවලිය කළමනාකරණය සහ ගෙවීම් කිරීම සිදු කරයි.	2013 ලාර්ක් ප්‍රතිපාදන මගින් යෝජනා කර ඇති රු.45,000.00ක ජීවනෝපාය ආධාරයක්
14	D 5	ව්‍යාපාරය වෙනත් ප්‍රදේශයක නැවත ස්ථානගත කිරීම හෝ ව්‍යාපාරය යළි ස්ථාපිත නොකිරීමට තීරණය කිරීම හේතුවෙන් වැටුප් ලබන කම්කරු සහ රැකියා වලින් ලබන ආදායම් ස්ථිරව අහිමි වීම.	කම්කරුවන්, ශ්‍රමිකයන් ඇතුළත්ව වැටුප් ලබන සේවකයන්	(a) ජීවනෝපාය සහාය සඳහා වන රු. 90,000ක් හෝ ආසන්න මාස තුනක කාලයක ආදායම/ වේතන වල සාමාන්‍ය මත පදනම්ව උපරිම මාස 6ක් සඳහා මුදල් වන්දියක් යන අගයන්ගෙන් වැඩි අගය ගෙවීම. (b) ප්‍රතිස්ථානගත වීම සඳහා මාස 3ක පූර්ව ලිඛිත දැනුම්දීමක්.	1. දීමනා/ දිරිදීමනා/ කරුණාසහගත දීමනාවන් පිළිබඳ හිමිකම් තක්සේරු කිරීමේ කමිටුව තීරණය කරනු ඇත. 2. ප්‍රාදේශීය ලේකම්/ නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ (ඉඩම්), කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය අත්කර ගැනීමේ ක්‍රියාවලිය කළමනාකරණය සහ ගෙවීම් කිරීම සිදු කරයි.	2013 ලාර්ක් ප්‍රතිපාදන මගින් යෝජනා කර ඇති රු.90,000.00ක ජීවනෝපාය ආධාරයක්
	E	**ජීවනෝපාය ප්‍රතිෂ්ඨාපනය සහ පුනරුත්ථාපනය**				
15	E 1	ප්‍රතිස්ථාපනය කිරීම හේතුවෙන් ජීවනෝපාය අහිමි වීම හෝ ඊට	දිළිඳු පුද්ගලයන්, ස්වයං රැකියාලාභීන්, කුඩා පරිමාණ	(a) ව්‍යාපාර සඳහා ආයෝජන කිරීමට/ ස්ථාපිත කිරීමට, ඵලදායී දේපළ ලබාගැනීම පිණිස ණය ලබා ගැනීමටත්, හවුල්කාර පාර්ශව සම්බන්ධ කරගත් කටයුතු සඳහා ප්‍රවේශවීමට	1. දීමනා/ දිරිදීමනා/ කරුණාසහගත දීමනාවන් පිළිබඳ හිමිකම් තක්සේරු කිරීමේ කමිටුව තීරණය	

		බලපෑම් එල්ලවීම.	ව්‍යාපාරිකයන්, අවදානම් තත්ත්වයේ සිටින පුද්ගලයන්	අවශ්‍ය වෘත්තීය සහාය හා උපදෙස් ලබාදීම. (b) ප්‍රතිස්ථාපනය කරනු ලබන පවුල්වල උනන්දුව දක්වන්නා වූ තරුණ තරුණියන් අතුරින් (එක් පවුලකින් එක් කාන්තාවක් හා එක් පිරිමි අයෙකු ලෙස) පවුලකින් උපරිම දෙදෙනෙකු බැගින් තෝරාගෙන ජීවනෝපාය ශක්තිමත් කිරීම සඳහා කුසලතා පුහුණුව ලබාදීම. (c) අවස්ථාවන් පවතින්නේ නම්, ව්‍යාපාර ස්ථානවල, ප්‍රතිස්ථාපනය සිදු කරන වැඩබිම්වල, ගෘහාශ්‍රිත කාර්යයන් සහ ව්‍යාපෘති සිවිල් වැඩ කටයුතු සිදු කරන ස්ථානවල රැකියා අවස්ථා ලබාදීම. (d) ව්‍යාපාර පරිසරයක (දැනට පවතින හෝ සැලසුම් කළ) හෝ කවර හෝ පොදු වෙළඳ සංකීර්ණයක පිහිටි වැඩි පහසුකම් සහිත විකල්ප ව්‍යාපාර ස්ථානයක්/ වෙළඳසැලක් බදු වාරිකය ගෙවා, දීර්ඝකාලීන බදු පදනම යටතේ සොයා ගැනීමට සහාය වීම.	කරනු ඇත.	
	F	**බාධා කිරීම් සහ වෙනත් දීමනා**				
16	F 1	විදුලිය, ජලය සහ ස්ථාවර දුරකථන සම්බන්ධතා සඳහා ප්‍රවේශය අහිමි වීම.	ප්‍රතිස්ථාපනය කළ නිවැසියන්, ව්‍යාපාර හිමිකරුවන්, ඉදිකිරීම් හිමිකරුවන්, ආයතන (ඉඩමට පවතින අයිතිය නොසලකා)	(a) සියලුම උපයෝජන සේවා සඳහා ප්‍රවේශවීම් ලබා ගැනීමට වැයවන පිරිවැය	දීමනා/ දිරිදීමනා/ කරුණාසහගත දීමනාවන් පිළිබඳ හිමිකම් තක්සේරු කිරීමේ කමිටුව තීරණය කරනු ඇත.	
17	F 2	ගෘහ භාණ්ඩ සහ සවි කිරීම්, නැවත	ප්‍රතිස්ථාපනය කළ නිවැසියන්,	(a) ගෘහ භාණ්ඩ සහ සවි කිරීම් නැවත සවි කිරීමට හැකිවන පරිදි රු. 10,000.00ක	1. ඉඩම් අත්කර ගැනීමේ පනතේ සහ 2008 රෙගුලාසි	2013 ලාර්ක් මගින් යෝජනා

<table>
<tr><td></td><td></td><td>සවිකිරිම සඳහා පිරිවැය</td><td>ව්‍යාපාර හිමිකරුවන්, ඉදිකිරීම් හිමිකරුවන්, ආයතන (ඉඩමට පවතින අයිතිය නොසලකා)</td><td>මූල්‍ය දීමනාවක්.</td><td>ප්‍රකාරව ප්‍රධාන තක්සේරුකරු විසින් සියලු තක්සේරු කිරීම් සිදු කිරීම.
2. ප්‍රාදේශීය ලේකම්/ නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ (ඉඩම්), කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය අත්කර ගැනීමේ ක්‍රියාවලිය කළමනාකරණය සහ ගෙවීම් කිරීම සිදු කරයි.</td><td>කරනුයේ රු.5,000ක ගෘහ නැවත සවි කිරීම් දීමනාවකි. නමුත් ඉහළ ජීවන වියදම් සලකා බලා නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරකම් සැලැස්ම මගින් රු.10,000ක් යෝජනා කෙරිණි.</td></tr>
<tr><td>18</td><td>F 3</td><td>පදිංචිය වෙනස් කිරීමේදී එම මාරු කිරීම සඳහා වැය වූ පිරිවැය</td><td>ප්‍රතිස්ථාපනය කළ කුටුම්බයන් (ඉඩමට පවතින අයිතිය නොසලකා)</td><td>(a) බලපෑමට ලක් වූ නිවසේ ගෙබිම් වර්ග ප්‍රමාණය මත පදනම්ව නිවාස සංවර්ධන අධිකාරියේ නිවාස යෝජනා ක්‍රමය වෙත පදිංචිය වෙනස් කිරීම/ ප්‍රවාහනය සඳහා දීමනාවක්.
<table>
<tr><th>ගෙබිම වර්ග ප්‍රමාණය (වර්ග අඩි)</th><th>දීමනාව (රු.)</th></tr>
<tr><td><1000</td><td>10,000.00</td></tr>
<tr><td>1000 – 2000</td><td>15,000.00</td></tr>
<tr><td>>2000</td><td>25,500.00</td></tr>
</table></td><td>1. ඉඩම් අත්කර ගැනීමේ පනතේ සහ 2008 රෙගුලාසි ප්‍රකාරව ප්‍රධාන තක්සේරුකරු විසින් සියලු තක්සේරු කිරීම් සිදු කිරීම.
2. ප්‍රාදේශීය ලේකම්/ නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ (ඉඩම්), කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය අත්කර ගැනීමේ ක්‍රියාවලිය කළමනාකරණය සහ ගෙවීම් කිරීම සිදු කරයි.</td><td></td></tr>
<tr><td>19</td><td>F 4</td><td>විකල්ප නවාතැන් පහසුකම් සොයා ගැනීම සඳහා වැය වූ වියදම්</td><td>ප්‍රතිස්ථාපනය කළ කුටුම්බයන්, ව්‍යාපාර හෝ ආයතන හිමිකරුවන් (ඉඩමට පවතින අයිතිය නොසලකා)</td><td>(a) “හිමිකම් තක්සේරු කිරීමේ කමිටුව මගින් තීරණය කරන ලද කාල සීමාව මත පදනම්ව ගෙවල්කුලී දීමනාවන් ගෙවනු ලැබේ,
<table>
<tr><th>ගෙබිම වර්ග ප්‍රමාණය (වර්ග අඩි)</th><th>දීමනාව (රු.)</th></tr>
<tr><td><500</td><td>50,000.00</td></tr>
<tr><td>500 – 750</td><td>60,000.00</td></tr>
</table></td><td>දීමනා/ දිරිදීමනා ගෙවීම පිළිබඳ හිමිකම් තක්සේරු කිරීමේ කමිටුව තීරණය කරනු ඇත.</td><td>2013 ලාර්ක් ප්‍රතිපාදන මගින් යෝජනා කළ පරිදි භූමියේ වර්ග ප්‍රමාණය මත පදනම්ව ගෙවල් කුලී දීමනාවක්</td></tr>
</table>

				750 – 1000 | *75,000.00* *>1000* | *100,000.00*		
	G	විශේෂ සහාය				
20	G 1	අවදානම් තත්ත්වයේ කාණ්ඩය යටතට ගැනෙන, පවුල්වල ගෘහමූලිකයන් මත ඇති කරන බලපෑම	අවදානම් කාණ්ඩය යටතට ගැනෙන කුටුම්බවල ගෘහ මූලිකයන් (ජාතික දරිද්‍රතා රේඛාවට පහළ මට්ටමට ගැනෙන කුටුම්බ, වයස්ගත හා ස්ත්‍රී මූලික පවුල්, නිදන්ගත රෝගවලින් පෙළෙන්නන්)	(a) එක් එක් පුද්ගලයා අවදානම් තත්ත්වයට පත්වන මට්ටමෙහි බරපතල බව සැලකිල්ලට ගනිමින් හිමිකම් තක්සේරු කිරීමේ කමිටුව විසින් නිශ්චය කරනු ලබන මුදලක් හෝ අවම රු. 15,000.00ක කරුණාසහගත ගෙවීමක්.	දීමනා/ දිරිදීමනා ගෙවීම පිළිබඳ හිමිකම් තක්සේරු කිරීමේ කමිටුව තීරණය කරනු ඇත	2013 ලාර්ක් මගින් යෝජනා කළ පරිදි රු.15,000ක් විශේෂ නැවත පදිංචි කිරීමේ ආධාරයක් ලෙස ලබාදීම.
21	G 2	උප පවුල් මත ඇති කරන බලපෑම	ස්වයං ප්‍රතිස්ථාපනය කෙරෙන ප්‍රධාන නිවාස ඒකකයේ/ පදිංචි ස්ථානයේ ජීවත්වන උප පවුල්	(a) රු. 1,000,000.00ක ස්වයං ප්‍රතිස්ථාපන දීමනාවක් සහ අවශ්‍ය පරිදි පුනරුත්ථාපන සහාය ලබාදීම.	දීමනා/ දිරිදීමනා ගෙවීම පිළිබඳ හිමිකම් තක්සේරු කිරීමේ කමිටුව තීරණය කරනු ඇත.	
	H	**අතිරේක දීමනා සහ දිරිදීමනා**				
22	H 1	අත්කර ගැනීමේ ක්‍රියාවලිය අතරතුර පැන නගින වියදම්	ඉඩම් අත්කර ගැනීමේ පනතේ 9 වන වගන්තිය යටතේ පවත්වන විමර්ශනයට සහභාගී වූ කුටුම්බවල ගෘහමූලිකයන්	(a) 9 වන වගන්තිය යටතේ විමර්ශනයට පෙනී සිටි, බලපෑමට ලක් වූ පුද්ගලයන් සඳහා රු. 10,000.00ක නොඉක්මවන මුදල් දීමනාව.		
23	H 2	නියම කරන ලද අවසාන දිනයට පෙර දේපළ බාරදීම	නෛතික හිමිකමක් සහිත සහ ප්‍රතිස්ථාපනය	(a) ව්‍යවස්ථාපිත වන්දියෙන් 25%කට සමාන වූ දීමනාවක්.	දීමනා/ දිරිදීමනා ගෙවීම පිළිබඳ හිමිකම් තක්සේරු කිරීමේ කමිටුව තීරණය කරනු ඇත.	

		වෙනුවෙන් ගෙවන දිරි දීමනාව	වනු ඇති කුටුම්බ හෝ ව්‍යාපාර හිමිකරුවන්			
24	H3	වෙනත් කවර හෝ උප වගන්තියකට අන්තර්ගත නොවන වන්දි පැකේජ	කුලී නිවැසියන් සහ ස්වයං රැකියාවල නිරත වූ පුද්ගලයන්	(a) සෑම කුටුම්බයක් සඳහාම උපරිමය රුපියල් 15,000/-ක මුදල් දීමනාවක්.	දීමනා/ දිරිදීමනා ගෙවීම පිළිබඳ හිමිකම් තක්සේරු කිරීමේ කමිටුව තීරණය කරනු ඇත	2013 ලාර්ක් මගින් යෝජනා කළ පරිදි වන්දි නොලබන කුලී නිවැසියන් හා ස්වයං රැකියාවේ නියුතු පුද්ගලයන් වෙනුවෙන් රු. 15,000.00ක දීමනාවක්
25	H4	නිවසක හිමිකරුවෙකු හෝ ආයෝජන දේපළක හිමිකරුවකු අවතැන් වූ විට	නිවසක හෝ ආයෝජන දේපළක හිමිකරුවෙකු	(a) ප්‍රතිස්ථාපන වටිනාකම/ වෙළඳපල වටිනාකම මත පදනම්ව 10%ක අතිරේක ගෙවීමක්.	1. ඉඩම් අත්කර ගැනීමේ පනතේ සහ 2008 රෙගුලාසි ප්‍රකාරව ප්‍රධාන තක්සේරුකරු විසින් සියලු තක්සේරු කිරීම් සිදු කිරීම. 2. ප්‍රාදේශීය ලේකම්/ නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ (ඉඩම්), කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය අත්කර ගැනීමේ ක්‍රියාවලිය කළමනාකරණය සහ ගෙවීම් කිරීම සිදු කරයි.	
	I	**ප්‍රජා සම්පත් අහිමි වීම**				
26	I 1	සංස්කෘතික සම්පත් (දෙවි මැදුරු, පන්සල්, මුස්ලිම් පල්ලි සහ ආගමික හා සංස්කෘතිකමය වටිනාකමක් සහිත ඉදිකිරීම් සහ වස්තූන්) අහිමි වීම.	ප්‍රදේශයේ ප්‍රජාව සහ කණ්ඩායම්	(a) අදාළ ස්ථාන/ ආයතනවල පාලනය සිදු කරන භාරකාර මණ්ඩල සමඟ සාකච්ඡා කොට, හැකි අවම කාල සීමාවක් තුළ, බලපෑමට ලක් වූ සංස්කෘතික සම්පත් ප්‍රතිස්ථාපනය කිරීම/ නැවත ඉදිකිරීම සහ පොදු දේපළ සම්පත් ප්‍රතිස්ථාපනය කිරීම. (b) සොහොන් කොත්/ සොහොන් ප්‍රතිස්ථාපනය කිරීම අවශ්‍ය වන්නේ නම්	1. ඉඩම් අත්කර ගැනීමේ පනතේ සහ 2008 රෙගුලාසි ප්‍රකාරව ප්‍රධාන තක්සේරුකරු විසින් සියලු තක්සේරු කිරීම් සිදු කිරීම. 2. දීමනා/ දිරිදීමනා ගෙවීම පිළිබඳ හිමිකම් තක්සේරු කිරීමේ කමිටුව තීරණය	

				(කවර හෝ ආකාරයේ ආගමික චාරිත්‍ර පවතී නම් ඒවාද ඇතුළත්ව) මළ සිරුරු ගොඩ ගැනීම සඳහා වන පිරිවැය ආවරණය කිරීම සඳහා මූල්‍ය දීමනාවක්.	කරනු ඇත. 3. ප්‍රාදේශීය ලේකම්/ නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ (ඉඩම්), කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය අත්කර ගැනීමේ ක්‍රියාවලිය කළමනාකරණය සහ ගෙවීම් කිරීම සිදු කරයි.	
27	I 2	ප්‍රජා සහ සමාජ සේවා පහසුකම් (ප්‍රාදේශීය මාර්ග, අඩි පාරවල්, ක්‍රීඩාංගන, පොදු ළිං, ජල මූලාශ්‍ර පවතින ස්ථාන ආදිය) අහිමි වීම.	ප්‍රදේශයේ ප්‍රජාව සහ කණ්ඩායම්	(a) අදාළ/ සුදුසු පරිදි ප්‍රජා සංවිධාන සහ දේපළවල භාරකාර මණ්ඩල සමඟ සාකච්ඡා කොට බලපෑමට ලක් වූ ප්‍රජා හෝ සමාජ සේවා පහසුකම් ඒවා පෙර පැවති තත්ත්වයට හෝ ඊට වඩා උසස් තත්ත්වයට පුනරුත්ථාපනය කිරීම/ ප්‍රතිස්ථාපනය කිරීම, හෝ (b) බලපෑමට ලක් වූ ප්‍රජා කණ්ඩායම් සමඟ සාකච්ඡා කොට අවශ්‍ය වන්නේ නම් ප්‍රතිස්ථාපනය/ ප්‍රතිස්ථානගත කිරීම, හෝ (c) මුළු ප්‍රතිස්ථාපන පිරිවැය මත මුදල් ගෙවීම, සහ (d) එම පහසුකම් භාවිතා කරන කණ්ඩායම්වලට අත්විඳීමට සිදුවන අපහසුතා මඟ හැරීම පිණිස ව්‍යාපෘති සිවිල් කාර්යය සිදු කරන අතරවාරයේදී තාවකාලික සේවාවන් සැපයීම සහ (e) ප්‍රජා සම්පත් වෙත ප්‍රවේශ වීම ප්‍රතිෂ්ඨාපනය	1. ඉඩම් අත්කර ගැනීමේ පනතේ සහ 2008 රෙගුලාසි ප්‍රකාරව ප්‍රධාන තක්සේරුකරු විසින් සියලු තක්සේරු කිරීම් සිදු කිරීම. 2. දීමනා/ දිරිදීමනා ගෙවීම පිළිබඳ හිමිකම් තක්සේරු කිරීමේ කමිටුව තීරණය කරනු ඇත. 3. ප්‍රාදේශීය ලේකම්/ නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ (ඉඩම්), කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය අත්කර ගැනීමේ ක්‍රියාවලිය කළමනාකරණය සහ ගෙවීම් කිරීම සිදු කරයි.	
28	I 3	සමාජ අරමුදල් (capital) අහිමි වීම/ සමාජ දුරස්ථභාවයක් ඇතිවීම.	සත්කාරක ප්‍රජාව සහ නැවත පදිංචි වූවන් අතර දුර්වල ඒකාබද්ධතාව සහ අන්‍යෝන්‍ය සමාජ සම්බන්ධතා දුර්වල වීම.	(a) සමාජ ප්‍රාග්ධනය (social capital) වැඩිකර ගැනීම පිණිස සත්කාරක ප්‍රජාව සහ නැවත පදිංචිවන්නන් යන කණ්ඩායම් දෙකම සහභාගී වන ප්‍රජා සංවිධාන පිහිටුවීම සහ දියුණු කිරීම සඳහා ව්‍යාපෘති හවුල්කාර නියෝජිත ආයතනවලට සහාය දීම. (b) සත්කාරක සහ ප්‍රතිස්ථාපිත පවුල් අතර සමාජීය අවස්ථා (social events) පැවැත්වීම	දීමනා/ දිරිදීමනා ගෙවීම පිළිබඳ හිමිකම් තක්සේරු කිරීමේ කමිටුව තීරණය කරනු ඇත	

				සඳහා පහසුකම් සැපයීම. (c) සත්කාරක හා ප්‍රතිස්ථාපිත යන ප්‍රජා කණ්ඩායම් දෙකටම ප්‍රතිලාභ අත්වන පොදු සුහසාධන කටයුතු සහ වෙනත් සේවාවන් වලදී හවුල්කාර නියෝජිත ආයතනවලට සහාය වීම.		
	J	**මහජන උපයෝගීතා සේවාවන්**				
29	J 1	බලපෑමට ලක් වූ මහජන උපයෝගීතා	මහජන උපයෝගීතා හිමිකරුවන් (ලංකා විදුලිබල මණ්ඩලය, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, ශ්‍රී ලංකා ටෙලිකොම් ආදී)	(a) අදාළ බලධාරීන්ගේ උපදෙස් සහිතව, තෝරාගත් ස්ථානවල නැවත ස්ථාපිත කිරීම.	1. ඉඩම් අත්කර ගැනීමේ පනතේ සහ 2008 රෙගුලාසි ප්‍රකාරව ප්‍රධාන තක්සේරුකරු විසින් සියලු තක්සේරු කිරීම් සිදු කිරීම. 2. ප්‍රාදේශීය ලේකම්/ නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ (ඉඩම්), කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය අත්කර ගැනීමේ ක්‍රියාවලිය කළමනාකරණය සහ ගෙවීම් කිරීම සිදු කරයි. 3. අදාළ මහජන උපයෝගීතා සේවා සපයන ආයතන එම කාර්යයන් සිදු කරනු ඇත.	
	K	**තාවකාලික බලපෑම්**				
30	K1	සිවිල් කාර්යයන් හේතුවෙන් වන තාවකාලික අහිතකර බලපෑම් (ප්‍රවේශයන් අහිමි වීම, දේපළ හෝ ඉඩම්වලට සිදුවන හානි, ආරක්ෂාව සම්බන්ධයෙන් පවතින අවදානම්, සංචරණය මත ඇති	නෛතික හිමිකමක් සහිත පුද්ගලයන්; බලපත්‍රලාභී වෙළඳුන්, කුලී නිවැසියන්/ බදුකරුවන්, වැනි නෛතික හිමිකමක් නොමැති පුද්ගලයන්; ජංගම වෙළඳුන්, වාණිජ්‍ය ව්‍යාපාර ස්ථානවල	(a) කාර්ය සිදු කෙරෙන ආකාරය දක්වන කාර්ය සටහන, ව්‍යාපෘතිය හේතුවෙන් සිදුවිය හැකි යැයි අපේක්ෂිත තාවකාලික බලපෑම් ආදී තොරතුරු මහජනතාව වෙත දැනුම්දීම සඳහා වැඩබිම තුළ දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම. (b) බලපෑමට ලක් වූ කවර හෝ වත්කම් (උදා: කඩා දැමෙන මායිම් තාප්ප, ඉවත් කෙරෙන ගස් ආදී) වෙනුවෙන් මුදලින් වන්දි ගෙවීම. (c) සංචරණය පහසු කිරීම සඳහා අවශ්‍ය පරිදි රථ වාහන කළමනාකරණ පියවර ගැනීම. (d) වෙළඳාම්/ ව්‍යාපාර අඛණ්ඩව පවත්වාගෙන	1. ඉඩම් අත්කර ගැනීමේ පනතේ සහ 2008 රෙගුලාසි ප්‍රකාරව ප්‍රධාන තක්සේරුකරු විසින් සියලු තක්සේරු කිරීම් සිදු කිරීම. 2. දීමනා/ දිරිදීමනා ගෙවීම පිළිබඳ හිමිකම් තක්සේරු කිරීමේ කමිටුව තීරණය කරනු ඇත. 3. ප්‍රාදේශීය ලේකම්/ නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ (ඉඩම්),	

		කරන බලපෑම වැනි)	සේවකයන්, කම්කරුවන් ප්‍රදේශයේ ජනතාව වැනි	යාම සඳහා ප්‍රවේශය සැපයීම පිණිස විශේෂ පියවර ගැනීම. (e) මාර්ගය දෙපස ඊට අයත් යෝජිත සීමාවෙන් පිටත පිහිටි සියලු ඉඩම් තාවකාලිකව භාවිතා කිරීම, ඉඩම් හිමියාගේ සහ කොන්ත්‍රාත්කරුගේ ලිඛිත අනුමැතිය හරහා සිදුවිය යුතුය. (f) ඉදිකිරීම් වැඩබිම්වල කඳවුරු (construction camps) ස්ථාපිත කිරීම, ක්‍රියාත්මක කිරීමේ ඒකක සමඟ සාකච්ඡාකොට කොන්ත්‍රාත්කරු විසින් සිදු කරනු ඇත.	කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය අත්කර ගැනීමේ ක්‍රියාවලිය කළමනාකරණය සහ ගෙවීම් කිරීම සිදු කරයි.	
	L	**නැවත පදිංචි කිරීමේ අනපේක්ෂිත බලපෑම්**				
31		(a) ව්‍යාපෘතිය හේතුවෙන් සිදුවන ස්වකැමැත්තෙන් තොරව නැවත පදිංචි කිරීමේ කවර හෝ අනපේක්ෂිත බලපෑම් ලේඛනගත කරන අතර නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරකම් සැලැස්මෙහි එකඟත්වයට පත්ව ඇති මූලධර්ම මත පදනම්ව එම බලපෑම් අවම කිරීමට පියවර ගැනේ. (b) හිමිකම් ගෙවීමේ ක්‍රමවේදය තුළ හඳුනාගෙන හෝ විස්තර කොට නොමැති ඕනෑම කාණ්ඩයකට අයත් ව්‍යාපෘතියෙන් බලපෑමට ලක් වූ පුද්ගලයන් හෝ දේපළ හෝ සේවාවන් වෙනුවෙන් වන්දි ගෙවනු ඇත./ එහිදී අදාළ නෛතික ලේඛන මාර්ගෝපදේශ ලෙස සලකමින් සහ ව්‍යාපෘති මෙහෙයුම් ඒකකයේ සමාජ නිලධාරින්ගේ සහ අදාළ ප්‍රාදේශීය ලේකම්වරයාගේ නිරීක්ෂණ සැලකිල්ලට ගනිමින් අමාත්‍යාංශයීය කමිටුව හරහා සිද්ධියෙන් සිද්ධිය සලකා ලබනු ඇත.				

5 **ප්‍රතිස්ථාපන පිරිවැය (Replacement Cost)**: අත්කර ගන්නා අවස්ථාවේදී වත්කමක් ප්‍රතිස්ථාපනය කිරීම සඳහා වැයවන වත්මන් වියදම අදහස් වන අතර, ඊට සාධාරණ වෙළඳපල අගය, ගනුදෙනු වියදම්, එකතුවන පොළිය, සංක්‍රාම හා ප්‍රතිස්ථාපන වියදම් සහ වෙනත් අදාළ ගෙවීම් ඇතුළත් වේ. නමුත් වත්කම්වල හා ව්‍යුහයන්ගේ ක්ෂය වීම් පවතී නම් වියදම් ගණනය කිරීමේදී ඒවා අදාළ කර නොගත යුතුය. සක්‍රීය වෙළඳපල තත්ත්වයක් නොමැති විටක ප්‍රතිස්ථාපන වියදම්වලට සියලුම ගොඩනැගිලි භාරදීමේ වියදම්, ඉදිකිරීම් සඳහා ශ්‍රම වියදම් සහ ගනුදෙනු හෝ ප්‍රතිස්ථාපන පිරිවැයක් වැය වී ඇත්නම් එයද ඇතුළත් වේ.

8 වන පරිච්ඡේදය - නිවාස හා ජනාවාස ප්‍රතිස්ථාපනය කිරීම

ආසියානු සංවර්ධන බැංකුවේ 2009 සමාජ ආරක්ෂණ ප්‍රතිපත්ති ප්‍රකාශනය අනුව, ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක් වන කුටුම්බයන්ගේ වර්තමාන සමාජ ආර්ථික සබඳතා ආරක්ෂා කිරීම පිණිස ඔවුන් වර්තමාන පදිංචි ස්ථානයට ආසන්න ප්‍රදේශයක පිහිටි විකල්ප නිවාසවල ප්‍රතිස්ථානගත කිරීම අවශ්‍ය කෙරේ. කෙසේ නමුත්, නගර මධ්‍යයේ ඉඩම් නොමැතිකම හා ඉඩම්වල අධික මිළ ගණන් හේතුවෙන් ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක් වන කුටුම්බ ප්‍රතිස්ථානගත කිරීම සඳහා කොළඹ නගරයේ ඔවුන් දැනට පදිංචි ස්ථානවලට ආසන්න තදාසන්න ප්‍රදේශවලින් සුදුසු ඉඩම් සොයා ගැනීම දුෂ්කර ය. එබැවින් නාගරික සංවර්ධන අධිකාරිය විසින් නාගරික පුනර්ජනන ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කරනු ලබන මධ්‍යම පාන්තික නිවාස යෝජනා ක්‍රම වලින් උපරිම පහසුකම් සහිත නිවාස ඒකක මිළදී ගැනීමට ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය තීරණය කර ඇත. මෙම නිවාස යෝජනා ක්‍රම ඔවුන් දැනට පදිංචි ස්ථාවලට ආසන්න ප්‍රදේශවල (කි.මී 2 ට අඩු) පිහිටා ඇති අතර සාපේක්ෂ ලෙස ගත් කළ එම නිවාස ඒකක ඔවුන් දැනට පදිංචි ස්ථානවලට වඩා බොහෝ සෙයින් යහපත්ය. මෙම සන්දර්භය තුළ කැළණිවැලි දුම්රිය මාර්ගයේ 01 අදියරේ නැවත පදිංචි කිරීමේ වැඩසටහන සඳහා නාගරික සංවර්ධන අධිකාරිය වෙතින් නිවාස ඒකක මිළදී ගැනීම අනුමත කළ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව අනුව, නාගරික සංවර්ධන අධිකාරිය සමඟ අවබෝධ ගිවිසුමක් අත්සන් කොට ඇත.

8.1 පදිංචි ස්ථාන ප්‍රතිස්ථානගත කිරීම

එක්සත් ජාතීන්ගේ මානව ජනාවාස වැඩසටහන මඟින් සිදු කළ මූලික සමාජ ආර්ථික සමීක්ෂණයේ දී හා ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් සිදු කළ සමාලෝචන සමීක්ෂණයේ දී පුද්ගලයන් 1295ක ජනගහනයක් ඇතුළත් කුටුම්බ 271ක් (නේවාසික - 241, නේවාසික හා වාණිජ - 15 සහ වාණිජ - 15) ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක් වන බව හෙළි විය. බලපෑමට ලක් වූ නේවාසික කුටුම්බ 297 වත්ත, එළුමඩුව හා සීවලිපුර Block B සහ A නම් වූ ප්‍රදේශ තුනක පිහිටා ඇත. මෙම ජනවාස තුන කැළණිවැලි දුම්රිය මාර්ගයේ අදියර 1හි 2 කොටසෙහි ලොකො (LOCO) හන්දියේ සිට සීවලී පටුමඟ දක්වා දුම්රිය මාර්ගය දෙපස පිහිටා ඇත.

ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක් වූ කුටුම්බ 255න් 217ක් ඉඩම සඳහා නෛතික හිමිකමක් රහිත කුටුම්බ ලෙසත් 12ක් ඉඩම සඳහා නෛතික හිමිකමක් සහිත කුටුම්බ ලෙසත් හඳුනාගෙන ඇත. ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක් වූ තවත් කුටුම්බ විසි අටක් සඳහා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මඟින් නියාමානුකූල කරන ලද ඉඩම් සඳහා නිකුත් කරන ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ කුටුම්බ කාඩ්පත් හා ලිපි ඇත. ඉඩම සඳහා නෛතික හිමිකමක් නොමැති ඉහත කුටුම්බ 217 පූර්ණ බලපෑමට ලක් වූ පිරිසක් සේ සැලකෙන අතර ඉඩම සඳහා නෛතික හිමිකමක් ඇති කුටුම්බ 12න් 6ක් අර්ධ ලෙස බලපෑමට ලක් වූ ලෙසත් ඉතිරිය පූර්ණ ලෙස බලපෑමට ලක් වූ ලෙසත් සැලකේ. ජාතික නිවාස සංවර්ධන අධිකාරිය නිකුත් කළ කුටුම්බ කාඩ්පත් හිමි කුටුම්බ 28ද ව්‍යාපෘතිය හේතුවෙන් සම්පූර්ණයෙන් බලපෑමට ලක් වේ. එහෙයින් ඔවුන් ද පූර්ණ ලෙස බලපෑමට ලක් වූ කුටුම්බ ලෙස සැලකේ. අර්ධ වශයෙන් බලපෑමට ලක් වූ කුටුම්බ හයෙන් නිවාස පහක් ව්‍යාපෘතිය මඟින් බලපෑමට ලක් වූ ඉඩම හා ඉදිකිරීම්වලට ලැබීමට නියමිත වන්දි මුදල ලබාගෙන එය පෙර තිබූ තැනම නඟා

සිටුවීම සිදු කළ හැකි ය. ඉඩම සඳහා නෛතික හිමිකමක් ඇති, සැලකිය යුතු ලෙස බලපෑමට ලක් වන්නා වූ එක් නිවසක් එය පෙර පැවති ස්ථානයේ ම සංවර්ධනය කිරීම සිදු කළ නොහැකි ය.

එකම නිවස තුළ විස්තීර්ණ පවුල් ද ජීවත් වන බව සමාජ ආර්ථික සමීක්ෂණවල දී හෙළි විය. කෙසේ නමුත්, මෙම ප්‍රජාව තුළ වෙසෙන ප්‍රධාන පවුල්වලින් උප පවුල වෙන්කොට හඳුනා ගැනීමට හා වෙන් කිරීමට පොදු නිර්ණායක යොදා ගත නොහැකි ය. එහෙයින් මෙම තත්ත්වයට විසඳුමක් ලෙස පවුලේ සමාජිකයන් ගණන හා දැනට පදංචි නිවසේ ගෙබිම් වර්ග ප්‍රමාණය මත පදනම් වූ විශේෂ ක්‍රමවේදයක් හිමිකම් ගෙවීමේ ක්‍රමවේදය තුළ යෝජනා වී ඇත.

8.1.2 *නැවත පදිංචි කිරීම පිළිබඳ බලපෑමට ලක් වූ කුටුම්බ දරණ ආකල්ප*

බලපෑමට ලක් වූ කුටුම්බයන්ගේ නැවත පදිංචි කිරීම පිළිබඳ වූ මනාපයන් 8.2 වගුවෙන් දැක්වේ. සියලු අනවසර පදිංචිකරුවන් හා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මඟින් නියමානුකූල කළ කුටුම්බ කොළඹ නගරය ආශ්‍රයෙන් නිවසක් මිලදී ගැනීම සඳහා ප්‍රමාණවත් නොවන, ස්වයං ප්‍රතිස්ථානගත වීමේ පැකේජය ලබා ගැනීමට වඩා නාගරික සංවර්ධන අධිකාරියේ නිවාස ඒකකවල නැවත පදිංචි වීමට කැමැත්තෙන් පසු වෙති. ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක් වන පුද්ගලයින් අතුරින් ස්වයං ප්‍රතිස්ථානගත වීමට කැමැත්ත පළ කර ඇත්තේ එක් කුටුම්බයක් පමණි. ඒ අනුව 97.6%ක් නාගරික සංවර්ධන අධිකාරියේ නිවාස ඒකකවල නැවත පදිංචි වීමට කැමැත්ත දක්වා ඇති අතර ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක් වූ කුටුම්බ අතරින් ඔප්පු හිමි 2%ක් එම ස්ථානයේ ම නැවත පදිංචි වනු ඇත.

8.2 වගුව : ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක් වූ කුටුම්බවල වන්දි සඳහා වූ මනාපයන් (බහු ප්‍රතිචාර)

බලපෑමට ලක් වූ ඉඩම හා ඉදිකිරීම් වෙනුවෙන් ලැබීමට කැමති වන්දිය	ගණන	ප්‍රතිශතය (%)
ස්වයං ප්‍රතිස්ථානගත වීම සඳහා වූ වන්දිය	1	0.4
නාගරික සංවර්ධන අධිකාරියේ මහල් නිවාසයෙන් නිවාස ඒකකයක්	249	97.6
ස්ථානීය වැඩිදියුණු කිරීම	05	2
මුළු ගණන	255	100.00

මූලාශ්‍රය :ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ සමාජ ආර්ථික සත්‍යාපන සමීක්ෂණය

8.2 යෝජිත වන්දි පැකේජය

ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක් වූ කුටුම්බ වෙත ඇති වන බලපෑම අඩු කිරීම සඳහා හිමිකම් ගෙවීමේ ක්‍රමවේදය තුළ ඔවුනට වන්දි ගෙවීම සඳහා වන පහත දැක්වෙන විකල්ප දෙක ව්‍යාපෘති කළමනාකරණ ඒකකය සළකා බලනු ඇත.

පළමු විකල්පය : ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක් වූ කුටුම්බ නාගරික සංවර්ධන අධිකාරියේ නිවාස යෝජනා ක්‍රමයක පිහිටි නිවාස ඒකකයක ඒ සඳහා නෛතික හිමිකමක් සහිතව නැවත පදිංචි කිරීම.

දෙවන විකල්පය : බලපෑමට ලක් වූ පාර්ශව වෙත ඔවුන් කැමති ස්ථානයක ස්වයං ප්‍රතිස්ථානගත වීම සඳහා වන්දි මුදලක් ලබා දීම.

සිය කැමැත්ත අනුව පළමු හෝ දෙවන විකල්ප තෝරා ගැනීමේ නිදහස ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක් වූ කුටුම්බ සතු වේ.

ඉහත කරුණුවලට අමතරව, ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක් වූ කුටුම්බ සඳහා වන නැවත පදිංචි කිරීමේ ආධාර පැකේජයට නව නිවාස ඒකකයට මාරු වීම සඳහා වූ කරුණා සහගත දීමනාවක්, කඩා දැමූ නිවසේ ගැල වූ ද්‍රව්‍ය ,සහ ප්‍රවාහන දීමනාවන් ඇතුළත් වේ. ඔප්පු සහිත පුද්ගලයන්හට සිය බලපෑමට ලක් වූ ගෙවත්තේ ඇති වටිනා ගස් හා භෝග වෙනුවෙන් හිමිකම් ලැබීමට හැකි ය. කෙටි කාලයකින් පදිංචි විය හැකි දැනට පවතින නිවාස යෝජනා ක්‍රමවල විස්තර පහතින් දැක්වේ.

වගුව 8.3: නිවාස යෝජනා ක්‍රමවල විස්තර

නිවාස යෝජනා ක්‍රමය	**පිහිටි ස්ථානය**	**නිවාස ඒකක ගණන**	**කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය මිල දී ගෙන ඇති නිවාස ඒකක ගණන**	**නිවාස ඒකකයක ගෙබිම් වර්ග ප්‍රමාණය වර්ග අඩි.**	**ඉඩම් අයිතිය**
ලක්හිරු සෙවණ	මාළිගාවත්ත	192	192	400	රජයේ ඉඩම
මෙත්සර උයන	බොරැල්ල	430	40	400	රජයේ ඉඩම
සියපත් සෙවන	දෙමටගොඩ	266	30	500	රජයේ ඉඩම

මුලාශ්‍රය :ව්‍යාපෘති කළමනාකරණ ඒකකය

3 රූපය : වර්තමාන පදිංචි ස්ථානයේ සහ ප්‍රතිස්ථානගත කිරීම සඳහා යෝජිත ප්‍රදේශයේ සාපේක්ෂ පිහිටීම.

ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක් වන 02 වන කොටසේ පදිංචි කුටුම්බ සඳහා වෙන් කළ නිවාස යෝජනා ක්‍රම තුන කි.මී. 0.5 - කි.මී. 3ක දුරකින් පිහිටා ඇත. ඉහත සිතියමේ ව්‍යාපෘති ප්‍රදේශය (සුදු පැහැයෙන්) හා නිවාස යෝජනා ක්‍රම තුනේ පිහිටීම (කහ පැහැති කොටස්වලින්) දැක්වේ. යෝජිත ගුවන්ගත ද්විත්ව මාර්ගය (Elevated Highway) දම් පැහැයෙන් දැක්වේ.

8.3 බලපෑමට ලක් වූ ආගමික සිද්ධස්ථාන ප්‍රතිස්ථානගත කිරීම

මෙම කැළණිවැලි දුම්රිය මාර්ගයේ පළමු අදියරෙහි දෙවන කොටසේ පිහිටි බුදුපිළිම තුනක් හා කතෝලික ආගමික ස්ථාන දෙකක් ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක්වේ. මෙම ආගමික ස්ථාන සුදුසු ස්ථානයක නැවත ඉදිකර දෙන මෙන් ප්‍රදේශවාසීහු ඉල්ලා සිටියහ.

9 වන පරිච්ඡේදය - ආදායම් ප්‍රතිස්ථාපන වැඩසටහන

9.1 හැඳින්වීම

ස්වකැමැත්තෙන් තොරව අවතැන් වූවන් නැවත පදිංචි කිරීමේ ජාතික ප්‍රතිපත්තිය සහ ආසියානු සංවර්ධන බැංකුවේ -2009 ආරක්ෂණ ප්‍රතිපත්ති ප්‍රකාශනය මඟින් සංවර්ධන අරමුණු උදෙසා සිදු කෙරෙන අනිවාර්ය ඉඩම් අත්කර ගැනීම හේතුවෙන් අවතැන් වන පුද්ගලයන්ගේ ජීවනෝපායන් යළි ස්ථාපිත කිරීමෙත් ඔවුන්ගේ ජීවන මට්ටම නඟා සිටුවීමේත් සහ ජනතාව දුඟී බවට පත් වීම වැළැක්වීමේත් අවශ්‍යතාවය පැහැදිළිව දක්වා ඇත. මෙම ප්‍රතිපත්තීන් දෙක ම ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක් වූ කුටුම්බ වෙත හැකි ඉක්මනින් ජීවනෝපාය වන්දි හා සංවර්ධන විකල්ප ලබා දීම පිළිබඳ දැඩි සේ අවධාරණය කරයි. ප්‍රධාන වශයෙන් ම ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක් වූ කුටුම්බ සඳහා වන සංවර්ධන අවස්ථාවක් වශයෙන් නැවත පදිංචි කිරීමේ සැලැස්ම සඳහන් කළ හැකි ය. කාලෝචිත පරිදි නැවත පදිංචි කිරීම ,ප්‍රමාණවත් හා කාලෝචිත වන්දි ලබා දීම, ආදායම් ප්‍රතිෂ්ඨාපනය සහ ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක් වූ අවදානම් තත්ත්වයට අයත් පුනරුත්ථාපනය කිරීම ආදියට සිදු කෙරෙන ආයතනික මැදිහත් වීම හරහා ව්‍යාපෘතියේ ප්‍රතිලාභ ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක් වූ කුටුම්බ වෙත ගලා යාමට කටයුතු සැලසීම ප්‍රමුඛ කාර්යයක් සේ සැළකිය යුතුවේ.

2019 ජනවාරි මස පැවැත් වූ ආදායම් ප්‍රතිෂ්ඨාපනය පිළිබඳ මූලික සමීක්ෂණයට අනුව, කැළණිවැලි දුම්රිය මාර්ගයේ පළමු අදියරෙහි 2 වන කොටසෙහි නේවාසිකව වෙසෙන ජනගහනය 568කි. මෙම ජනතාව සේවා හා කුඩා පරිමාණ නිෂ්පාදනවලට සම්බන්ධ ආදායම් උත්පාදන ජීවනෝපාය ක්‍රියාකාරකම්වල නිරත වෙති. ඔවුන් කෘෂිකාර්මික හෝ භූමිය පාදක කොටගත් වෙනත් ජීවනෝපාය මාර්ගයක නිරත නොවන බව ද සමීක්ෂණය මඟින් හෙළි විය. මෙම ප්‍රජාව තුළ මතුකුඩු ජාවාරම්කරුවන් හා ලිංගික ශ්‍රමිකයන් ද හඳුනා නොගත් සංඛ්‍යාවක් සිටින බව කැළණිවැලි දුම්රිය මාර්ගයේ පළමු අදියරේ 2 වන කොටසෙහි වෙසෙන ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක් වූ කුටුම්බවල සාමාජිකයන් සමඟ සිදු කළ සාකච්ඡාවල දී අනාවරණය විය. ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක් වූ කුටුම්බවල ප්‍රධාන ආදායම් මාර්ග පහත වගුවෙන් දැක්වේ.

9.1 වගුව: කැළණිවැලි දුම්රිය මාර්ගයේ පළමු අදියරෙහි 2 වන කොටසෙහි වෙසෙන ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක් වූ කුටුම්බවල පුද්ගලන්ගේ ආදායම් මාර්ග

ආදායම් මාර්ගය	පුද්ගලයන් ගණන	ප්‍රතිශතය (%)
රජයේ සේවකයන්	43	7.57
පෞද්ගලික අංශයේ සේවකයන්	147	25.88
දෛනික වැටුප් ලබන කම්කරුවන්	54	9.51
කොන්ත්‍රාත් කම්කරුවන්	62	10.92
නුපුහුණු ශ්‍රමිකයන්	4	0.70
ව්‍යාපාර	15	2.64

ස්වයං රැකියාවල නියුතු	167	29.40
ත්‍රී රෝද රථ රියදුරන්	14	2.46
ඇඳුම් මසන්නන්	11	1.94
විදෙස් ශ්‍රමිකයන්	38	6.69
විශ්‍රාමිකයන්	13	2.29
මුළු ගණන	**568**	**100**

මූලාශ්‍රය :ආදායම් ප්‍රතිෂ්ඨාපනය පිළිබඳ මූලික සමීක්ෂණය 2019 -ජනවාරි

9.2 ජීවනෝපාය මත බලපෑම

ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් පවත්වන ලද ආදායම් ප්‍රතිෂ්ඨාපනය පිළිබඳ මූලික සමීක්ෂණයට අනුව ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක් වූ ප්‍රදේශය තුළ සෘජුව ම බලපෑමට ලක් වන වාණිජ ඉදිකිරීම් 15ක් හා නේවාසික හා වාණිජ ඉදිකිරීම් 15ක් ඇත. ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක් වන එකී ව්‍යාපාර 15න් ශ්‍රමිකයන් 19 දෙනෙකුගේ රැකියා බලපෑමට ලක් වේ. එමෙන් ම ස්වයං රැකියාවල නියුතු 167 දෙනෙක් වන අතර ඉන් 65 දෙනෙක් බලපෑමට ලක් වූ නිවෙස් තුළ ම ස්වයං රැකියාවල නිරතව සිටිති. ආදායම් කාණ්ඩවල සාරාංශය පහත වගුවෙන් දැක්වේ.

වගුව 9.2: බලපෑමට ලක් වූ කුටුම්බ සංඛ්‍යාව සහ එක් එක් ආදායම් ඉපැයීමේ මූලාශ්‍ර අනුව බලපෑමට ලක් වූ ශ්‍රමිකයන්

ආදායම් ඉපැයීමේ මූලාශ්‍ර	**බලපෑමට ලක් වූ කුටුම්බ සංඛ්‍යාව**	**බලපෑමට ලක් වූ ශ්‍රමිකයන් සංඛ්‍යාව**
වාණිජ	15	19
වාණිජ හා නේවාසික	15	නැත
ස්වයං රැකියා	65	-
මුළු ගණන	**95**	**19**

මූලාශ්‍රය :ආදායම් ප්‍රතිෂ්ඨාපනය පිළිබඳ මූලික සමීක්ෂණය 2019 -ජනවාරි

පහත සඳහන් දත්ත, ඉහත වගුවේ දැක්වෙන බලපෑමට ලක් වූ කුටුම්බවලට අදාළ වේ. ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක් වූ කුටුම්බවල ස්වයං රැකියා මත රැඳුණු 65දෙනා අතරින් සිය ප්‍රධාන ආදායම් මාර්ගයට සෘජු බලපෑමක් ඇති වන කුටුම්බ සංඛ්‍යාව පහත වගුවේ දැක්වේ.

වගුව 9.3: බලපෑමට ලක් වන කුටුම්බවල ප්‍රධාන ආදායම් මාර්ග

ප්‍රධාන ආදායම් මාර්ගය	**ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක් වූ කුටුම්බ**	**ප්‍රතිශතය (%)**
පාවහන් අලුත්වැඩියා කිරීම	03	5.0
පාපැදි අලුත්වැඩියා කිරීම	02	3.0
ආහාර සැකසුම් හා වෙළඳාම	10	18.0
සිල්ලර වෙළඳාම	07	13.0
ජංගම වෙළඳාම	08	14.0

වෙනත්	07	13.0
මුළු ගණන	**37**	**100.0**

ආදායම් ප්‍රතිෂ්ඨාපනය පිළිබඳ මූලික සමීක්ෂණය 2019 -ජනවාරි

සිය ආදායම් මාර්ගයට සෘජු බලපෑමක් ඇති වන කුටුම්බ 37 අතරින් ආහාර සැකසුම් හා වෙළඳාමේ යෙදෙන 10 දෙනා සැළකිය යුතු බලපෑමකට ලක් වේ.

ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක් වූ කුටුම්බවල සාමාජිකයන් 378ක් රැකියා වියුක්ත බව සමීක්ෂණයෙන් දැක්වේ. වයස අනුව වර්ගීකරණය කළ රැකියා විරහිත පිරිමි හා ගැහැණු සංඛ්‍යාව පහත දක්වා ඇත.

වගුව 9.4: ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක් වූ කුටුම්බවල රැකියා විරහිත සාමාජිකයන්

වයස් කාණ්ඩය	**පිරිමි**	ගැහැණු	**මුළු සංඛ්‍යාව**	**ප්‍රතිශතය (%)**
20-18	20	24	44	12
30-21	32	72	104	27
50-31	71	88	159	42
61-51	25	46	71	19
මුළු ගණන	**148**	**230**	**378**	**100**

මූලාශ්‍රය :ආදායම් ප්‍රතිෂ්ඨාපනය පිළිබඳ මූලික සමීක්ෂණය 2019 -ජනවාරි

වගුව 9.5: ව්‍යාපෘතිය ආශ්‍රිත ප්‍රදේශවල වෙසෙන ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක් වූ කුටුම්බවල මාසික ආදායම් මට්ටම්

මාසික ආදායම් මට්ටම් (රු.)	**ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක් වූ කුටුම්බ ගණන**	**ප්‍රතිශතය (%)**
20000ට අඩු	57	21
20001 – 30000	47	18
30001 – 40000	41	15
40001 – 50000	45	17
100000 - 50001	59	22
100000ට වැඩි	17	7
මුළු සංඛ්‍යාව	**266**	**100**

මූලාශ්‍රය :ආදායම් ප්‍රතිෂ්ඨාපනය පිළිබඳ මූලික සමීක්ෂණය 2019 -ජනවාරි

ඉහත සමීක්ෂණයට අනුව ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක් වූ කුටුම්බ 104ක් දිනකට රු. 1000ට වඩා අඩුවෙන් උපයයි; ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක් වූ කුටුම්බ 29ක් රු - 50,000.00 .රු100,000.00 .ත් අතර මාසික ආදායමක් උපයයි. සමෘද්ධි (දුගී බව තුරන් කිරීමේ රජයේ ආධාරය) ප්‍රතිලාභ ලබන ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක් වූ කුටුම්බ 4ක් හා රජයේ වැඩිහිටි සුබසාධන ගෙවීම ලබන වැඩිහිටියන් 06ක් සිටිති.

9.3 අවදානම් තත්ත්වයේ පවුල් සහ පුද්ගලයන් සඳහා ස්වකැමැත්තෙන් තොරව නැවත පදිංචි කිරීමේ අවශ්‍යතා

වගුව 9.6: ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක් වූ කුටුම්බවල අවදානම් තත්ත්වය

දරිද්‍රතා තත්ත්වය	ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක් වූ කුටුම්බ ගණන
දරිද්‍රතා මට්ටමට පහළ	09
"සමෘද්ධි "ආධාර	11
අනෙකුත් සුබසාධන	04
කාන්තා මූලික කුටුම්බ	10
වැඩිහිටි මූලික කුටුම්බ	09
මුළු ගණන	**43**

මූලාශ්‍රය :ආදායම් ප්‍රතිෂ්ඨාපනය පිළිබඳ මූලික සමීක්ෂණය 2019 -ජනවාරි

ඉහත වගුවෙහි දැක්වෙන පරිදි ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක් වූ කුටුම්බවල අවදානම් සහගත තත්ත්වයට අනුව දරිද්‍රතා මට්ටමට පහළින් කුටුම්බ 09ක් , කාන්තා මූලික කුටුම්බ 10ක් සහ වැඩැහිටි මූලික කුටුම්බ 09ක් වේ. "සමෘද්ධි "හා "අනෙකුත් සුබසාධන "ඇතුළු රජයෙන් සුබසාධන ප්‍රතිලාභ ලබන මුළු කුටුම්බ සංඛ්‍යාව 15ක් බව ද සමීක්ෂණය මඟින් අනාවරණ වේ .

වගුව 9.7: ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක්වන පුද්ගලයන්ගේ අවදානම් සහගත තත්ත්වය

අවදානම් කාණ්ඩය	පිරිමි	කාන්තා	මුළු ගණන	ප්‍රතිශතය (%)
ආබාධිත පුද්ගලයන්	08	05	13	33
නිදන්ගත රෝග සහිත පුද්ගලයන්	11	08	19	49
මානසික ගැටලු සහිත පුද්ගලයන්	04	03	07	18
මුළු ගණන	**23**	**16**	**39**	**100**

මූලාශ්‍රය :ආදායම් ප්‍රතිෂ්ඨාපනය පිළිබඳ මූලික සමීක්ෂණය 2019 -ජනවාරි

සමාජ ආර්ථික සමීක්ෂණය පිළිබඳ විමසා බැලීමේ දී ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක් වූ අවදානම් තත්ත්වයට අයත් කාණ්ඩයට ගැනෙන මුළු පුද්ගලයින් සංඛ්‍යාව 39ක් වන අතර ඊට පිරිමි 23ක් හා කාන්තාවන් 16ක් ඇතුළත් ය. ව්‍යාපෘති ප්‍රදේශය තුළ වැඩිහිටි පිරිමින් සංඛ්‍යාව ඉක්ම වූ වැඩිහිටි කාන්තාවන් සංඛ්‍යාවක් වෙසෙන බව ද ඉන් දැක්වේ.

9.4 කැළණිවැලි දුම්රිය මාර්ගයේ පළමු අදියරෙහි "2 වන කොටස" සඳහා ආදායම් ප්‍රතිෂ්ඨාපන වැඩසටහන

ආදායම් ප්‍රතිෂ්ඨාපන වැඩසටහන සැලසුම් කිරීමේ හා ක්‍රියාත්මක කිරීමෙහිලා වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය අරමුදල් සපයා දෙමින් ;සහ ව්‍යවසායකත්ව සංවර්ධන ක්ෂේත්‍රයට අදාළ රජයේ හා පෞද්ගලික

ආයතනවලින් සේවා හා ප්‍රතිඵල ලබා ගැනීමට ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක්වන පුද්ගලයන් වෙත පහසුකම් සපයා දෙමින් හා අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදු කරමින් ව්‍යාපෘති කළමනාකරණ ඒකකය ප්‍රධාන කාර්ය භාරයක් ඉටු කරනු ඇත. ව්‍යාපෘති කළමනාකරණ ඒකකය වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ප්‍රවර්ධන සහය හා මූලික අරමුදල් සපයා දෙනු ලබයි. ව්‍යාපෘති කළමනාකරණ ඒකකයට අනුබද්ධිත පරිසර හා සමාජ ආරක්ෂණ අංශයෙහි නියෝජ්‍ය අධ්‍යක්ෂකවරයා ආදායම් ප්‍රතිෂ්ඨාපන වැඩසටහන සම්බන්ධයෙන් ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ මූලික වනු ඇත.

9.5 ආදායම් ප්‍රතිෂ්ඨාපන වැඩසටහන සඳහා ජීවනෝපාය සංවර්ධන පුහුණු වැඩසටහන්වල අවශ්‍යතාවය

අවදානම් තත්ත්වයට අයත් පුද්ගලයන්ගේ හැකියාවන් වැඩි දියුණු කිරීම සඳහා ආදායම් ප්‍රතිෂ්ඨාපන වැඩසටහන තුළදී ජීවනෝපාය පුහුණුව ලබා දීම වැදගත් වේ. මෙම වැඩසටහන් බලපෑමට ලක් වූ කුටුම්බවල ආදායම් ප්‍රතිෂ්ඨාපනය කිරීමට උපකාරී වන අතර ඉන් රැකියා වියුක්ති ගැටලුව ද යම්තාක් දුරට විසඳනු ඇත. ස්වයං රැකියා නියුක්තිකයන්හට ඔවුන්ගේ නව සභාධිපත්‍ය ජීවන රටාවට සරිලන පරිදි සුදුසු පරිසර හිතකාමී තාක්ෂණයන් /උපකරණ හැසිරවීමට අවශ්‍ය පුහුණුව ලබා දීම ද මෙම පුහුණු වැඩසටහනේ එක් අරමුණකි.

ජීවනෝපාය පුහුණුවීම් වැඩසටහන් පැවැත්වීම පිළිබඳව ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක් වූ කුටුම්බ අතරින් කුටුම්බ 112ක් ඊට ධනාත්මකව ද කුටුම්බ 51ක් ඍණාත්මකව ද ප්‍රතිචාර දැක් වූ බව මූලික ආදායම් ප්‍රතිෂ්ඨාපන සමීක්ෂණයෙන් අනාවරණය වී ඇත. ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක් වූ කුටුම්බ 23කට ඊට සහභාගී වන්නේ ද නොවන්නේ ද යන්න පිළිබඳ නිශ්චිත අදහසක් නොතිබූ අතර කුටුම්බ 98කට ආදායම් ප්‍රතිෂ්ඨාපන වැඩසටහන පිළිබඳ සමීක්ෂණයේ දී එම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමට අවශ්‍ය නොවී ය.

තවද ,සමීක්ෂණ වාර්තාවලට අනුව, ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක් වූ කුටුම්බ 77ක් සතුව කුඩා ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අවශ්‍ය මූලික ප්‍රාග්ධනය පවතින බව අනාවරණය වූ අතර කුටුම්බ 72ක් ව්‍යාපාරයක් සඳහා යොදා ගත හැකි ප්‍රාග්ධන වත්කම් හිමි පුද්ගලයන් වූ අතර කුටුම්බ 123ක් නව පදිංචි ස්ථානයේ ව්‍යාපාරයක් ආරම්භ කිරීමේ අපේක්ෂාවෙන් පසුවන්නන් බව අනාවරණය විනි. ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක් වූ කුටුම්බවල ජීවන තත්ත්වය නඟා සිටුවීම සඳහා ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් වැදගත් බව උක්ත කරුණු මඟින් පිළිඹිබු වේ.

9.6 ජීවනෝපාය හා ආදායම් ප්‍රතිෂ්ඨාපන උපාය මාර්ග

ව්‍යාපෘති ප්‍රදේශය තුළ ප්‍රතිස්ථානගත කිරීමට නියමිත කුටුම්බ ගණන 255කි .ප්‍රතිස්ථානගත කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ඔවුන්ගේ ආදායම් මාර්ගවලින් කිහිපයක් බලපෑමට ලක් වනු ඇතැයි විශ්වාස කෙරේ .එහෙයින් පහත සඳහන් පරිදි බහුවිධ ප්‍රවේශයන් මත පදනම්ව ආදායම් ප්‍රතිෂ්ඨාපන වැඩසටහනෙහි උපාය මාර්ග ශක්තිමත් කරනු ඇත .ආදායම් ප්‍රතිෂ්ඨාපන වැඩසටහන සඳහා යෝජිත ක්‍රියාකාරකම් වනුයේ:

- ජීවනෝපාය ක්‍රියාකාරකම් පිළිබඳ ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක්වන පුද්ගලයන්ගේ දැනුවත්භාවය ඉහළ නැංවීම .

- මානව සම්පත් සංවර්ධනය පිළිබඳ පුහුණුව
- රැකියා /වෘත්තීය කුසලතා සංවර්ධන පුහුණුව
- ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක්වන පුද්ගලයන් බැංකු ගිණුම් ආරම්භ කිරීමට උනන්දු කරවීම හා බැංකුකරණ /ඉතිරි කිරීමේ පුරුදු ප්‍රවර්ධනය කිරීම
- නායකත්ව ලක්ෂණ වැඩිදියුණු කිරීම හා ප්‍රවර්ධනය කිරීම
- පොදු ගැටලු විසඳා ගැනීම සඳහා සාමාජිකයන් අතර සමිති සංගම් පිහිටුවීම

9.7 ආදායම් ප්‍රතිෂ්ඨාපන වැඩසටහනට සහභාගී වීමට අවස්ථාව ලබන ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක් වූ කුටුම්බ කාණ්ඩ

ආදායම් ප්‍රතිෂ්ඨාපන වැඩසටහනට සහභාගී වීමට අවස්ථාව ලබන ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක් වූ පුද්ගලයන් හා කුටුම්බ කාණ්ඩ සියල්ල සමඟ සාකච්ඡා කොට ඔවුන්ගේ කුටුම්බ තුළ නැවත පදිංචි කිරීම සම්බන්ධයෙන් පවතින අවශ්‍යතා පිළබඳ තත්ත්වය අනුව ආදායම් ප්‍රතිෂ්ඨාපන වැඩසටහන ක්‍රියාත්මක කෙරෙනු ඇත .ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක් වූ අවදානම් සහගත කුටුම්බ හඳුනා ගැනීම සහ වෙනස් වීමට උචිත පරිදි ඔවුන්ගේ හැකියා වර්ධනය කර ගැනීමට සහය ලබා දීම නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරකම් සැලැස්මේ වැදගත් අංගයකි. ආදායම් ප්‍රතිෂ්ඨාපන වැඩසටහනෙහි ප්‍රතිලාභ හිමි ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක් වූ කුටුම්බ කාණ්ඩ ලැයිස්තුව පහතින් දැක්වේ.

- වසරකට වඩා රැකියා වියුක්ති සාමාජිකයන් සහිත කුටුම්බ
- නිදන්ගත රෝගවලින් පෙළෙන සාමාජිකයන් සහිත කුටුම්බ
- ආබාධිත සාමාජිකයන් සහිත කුටුම්බ
- දික්කසාද වූ හෝ නැවත විවාහ නොවූ සාමාජිකයන් සහිත කුටුම්බ
- වයස අවු 15 :ට වැඩි පාසල් හැර ගිය අය සහිත කුටුම්බ
- සාක්ෂරතාවය නොමැති සාමාජිකයන් සහිත කුටුම්බ
- ව්‍යාපාර අහිමි වන කුටුම්බ
- තම ආදායම ඉහළ නංවා ගැනීමට ආයතනික සහය අවශ්‍ය ඉතා දිළිඳු
- අවදානම් සහගත කාණ්ඩ

9.8 විභව්‍ය ආදායම් ප්‍රතිෂ්ඨාපන වැඩසටහන

ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක් වූ කුටුම්බයන්ගේ ජීවනෝපායන් සියල්ල ම පාහේ සේවා හා කුඩා පරිමාණ නිෂ්පාදන ආශ්‍රිත වන බව මෙම සමීක්ෂණ මඟින් හෙළි විය. සමහර ජීවනෝපායන් නිවෙස් මූලිකව සිදු කෙරෙන අතර ඇතැමෙක් අසල්වාසි නිවෙස්වල සේවය කිරීමෙන් ආදායම් උපයති .එක් එක් පුද්ගලයන් හා සිදු කළ සාකච්ඡා, විධිමත් කණ්ඩායම් සාකච්ඡා සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සම්පත් පැතිකඩ මඟින් ඉහත තොරතුරු තහවුරු වේ .මෙම තොරතුරු මත පදනම්ව ආදායම් ප්‍රතිෂ්ඨාපන වැඩසටහන සැලසුම් කළ හැකි ය.

ආදායම් ප්‍රතිෂ්ඨාපන ක්‍රියාකාරකම් වර්ග දෙකකි ;

- කෙටි කාලීන ආදායම් ප්‍රතිෂ්ඨාපන ක්‍රියාකාරකම්
- දීර්ඝ කාලීන ආදායම් ප්‍රතිෂ්ඨාපන ක්‍රියාකාරකම්

කෙටි කාලීන ආදායම් ප්‍රතිෂ්ඨාපන ක්‍රියාකාරකම්

කෙටි කාලීන ආදායම් ප්‍රතිෂ්ඨාපන ක්‍රියාකාරකම් යටතේ ප්‍රතිස්ථානගත කිරීමට පෙර හා පසු ආසන්නතම කාල සීමාව තුළ ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක් වූ පුද්ගලයන්ගේ ආදායම ප්‍රතිෂ්ඨාපනය කිරීමට අපේක්ෂා කෙරේ. ප්‍රතිස්ථානගත කිරීම හේතුවෙන් ඇති විය හැකි කෙටි කාලීන බලපෑම් අඩු කිරීම සඳහා කැළණිවැලි දුම්රිය මාර්ගයේ පළමු අදියරේ විවිධ කෙටි කාලීන ආදායම් ප්‍රතිෂ්ඨාපන ක්‍රියාකාරකම් යෝජනා කර ඇත. සියලු තාවකාලික හා ස්ථිර ආදායම් අහිමි වීම් සඳහා හිමිකම් ගෙවීමේ ක්‍රමවේදයෙහි දක්වා ඇති පරිදි ව්‍යාපෘතිය වන්දි ගෙවීම සිදු කරනු ඇත. එහෙයින් නැවත පදිංචි කෙරෙන පුද්ගලයන් හට ඔවුන්ගේ රැකියා හා ජීවනෝපාය මාර්ග වෙත වූ අවම බලපෑම් පමණක් දරා ගැනීමට සිදු වනු ඇත. ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක් වූ පුද්ගලයන්ගේ ආදායම් අහිමි වීම් පිළිබඳ ඍජුව ක්‍රියා කිරීමට හිමිකම් ගෙවීමේ ක්‍රමවේදය හරහා යෝජිත විකල්පයන් කිහිපයක් පහත දැක්වේ.

- ප්‍රතිස්ථානගත කිරීමට පෙර ප්‍රමාණවත් වන්දියක් ගෙවා ඇති බවට සහතික වීම.
- ප්‍රතිස්ථානගත වීමට හා පදිංචි ස්ථානයේ සිට වෙනත් ස්ථානයකට මාරු වීමට දීමනා ලබා දීම.
- ප්‍රවාහන දීමනා ලබා දීම .
- අවශ්‍ය නම් නොමිලේ හෝ සහන මිලට භාණ්ඩ ලබා දීම.
- හිමිකම් ගෙවීමේ ක්‍රමවේදයෙහි සඳහන් පරිදි ප්‍රමාණවත් ආදායමක් උපයන තෙක් පදිංචිය මාරු කිරීම වෙනුවෙන් දීමනා.
- අවදානම් සහගත කණ්ඩායම් සඳහා විශේෂ දීමනා.
- ව්‍යාපෘතිය ආශ්‍රිත රැකියා අවස්ථා සඳහා ඉඩ ලබා දීම .

හිමිකම් ගෙවීමේ ක්‍රමවේදයේ දැක්වෙන පරිදි ඔහු /ඇයට හිමි වන වන්දිය පිළිබඳ කිසියම් පුද්ගලයෙක් තෘප්තිමත් නොවන්නේ නම්, ඔහුට /ඇයට හිමිකම් තක්සේරු කිරීමේ කමිටුව වෙත සහන ඉල්ලා අභියාචනා කළ හැකි ය.

දීර්ඝකාලීන ආදායම් ප්‍රතිෂ්ඨාපන ක්‍රියාකාරකම්

යෝජිත දුම්රිය මාර්ගය වැඩි දියුණු කිරීම සඳහා ව්‍යාපෘතිය වෙනුවෙන් ඉඩම්වල අයිතිය නැවත ලබා ගැනීමට හා අත්කර ගැනීමට ව්‍යාපෘති කළමනාකරණ ඒකකයට අවශ්‍ය වේ. මෙම ක්‍රියාවලියේ දී දුම්රිය මාර්ගය දිගේ පිහිටි ඉඩම්වල වෙසෙන බොහොමයක් කුටුම්බ ඉන් බලපෑමට ලක් වේ; එහි ප්‍රතිඵලයක් ලෙස ඔවුන්ගේ ජීවනෝපායන් බලපෑමට ලක් විය හැකි ය. ජීවනෝපායන් ප්‍රතිෂ්ඨාපනයේ දීර්ඝ කාලීන පැවැත්ම සහතික කිරීම සඳහා මුදල් වන්දි පමණක් ප්‍රමාණවත් නොවනු ඇත. පුහුණුවීම් හා සම්බන්ධීකරණ වියදම් වෙනුවෙන් ප්‍රතිපාදන සලසන නැවත පදිංචි කිරීමේ හා පුනරුත්ථාපනය කිරීමේ අයවැය මඟින් දීර්ඝ කාලීන ආදායම් ප්‍රතිෂ්ඨාපන

ක්‍රියාකාරකම් සඳහා මුදල් සැපයේ. එබැවින් පවත්නා ජීවනෝපාය වැඩිදියුණු කිරීමට හෝ විවිධාංගීකරණය කිරීමට පහත සඳහන් උපාය මාර්ග අනුගමනය කෙරේ.

- වෘත්තිමය නිපුණතා පිළිබඳ පුහුණු වැඩසටහන් හරහා පවත්නා ව්‍යාපාර පුළුල් කිරීමට හා දියුණු කිරීමට හෝ විවිධාංගිකරණය කිරීමට සහය වීම.
- ස්වයං රැකියා සඳහා සුදුසු ජීවනෝපාය පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම.
- රේඛීය ආයතන සමඟ සම්බන්ධතා ගොඩනඟා ගැනීම සහ රජයේ අනුග්‍රහය සමඟ පවත්නා ජාතික දරිද්‍රතා විකල්ප හා ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් හඳුන්වා දීම.
- ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක් වූ කුටුම්බවල සාමාජිකයන් සඳහා සුදුසු රැකියා අවස්ථා පිළිබඳ සොයා බැලීම.
- ප්‍රමාණවත් ඉඩ පහසුකම් තිබේ නම් ව්‍යාපාර සඳහා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.
- ක්ෂුද්‍ර මූල්‍ය හා කුඩා පරිමාණ ව්‍යාපාර සංවර්ධනය උදෙසා ස්වයං ආධාර කණ්ඩායම් සංවිධානය කිරීම.
- ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක් වූ කුටුම්බවල සාමාජිකයන් හට මෙවලම් හා කුඩා පරිමාණ යන්ත්‍රෝපකරණ මිළ දී ගැනීමට සහය වීම.
- අදාළ ආයතන /සංවිධාන සමඟ සබඳතා ගොඩනගා ගැනීමට ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක් වූ කුටුම්බවල සාමාජිකයන් හට සහය වීම.
- ප්‍රජා නායකයන් පුහුණු කිරීම.

කාන්තාවන්ගේ හා කාන්තා මූලික කුටුම්බවල ජීවනෝපායන් ප්‍රතිෂ්ඨාපනය කිරීම සඳහා විශේෂ අවධානයක් යොමු කරනු ඇත. ප්‍රජාවේ කාන්තා සාමාජිකයන් දිරි ගැන්විය හැකි කාන්තා නායිකාවන් මෙම ක්‍රියාවලියට ක්‍රියාකාරි ලෙස සම්බන්ධ කර ගනු ඇත. හැකි සෑම විටම කාන්තාවන්ගේ ජීවනෝපායන් ප්‍රතිෂ්ඨාපනය කිරීමට ප්‍රමුඛත්වය ගැනීම සඳහා කාන්තා සංවිධාන පිහිටවනු ඇත.

9.9 ආදායම් ප්‍රතිෂ්ඨාපන වැඩසටහන ක්‍රියාත්මක කිරීමෙහි ලා සංවිධානවලට සහාය වීම.

ආදායම් ප්‍රතිෂ්ඨාපන වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ දී අවශ්‍ය ඕනෑම විටක ඊට අවශ්‍ය අමතර විශේෂඥ සහාය බාහිරෙන් ලබා ගනු ඇත. ව්‍යාපෘති කළමනාකරණ ඒකකය පහත දැක්වෙන ආයතන සමඟ ආදායම් ප්‍රතිෂ්ඨාපන වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ දී සබඳතා පවත්වා ගෙන යනු ඇත.

- බස්නාහිර පළාත් සභාව
- කොළඹ මහ නගර සභාව
- නාගරික සංවර්ධන අධිකාරිය
- සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය
- තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
- සමෘද්ධි අධිකාරිය
- බැංකු හා මූල්‍ය සංවිධාන
- වෘත්තීය පුහුණු අධිකාරිය

- ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය
- ජාතික අධ්‍යුනිකත්ව සහ කාර්මික පුහුණු ආයතනය
- ∉ දරිද්‍රතාවය තුරන් කිරීම උදෙසා කටයුතු කරන වෙනත් රාජ්‍ය නොවන සංවිධානය

9.10 ආදායම් ප්‍රතිෂ්ඨාපන වැඩසටහනෙහි ප්‍රගතිය අධීක්ෂණය

ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් ආදායම් ප්‍රතිෂ්ඨාපන උපදේශකවරයා හරහා ආදායම් ප්‍රතිෂ්ඨාපන වැඩසටහනෙහි ප්‍රගතිය අධීක්ෂණය කරනු ලබන අතර මාසිකව ප්‍රගති වාර්තා ඉදිරිපත් කරනු ඇත. ප්‍රගතිය පිළබඳ බාහිර අධීක්ෂණ කටයුතු වාර්ෂිකව සිදු කරනු ඇත.

10 වන පරිච්ඡේදය - නැවත පදිංචි කිරීමේ අයවැය සහ මූල්‍යමය සැලැස්ම

10.1 හැඳින්වීම

කැළණිවැලි දුම්රිය මාර්ගයේ පළමු අදියරහි 2 වන කොටස සඳහා සකස් කරනු ලැබූ නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරකම් සැලැස්මෙහි ඉදිරිපත් නොට ඇති හිමිකම් ගෙවීමේ ක්‍රමවේදයෙහි සඳහන් පරාමිතීන් මත පදනම්ව නැවත පදිංචි කිරීමේ අයවැය සකස් කොට ඇත. එහි, ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක්ව ඉඩම් අහිමි වීම, ඉදිකිරීම් අහිමි වීම, ගස් හා බෝග අහිමි වීම සඳහා ගෙවන වන්දිය ඇතුළත් ඉඩම් අත්කර ගැනීමේ පිරිවැය, ආදායම් හා ජීවනෝපාය ප්‍රතිස්ථාපනය හා වර්ධනය කිරීම සඳහා පිරිවැය, බාහිර සුපරීක්ෂණය හා කාර්ය මණ්ඩල පුහුණුවද ඇතුළත්ව පරිපාලන හා සුපරීක්ෂණය සඳහා වන පිරිවැය සහ වෙනත් හදිසි අවස්ථා සඳහා වන පිරිවැය එයට අයත් වේ. ප්‍රතිස්ථානගත කිරීමේ නිවාස ඒකක සඳහා වන වියදම් සඳහා 2017 ඔක්තෝබර් මස 17 වන දින අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇති බැවින් එය මෙයට ඇතුළත් කොට නොමැත.

වෙළඳපල මිල මත පදනම් වන 2008 ඉඩම් අත්කර ගැනීමේ නියෝග ප්‍රකාරව ප්‍රතිස්ථාපන පිරිවැය මත පදනම්ව අත්කර ගනු ලබන ඉඩම්, ඉදිකිරීම් සහ වෙනත් වත්කම් වල පිරිවැය තක්සේරු කරනු ලැබේ. එසේම, ස්වකැමැත්තෙන් තොරව අවතැන් වූවන් නැවත පදිංචි කිරීමේ ජාතික ප්‍රතිපත්තිය සහ ඉඩම් අත්කර ගැනීමේ රෙගුලාසි අතර පවතින පරතරය පියවීම පිණිස වෙනත් සමාජ ආරක්ෂණ ප්‍රතිපත්තීන් කිහිපයක් (සාධාරණ වෙළඳපල වටිනාකම, හුවමාරු කිරීමේ පිරිවැය, එකතු කළ පොලිය, මාරුවීමේ සහ ප්‍රතිස්ථාපනය කිරීමේ පිරිවැය සහ වෙනත් අදාළ ගෙවීම්) අනුගමනය කර ඇත. 2008 ඉඩම් අත්කර ගැනීමේ රෙගුලාසිවල සඳහන් කොට ඇති අහිතකර බලපෑම් හා වෙන් කිරීම්, බාධා කිරීම් සහ හුවමාරු කිරීමේ පිරිවැය (ක්ෂයවීම් රහිතව) ගෙවනු ලැබේ.

අයවැයෙහි ඉදිරිපත් කොට ඇති වටිනාකම් සඳහන් කොට දැක්විය හැකිය. අයවැයෙහි ගණනය කිරීම් සිදු කිරීම සඳහා බලපෑමට ලක් වූ පුද්ගලයන් සම්බන්ධයෙන් සිදු කළ සංගණනයෙහි දත්තද, ඉඩම් වෙළඳපල හා ගොඩනැගිලි වල කුලිය පිළිබඳව සිදු කළ අඛණ්ඩ සමීක්ෂණද උපකාරී වී ඇත. ඉඩම් අත්කර ගැනීමේ හා නැවත පදිංචි කිරීමේ පිරිවැය ආවරණය කිරීම සඳහා අවශ්‍ය අරමුදල් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ නියෝජිත ආයතනය විසින් ව්‍යාපෘති කළමනාකරණ ඒකකය වෙත ලබාදෙනු ඇත. නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරකම් සැලැස්ම ක්‍රියාත්මක කිරීම අතරතුරදී පැන නැගිය හැකි අනපේක්ෂිත පිරිවැය ආවරණය කර ගැනීම පිණිස නැවත පදිංචි කිරීමේ මුළු අයවැයෙන් 10%ක වටිනාකමකට සමාන හදිසි අවශ්‍යතා අරමුදලක් වෙන් කොට තබනු ඇත.

අයවැය සඳහා වැඩිදුර විස්තරයක්:

- ව්‍යාපාර ප්‍රතිස්ථානගත කිරීමේ අරමුදල්: බලපෑමට ලක්වන විවිධ වර්ගවලට අයත් පුද්ගලයන් සඳහා අදාළ කරගත හැකි හිමිකම් ගෙවීමේ ක්‍රමවේදයේ සඳහන් වන පරාමිතීන්/ උපරිම සීමාවන් මත පදනම්ව, ව්‍යාපාර ප්‍රතිස්ථාපනය කිරීම සඳහා ලබාදෙන වන්දි මුදල තක්සේරු කර ඇත.

- ගෙවල් කුලී වට්නාකම්: ව්‍යාපෘතියෙන් බලපෑමට ලක් වූ පුද්ගලයන් සම්බන්ධයෙන් සිදු කරනු ලැබූ සංගණනයේ වාර්තාවන් අනුව බදුකරුවන්ගේ මාසික බදු ආදායමේ සාමාන්‍යය මත පදනම්ව, බලපෑමට ලක් වූ පුද්ගලයන්ගේ ගෙවල් කුලී ආදායම් අහිමි වීම් සඳහා වන්දි මුදල් තක්සේරු කර ඇත.
- ව්‍යාපාර ආදායම් සහ පඩිනඩි: ව්‍යාපෘතියෙන් බලපෑමට ලක් වූ පුද්ගලයන් පිළිබඳව සිදු කරනු ලැබූ සංගණනයේදී වාර්තා වූ පරිදි ව්‍යාපෘතියෙන් බලපෑමට ලක් වූ විවිධ වර්ගවලට අයත් පුද්ගලයන් කාණ්ඩවල මාසික ව්‍යාපාර ආදායම සහ පඩිනඩි වල සාමාන්‍ය මත පදනම්ව, ව්‍යාපෘතියෙන් බලපෑමට ලක්වූවන්ගේ මාසික ව්‍යාපාර ආදායම හා පඩිනඩි අහිමිවීම සඳහා වන්දි තක්සේරු කරනු ලැබේ.
- ජීවනෝපාය ප්‍රතිස්ථාපන දීමනා: ව්‍යාපෘතියෙන් බලපෑමට ලක්වන විවිධ වර්ගවලට අයත් පුද්ගලයන් සඳහා අදාළ කර ගනු ලබන හිමිකම් ගෙවීමේ ක්‍රමවේදයෙහි සඳහන් වන පරාමිතීන්/ උපරිම සීමාවන් මත පදනම්ව ඇස්තමේන්තු කිරීම.
- අවදානම් තත්ත්වයේ පුද්ගලයන් සඳහා කරුණාසහගත ගෙවීම් සඳහා ප්‍රතිපාදන: ව්‍යාපාර ආදායමෙන්/ ගෙවල් කුලී ආදායමෙන්/ පඩිනඩි වලින් 5%ක්.
- හිමිකම් ගෙවීමේ ක්‍රමවේදය මගින් ආවරණය නොකෙරෙන බලපෑම් සඳහා කරුණාසහගත ගෙවම් සිදු කිරීමට ප්‍රතිපාදන: ඉඩම්, ප්‍රතිස්ථානගත කිරීම, ආදායම් අහිමිවීම, ජීවනෝපාය ප්‍රතිස්ථාපනය සඳහා වන මුළු වන්දි මුදලින් 10%ක්.
- හිමිකම් තක්සේරු කිරීමේ කමිටුවෙහි විමර්ශන සඳහා පෙනී සිටීම සහ ලිපි ලේඛන සකස් කිරීමේ ගාස්තු: බලපෑමට ලක් වූ එක් පුද්ගලයෙකු වෙනුවෙන් ශ්‍රී ලංකා රුපියල් 10,000/-ක ගාස්තුවක් වශයෙන් තක්සේරු කර ඇත.
- කලින් හඳුනා නොගත් බලපෑම්: ව්‍යාපාර ආදායම් අහිමි වීම, ගෙවල්කුලී ආදායම් අහිමි වීම සහ පඩිනඩි අහිමි වීම සඳහා ලබාදුන් මුළු වන්දි මුදලින් 10%ක්.

10.2 වන්දි ගෙවීම

10.2.1 පුද්ගලික ඉඩම් සඳහා වන්දි

ගෙවතු වලින්ද සමන්විත, අත්කර ගනු ලබන පුද්ගලික ඉඩම් සමහරක් කොළඹ මහනගර සභා බල ප්‍රදේශය තුළ පිහිටයි. රාජ්‍ය ආයතන, විශේෂයෙන්ම තක්සේරු දෙපාර්තමේන්තුව විසින් යොදා ගන්නා ගාස්තු මත පදනම්ව පිරිවැය තක්සේරු කිරීමේදී ඒකක අගය නිශ්චය කොට ඇත. අදාළ ස්ථානීය බිම නිරීක්ෂණය කිරීමෙන් අනතුරුව තක්සේරු දෙපාර්තමේන්තුව විසින් සත්‍ය වන්දි මුදල නිශ්චය කරනු ඇත. සංගණන සමීක්ෂණය අතරතුර දී, වර්තමාන වෙළඳපල මිල ගණන් පිළිබඳව; බලපෑමට ලක්වූවන්ගෙන් සහ ග්‍රාම නිලධාරීවරුන්ගෙන් තොරතුරු ලබාගෙන ඇත. කෙසේවුවද, තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරනු ලැබූ මිල ගණන්, පිරිවැය තක්සේරු කිරීම පිණිස යොදා ගන්නා නිල මිල ගණන් වශයෙන් සලකා ක්‍රියා කරන ලදී. කොළඹ මහනගර සභා සීමාව තුළ භාවිතා කරන මිල ගණන් ප්‍රධාන තක්සේරුකරු විසින් ලබා දී ඇත. අයවැය සකස් කිරීම සඳහා සාධාරණ තක්සේරු කිරීමක් ලබාදීම සඳහා මෙම මිල ගණන් සාමාන්‍යකරණය කර ඇත.

වගුව 10.1: කොළඹ මහනගර සහා බල ප්‍රදේශයේ ඉඩම්වල ප්‍රතිස්ථාපන වටිනාකම තක්සේරු කිරීම සඳහා ඒකක වටිනාකම (පර්චසයකට රුපියල්)

ප්‍රදේශය	නේවාසික			ව්‍යාපාර			සාමාන්‍ය
	පහළ	ඉහළ	සාමාන්‍ය	පහළ	ඉහළ	සාමාන්‍ය	
කොළඹ මහනගර සහා බල ප්‍රදේශය	3,900,000	4,200,000	4,050,000	4,500,000	5,400,000	4,950,000	4,500,000

ව්‍යාපෘතියෙන් අර්ධ වශයෙන් බලපෑමට ලක්වන ඔප්පු හිමියන් හය දෙනෙකු සහ ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ ඔප්පු හිමියන් හය දෙනෙකු සඳහා වන්දි ගෙවීම, 1950 ඉඩම් අත්කර ගැනීමේ පනත හා 2008 රෙගුලාසි ප්‍රකාරව සහ අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කළ යුතු හිමිකම් ගෙවීමේ කමිටුවේ නිර්දේශ ප්‍රකාරව සිදු කරනු ඇත.

10.2.2 පොදු මහජන සම්පත් ඇතුළත්ව ඉදිකිරීම් සඳහා වන්දි ගෙවීම

CIDA ආයතනයට, ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට සහ එක්සත් ජාතීන්ගේ මානව ජනාවාස වැඩසටහනෙහි (UN-Habitat) ඉදිකිරීම් අංශයට සම්බන්ධව කටයුතු කරන තාක්ෂණික විශේෂඥයින් විසින් ලබාදෙන තොරතුරු මත පදනම්ව ඉදිකිරීම්වල ප්‍රතිස්ථාපන පිරිවැය ගණනය කිරීම පිණිස ඒකක වටිනාකම නිශ්චය කරනු ඇත. පළාත් සභාවෙහි ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් ලබාදෙන BSR, එක්සත් ජාතීන්ගේ මානව ජනාවාස වැඩසටහනෙහි (UN Habitat) ගාස්තු සමඟ සංසන්දනය කොට, සමීක්ෂණයේදී හඳුනාගත් ඉදිකිරීම් කාණ්ඩය සඳහා අදාළ කරනු ඇත. අමුද්‍රව්‍ය, කම්කරු ශ්‍රමය ආදියෙහි පිරිවැය හඳුනා ගනිමින් විවිධ ඉදිකිරීම් වර්ග අනුව අයවැය සඳහා පිරිවැය ඇස්තමේන්තු තීරණය කරන ලදී. ඉදිකිරීම් සඳහා පිරිවැය ඇස්තමේන්තු පහත 10.2 වගුවෙන් දැක්වේ.

වගුව 10.2: ඉදිකිරීම්වල ප්‍රතිස්ථාපනය පිරිවැය ඇස්තමේන්තුව කිරීමේදී ඒකක ගාස්තු

නිවාස කාණ්ඩය	බිම වර්ගය	වහළ වර්ගය	බිත්ති වර්ගය	වටිනාකම (ශ්‍රී ලංකා රුපියල්/ වර්ග අඩි)
කාණ්ඩය – 1	ටයිල්/ ටෙරාසෝ/ සිමෙන්ති	කොන්ක්‍රීට්	ගඩොල්/ සිමෙන්ති ගල්	5,000-4200
කාණ්ඩය – 2	ටයිල්/ ටෙරාසෝ/ සිමෙන්ති	ඇස්බැස්ටොස්/ ටයිල්	ගඩොල්/ සිමෙන්ති ගල්	4,200-4000
කාණ්ඩය – 3	ටයිල්/ ටෙරාසෝ/ සිමෙන්ති	තාර/ ටකරං/ පොල් අතු	ගඩොල්/ සිමෙන්ති ගල්	3,800-2200
කාණ්ඩය – 4	මැටි / ලැලි	ඇස්බැස්ටොස්/ ටයිල්	ගඩොල්/ සිමෙන්ති ගල්	2,200-2000

කාණ්ඩය – 5	මැටි / ලැලි	තාර/ ටකරං/ පොල් අතු	ගඩොල්/ සිමෙන්ති ගල්	2,200-2000
කාණ්ඩය – 6	මැටි / ලැලි	තාර/ ටකරං / පොල් අතු	මැටි/ ලැලි / ටකරං	2,000-1800

සටහන: අයවැය සැකසීමේ ඇරමුණ වෙනුවෙන් වැඩි අගය ලබාගෙන ඇත.

බලපෑමට ලක් වූ කිසියම් පුද්ගලයෙකු මෙම ව්‍යාපෘතිය යටතේ ස්වයං ප්‍රතිස්ථාපනය වීමට අපේක්ෂා කරයි නම්, ඉහත 10.2 වගුවේ සඳහන් කොට ඇති වගුව මත පදනම්ව අදාළ ඉදිකිරීම සඳහා වන්දි ගෙවනු ලැබේ. කෙසේවුවද, ඉදිකිරීමේ වටිනාකම තීරණය කරනු ලබන්නේ ප්‍රධාන තක්සේරුකරු විසිනි. නාගරික සංවර්ධන අධිකාරියේ නිවාසයක් ලැබීමට කැමැත්ත දක්වන, බලපෑමට ලක් වූ පුද්ගලයන් හට ඔහුගේ/ ඇයගේ නිවසේ වටිනාකමින් නව නිවසේ වටිනාකම අඩුකොට ඉතිරි මුදල ලබා දෙනු ඇත.

10.2.3 ශාක සහ බෝග සඳහා වන්දි

එක්සත් ජාතීන්ගේ මානව ජනාවාස වැඩසටහන (UN-Habitat) සහ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් සිදු කරන ලද සංගණන සමීක්ෂණයේදී ව්‍යාපෘතියෙන් බලපෑමට ලක්වන ශාක හඳුනා ගන්නා ලදී. ඒ වෙනුවෙන් වන්දි ගෙවීමේදී, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම දෙපාර්මේන්තුව, හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු ආයතනය, තොග වෙළඳුන් සහ දැව ගබඩාවලින් ලබාදුන් තොරතුරුවලට අනුව වෙළඳපල වටිනාකම තක්සේරු කර ඒ අනුව වන්දි මුදල නිශ්චය කරන ලදී. ශාක වල වටිනාකම නිශ්චය කිරීමේදී ඒ එක් එක් ශාකය වෙන් වෙන්ව පරීක්ෂා කළ යුතු බව දැව සංස්ථාවේ නිලධාරීන්ද, දැව වෙළඳුන් සේම තක්සේරු නිලධාරීන්ද ප්‍රකාශ කොට ඇත. ඔවුන්ගේ ඉඩම්වල පවතින ශාකවල අස්වැන්න නෙළාගන්නා ලෙස බලපෑමට ලක් වූ පුද්ගලයන් උනන්දු කරන ලදී. පළතුරු ගස් තක්සේරු කිරීමේදී එය ළපටි ගසක් සේ සලකා එම ගස පරිණත වීමට ගතවන කාලයෙන් එම ඵලවල වාර්ෂික වටිනාකම ගුණනය කොට වටිනාකම ගණනය කරන ලදී. විවිධ වර්ග වලට අයත් ශාක සඳහා සවිස්තරාත්මක පිරිවැය තක්සේරුව කණ්ඩායම් කිහිපයකට වෙන්කොට සිදු කරන ලද අතර උප එකතුව අයවැයෙහි සඳහන් කොට ඇත. ඉඩමට හිමිකමක් සහිත බලපෑමට ලක්වන පුද්ගලයන්ගේ ශාක සඳහා 1950 ඉඩම් අත්කර ගැනීමේ පනතේ සහ 2008 ඉඩම් අත්කර ගැනීමේ රෙගුලාසි ප්‍රකාරව වන්දි ලැබෙනු ඇත. දුම්රිය මාර්ගය දෙපස ඊට අයත් බිම් තීරයෙහි වගාකර ඇති පුද්ගලයන් හට ඒවායේ අස්වනු නෙළාගත හැකි අතර එසේ කිරීමට අපොහොසත් වන්නේ නම් ඒවා ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ දේපළක් ලෙස සලකනු ලැබේ.

කුලී නිවැසියන් සහ නිවාස හිමියන් සඳහා එම නිවස භුක්ති විඳි කාලසීමාව සහ හිමිකම් ගෙවීමේ ක්‍රමවේදයේ දැක්වෙන අනුපාතය අනුව වන්දි ගෙවනු ඇත. බලපෑමට ලක්වන ව්‍යාපාර හිමියන්ගේ ආදායම් සහ සේවකයන්ගේ වැටුප් අහිමිවීම සඳහා වන්දි හිමිකම් ගෙවීමේ ක්‍රමවේදයෙහි සඳහන් කර ඇති අතර ඒ අනුව ගෙවීම් සිදු කරනු ඇත. බලපෑමට ලක් වූ සියලුම පාර්ශව, ඉදිකිරීම් ඉවත් කිරීම සහ ඉඩම් අත්කර ගැනීම සඳහා වන්දි ගෙවීම ආසියානු සංවර්ධන බැංකුවේ සමාජ ආරක්ෂණ ප්‍රතිපත්ති සහ ස්වකැමැත්තෙන් තොරව අවතැන්වූවන් නැවත පදිංචි කිරීමේ ජාතික ප්‍රතිපත්තිය අනුව සිදුවන බව සහතික කළ යුතුය.

වගුව 10.3: නැවත පදිංචි කිරීමේ අයවැය

අනුක්‍රමික අංකය	බලපෑමට ලක් වූ වර්ගය	බලපෑමට ලක් වූ අයිතමය	ඒකකය	ගණන	අනුපාතය (ශ්‍රී ලංකා රුපියල්)	මුළු එකතුව (ශ්‍රී ලංකා රුපියල්)	සටහන්
01	ඉඩම් අහිමි වීම	නේවාසික	පර්චස්	100	4,050,000	405,000,000	
		වාණිජ/ ව්‍යාපාර	පර්චස්	7	4,950,000	34,650,000	
02	නේවාසික ඉදිකිරීම් අහිමිවීම සඳහා වන්දි	නාගරික සංවර්ධන අධිකාරියේ නිවාස ඒකක (වර්ග අඩි 400)	නිවාස ඒකක	235	4,000,000	940,000,000	අංක 17/2290/709/084 හා 2017.10.17 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව ගෙවා ඇත.
		නාගරික සංවර්ධන අධිකාරියේ නිවාස ඒකක (වර්ග අඩි 500)	නිවාස ඒකක	26	5,000,000	130,000,000	-----එම-----
		ඉදිකිරීම් අහිමි වීම (ව්‍යාපෘතියෙන් බලපෑමට ලක් වූ පුද්ගලයන් ස්වයං ප්‍රතිස්ථාපනය)	වර්ග අඩි	5000	4,200	21,000,000	කඩිනමින් අවශ්‍ය කෙරේ
		ඉදිකිරීම් අහිමි වීම (අර්ධ වශයෙන් බලපෑමට ලක් වූ ගොඩනැගිලි)	වර්ග අඩි	10500	4,200	44,100,000	
		ප්‍රාථමික හා ද්විතියික ඉදිකිරීම් අහිමි වීම (තාප්ප හා ගේට්ටු)	වර්ග අඩි	3200	170	544,000	අවස්ථානුරූපී වියදම්
		වෙනත් ඉදිකිරීම් අහිමි වීම (බලු කූඩු හා පරෙවි කූඩු)	එකවරක් ගෙවන	2	100,000	200,000	කඩිනමින් අවශ්‍ය කෙරේ
		කුලියට ලබාගත් නවාතැන්පළ අහිමි වීම (කුලී හා බදුකරුවන්)	බලපෑමට ලක් වූ පුද්ගලයින් ගණන	6 x 2	15,000	180,000	කඩිනමින් අවශ්‍ය කෙරේ
		කුලියට ලබාගත් නවාතැන්පළ අහිමි වීම (රජයේ නිල නිවාස)	බලපෑමට ලක් වූ පුද්ගලයින් ගණන	33	50,000	1,650,000	
		රජයේ ඉදිකිරීම් (රජයේ නිල නිවාස - පහළ තනතුරු)	බලපෑමට ලක් වූ පුද්ගලයින් ගණන	15	5,000,000	75,000,000	කඩිනමින් අවශ්‍ය කෙරේ
		රජයේ ඉදිකිරීම් (රජයේ නිල නිවාස - උසස් තනතුරු)	බලපෑමට ලක් වූ පුද්ගලයින් ගණන	18	7,500,000	135,000,000	කඩිනමින් අවශ්‍ය කෙරේ
		රජයේ ඉදිකිරීම් - 15 (ගොඩනැගිලි	එකවරක් ගෙවන		30,000,000	30,000,000	කඩිනමින් අවශ්‍ය

		හා වෙනත්)					කෙරේ
03	ශාක අහිමි වීම සඳහා වන්දි	ඵල දරන		66	3,000	198,000	කඩිනමින් අවශ්‍ය කෙරේ
		දැව (කොස්)		6	30,000	180,000	කඩිනමින් අවශ්‍ය කෙරේ
		දැව (පිහිඹියා)		1	5,000	5,000	කඩිනමින් අවශ්‍ය කෙරේ
		පොල් ගස්		30	10,000	300,000	කඩිනමින් අවශ්‍ය කෙරේ
		වෙනත්		3	2,000	6,000	කඩිනමින් අවශ්‍ය කෙරේ
04	ජීවනෝපාය ප්‍රතිස්ථාපනය හා පුනරුත්ථාපනය	ප්‍රතිස්ථානගත කිරීම හේතුවෙන් ජීවනෝපාය අහිමිවීම හෝ ඒ මත බලපෑම් ඇතිවීම.	ව්‍යාපෘතියෙන් බලපෑමට ලක් වූ පුද්ගලයන්	150	30,000	4,500,000	කඩිනමින් අවශ්‍ය කෙරේ
05	ආදායම් අහිමි වීම සඳහා වන්දි	මාස 32ක් සඳහා ව්‍යාපාර ආදායම (ස්ථිර ලියාපදිංචි)	ව්‍යාපෘතියෙන් බලපෑමට ලක් වූ පුද්ගලයන්	15	32x20000	9,600,000	කඩිනමින් අවශ්‍ය කෙරේ
		මාස 18ක් සඳහා ව්‍යාපාර ආදායම (ස්ථිර අවිධිමත්)	ව්‍යාපෘතියෙන් බලපෑමට ලක් වූ පුද්ගලයන්	15	18x 15,000	4,050,000	කඩිනමින් අවශ්‍ය කෙරේ
		මාස 06ක් සඳහා ව්‍යාපාර ආදායම (තාවකාලික)	ව්‍යාපෘතියෙන් බලපෑමට ලක්වූ ව්‍යාපාර හිමිකරුවන්	65	6x 15,000	5,850,000	කඩිනමින් අවශ්‍ය කෙරේ
		වැටුප්/ වේතන අහිමි වීම	ව්‍යාපෘතියෙන් බලපෑමට ලක්වූ ව්‍යාපාර හිමිකරුවන්	19	90,000	1,710,000	කඩිනමින් අවශ්‍ය කෙරේ
		ගෙවල් කුලී/ බදු ආදායම් අහිමි වීම	ව්‍යාපෘතියෙන් බලපෑමට ලක්වූ ව්‍යාපාර හිමිකරුවන්	6 x 2	45,000	540,000	කඩිනමින් අවශ්‍ය කෙරේ
06	බාධා කිරීම් හා වෙනත් දීමනා	උපයෝගීතා සඳහා ප්‍රවේශය අහිමි වීම	ව්‍යාපෘතියෙන් බලපෑමට ලක් වූ කුටුම්බ	271	15,000	4,065,000	කඩිනමින් අවශ්‍ය කෙරේ

		නැවත සවි කිරීම සඳහා පිරිවැය	ව්‍යාපෘතියෙන් බලපෑමට ලක් වූ කුටුම්බ	271	10,000	2,710,000	කඩිනමින් අවශ්‍ය කෙරේ
		පදිංචිය මාරු කිරීමේ පිරිවැය	ව්‍යාපෘතියෙන් බලපෑමට ලක් වූ කුටුම්බ (1000> (වර්ග අඩි)	235	10,000	2,350,000	කඩිනමින් අවශ්‍ය කෙරේ
			ව්‍යාපෘතියෙන් බලපෑමට ලක් වූ කුටුම්බ (1000-2000 (වර්ග අඩි)	21	15,000	315,000	කඩිනමින් අවශ්‍ය කෙරේ
			ව්‍යාපෘතියෙන් බලපෑමට ලක් වූ කුටුම්බ (>2000 (වර්ග අඩි)	2	25,000	50,000	කඩිනමින් අවශ්‍ය කෙරේ
		විකල්ප නවාතැන්	ව්‍යාපෘතියෙන් බලපෑමට ලක් වූ කුටුම්බ (10%)	25	50,000	1,250,000	කඩිනමින් අවශ්‍ය කෙරේ
07	විශේෂ සහාය	අවදානම් තත්ත්වය යටතට ගැනෙන ගෘහමූලිකයන් මත ඇති කරන බලපෑම්	ව්‍යාපෘතියෙන් බලපෑමට ලක් වූ කුටුම්බ	43	15,000	645,000	කඩිනමින් අවශ්‍ය කෙරේ
		උප පවුල් මත ඇති කරන බලපෑම්	උප පවුල්	5	1,000,000	5,000,000	කඩිනමින් අවශ්‍ය කෙරේ
08	අතිරේක දීමනා සහ දිරිදීමනා	9 වන වගන්තිය යටතේ විමර්ශනය	ව්‍යාපෘතියෙන් බලපෑමට ලක් වූ කුටුම්බ	40	10,000	400,000	
		අවසන් දිනයට ප්‍රථම දේපළවල භුක්තිය භාරදීම වෙනුවෙන් 25%ක දිරිදීමනාවක්	පර්චස්	107	562,500	60,187,500	
		වෙනත් කිසිදු උප වගන්තියක නොමැති වන්දි පැකේජ	ව්‍යාපෘතියෙන් බලපෑමට ලක් වූ කුටුම්බ (5%)	13	20,000	260,000	කඩිනමින් අවශ්‍ය කෙරේ

		නිවසක හෝ ආයෝජන දේපළක හිමිකරුවෙකු අවතැන් වූ විට 10%ක්	පර්වස්	107	405,000	43,335,000	
09	ප්‍රජා සම්පත් අහිමි වීම	සංස්කෘතිකමය සම්පත් සහ ආගමික වටිනාකමක් සහිත පිළිම අහිමි වීම	එකවර ගෙවන	4	300,000	1,200,000	අවස්ථානුරූපී වියදම්
		සිවිල් හා සමාජ සේවා පහසුකම් විදුලි ට්‍රාන්ස්ෆෝමර් අහිමි වීම	එකවර ගෙවන	2	2,000,000	4,000,000	අවස්ථානුරූපී වියදම්
		සමාජ ප්‍රාග්ධන අහිමි වීම/ සමාජීය දුරස්වීම සිදුවීම	එකවර ගෙවන	3	200,000	600,000	අවස්ථානුරූපී වියදම්
10	මහජන උපයෝගීතා සේවාවන්	මහජන උපයෝගීතා බලපෑමට ලක්වීම	එකවර ගෙවන	2	1,000,000	2,000,000	අවස්ථානුරූපී වියදම්
11	හිමිකම් තක්සේරු කිරීමේ කමිටු ක්‍රියාකාරීත්වය	ව්‍යාපෘතියෙන් බලපෑමට ලක් වූ කුටුම්බ පරීක්ෂා කිරීම, වාර්තාකරණය, සමාලෝචනය හා අනුමැතිය ලබාදීම	එකවර ගෙවන	250	10,000	2,500,000	කඩිනමින් අවශ්‍ය කෙරේ
12	බාහිර සුපරීක්ෂණය	බාහිර සුපරීක්ෂණය	මාස	30	200,000	6,000,000	
		මුළු ගණන (රුපියල් වලින්)				**,1981,130,500**	
	අනපේක්ෂිත නැවත පදිංචි කිරීමේ බලපෑම් සහ හදිසි අවස්ථා	මුළු ගණනෙන් 10%				**198,113,050**	
		මුළු එකතුව (ශ්‍රී ලංකා රුපියල්)				**2,179,243,550**	
		ඉතිරි මුදල (නාගරික සංවර්ධන අධිකාරියේ නිවාස ඒකක සඳහා දැනටමත් සිදුකර ඇති ගෙවීම් හැර)				**1,109,243,550**	

සම්පූර්ණ මුදල සඳහා අනුමැතිය අවශ්‍ය කෙරේ: රු. 1,109,243,550

කඩිනමින් අවශ්‍ය කෙරෙන ප්‍රමාණය: රු. 304,964,000.00

11 වන පරිච්ඡේදය - ක්‍රියාත්මක කිරීමේ උපලේඛනය

නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරකම් සැලැස්මෙහි අවසන් පිටපත සකස් කිරීම දක්වා වන කාර්යය, නැවත පදිංචි කිරීමේ වැඩ රාමුව සකස් කිරීමේ සිට නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරකම් සැලැස්මෙහි කෙටුම්පතක් සකස් කිරීම දක්වා විවිධාකාර වූ සමාජ කළමනාකරණ ක්‍රියාකාරකම් අදියරවලින් සමන්විත ක්‍රියාවලියකි. නැවත පදිංචි කිරීමේ වැඩසටහන අදියර ගණනාවකින් යුතු වන අතර ඒවානම්, සමාජ ආර්ථික සමීක්ෂණය හා සංගණනය, කඩඉම් දිනය (cut-off date) ප්‍රසිද්ධ කිරීම, නැවත පදිංචි කිරීමේ සැලසුම් කිරීම, මහජන උපදේශන/ සාකච්ඡා සහ තොරතුරු බෙදා හැරීම, ඉඩම් අත්කර ගැනීම, වන්දි ගෙවීම සහ නැවත පදිංචි කිරීමේ සහාය ලබාදීම, ප්‍රතිස්ථානගත කිරීම, දුක්ගැනවිලි සඳහා සහන සැලසීම, ආදායම් ප්‍රතිස්ථාපනය හා වර්ධනය කිරීම සහ නැවත පදිංචි කිරීමේ වැඩසටහන සුපරීක්ෂණය හා ඇගයීම වේ.

නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරකම් සැලැස්ම පහත ප්‍රතිපත්ති මත පදනම් වේ;

- බලපෑමට ලක් වූ සියලුම පුද්ගලයන් වෙත ඔවුන් ප්‍රතිස්ථානගත වීමට පෙර ඔවුනට ලැබිය යුතු වන්දි මුදල සම්පූර්ණයෙන් ගෙවීම සහ ලබාදිය යුතු වෙනත් ප්‍රතිලාභ සහ දීමනා ලබාදීම.
- ඉදිකිරීම් වැඩසටහනෙහි ආරම්භයටත් එහි සාර්ථක ක්‍රියාකාරීත්වය යටතේ බාධාවක් නොවන අයුරින්, කුටුම්බ සහ ව්‍යාපාර ප්‍රතිස්ථානගත කිරීම, මනා කාර්ය සටහනකට අනුව සම්බන්ධීකරණය කළ යුතු වේ.

භෞතික වශයෙන් අවතැන් වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීමේ බිම්වල ආරක්ෂිතව ප්‍රතිස්ථානගත කරන තෙක් භෞතික හෝ ආර්ථික අවතැන්වීමක් සිදු නොවන බවට සහ ඉදිකිරීම් ආරම්භ කිරීමට පෙරාතුව මෙම ව්‍යාපෘතිය හේතුවෙන් අවතැන් වූ දේපළ වෙනුවෙන් සම්පූර්ණ ප්‍රතිස්ථාපන පිරිවැය මත, ව්‍යාපෘතියෙන් බලපෑමට ලක්වූවන් හට වන්දි ගෙවනු ලබන බවට නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරකම් සැලැස්ම මගින් සහතික වනු ඇත. ඉදිකිරීම් කාර්යය ආරම්භ කිරීමට පෙර, දුම්රිය මාර්ගය දෙපස සැලකිය යුතු දුර ප්‍රමාණයක් ඒ කාර්යයන් වෙනුවෙන් නිදහස් කිරීම අවශ්‍ය වේ. මේ අනුව, සිවිල් ඉදිකිරීම් කාර්යයන් ආරම්භ කිරීමට යෝග්‍ය පරිදි නිදහස් යැයි හඳුනාගත් කොටස් සඳහා ඉදිකිරීම් සැලසුම් ක්‍රියාත්මක කරනු ඇත.

ක්‍රියාත්මක අදියර පුරාවටම ඉදිකිරීම් සිදු කරනු ඇති අතර ඉඩම් හා සම්බන්ධ සියලු අවහිරතා වලින් ඒවා නිදහස් කිරීම සිදු කරනු ඇති අතර සිවිල් කාර්යය ආරම්භ කිරීම සඳහා කොන්ත්‍රාත්කරුට භාර දීමට පෙර නැවත පදිංචි කිරීමේ හා පුනරුත්ථාපන කටයුතු නිම කරනු ඇත. කෙසේවුවද, පශ්චාත් නැවත පදිංචි කිරීමේ සුපරීක්ෂණ කටයුතුවලට; ජීවනෝපාය වර්ධනය කිරීම, ප්‍රජාවගේ ජීවිත ස්ථාපිත කිරීම, දුක්ගැනවිලි සඳහා සහන සැලසීම, තක්සේරු කිරීම හා ඇගයීම හා මහජන උපදේශන/ සාකච්ඡා තවදුරටත් ඉදිරියට සිදු කිරීම සහ ව්‍යාපෘතිය නිම කිරීමෙන් පසු පවා තොරතුරු දැනුම් දීම හා හුවමාරු කිරීම සිදු කිරීම ඇතුළත් වේ.

ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ කාර්ය සටහන මගින් ක්‍රියාත්මක කිරීමේ පියවර දැක්වෙන අතර වෙනස්කම් කිරීමේ හැකියාවද පවතී. නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරකම් සැලැස්ම ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධ වන, සිදු කරන ක්‍රියාකාරකම් වල සත්‍ය ප්‍රගතිය මත පදනම්ව විවිධ වෙනස්කම්වලට භාජනය කිරීමටද නියමිත අතර කලින් කලට සිදු කරන යාවත්කාලීන කිරීම් වලටද යටත් වේ. නැවත පදිංචි කිරීමේ කටයුතුවල ක්‍රියාත්මක කිරීමේ කාර්ය සටහන වගුව 11.1 හි ඉදිරිපත් කර ඇත.

KV Line Phase 1 හි අදාළ කොටස් වල නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපනය කිරීම් සඳහා වැඩිදුර විස්තර කිරීම් සහිතව ක්‍රියාත්මක කිරීමේ කාර්ය සටහනක් සකස් කරනු ඇත.

වගුව 11.1: යෝජිත ක්‍රියාත්මක කිරීමේ කාර්ය සටහන

ක්‍රියාකාරකම්	2017				2018				2019				2020				2021				2022			
	1	2	3	4	1	2	3	4	1	2	3	4	1	2	3	4	1	2	3	4	1	2	3	4
සමාජ ආර්ථික හා සංගණන සමීක්ෂණය																								
කඩඉම් දිනය ප්‍රකාශයට පත් කිරීම																								
අවසාන පෙළගැස්ම මත පදනම්ව සංගණනය නැවත සංශෝධනය කිරීම																								
නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරකම් සැලැස්ම සකස් කිරීම																								
හිමිකම් ගෙවීමේ ක්‍රමවේදය හා අයවැය සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම																								
ආසියානු සංවර්ධන බැංකුවේ අනුමැතිය ලබා ගැනීම																								
නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරකම් සැලැස්ම මහජනතාව වෙත අනාවරණය කිරීම																								
හිමිකම් තක්සේරු කිරීමේ කමිටුවක් ස්ථාපිත කිරීම																								
ලේඛනගත සාක්ෂි සමඟ සසඳා ව්‍යාපෘතියෙන් බලපෑමට ලක් වූ පුද්ගලයන්ගේ හිමිකම් තහවුරු කිරීම																								
ඉඩම් අත්කර ගැනීම සහ වන්දි ගෙවීම සම්බන්ධීකරණය																								
ව්‍යාපෘතියෙන් බලපෑමට ලක් වූ පුද්ගලයන් හට ඔවුන්ගේ හිමිකම් පිළිබඳ දැනුම් දීම																								
ඉඩම් අත්කර ගැනීමේ යෝජනාව ප්‍රාදේශීය ලේකම් වෙත දැනුම් දීම																								
නැවත පදිංචි කිරීමේ උපදේශකවරුන්ගේ සේවය කුලී පදනමින් ලබා ගැනීම																								
වන්දි සහ වෙනත් දීමනා ගෙවීම																								
ඉඩම් අත්කර ගැනීම හා ඉදිකිරීම්වල භුක්තිය ලබා ගැනීම																								

නැවත පදිංචි කිරීම සහ නාගරික සංවර්ධන අධිකාරියේ නව නිවාස යෝජනා ක්‍රමවල ප්‍රතිස්ථානගත කිරීම																								
දුක්ගැනවිලි සඳහා සහන සැලසීමේ යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීම																								
ඉදිකිරීම් කඩා ඉවත් කිරීම හා ඉදිකිරීම් සඳහා ඉඩම් එළි කිරීම																								
අත්කර ගනු ලැබූ ඉඩම් දුම්රිය කොන්ත්‍රාත්කරුවන් වෙත භාරදීම																								
ව්‍යාපෘතියෙන් බලපෑමට ලක් වූවන් හට දුක්ගැනවිලි සඳහා සහන/ සහාය ලබාදීම																								
නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරකම් සැලැස්ම ක්‍රියාත්මක කරීම අභ්‍යන්තර සුපරීක්ෂණය																								
තොරතුරු බෙදා හැරීම																								
සමාජ ආරක්ෂණ අනුකූලතා බාහිර සුපරීක්ෂණය හා ඇගයීම																								
නැවත පදිංචි කිරීමේ සැලැස්ම හා ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පිළිබඳ ව්‍යාපෘති වාර්තා																								

12 වන පරිච්ඡේදය - ආයතනික කටයුතු

12.1 හැඳින්වීම

ස්වකැමැත්තෙන් තොරව නැවත පදිංචි කිරීම සැලසුම් කිරීමේ, ක්‍රියාත්මක කිරීමේ හා අධීක්ෂණය කිරීමේ විවිධ සංරචක සාර්ථකව ඉදිරියට කරගෙන යාම සඳහා අමාත්‍යාංශ හා ආයතන කිහිපයක් සම්බන්ධ වේ. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ සමස්ත වගකීම ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය දරනු ලබයි. එම අමාත්‍යාංශයේ පවතින ඉඩම් අංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරයෙකු අංශ ප්‍රධානී ලෙස කටයුතු කරන අතර ඔහුට සහය වීම සඳහා සහකාර ලේකම්වරයෙකු සේවයේ නියුතු ඇත. එම අංශය මඟින් ඉඩම් බැහැර කිරීම හා බදු දීම ඇතුළුව ඉඩම් කළමනාකරණය හා පරිපාලනය ආවරණය වන නමුත් නැවත පදිංචි කිරීමේ කාර්යය ඇතුළත් නොවේ. නැවත පදිංචි කිරීම ක්‍රියාත්මක කිරීම සඳහා වන ආයතනික කටයුතු පිළිබඳ වගවීම සහතික කිරීම සඳහාත් අවශ්‍ය ධාරිතාවය සැපයීම සඳහාත් සැලසුම් කොට ඇති හෙයින් කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතියේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය ,නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරකම් සැලැස්ම, එහි මෙහෙයුම් මට්ටමේ ක්‍රියාත්මක කිරීමේ වගකීම දරන කේන්ද්‍රීය ආයතනය ලෙස කටයුතු කරයි. ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ මඟ පෙන්වීම හා අධීක්ෂණයට යටත්ව යම් මට්ටමක මූල්‍ය ස්වාධීනත්වයක් හා පරිපාලනමය නම්‍යශීලීත්වයකින් යුතුව ව්‍යාපෘති කළමනාකරණ ඒකකය මේ සඳහා ශක්තිමත් කොට ඇත.

12.2 ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය

ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය, ශ්‍රී ලංකා දුම්රිය සේවා දෙපාර්තමේන්තුව හා එක්ව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම කළමනාකරණය සඳහා ඒ යටතේ පිහිටුවන ලද ව්‍යාපෘති කළමනාකරණ ඒකකය හරහා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරයි. ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංය හා ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ කළමනාකරණ සේවා අංශයෙන් නිකුත් කරන ලද පොදු මාර්ගෝපදේශවලට යටත්ව ව්‍යාපෘති අරමුණු ඉටු කර ගැනීම උදෙසා යම් මට්ටමක මූල්‍යමය ස්වාධීනත්වයකින් හා පරිපාලනමය නම්‍යශීලීත්වයකින් ව්‍යාපෘති කළමනාකරණ ඒකකය ශක්තිමත් කොට ඇත. ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ මූලිකත්වය පූර්ණ කාලීනව සේවයේ නියුතු ව්‍යාපෘති අධ්‍යක්ෂකවරයෙකු දරන අතර ඔහු ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශ ලේකම් වෙත ඍජුවම වාර්තා කළ යුතු වේ. ප්‍රසම්පාදනය ,මූල්‍ය කළමනාකරණය හා නැවත පදිංචි කිරීම සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම ඇතුළු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ හා කළමනාකරණය කිරීමේ සියලු කටයුතුවල පාලනය ව්‍යාපෘති අධ්‍යක්ෂකවරයා වෙත පැවරී ඇත. නැවත පදිංචි කිරීම සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා පහත දක්වා ඇති පරිදි ප්‍රධාන ක්ෂේත්‍ර කිහිපයක් පිළිබඳ හා ඊට අදාළ කාර්යයන් කෙරෙහි ව්‍යාපෘති කළමනාකරණ ඒකකය සිය අවධානය යොමු කරනු ඇත.

- දැනුවත් කිරීම සඳහා වන ක්‍රියාවලිය ආරම්භ කිරීම හා ඉඩම් අත්කර ගැනීම කළමනාකරණය සහ පරිසර හා සමාජ ආරක්ෂණ කළමනාකරණය සඳහා ඒ ඒ අංශ පිහිටුවමින් සංවිධාන ව්‍යූහය සකස් කිරීම.
- නැවත පදිංචි කිරීමේ වැඩ රාමුව හා නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරකම් සැලැස්ම සකස් කිරීම පිණිස උපදේශන සේවාවන් සඳහා බඳවා ගැනීම.
- වන්දි ගෙවීම හා නැවත පදිංචි කිරීම කළමනාකරණය කිරීමේ ක්‍රියාවලිය ඇතුළත්ව, හා පුනරුත්ථාපන ප්‍රතිලාභ ලබා දෙමින් හා දුක් ගැනවිලි සඳහා සහන සැලසීමේ ක්‍රියාවලියට යොමු වෙමින් නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරකම් සැලැස්ම ක්‍රියාත්මක කිරීම පිණිස

ආයතනික සබඳතා ගොඩනගා ගැනීම සහ අදාළ ආයතන හා සංවිධාන සම්බන්ධීකරණය කිරීම.

- බාහිර සුපරීක්ෂණ ක්‍රියාවලියක් සංවිධානය කිරීම.
- මෙහෙයුම් කමිටු හා අදාළ ආයතනවලට තොරතුරු හා ප්‍රතිපෝෂණ සැපයීම.

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමෙහිලා සමස්ත වගකීම ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය සතු වේ. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා හවුල්කාර ආයතන කිහිපයක් සම්බන්ධ වේ .නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලියේ දී පහත සඳහන් රාජ්‍ය ආයතන වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.

- ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය
- මහානගර හා බස්නාහිර පළාත් සංවර්ධන අමාත්‍යාංශය
- ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය
- ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය
- පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය (අදාළ පළාත් පාලන ආයතන ඇතුළත්ව)
- නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය
- විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය
- ශ්‍රී ලංකා දුම්රිය සේවය
- විදේශ සම්පත් දෙපාර්තමේන්තුව
- ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
- ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව
- ප්‍රාදේශීය ලේකම් කාර්යාල
- මධ්‍යම පරිසර අධිකාරිය
- මිනින්දෝරු දෙපාර්තමේන්තුව
- තක්සේරු දෙපාර්තමේන්තුව
- රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව
- නාගරික සංවර්ධන අධිකාරිය
- ජාතික නිවාස සංවර්ධන අධිකාරිය
- ලංකා විදුලිබල මණ්ඩලය
- ජාතික ජල සම්පාදන හා ජලපවාහන මණ්ඩලය
- ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම
- ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව
- මාර්ග සංවර්ධන අධිකාරිය
- පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව
- පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය

12.3 පරිසර හා සමාජ ආරක්ෂණ අංශය සහ ඉඩම් අත්කර ගැනීමේ අංශය

ව්‍යාපෘති කළමනාකරණ ඒකකයෙහි අනුකූලතාවය ආරක්ෂා කිරීම සඳහා වන කේන්ද්‍රිය අංශය පරිසර හා සමාජ ආරක්ෂණ අංශය වේ. එය ඉඩම් අත්කර ගැනීමේ අංශය සමඟ සමීප සම්බන්ධීකරණයකින් යුතුව කටයුතු

කරයි. නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලියේ සමස්ත සැලසුම් කිරීම, කළමනාකරණය, ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය කිරීමේ වගකීම පරිසර හා සමාජ ආරක්ෂණ අංශය හා ඉඩම් අත්කර ගැනීමේ අංශය සතු වේ. පරිසර හා සමාජ ආරක්ෂණ අංශය හා ඉඩම් අත්කර ගැනීමේ අංශය යටතේ වන කාර්යයන් හා වගකීම්වලට පහත සඳහන් දෑ අන්තර්ගත වේ.

12.3.1 *පරිසර හා සමාජ ආරක්ෂණ අංශය:*

පරිසර හා සමාජ ආරක්ෂණ අංශයේ මූලිකත්වය දරනු ලබන්නේ පූර්ණ කාලීන නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂකවරයෙකු වන අතර සමාජ ආරක්ෂණ හා පරිසර ආරක්ෂණ යන ක්ෂේත්‍රයන්හි විශේෂඥවරුන් දෙදෙනෙකුගේ සහය ඇතිව ක්‍රියාත්මක වන එම අංශයේ පූර්ණ කාලීන කාර්ය මණ්ඩලය ජ්‍යෙෂ්ඨ සමාජ ආරක්ෂණ නිලධාරීන් දෙදෙනෙකු, සමාජ ආරක්ෂණ නිලධාරින් හත් දෙනෙකු සහ නැවත පදිංචි කිරීමේ සහකාර නිලධාරින් දෙදෙනෙකුගෙන් සමන්විත වේ. ඊට අමතරව, ක්‍රියාත්මක කිරීමේ කටයුතුවලට සහය වීම සඳහා නැවත පදිංචි කිරීමේ උපදේශන ආයතනයක සේවය ලබා ගැනේ. තවද, ප්‍රජා ස්වේච්ඡා සේවකයන්ගේ සහය ද ලබා ගනු ඇත. ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක් වූ පුද්ගලයින් සහ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය අතර ප්‍රධාන සම්බන්ධකයක් ලෙස ප්‍රජා ස්වේච්ඡා සේවකයින් කටයුතු කරයි. ප්‍රජා ස්වේච්ඡා සේවකයින්ගෙන් අවම වශයෙන් 50%ක් කාන්තාවන් විය යුතු බවට නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්මෙහි නිර්දේශ කර ඇත.

12.3.2 *ඉඩම් අත්කර ගැනීමේ අංශය:*

ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂක (ඉඩම්) මූලික්තවය දරණ, ව්‍යාපෘතිය හා සම්බන්ධ ඉඩම් අත්කර ගැනීමේ කළමනාකරණය සඳහා කැප වූ වෙන ම අංශයක් පිහිටුවා ඇත. මෙම අංශය අමාත්‍යාංශයේ ඉඩම් පරිපාලන අංශය සමඟ සමීප සම්බන්ධතාවයෙන් යුතුව කටයුතු කරයි. ඉඩම් අත්කර ගැනීමේ අංශයට අයත් ප්‍රධාන කාර්යයන් වනුයේ; දුම්රිය මාර්ග වැඩිදියුණු කිරීමේ කටයුතු හේතුවෙන් බලපෑමට ලක් වන පෞද්ගලික ඉඩම් හඳුනා ගැනීම, ඉඩම් අත්කර ගැනීම, පරීක්ෂා කිරීම, බඩම් මැනීම, සවිස්තර මිනුම් සහිත මැනුම් කටයුතු ,තක්සේරු කිරීම හා බලපෑමට ලක් වූ පාර්ශව වෙත වන්දි ගෙවීම ආදියයි. ඊට අමතරව පහසුකම් සැලසීම හා ඉඩම් අත්කර ගැනීම සඳහා ප්‍රාදේශිය ලේකම් කාර්යාලය, ඉඩම් අමාත්‍යාංශය, මිනින්දෝරු දෙපාර්තමේන්තුව සහ තක්සේරු දෙපාර්තමේන්තුව හා රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව සමඟ සමීප සම්බන්ධීකරණය සිදු කිරීම ද ඔවුන්ගේ වගකීම්වලට අයත් වේ. නැවත පදිංචි කිරිමේ ක්‍රියාවලියට සහාය වීම පිණිස පවත්වනු ලබන විවිධ සමාජ ආර්ථික සමීක්ෂණවල දී පරිසර හා සමාජ ආරක්ෂණ අංශයට සහයෝගය ලබා දීම ද ඉඩම් අත්කර ගැනීමේ අංශයේ වගකීමකි.

නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරකම් සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ දී සහය වන අනෙකුත් පාර්ශවකරුවන්ගේ තොරතුරු පහතින් දැක්වේ.

12.4 ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සිදු කෙරෙන සියලු සංවර්ධන කටයුතු සම්බන්ධීකරණය කිරීම, රජයේ ඉඩම් හා අනෙකුත් පරිපාලන හා සම්බන්ධීකරණ කටයුතු කළමනාකරණ කිරීම, ප්‍රාදේශීය ලේකම්වරයාගේ ප්‍රධාන වගකීම් අතර වේ. ඉඩම් ආඥාපනත යටතේ අනවසර පදිංචියට එරෙහිව නෛතික ක්‍රියාමාර්ග ගැනීමේ බලය ප්‍රාදේශීය ලේකම් සතු වන අතර ඉඩම් නියමානුකූල කිරීමේ හා බැහැර කිරීමේ වගකීම ඔහු දරයි. ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ ඉඩම් අත්කර ගැනීමේ ක්‍රියාපටිපාටියට අනුව ඉඩම පිහිටි යෝජිත ව්‍යාපෘති ප්‍රදේශයේ අත්කර ගැනීමේ නිලධාරියා ලෙස ප්‍රාදේශීය ලේකම්වරයා කටයුතු කරයි. ඔහු /ඇය ඉඩම් අත්කර ගැනීමේ පටිපාටිමය අරමුණු පිළිබඳ නිලධාරින් හා ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක් වූ පුද්ගලයන් දැනුවත් කරනු ඇතැයි අපේක්ෂා කෙරේ .ඉඩම් අත්කර ගැනීමේ හා නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලිය තුළ ප්‍රාදේශීය ලේකම්වරයා සතුව වැදගත් කාර්යභාරයක් ඇත. ඉඩම අත්කර ගැනීමෙන් පසු අත්කර ගැනීමේ නිලධාරියා වශයෙන් ප්‍රාදේශීය ලේකම්වරයා ඉඩම ඉල්ලුම් කළ ආයතනය වෙත පැවරුම් නියෝගයක් නිකුත් කරයි.

12.5 මිනින්දෝරු දෙපාර්තමේන්තුව

ඉඩම් අත්කර ගැනීමේ පනත අනුව ඉඩම් මැනීම හා පිඹුරු සැකසීම සඳහා ව්‍යවස්ථාපිත වගකීමක් මිනින්දෝරු දෙපාර්තමේන්තුව සතු වේ. මිනින්දෝරු දෙපාර්තමේන්තුව ඉඩම් මැනීම සඳහා ඔවුන්ගේ බලපත්‍රලාභී මිනින්දෝරුවන් යොදා ගනී. මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් සකස් කරනු ලබන අවසාන පිඹුරුවලට (ප්‍රාරම්භක පිඹුරු) අත්කර ගැනීමට අවශ්‍ය සියලු ඉඩම් කැබලිවල පිඹුරු හා හිමිකම් කියන්නන්ගේ නාම ලේඛනය (ඉඩම්/ ඉදිකරීම්වල අයිතියට හිමිකම් කියන පුද්ගලයන්ගේ ලැයිස්තුව) ඇතුළත් විය යුතු ය. මැනුම්පතිගේ නියෝග යටතේ සේවය කිරීම සඳහා බලයලත් මිනින්දෝරුවන් කෙටි කාලයකට බඳවා ගැනීමට ව්‍යාපෘති කළමනාකරණ ඒකකය සහය ලබා දෙයි.

12.6 ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

රට තුළ රජයේ ඉඩම් ප්‍රතිපත්ති සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීම, රජයේ ඉඩම් සංරක්ෂණය කිරීම, ඉඩම් හිමිකම් නිරවුල් කිරීම, සහ මහජන අරමුණු සඳහා ඉඩම් අත්කර ගැනීම ආදි කාර්යයන් සඳහා වර්ෂ 1932දී ඉඩම් අමාත්‍යාංශය පිහිටුවන ලදී. ඉඩම් මැනීම ,ඉඩම් අත්කර ගැනීම, ඉඩම් අන්සතු කිරීම හා බැහැර කිරීම, ඉඩම් ප්‍රතිපත්ති හා සංවර්ධනය, ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම්කරණය, ඉඩම් හිමිකම් ලියාපදිංචි කිරීම මෙහි ප්‍රධාන කාර්යයන් වේ. ස්වකැමැත්තෙන් තොරව අවතැන්වූවන් නැවත පදිංචි කිරීමේ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම, පරිපාලනය හා සංවර්ධනය හා අනෙකුත් ආයතනවලට ස්වකැමැත්තෙන් තොරව අවතැන්වූවන් නැවත පදිංචි කිරීමේ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට සහාය වීමේ වගකීම ද ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය දරයි. 2003 කාර්ය සංග්‍රහයට අමතරව ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය (i) ස්වකැමැත්තෙන් තොරව නැවත පදිංචි කිරීම සැලසුම් කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ මාර්ගෝපදේශ, (ii) නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරකම් සැලැස්ම සකස් කිරීම සඳහා මාර්ගෝපදේශ සහ (iii) සහභාගිත්ව නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලිය සඳහා මාර්ගෝපදේශ සකස් කොට ඇත.

12.7 තක්සේරු දෙපාර්තමේන්තුව

ඉඩම් අත්කර ගැනීමේ පනත මගින් තක්සේරු කිරීමේ සම්ප්‍රාදායික ප්‍රවේශය වූ "විවෘත වෙළඳපොළ වටිනාකම" හෝ "නැවත ස්ථාපනය කිරීමේ පිරිවැය" ලෙස නිර්වචනය කර ඇති "වෙළඳපොළ වටිනාකම" මත පදනම්ව

ඉඩම් හා ඉදිකිරීම්වලට සිදු වන හානිය තක්සේරු කිරීමට අවසර ලබා දෙයි. 2008 ඉඩම් අත්කර ගැනීමේ රෙගුලාසි මඟින් ක්ෂය වීම්, හානිකර බලපෑම් හා වෙන් කිරීම්, සහ බාධාවන් හා වෙනත් අලාභ රහිතව පවතින වෙළඳපොළ වටිනාකම මත පදනම්ව වන්දි නිර්ණය කිරීම සඳහා සවිස්තර මාර්ගෝපදේශයන් සැපයේ. තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් පත් කළ තක්සේරු නිලධාරින් තනි තනිව හෝ එක්ව දේපළ වෙත ගොස් පහත සඳහන් කරුණු පදනම් කරගෙන ඔවුන්ගේ තක්සේරුව සිදු කරනු ඇත.

- ගොනු කරන ලද කොන්දේසි /ක්ෂේත්‍රයේ ස්වභාවය හා දේපළ අවට පරිසරය.
- දේපළ පරිහරණය කිරීමේ අරමුණ.
- දේපළවල වටිනාකම හා සම්බන්ධ ලිඛිත සාක්ෂි : ඔප්පු, තක්සේරු සහතික, ණය ලේඛන, ආදායම් ඉපැයීම පිළිබඳ සාක්ෂි ආදිය, ජනතාවගේ අදහස් විමසීම.
- ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල, පළාත් හා මධ්‍යම ආදායම් බදු කාර්යාලවල ඇති ද්විතියික තොරතුරු අධ්‍යනය කිරීම.
- දේපළ තක්සේරුව මඟින් සෑම දේපළකට ම වෙන් වෙන් වශයෙන් වටිනාකමක් ලැබේ .

තක්සේරු නිලධාරින්හට අපේක්ෂිත ස්ථානවලට යාම සඳහා කටයුතු සංවිධානය කර ගැනීමට සහය ලබා දෙමින් නියමිත කාලපරිච්ඡේදයන්ට අනුව ව්‍යාපෘතියේ කටයුතුවලට යොමු වීම සඳහා ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් තක්සේරු දෙපාර්තමේන්තුවට සහය වනු ඇත.

12.8 නැවත පදිංචි කිරීමේ වැඩ රාමුව සහ නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම අනුමත කිරීමේ ක්‍රියාවලිය

නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම අනුමත කිරීමේ වගකීම දරණ ජාතික ආයතනය ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය වේ. ස්වකැමැත්තෙන් තොරව අවතැන්වූවන් නැවත පදිංචි කිරීමේ ජාතික ප්‍රතිපත්තිය මඟින් නැවත පදිංචි කිරීමේ ක්‍රියාකකම් සැලැස්ම සඳහා අනුමැතිය ලබා දීම මධ්‍යම පරිසර අධිකාරිය වෙත පවරා ඇතත් එය සම්පූර්ණ අනුමැතියක් දක්වන ප්‍රතිපත්තිමය මට්ටමේ ප්‍රකාශයක් ලෙස හඳුනාගෙන ඇත. ඵලදායි ලෙස ස්වකැමැත්තෙන් තොරව අවතැන්වූවන් නැවත පදිංචි කිරීමේ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම සඳහා ධාරිතා සංවර්ධනය ද සහිතව ඉඩම් අත්කර ගැනීමේ සහ ස්වකැමැත්තෙන් තොරව අවතැන්වූවන් නැවත පදිංචි කිරීමේ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීමේ වගකීම ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය දරයි. ව්‍යාපෘතිය සඳහා ඉඩමේ යෝග්‍යතාවය පිරික්සීමෙන් අනතුරුව, ව්‍යාපෘති කළමනාකරණ ඒකකය නියමිත ආකෘතිය (ඉඩම් නියෝග 248 3 ආ) අනුව යෝජනාවක් සකස් කොට රේඛීය අමාත්‍යාංශයේ ලේකම් වෙත ඉදිරිපත් කරයි. එවිට ඔහු ඔහුගේ නිර්දේශය, ඉඩම් අත්කර ගැනීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරයි. ව්‍යාපෘතිය හේතුවෙන් ජනතාව ආර්ථික හෝ භෞතික අවතැන් වීමකට ලක් වන්නේ නම් ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය විසින් පිළිගත හැකි නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරකම් සැලැස්මක් ඉල්ලා සිටිනු ඇත.

නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරකම් සැලැස්ම සකස් කිරීමේ ක්‍රියාවලිය ස්වකැමැත්තෙන් තොරව අවතැන්වූවන් නැවත පදිංචි කිරීමේ ජාතික ප්‍රතිපත්තිය, සමාජ ආරක්ෂණ ප්‍රතිපත්ති ප්‍රකාශනය සහ අනෙකුත් අදාළ නීති හා රෙගුලාසිවලට අනුව සිදුකෙරෙනු ඇති අතර නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්මෙහි කෙටුම්පත්

සමාලෝචනය කරමින් ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ ක්‍රියාකාරී මැදහත් වීමෙන් එහි මෙහෙයුම් කටයුතුවල යථා තත්ත්වයන් සලකුණු කෙරේ. අවසාන නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරකම් සැලැස්ම අනුමැතිය හා පැහැදිළි කිරීම් සඳහා ආසියානු සංවර්ධන බැංකුව වෙත ඉදිරිපත් කෙරේ.

13 වන පරිච්ඡේදය - සුපරීක්ෂණය හා වාර්තා කිරීම

නැවත පදිංචි කිරීම සුපරීක්ෂණය යනු, නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරකම් සැලැස්ම මත පදනම්ව නැවත පදිංචි කිරීමේ ප්‍රගතිය පිළිබඳ තොරතුරු එක්රැස් කිරීම, විශ්ලේෂණය කිරීම, වාර්තා කිරීම සහ භාවිතා කිරීමයි. ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක් වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය මඟින් ඔවුන්ගේ ආර්ථික හා සමාජයීය සම්පත් වැඩිදියුණු කිරීමට හෝ අවම වශයෙන් ව්‍යාපෘතියට පෙර තිබූ තත්ත්වයට ප්‍රතිෂ්ඨාපනය කිරීමට ව්‍යාපෘතියට හැකි බවට සහතික විය යුතු ය. ස්වකැමැත්තෙන් තොරව නැවත පදිංචි කිරීමේ දී එය ක්‍රියාවට නංවන ක්‍රියාවලිය තුළ මතු වන ප්‍රශ්න අවම කර ගැනීමට හෝ වළක්වා ගැනීමට සුපරීක්ෂණ හා ඇගයීම් කටයුතු වඩා වැදගත් වේ. සැලැස්මට අනුව කටයුතු ක්‍රියාත්මක වන්නේ ද යන්න තහවුරු කර ගැනීම සඳහා කලින් කලට පරීක්ෂා කිරීම සුපරීක්ෂණයට අයත් වේ .එමඟින් නැවත පදිංචි කෙරෙන පුද්ගලයන්හට හා ඔවුන්ගේ අවශ්‍යතාවයන්ට මෙන්ම ක්‍රියාත්මක වෙමින් පවතින නැවත පදිංචි කිරීමේ වැඩසටහන පිළිබඳ ප්‍රතිපෝෂණ හා ප්‍රතිචාරවලට ද ප්‍රවේශයක් හිමි වේ. මෙම ප්‍රශ්න නියමිත කාලයේ දී හඳුනා ගැනීම හා විසඳීම නැවත පදිංචි කිරීමේ අරමුණු සාක්ෂාත් කර ගැනීමේ දී වඩා වැදගත් වේ.

සුපරීක්ෂණ දර්ශක පුළුල් කාණ්ඩ දෙකකින් සමන්විත වේ.

- ක්‍රියාවලි හා නිමැවුම් දර්ශක හෝ අභ්‍යන්තර සුපරීක්ෂණය
- ප්‍රතිඵල හා බලපෑම් දර්ශක හෝ බාහිර සුපරීක්ෂණය

13.1 සුපරීක්ෂණයේ ඉලක්ක හා අරමුණු

- ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක් වූ පුද්ගලයන්ගේ හිමිකම් හා අයිතීන් සුරැකෙන බවටත් ඔවුන්ගේ ජීවන තත්ත්වය ප්‍රතිෂ්ඨාපනය හෝ වැඩිදියුණු කෙරෙන බවටත් සහතික වීම.
- ආදායම් ප්‍රතිෂ්ඨාපනයේ හා සංවර්ධන කටයුතුවල තිරසාරත්වය ඇගයීම .
- වන්දි ,පුනරුත්ථාපනය ,නැවත පදිංචි කිරීම ,සහ විවිධ ආධාර ක්‍රමවල ප්‍රමාණවත් බව ඇගයීම.
- ප්‍රශ්න හා ඇති විය හැකි ප්‍රශ්න හඳුනා ගැනීම සහ දුෂ්කරතා අවම කර ගැනීමට වහා ප්‍රතිචාර දැක්වීම.
- එක් එක් සන්ධිස්ථාන පසු කිරීමේ භෞතික ප්‍රගතිය තක්සේරු කිරීම.

13.2 අභ්‍යන්තර සුපරීක්ෂණය හා ක්‍රමවේදය

ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ නියෝජිතයන්, උපදේශකවරයෙක් හා කොන්ත්‍රාත්කරුවෙක්ගෙන් සැදුම් ලත් කණ්ඩායමක් මඟින් අභ්‍යන්තර සුපරීක්ෂණය සිදුකෙරෙනු ඇත. එය මාසිකව සිදු කෙරේ.

13.3 සුපරීක්ෂණයේ ප්‍රධාන දර්ශක

සුපරීක්ෂණය සඳහා පහත දැක්වෙන දර්ශකයන් යොදා ගැනේ.

- පූර්ව /පසු සමාජ ආර්ථික තත්ත්වයන් සංසන්දනය කිරීම.
- ආදායම් ඉපැයීමේ ධාරිතාව ප්‍රතිෂ්ඨාපනය කිරීම.

- සත්කාරක ගම්වැසියන් සමඟ සමෝධානය.
- අධ්‍යාපනය, ජල සැපයුම, විදුලිය, සනීපාරක්ෂණ ආදියට ප්‍රවේශය

13.4 වාර්තා කිරීමේ අවශ්‍යතා

උපදේශකවරයා මාසික සුපරීක්ෂණ වාර්තා හා කාර්තුමය වාර්තා සකස් කොට ව්‍යාපෘති කළමනාකරණ ඒකකය වෙත ඉදිරිපත් කරනු ඇත. ව්‍යාපෘති කළමනාකරණ ඒකකය මාසික වාර්තා සමාලෝචනය කිරීම හා අර්ධ වාර්ෂික සුපරීක්ෂණ වාර්තා සකස් කිරීම සිදු කරනු ඇත. සුපරීක්ෂණ වාර්තා මඟින් ඉඩම් හා අනෙකුත් දේපළ අත්කර ගැනීම හා නැවත පදිංචි කිරීමේ කටයුතු නැවත පදිංචි කිරිමේ ක්‍රියාකාරකම් සැලැස්මට අනුව සිදු වි ඇත් ද යන්න විමසයි. එමඟින් ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක් වූ පුද්ගලයන් සමඟ පැවැත් වූ උපදේශන /සාකච්ඡා පිළිබඳ හා හඳුනා ගත් ගැටලුවල සාරාංශය හා ඒවා විසඳීමට ගත් ක්‍රියාමාර්ග ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක් වූ පුද්ගලයන් ඉදිරිපත් කළ පැමිණිලි හා දුක්ගැනවිලි සහ ඒ සඳහා ගත් ක්‍රියාමාර්ග සහ ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක් වූ පුද්ගලයන්ගේ ජීවනෝපායන් හා ආදායම් මාර්ග ප්‍රතිෂ්ඨාපනය කිරීමට හා වැඩිදියුණු කිරීමට සිදු කළ විශේෂ ක්‍රියාකරකම්වල සාරාංශයක් සමඟ ලේඛනගත කෙරේ.

13.5 බාහිර සුපරීක්ෂණය හා ක්‍රමවේදය

බාහිර සුපරීක්ෂණය, නැවත පදිංචි කිරීමේ වැඩසටහන් සුපරීක්ෂණය සම්බන්ධයෙන් අත්දැකීම් සහිත බාහිර ආයතනයක් මඟින් සිදු කෙරෙනු ඇත. ව්‍යාපෘති කළමනාකරණ ඒකකය මේ සඳහා සුදුසු ආයතනයක් තෝරා ගනු ඇත. නැවත පදිංචි කිරීමේ වැඩසටහන ආරම්භ කිරීමෙන් පසු බාහිර සුපරීක්ෂණය ඇරඹේ. කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතියේ - ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ ප්‍රගතිය නැවත සමාලෝචනය කිරීම සඳහා පවත්වන රැස්වීම්වලට බාහිර අධීක්ෂකවරයා සහභාගි විය යුතු අතර ආසියානු සංවර්ධන බැංකුවේ නිලධාරින් පැමිණෙන අවස්ථාවල දී පැමිණ සිටිය යුතුය. ඔහු/ ඇය නැවත පදිංචි කිරීමේ කටයුතු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය දැක්වෙන මාසික සුපරීක්ෂණ වාර්තා හා කාර්තුමය වාර්තා සකස් කොට, ඕනෑම අනුකූලතා ගැටලුවක් හා නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ව්‍යාපෘති කළමනාකරණ ඒකකයට හා ආසියානු සංවර්ධන බැංකුව වෙත ඉදිරිපත් කළ යුතු ය.

බාහිර සුපරීක්ෂණයේ විශේෂිත කාර්යයන්වලට පහත කරුණු ඇතුළත් වේ.

¬ ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක් වූ පුද්ගලයන්ගේ පූර්ව ව්‍යාපෘතිවල (අවතැන් වීමට පෙර) පාදක දත්ත සමාලෝචනය කිරීම.

- ක්ෂේත්‍ර කාර්යාලවල, ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ සහ එක් එක් කුටුම්බවල ඇති වාර්තා මත පදනම්ව නැවත පදංචි කිරීමේ ක්‍රියාකාරකම් සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය විමසීම.
- ආරක්ෂණ අනුකූලතා ගැටලු සඳහා උපදෙස් ලබා දීම, ස්වකැමැත්තෙන් තොරව නැවත පදිංචි කිරීමේ විශේෂ ගැටලු හඳුනා ගතහොත් එවැනි ගැටලු විසඳීම සඳහා නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග සැලැස්මක් සකස් කිරීම.
- නැවත පදිංචි කිරීමේ බලපෑම් පිළිබඳ තොරතුරු රැස් කිරීමට හා විශ්ලේෂණය කිරීමට සුදුසු දර්ශක කට්ටලයක් හඳුනා ගැනීම.
- බලපෑම විශ්ලේෂණය සඳහා විධිමත් හා අවිධිමත් විවිධ සමීක්ෂණ යොදා ගැනීම.

- නැවත පදිංචි කිරීමේ කාර්යක්ෂමතාව, ඵලදායීත්වය, බලපෑම හා තිරසාරත්වය ඇගයීම.
- උගත් පාඩම් ඇසුරෙන් අනාගත නැවත පදිංචි කිරීමේ ප්‍රතිපත්ති සම්පාදනයට හා සැලසුම් කිරීමට මාර්ගෝපදේශ සැපයීම.

ආරක්ෂණ සුපරීක්ෂණය සඳහා වූ ප්‍රධාන මිනුම් දඬුවලට පහත කරුණු අන්තර්ගත වේ.

- අවසාන ඉංජිනේරු සැලැස්ම අනුගමනය කරමින් නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම යාවත්කාලීන කිරීම.
- තොරතුරු අනාවරණය හා උපදේශනය /සාකච්ඡා.
- ඉඩම් අත්කර ගැනීමේ හා වන්දි ගෙවීමේ තත්ත්වය.
- බලපෑමට ලක් වූ ඉදිකිරීම් හා අනෙකුත් වත්කම් සඳහා වන්දි ගෙවීම.
- ≈ ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක් වූ පුද්ගලයන් ප්‍රතිස්ථානගත කිරීම.
- ආදායම් අහිමි වීම සඳහා ගෙවීම්.
- ආදායම් ප්‍රතිෂ්ඨාපන ක්‍රියාකාරකම්.
- ඉදිකිරීම් ආශ්‍රිත බලපෑම් අවම කිරීමේ තත්ත්වය.
- දුක්ගැනවිලි සම්බන්ධ කටයුතු හැසිරවීමේ හා දුක්ගැනවිලි සඳහා සහන සැලසීමේ තත්ත්ව .

සුපරීක්ෂණ හා ඇගයීම් නිලධාරීන් නිතිපතා ව්‍යාපෘති ප්‍රදේශයට හා නැවත පදිංචි කිරීමේ ස්ථානවලට ගොස් එම ප්‍රජාවන් හා පාර්ශවකරුවන් සමඟ සම්බන්ධ වනු ඇත. උපදේශන / සාකච්ඡා අඛණ්ඩව සිදු කෙරෙන බවට ඔවුන් වගබලා ගන්නා අතර සුපරීක්ෂණ ප්‍රතිඵල ඇතුළු තොරතුරු ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක් වූ පුද්ගලයන් වෙත අනාවරණය කිරීමට වූ කැපවීම ඉන් පෙන්නුම් කරයි. එක් අතකින් නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරකම් සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පරීක්ෂා කිරීමේ අවශ්‍යතාවය කෙරෙහි ඔවුන් අවධානය යොමු කරනු ඇති අතර අනෙක් අතට වන්දි හා නැවත පදිංචි කිරීමේ ආධාර ඇතුළු ආරක්ෂණ ක්‍රියාමාර්ග ගැනීමට වූ කැපවීම සහතික කරනු ඇත. ඉදිකිරීම් ආශ්‍රිත තාවකාලික බලපෑම් ඇතුළු ඕනෑම දුක්ගැනවිල්ලකට ඔවුන් සවන් දී ඒ පිළිබඳ සොයා බලනු ඇත. නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරකම් සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ ඇති හිඩැස් ඔවුන් විසින් හඳුනා ගනු ලබන අතර ව්‍යාපෘතිය හේතුවෙන් බලපෑමට ලක් වූ පුද්ගලයන් සමඟ සාකච්ඡා කොට බලපෑම් කිරීමට, වළක්වා ගැනීමට හෝ අවම කිරීමට විසඳුම් සොයා ගනු ඇත. ඒ අනුව ඔවුන් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීමට හෝ එය පහසු කිරීම සඳහා ඔවුන්ගේ නිර්දේශ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය වෙත ඉදිරිපත් කරයි. එහෙයින්, අභ්‍යන්තර හා බාහිර සුපරීක්ෂණය ව්‍යාපෘතියෙහි සමස්ත කළමනාකරණය සඳහා අත්‍යාවශ්‍ය අංගයකි.